226 වන කාණ්ඩය - 06 වන කලාපය
தொகுதி 226 - இல. 06
Volume 226 - No. 06

2014 ජූනි 18වන බදාදා
2014 யூன் 18, புதன்கிழமை
Wednesday, 18th June, 2014

# පාර්ලිමේන්තු විවාද
(හැන්සාඩ්)

# பாராளுமன்ற விவாதங்கள்
(ஹன்சாட்)

# PARLIAMENTARY DEBATES
(HANSARD)

## නිල වාර්තාව
அதிகார அறிக்கை
OFFICIAL REPORT

(අශෝධිත පිටපත /பிழை திருத்தப்படாதது /Uncorrected)

# අන්තර්ගත ප්‍රධාන කරුණු

**නිවේදන :**
කථානායකතුමාගේ සහතිකය

**ප්‍රශ්නවලට වාචික පිළිතුරු**

**පෞද්ගලිකව දැනුම් දීමෙන් ඇසූ ප්‍රශ්නය :**
ට්‍රාන්ස්පේරන්සි ඉන්ටර්නැෂනල් ශ්‍රී ලංකා ආයතනය දෙමළ භාෂාවෙන් කටයුතු කරන මාධ්‍යවේදීන් උදෙසා පැවැත්වූ වැඩ මුළුව

**එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් මහ කොමසාරිස් කාර්යාලය මගින් ශ්‍රී ලංකාවට එරෙහිව පැවැත්වීමට නියමිත පරීක්ෂණය සිදු නොකළ යුතු බව -** යෝජනාව සම්මත විය

---

# பிரதான உள்ளடக்கம்

**அறிவிப்புகள்:**
சபாநாயகரது சான்றுரை

**வினாக்களுக்கு வாய்மூல விடைகள்**

**தனி அறிவித்தல்மூல வினா:**
ட்ரான்ஸ்பரன்சி இன்ரநெஷனல் ஸ்ரீலங்கா நிறுவனம் நடத்திய தமிழ் மொழிமூல ஊடகவியலாளர்களுக்கான செயலமர்வு

**ஐக்கிய நாடுகளின் மனித உரிமைகள் ஆணையாளர் அலுவலகத்தினால் இலங்கைக்கு எதிரான விசாரணை மேற்கொள்ளப்படக்கூடாது -** பிரேரணை நிறைவேற்றப்பட்டது

---

# PRINCIPAL CONTENTS

ANNOUNCEMENTS:
Speaker's Certificate

ORAL ANSWERS TO QUESTIONS

QUESTION BY PRIVATE NOTICE:
Workshop conducted by Transparency International Sri Lanka for Journalists Working in Tamil Language

THE INVESTIGATION AGAINST SRI LANKA BY THE OFFICE OF THE UNITED NATIONS HIGH COMMISSIONER FOR HUMAN RIGHTS SHOULD NOT BE HELD – Motion Passed

# පාර්ලිමේන්තුව
## பாராளுமன்றம்
## PARLIAMENT

***2014 ජුනි 18*වන බදාදා**
*2014 யூன் 18, புதன்கிழமை*
*Wednesday, 18th June, 2014*

**අ.භා. 1.00ට පාර්ලිමේන්තුව රැස් විය.**
**නියෝජ්‍ය කථානායකතුමා [ගරු චන්දිම වීරක්කොඩි මහතා] මූලාසනාරූඪ විය.**
பாராளுமன்றம் பி.ப. 1.00 மணிக்குக் கூடியது.
பிரதிச் சபாநாயகர் அவர்கள் [மாண்புமிகு சந்திம வீரக்கொடி] தலைமை வகித்தார்கள்.
The Parliament met at 1.00 p.m.,
MR. DEPUTY SPEAKER [THE HON. CHANDIMA WEERAKKODY] in the Chair.

# නිවේදන
## அறிவிப்புக்கள்
## ANNOUNCEMENTS

# I
## කථානායකතුමාගේ සහතිකය
### சபாநாயகரது சான்றுரை
### SPEAKER'S CERTIFICATE

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 79 වැනි ව්‍යවස්ථාව අනුව, 2014 ජුනි මස 17 වන දින ගරු කථානායකතුමා විසින් පහත සඳහන් පනත් කෙටුම්පත්හි සහතිකය සටහන් කළ බව දන්වනු කැමැත්තෙමි.

- කුමාරසිරි හෙට්ටිගේ පදනම (සංස්ථාගත කිරීමේ)
- මොහාන් ලාල් ග්‍රේරු පදනම (සංස්ථාගත කිරීමේ)
- වික්ටර් ඇන්ටනි අධ්‍යාපන, සමාජ, ආර්ථික සත්කාරක හා පුණ්‍යාධාර පදනම (සංස්ථාගත කිරීමේ)

# II
## පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභා රැස්වීම
### பாராளுமன்ற அலுவல்கள் பற்றிய குழுக் கூட்டம்
### MEETING OF COMMITTEE ON PARLIAMENTARY BUSINESS

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)

පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභාවේ රැස්වීමක් 2014 ජුනි මස 18වන බදාදා, එනම් අද දින පස් වරු 2.30ට ගරු කථානායකතුමාගේ නිල කාමරයේදී පැවැත්වීමට නියමිත බැවින්, එයට පැමිණ සහභාගි වන ලෙස ගරු සභික මන්ත්‍රීන් සියලු දෙනාට මෙයින් දැනුම් දීමට කැමැත්තෙමි.

# ලිපි ලේඛනාදිය පිළිගැන්වීම
## சமர்ப்பிக்கப்பட்ட பத்திரங்கள்
## PAPERS PRESENTED

2013 වර්ෂය සඳහා මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශයේ කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවේ කාර්යසාධන වාර්තාව.- [අග්‍රාමාත්‍ය සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍ය ගරු දි.මු. ජයරත්න මහතා වෙනුවට ගරු දිනේෂ් ගුණවර්ධන මහතා ]

***සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.***
*சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.*
*Ordered to lie upon the Table.*

(i) 2008 අංක 35 දරන සමුද්‍ර දූෂණය වැළැක්වීමේ පනතේ 6 වැනි වගන්තියේ (උ) ඡේදය සහ 39 වැනි වගන්තිය සමග කියවිය යුතු 51 වැනි වගන්තියේ (2) වැනි උප වගන්තියේ (ඇ) ඡේදය යටතේ පරිසර අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2012 අගෝස්තු 15 දිනැති අංක 1771/19 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියෝග; සහ

(ii) 2008 අංක 35 දරන සමුද්‍ර දූෂණය වැළැක්වීමේ පනතේ 27 වැනි සහ 28 වැනි වගන්ති සමග කියවිය යුතු 51 වැනි වගන්තිය යටතේ පරිසර හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2013 ජුනි 28 දිනැති අංක 1816/37 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද සහ 2013 සැප්තැම්බර් 27 දිනැති අංක 1829/38 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ නිවැරදි කර පළ කරන ලද නියෝග.- [පරිසර හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍ය ගරු ඒ.ඩී. සුසිල් ප්‍රේමජයන්ත මහතා වෙනුවට ගරු දිනේෂ් ගුණවර්ධන මහතා]

***සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.***
*சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.*
*Ordered to lie upon the Table.*

(203 වැනි අධිකාරය වූ) මෝටර් වාහන පනතේ 19 වැනි වගන්තිය සමග කියවිය යුතු, එකී පනතේ 237 වැනි වගන්තිය යටතේ ප්‍රවාහන අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2014 ජනවාරි 29 දිනැති අංක 1847/32 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියෝග .- [ප්‍රවාහන අමාත්‍ය ගරු කුමාර වෙල්ගම මහතා වෙනුවට ගරු දිනේෂ් ගුණවර්ධන මහතා]

***සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.***
*சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.*
*Ordered to lie upon the Table.*

**ගරු දයාශ්‍රිත තිසේරා මහතා (රාජ්‍ය සම්පත් හා ව්‍යවසාය සංවර්ධන අමාත්‍යතුමා)**
(மாண்புமிகு தயாசிறித திசேரா - அரச வளங்கள், தொழில்முயற்சி அபிவிருத்தி அமைச்சர்)
(The Hon. Dayasritha Thissera - Minister of State Resources and Enterprise Development)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පහත සඳහන් වාර්තා මම ඉදිරිපත් කරනවා.

(i) 2007 මාර්තු 31 වැනි දිනෙන් අවසන් වන වර්ෂය සඳහා සීමාසහිත ශ්‍රී ලංකා රබර් නිෂ්පාදන සහ අපනයන සංස්ථාවේ ගිණුම් වාර්තාව;

(ii) 2008 මාර්තු 31 වැනි දිනෙන් අවසන් වන වර්ෂය සඳහා සීමාසහිත ශ්‍රී ලංකා රබර් නිෂ්පාදන සහ අපනයන සංස්ථාවේ ගිණුම් වාර්තාව;

(iii) 2009 මාර්තු 31 වැනි දිනෙන් අවසන් වන වර්ෂය සඳහා සීමාසහිත ශ්‍රී ලංකා රබර් නිෂ්පාදන සහ අපනයන සංස්ථාවේ ගිණුම් වාර්තාව;

(iv) 2010 මාර්තු 31 වැනි දිනෙන් අවසන් වන වර්ෂය සඳහා සීමාසහිත ශ්‍රී ලංකා රබර් නිෂ්පාදන සහ අපනයන සංස්ථාවේ ගිණුම් වාර්තාව; සහ

[ගරු දයාශ්‍රිත තිසේරා මහතා]

(v) 2011 මාර්තු 31 වැනි දිනෙන් අවසන් වන වර්ෂය සඳහා සීමාසහිත ශ්‍රී ලංකා රබර් නිෂ්පාදන සහ අපනයන සංස්ථාවේ ගිණුම් වාර්තාව.

මෙම වාර්තා රාජ්‍ය සම්පත් හා ව්‍යවසාය සංවර්ධන කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාවට යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

2012 සහ 2013 වර්ෂ සඳහා රාජ්‍ය සම්පත් හා ව්‍යවසාය සංවර්ධන අමාත්‍යාංශයේ කාර්ය සාධන වාර්තා.- [රාජ්‍ය සම්පත් හා ව්‍යවසාය සංවර්ධන අමාත්‍ය ගරු දයාශ්‍රිත තිසේරා මහතා]

***සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.***
*சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.*
*Ordered to lie upon the Table.*

## උපදේශක කාරක සභා වාර්තා
## ஆலோசனைக் குழு அறிக்கைகள்
## CONSULTATIVE COMMITTEE REPORTS

**ගරු දයාශ්‍රිත තිසේරා මහතා**
(மாண்புமிகு தயாசிறித திஸேரா)
(The Hon. Dayasritha Thissera)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම පහත සඳහන් වාර්තා සම්බන්ධයෙන් රාජ්‍ය සම්පත් හා ව්‍යවසාය සංවර්ධන කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාවේ වාර්තාව ඉදිරිපත් කරමි.

(i) 2012 වර්ෂය සඳහා ලංකා මිනරල් සැන්ඩ්ස් ලිමිටඩ්හි වාර්ෂික වාර්තාව;

(ii) 2011 මාර්තු 31 වැනි දිනෙන් අවසන් වූ මුදල් වර්ෂය සඳහා බීසීසී ලංකා ලිමිටඩ්හි වාර්ෂික වාර්තාව; සහ

(iii) 2006, 2007, 2008, 2009 සහ 2010 වර්ෂ සඳහා ජනතා වතු සංවර්ධන මණ්ඩලයේ වාර්ෂික වාර්තා.

***සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.***
*சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.*
*Ordered to lie upon the Table.*

## පෙත්සම්
## மனுக்கள்
## PETITIONS

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ගරු ගාමිණී ලොකුගේ මහතා - පැමිණ නැත.

**ගරු රෝහණ දිසානායක මහතා (ප්‍රවාහන නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு ரோஹண திசாநாயக்க - போக்குவரத்து பிரதி அமைச்சர்)
(The Hon. Rohana Dissanayake - Deputy Minister of Transport)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම උකුවෙල, ඇලවල, අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ සහකාර අධ්‍යක්ෂ කාර්යාලයේ ඩී.ජී. දිසානායක මහතාගෙන් ලැබුණු පෙත්සමක් පිළිගන්වමි.

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා**
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම කොට්ටාව, පන්නිපිටිය, බංගලාවත්ත, එක්සත් මාවත, අංක 287 දරන ස්ථානයෙහි පදිංචි එන්.ඩී. විජේපාල මහතාගෙන් ලැබුණු පෙත්සමක් පිළිගන්වමි.

**ගරු වසන්ත අලුවිහාරේ මහතා**
(மாண்புமிகு வசந்த அலுவிஹாரே)
(The Hon.Wasantha Aluwihare)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම රත්තොට, කුරුවාව, පහළ පැපොලයායෙහි පදිංචි එච්.ඩී.බී.එස්. පෙරේරා මහතාගෙන් ලැබුණු පෙත්සමක් පිළිගන්වමි.

***ඉදිරිපත් කරන ලද පෙත්සම් මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවට පැවරිය යුතු යයි නියෝග කරන ලදී.***
*சமர்ப்பிக்கப்பட்ட மனுக்களைப் பொதுமனுக் குழுவுக்குச் சாட்டக் கட்டளையிடப்பட்டது.*
*Petitions ordered to be referred to the Committee on Public Petitions.*

**ගරු ජෝන් අමරතුංග මහතා**
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපේ පක්ෂ නායක රැස්වීමේදී තීරණයක් ගත්තා, පස් වරු 2.00 වෙනකොට ප්‍රශ්නවලට වාචික පිළිතුරු දෙන එක අවසාන කරනවාය කියලා. ඒ රැස්වීමට ඔබතුමාත් සහභාගි වුණා. නමුත් ඒක සිද්ධ වෙන්නේ නැහැ. එහෙම කළේ නැත්නම් අපට විවාදයට ලැබෙන වෙලාව මදි වෙනවා.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ගරු මන්ත්‍රීතුමනි, ඊයේත් අපි ඉතාම ඕනෑකමින් ඒ කටයුතු කළා. ඊයේ විනාඩි පහයි පරක්කු වුණේ.

මම ගරු මන්ත්‍රීවරුන්ගෙන් ඉල්ලීමක් කරනවා, අතුරු ප්‍රශ්න කෙටියෙන් අහන්න කියලා. ගරු අමාත්‍යවරුන්ගෙනුත් ඉල්ලීමක් කරනවා පිළිතුරු පැහැදිලිව, කෙටියෙන් ලබා දෙන්න කියලා.

**ගරු ජෝන් අමරතුංග මහතා**
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)
බොහොම ස්තුතියි.

## ප්‍රශ්නවලට වාචික පිළිතුරු
## வினாக்களுக்கு வாய்மூல விடைகள்
## ORAL ANSWERS TO QUESTIONS

### උතුරු වසන්තය වැඩසටහන : ක්‍රියාත්මක කළ වැඩසටහන්
### வடக்கின் வசந்தம் நிகழ்ச்சித்திட்டம் : செயற்படுத்திய வேலைத்திட்டங்கள்
### UTHURU WASANTHAYA PROGRAMME : PROJECTS IMPLEMENTED

2622/'12

**1. ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ආර්ථික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (2):

(අ) 2009, 2010 සහ 2011 යන වර්ෂයවලදී උතුරු වසන්තය වැඩසටහන යටතේ, උතුරු පළාතේ ක්‍රියාත්මක වූ වැඩසටහන් කවරේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) ඉහත වැඩසටහන් සඳහා,

(i) ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් වැය කළ මුදල;

(ii) විෂය මට්ටමින් වැය කළ මුදල;

කොපමණද යන්න වෙන් වෙන් වශයෙන් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) උතුරු පළාතේ සංවර්ධනය සඳහා ඉහත වැඩසටහන් ප්‍රමාණවත්වේද යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නො එසේ නම්, ඒ මන්ද?

பொருளாதார அபிவிருத்தி அமைச்சரைக் கேட்ட வினா:

(அ) 2009, 2010 மற்றும் 2011ஆம் ஆண்டுகளில் வடக்கின் வசந்தம் நிகழ்ச்சித்திட்டத்தின்கீழ் வட மாகாணத்தில் செயற்படுத்தப்பட்ட வேலைத் திட்டங்கள் யாவை யென்பதை அவர் குறிப்பிடுவாரா?

(ஆ) மேற்படி வேலைத்திட்டத்துக்காக,

(i) பிரதேச செயலக மட்டத்தில் செலவிடப்பட்ட பணத்தொகை எவ்வளவென்பதையும்;

(ii) விடய மட்டத்தில் செலவிடப்பட்ட பணத்தொகை எவ்வளவென்பதையும்

தனித்தனியாக அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) வட மாகாணத்தின் அபிவிருத்திக்காக மேற்படி வேலைத்திட்டங்கள் போதுமானவையா என்பதையும் அவர் குறிப்பிடுவாரா?

(ஈ) இன்றேல், ஏன்?

asked the Minister of Economic Development:

(a) Will he state the projects implemented in the Northern Province under the "Uthuru Wasanthaya" Programme during the years 2009, 2010 and 2011?

(b) Will he inform this House separately, pertaining to the aforesaid projects -

(i) the amount of money spent at the Divisional Secretary's Divisions level; and

(ii) the amount of money spent under each subject?

(b) Will he also state whether the aforesaid projects are sufficient to develop the Northern Province?

(c) If not, why?

**ගරු සුසන්ත පුංචිනිලමේ මහතා (ආර්ථික සංවර්ධන නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு சுசந்த புஞ்சிநிலமே - பொருளாதார அபிவிருத்தி பிரதி அமைச்சர்)
(The Hon. Susantha Punchinilame - Deputy Minister of Economic Development)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ආර්ථික සංවර්ධන අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ පිළිතුරේ කොළ අටක් තිබෙනවා කියවන්න. ඒ කොළ අට කියවන්නද? එහෙම නැත්නම් සභාගත කරන්නද?

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ගරු මන්ත්‍රීතුමනි, පිළිතුර සභාගත කළාට පස්සේ අතුරු ප්‍රශ්න ඇහුවොත් පහසුයි නේද?

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
හොඳයි.

**ගරු සුසන්ත පුංචිනිලමේ මහතා**
(மாண்புமிகு சுசந்த புஞ்சிநிலமே)
(The Hon. Susantha Punchinilame)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ආර්ථික සංවර්ධන අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

***සභාමේසය මත තබන ලද පිළිතුර:***
**சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) 2009, 2010 හා 2011 වර්ෂයන්හිදී උතුරු වසන්තය වැඩසටහන යටතේ ක්‍රියාත්මක වූ වැඩසටහන පහත පරිදි වේ.

වසර තිහක් පුරාවට උතුරු, නැගෙනහිර පළාත්වල පැවති යුධමය වාතාවරණය මුළුමනින්ම නිමා කර වසර 05කට අධික කාලයක් ගෙවී ඇති බවත්, පැවති බිහිසුණු යුධමය වටපිටාව හේතුවෙන් සමස්ත සමාජය පුරා ඇතිව තිබූ අවිනිශ්චිතභාවය සමාජය වෙතින් මේ වන විට මුළුමනින්ම තුරන් වී ඇති බවත් මහත් අභිමානයෙන් යුතුව මෙම ගරු සභාවට සිහිපත් කරනු කැමැත්තෙමි.

ඔබ කවුරුත් දන්නා පරිදි රටේ පැවති කැළඹිලි ස්වභාවය නිසා ආරක්ෂක කඳවුරු ආරක්ෂක මුර පොළවල් රැසක් පිහිටුවා තිබූ අතර මෙහිදී සාමාන්‍ය ජනතාව දැඩි සෝදිසි කිරීම්වලට බඳුන් වූ අතර ගමනාගමනයේ යෙදීම අතිශය පීඩාකාරී අත්දැකීමක් විය.

යුද්ධය සමයේ වඩාත් පීඩාවට පත් වූයේ උතුරු පළාතේ ජනතාවයි. ත්‍රස්ත ග්‍රහණයට හසු වූ උතුරු පළාතේ ජනතාවට දේශපාලන මතවාද ඉදිරිපත් කිරීමේ නිදහස, ඡන්ද බලය භාවිත කිරීමේ අයිතිය සීමා වූ අතර, විවිධ දේශපාලනික මත දරන ලද දමිළ නායකයන් රැසක් ඉතා අමානුෂික ලෙස ඝාතනය විය. එමෙන්ම රජයේ සංවර්ධන වැඩ පිළිවෙළ පසු ගිය දශක 3ක් පුරාවටම උතුරු පළාතේ ක්‍රියාත්මක කිරීමට නොහැකි විය. ඉදි කිරීම් කටයුතු සඳහා යවන ලද අමුද්‍රව්‍ය ත්‍රස්ත ග්‍රහණයට හසු වූ අතර, මාර්ග බෝක්කු හා පාලම් පුපුරවා හරින ලදී. උතුර දකුණ යා කරන ලද දුම්රිය මාර්ගය ද සම්පූර්ණයෙන් විනාශ කරන ලදී. විදුලි සම්ප්‍රේෂණ රැහැන්, සන්නිවේදන යටිතල පහසුකම්, ජල සම්පාදන පද්ධති සම්පූර්ණයෙන් විනාශ කරන ලදී. එබැවින් උතුරු පළාත සම්පූර්ණයෙන්ම නැවත සංවර්ධනය කළ යුතු කලාපයක් බවට පත්ව තිබිණි.

රටේ සමස්ත සංවර්ධන ප්‍රතිපත්තිය වන මහින්ද චින්තන ඉදිරි දැක්මට අනුව උතුරු පළාතේ සංවර්ධනය සඳහා උතුරු වසන්තය සංවර්ධන වැඩසටහන ක්‍රියාවට නංවන ලදී.

උතුරු පළාතට සංවර්ධනයේ අරුණළු උදා කරමින් උතුරු වසන්තය වැඩ සටහන ආරම්භ කරන ලද්දේ දින 180ක වැඩ සටහනක් ලෙසිනි. මෙම වැඩ සටහන ක්‍රියාත්මක කිරීම සඳහා රජය පෞද්ගලික අංශය, රාජ්‍ය නොවන සංවිධාන හා විදේශාධාර ලබා දෙන ආයතන ඒකාබද්ධව මූල්‍ය අනුග්‍රහය දක්වන අතර භෞතික මෙන්ම මූල්‍ය ප්‍රගතිය ද අධීක්ෂණය කරන ලදී. මෙහිදී සමහර වියදම් එම ආයතන විසින්ම දරන ලදී. උතුරේ සිදු කරන ලද ප්‍රධාන සංවර්ධන කාර්යයන් පහත පරිදි සඳහන් කළ හැකිය.

[ගරු සුසන්ත පුංචිනිලමේ මහතා]

- බිම් බෝම්බ ඉවත් කිරීම හා ජනතාව නැවත පදිංචි කිරීම
- උතුරු පළාතේ ආර්ථික හා සමාජයීය යටිතල පහසුකම් සංවර්ධනය
- කෘෂිකර්මය නඟාසිටුවීම
- ත්‍රස්තවාදී සංවිධානවල සාමාජිකයන් පුනරුත්ථාපනය කිරීම

**බිම් බෝම්බ ඉවත් කිරීම හා නැවත පදිංචි කරවීම**

යුද්ධය පැවති වකවානුවේ වළලන ලද බිම් බෝම්බ ප්‍රමාණය මිලියන 1.5ක් පමණ වෙතැයි ගණන් බලා ඇති අතර උතුරු හා නැගෙනහිර පළාත් දෙකේම ගම්මාන 640ක් පමණ බිම් බෝම්බ තර්ජනයට ලක්ව ඇති ප්‍රදේශ ලෙස හඳුනා ගන්නා ලදී. එබැවින් ගැටුම් අවසානයත් සමඟ මතු වූ කඩිනම් අවශ්‍යතාව වූයේ සියලුම ආකාරයේ පුපුරා නොගිය අවි කොටස් හේතුවෙන් අනාරක්ෂිත තත්ත්වයට පත් වී තිබුණු ගැටුම්වලින් බලපෑමට පත් වූ ප්‍රදේශයන්හි බිම් බෝම්බ ඉවත් කර ජනතාවට නැවත පදිංචි විය හැකි අනාරක්ෂිත බවින් තොර පරිසරයක් ගොඩ නැඟීමයි. අවතැන් වූවන් ඔවුන්ගේ මුල් වාසස්ථානයන්හි නැවත පදිංචි කිරීමේදී සහ ගැටුම් බල පැවැත්වූ ප්‍රදේශයන්හි සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේදී බිම් බෝම්බ පැවතීම මහත් බාධාවක් විය. එම නිසා බෝම්බවලින් තොර පරිසරයක් ගොඩනැඟීම ඉලක්ක කර ගෙන බිම් බෝම්බ ඉවත් කිරීමේ මානුෂවාදී වැඩසටහන ක්‍රියාත්මක කරන ලදී. බිම් බෝම්බ ඉවත් කිරීමේ කටයුතු සඳහා ශ්‍රී ලංකා යුද හමුදාව ප්‍රමාණවත් මානව සම්පත් යොදවන ලදී. එමෙන්ම රාජ්‍ය නොවන සංවිධාන විශාල ප්‍රමාණයක්ද මේ සඳහා දායකත්වයක් දක්වන ලදී.

2013 වර්ෂය අවසන් වන විට උතුරු පළාතේ බිම් බෝම්බ තිබූ සම්පූර්ණ බිම් ප්‍රමාණයෙන් සියයට 96ක (වර්ග මීටර් 1,357,930,226) පමණ බිම බෝම්බ ඉවත් කිරීමට රජය සමත් විය.

**බිම් බෝම්බ ඉවත් කිරීමේ වැඩසටහන - 2013.12.31 දිනට ප්‍රගතිය**

| දිස්ත්‍රික්කය | බිම් බෝම්බ උවදුරට ගොදුරු වූ මුළු භූමි ප්‍රමාණය (වර්ග මීටර) | සම්පූර්ණයෙන් බිම් බෝම්බ ඉවත් කර ඇති මුළු භූමි ප්‍රමාණය ( වර්ග මීටර) | තවදුරටත් බිම් බෝම්බ ඉවත් කිරීමට ඇති භූමි ප්‍රමාණය (වර්ග මීටර |
|---|---|---|---|
| යාපනය | 51,935,532 | 47,934,500 | 3,807,011 |
| කිලිනොච්චිය | 597,375,765 | 579,316,088 | 18,059,677 |
| මුලතිව් | 230,331,444 | 214,148,015 | 16,183,429 |
| වවුනියාව | 223,251,300 | 218,172,099 | 5,079,201 |
| මන්නාරම | 314,669,910 | 298,165,504 | 16,504,406 |
| **එකතුව** | **1,417,563,950** | **1,357,930,226** | **59,633,724** |

**අවතැන්වූවන් නැවත පදිංචි කිරීම.**

අවතැන්වූවන් නැවත පදිංචි කිරීම 2009 වර්ෂයේදී මන්නාරම දිස්ත්‍රික්කයේ මුසලි හා නානඩ්ඩාන් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවලින් ආරම්භ විය. මෙහිදී පවුල් 3,125කට අයත් සාමාජිකයන් 12,690ක් ග්‍රාම නිලධාරි වසම් 15ක පදිංචි කරවන ලදී. 2009 වර්ෂයේ සැප්තැම්බර් මාසයේ මාන්තෙයි බටහිර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පවුල් 2,328කට අයත් සාමාජිකයන් 7,584කට ස්ථාවර වාසස්ථාන ලබා දෙන ලදී. එමෙන්ම මුලතිව් හා යාපනය දිස්ත්‍රික්කයේ පවුල් 25,000කට වැඩි ප්‍රමාණයක් නැවත පදිංචි කරවන ලදී. නැවත පදිංචි කරන සෑම පවුලක් සඳහාම වියළි ආහාර සලාක, වහළය සෙවිලි කර ගැනීම හා බිම් සකස් කර ගැනීමට ආධාර, සිමෙන්ති වැනි ද්‍රව්‍යමය ආධාර කට්ටලයක් ලබා දෙන ලදී. අවතැන් ජනතාවගේ සනීපාරක්ෂක හා ජල පහසුකම් පිළිබඳව රජය විශේෂ අවධානයක් යොමු කරන ලදී.

2011.12.31 දිනට නැවත පදිංචි කිරීමේ වැඩ සටහන අත්කර ගෙන ඇති ප්‍රගතිය.

| දිස්ත්‍රික්කය | නැවත පදිංචි කරන ලද පුද්ගලයන් ගණන |
|---|---|
| යාපනය | 117,439 |
| කිලිනොච්චිය | 123,254 |
| මුලතිව් | 94,874 |
| වවුනියාව | 40,218 |
| මන්නාරම | 93,775 |
| එකතුව | 469,560 |

යුද්ධය අවසන් වීමත් සමඟ අවතැන්වූවන් තාවකාලික කඳවුරුවල පදිංචි කරවූ අතර 2009 වසරේ සිට ඔවුන්ට ස්ථිර නිවාස ලබා දීම ආරම්භ කරන ලදී.

| දිස්ත්‍රික්කය | 2009 වර්ෂය | | 2010 වර්ෂය | | 2011 වර්ෂය | |
|---|---|---|---|---|---|---|
| | ලබා දුන් නිවාස | වියදම රු. මි. | ලබා දුන් නිවාස | වියදම රු. මි. | ලබා දුන් නිවාස | වියදම රු. මි. |
| යාපනය | 2330 | 523.98 | 962 | 761.88 | 4944 | 913.20 |
| කිලිනොච්චිය | | | 93 | 645.37 | 4631 | 858.73 |
| මුලතිව් | | | | | 2 | 0.21 |
| වවුනියාව | 581 | 145.57 | | | | |
| මන්නාරම | 220 | 122.37 | 466 | 280.70 | 1045 | 125.19 |
| එකතුව | 3,131 | 791.92 | 1,521 | 1,687.95 | 10,622 | 1,897.33 |

**ආර්ථික හා සමාජයීය යටිතල පහසුකම් සංවර්ධනය**

යුද සමයේදී ත්‍රස්තවාදී ග්‍රහණයට හසු වූ යටිතල පහසුකම් බොහොමයක් යුද්ධය අවසන් වීමත් සමඟ සුන්බුන් ගොඩක් බවට පත්ව තිබුණි. එබැවින් උතුරු වසන්තය වැඩසටහන යටතේ මහා මාර්ග, දුම්රිය මාර්ග, වාරිමාර්ග, විදුලි බලය හා බලශක්ති හා ජල සම්පාදනය ආදී ක්ෂේත්‍රයන්හි විශාල ලෙස මුදල් ආයෝජනය කරන ලදී.

- **මාර්ග හා පාලම් සංවර්ධනය**

මාර්ග හා පාලම් සංවර්ධනය අත්‍යවශ්‍යයෙන්ම කළ යුතු කාර්යයන් වනුයේ උතුරු පළාතේ සියලු සංවර්ධන කටයුතු කාර්යක්ෂමව කර ගෙන යෑමට නම් ඉතා උසස් මට්ටමේ මාර්ග හා පාලම් ඇතුළු ප්‍රවාහන පද්ධතියක අවශ්‍යතාවයි. එබැවින් මාර්ග සංවර්ධනයට උතුරු වසන්තය වැඩ සටහන මඟින් වඩාත් ප්‍රමුඛතාවක් හිමි විය. මාර්ග පද්ධතිය ක්‍රමවත්ව සකස් කිරීම සඳහා රජය මෙන්ම විදේශාධාර ආයතන ද විශාල මූල්‍ය දායකත්වයක් සපයන ලදී. ප්‍රාදේශීය වශයෙන් ගත් කළ උතුරු පළාතේ තිබෙන දුරස්ථභාවය අවම කිරීමත්, තුළිත ප්‍රාදේශීය සංවර්ධනයක් ළඟා කර ගැනීමත් මාර්ග පද්ධතිය සංවර්ධනය කිරීමේ ප්‍රධාන අරමුණයි. උතුරු පළාතේ A හා B ශ්‍රේණියේ මාර්ග කි.මී. 1865ක් කුඩා හා මධ්‍ය පරිමාණ පාලම් 32ක් ඉදි කිරීම වෙනුවෙන් රු.මි. 61,730.94ක් ආයෝජනය කර ඇත.

ප්‍රධාන පාලම් ව්‍යාපෘති සඳහා වැය කරන ලද මුදල පහත පරිදි දැක්විය හැකිය.

| පාලම් ව්‍යාපෘතිය | රු. මි. |
|---|---|
| A32 මාර්ගයේ ඉදි කරන ලද සංගුප්පිට්ටි පාලම | 983.00 |
| A14 මාර්ගයේ ඉදි කරන ලද නව මන්නාරම පාලම | 2460.00 |
| තල්ලඩි-අරුප්පු මාර්ගයේ ඉදි කරන ලද අරුවිආරු පාලම | 151.42 |

- **බස් රථ ප්‍රවාහනය**

උතුරු පළාත සඳහා නව බස් රථ 40ක් ලබා දීම, දැනට තිබෙන බස් රථ 62ක නඩත්තු කටයුතු සිදු කිරීම හා බස් ඩිපෝ ඉදි කිරීම යනාදී කටයුතු සිදු කිරීම සඳහා ආයෝජනය කරන ලද මුදල රුපියල් මිලියන. 633.89කි.

- **දුම්රිය මාර්ග සංවර්ධනය**

ගොඩබිම් ප්‍රවාහනයේදී මහා පරිමාණ මඟීන් හා භාණ්ඩ ප්‍රවාහනය සඳහා යොදා ගනු ලබන්නේ දුම්රියයි. යුද්ධයට පෙර යාපන අර්ධද්වීපයේ සිට ප්‍රධාන ගොඩබිමටත්, ප්‍රධාන ගොඩබිමේ සිට යාපනය අර්ධද්වීපයටත් මඟීන් හා භාණ්ඩ ප්‍රවාහනය කරමින් යාපනය අර්ධද්වීපය හුදකලා නොකර සම්බන්ධතා පවත්වා ගැනීමට මහත් රුකුලක් සපයන ලද්දේ දුම්රිය ප්‍රවාහනයයි.

යුද්ධය පැවති දශක තුනක කාලයේදී මුළුමනින්ම විනාශ කරන ලද උතුරු දුම්රිය මාර්ගය හා දුම්රිය නැවතුම් පොළවල් "උතුරු වසන්තය" වැඩ සටහන යටතේ රුපියල් මිලියන 23,505.97ක් ආයෝජනය කරමින් ප්‍රතිසංස්කරණය කරන ලදී.

| දුම්රිය මාර්ගයේ නම | සංවර්ධනය කරනු ලබන දුර කි.මී |
|---|---|
| කන්කසන්තුරෙයි සිට පලෙවි දක්වා | 56 |
| ඕමන්තෙයි සිට පලෙවි දක්වා | 90 |
| මැදවච්චිය සිට මඩු දක්වා | 43 |
| මඩු සිට තලෙයිමන්නාරම දක්වා | 63 |
| එකතුව | 252 |

- **විදුලිබලය හා බලශක්ති**

උතුරු පළාතේ කුඩා හා මධ්‍ය පරිමාණ කර්මාන්ත සංවර්ධනය සඳහා අත්‍යවශ්‍ය සාධකයක් වනුයේ විදුලි බලයයි. "උතුරු වසන්තය" වැඩ සටහනේ ප්‍රතිපත්ති රාමුවේ පැහැදිලිව සඳහන් කර ඇති කරුණක් වනුයේ උතුරු කලාපය සඳහා විදුලිය ලබා දීමයි. 2009/2010කාල වකවානුවේදී රජය විශාල මුදලක් ආයෝජනය කරමින් ග්‍රාමීය විදුලි සැපයුම් ව්‍යාපෘති රැසක් ක්‍රියාත්මක කරන ලදී. රුපියල් මිලියන 10,460.00ක් ආයෝජනය කරමින් යාපනය අර්ධද්වීපයට විදුලිය සපයන චුන්නාකම් විදුලි උපපොළ හා කිලිනොච්චි හා චුන්නාකම් දක්වා විදුලි සම්ප්‍රේෂණ රැහැන් පද්ධතිය ඉදි කිරීමත්, වවුනියාව සිට කිලිනොච්චි දක්වා වන විදුලි සම්ප්‍රේෂණ රැහැන් පද්ධතිය ඉදි කිරීම හා වවුනියාව විදුලි උපපොළ ඉදි කිරීමත් මෙම අංශය යටතේ සිදු කරන ලද විශාලතම ආයෝජන වේ.

2009 වර්ෂයේ සිට 2011 වර්ෂය දක්වා උතුරු පළාතේ විදුලි සැපයුමෙහි ඇතිවී ඇති ප්‍රගතිය

| දිස්ත්‍රික්කය | 2009 | 2011 |
|---|---|---|
| යාපනය | 60% | 80% |
| කිලිනොච්චිය | - | 29% |
| මුලතිව් | - | 23% |
| වවුනියාව | 62% | 77% |
| මන්නාරම | 37% | 60% |

- **තොරතුරු තාක්ෂණය**

උතුරු පළාතේ යාපනය හා මන්නාරම දිස්ත්‍රික්කයන්හි පාසල් ශිෂ්‍යයන්ගේ හා රැකියා අපේක්ෂිත කරුණ තරුණියන්ගේ තොරතුරු තාක්ෂණ දැනුම වර්ධනය කිරීම සඳහා තොරතුරු තාක්ෂණ මධ්‍යස්ථාන ඉදි කිරීම සඳහා රුපියල් මිලියන 24.68ක් වැය කර ඇති අතර මෙමඟින් ශිෂ්‍යයන් හටත්, රැකියා අපේක්ෂිත තරුණ තරුණියන් රැසකටත් ප්‍රතිලාභ අත්වේ.

- **කෘෂිකර්මය**

උතුරු පළාතේ ජීවත් වන සාමාන්‍ය ජනතාවගෙන් සියයට 80ක් පමණ තම ජීවනෝපාය කර ගෙන ඇත්තේ කෘෂිකර්මාන්තයයි. "උතුරු වසන්තය" වැඩසටහන යටතේ කෘෂිකර්මාන්තය නඟාසිටුවීම සඳහා පහත සඳහන් සංවර්ධන කාර්යයන් සිදු කරන ලදී.

කුඩා හා මධ්‍ය පරිමාණ වාරි කර්මාන්ත ප්‍රතිසංස්කරණය

| දිස්ත්‍රික්කය | වියදම රු.මි | | |
|---|---|---|---|
| | 2009 | 2010 | 2011 |
| යාපනය | 32.23 | 47.38 | - |
| කිලිනොච්චිය | 0.07 | 83.17 | 56.02 |
| මුලතිව් | 3.15 | 33.2 | 218.55 |
| වවුනියාව | 21.56 | 66.4 | 73.2 |
| මන්නාරම | 5.73 | 90.62 | 69.62 |
| එකතුව | 62.74 | 320.77 | 417.39 |

මහා පරිමාණ වාරි කර්මාන්ත ප්‍රතිසංස්කරණය

| දිස්ත්‍රික්කය | වියදම රු.මි | | |
|---|---|---|---|
| | 2009 | 2010 | 2011 |
| යාපනය | 79.32 | - | 51.08 |
| කිලිනොච්චිය | - | 26.91 | 218.42 |
| මුලතිව් | 34.18 | 48.87 | 64.12 |
| වවුනියාව | - | 31.29 | 94.53 |
| මන්නාරම | 178.22 | 156.66 | 114.81 |
| එකතුව | 291.72 | 263.73 | 542.96 |

වාරි කර්මාන්ත ප්‍රතිසංස්කරණයට අමතරව කෘෂිකර්මාන්තයේ උන්නතිය සඳහා අවශ්‍ය වන ගබඩා, බීජ නිෂ්පාදනය සඳහා අවශ්‍ය තවාන්, ගොඩනැඟිලි ඉදි කිරීම හා ප්‍රතිසංස්කරණය සඳහාත් සත්ව පාලනය හා ධීවර කර්මාන්තය සඳහා "උතුරු වසන්තය" වැඩ සටහන යටතේ ලබා දුන් ප්‍රතිපාදන පහත දක්වා ඇත.

| අංශය | වියදම රු.මි | | |
|---|---|---|---|
| | 2009 | 2010 | 2011 |
| කෘෂිකාර්මික ගොඩනැඟිලි ඉදි කිරීම හා ප්‍රතිසංස්කරණය | 7.57 | 70.99 | 289.36 |
| සත්ව පාලනය | 7.26 | 12.17 | 46.15 |
| ධීවර කර්මාන්තය | 2.89 | 372.86 | 34.01 |

**ත්‍රස්තවාදී සාමාජිකයන් පුනරුත්ථාපනය කිරීම**

උතුරු පළාතේ යුද ගැටුම් නිමා වීමත් සමඟම ත්‍රස්තවාදී සාමාජිකයන් පුනරුත්ථාපනය කර ඔවුන් මානසික හා කායිකව ශක්තිමත් කර නැවත සිවිල් සමාජයට මුදා හැරීම "උතුරු වසන්තය" වැඩ සටහන යටතේ සිදු කරන ලද භාරදූර කාර්යය විය. මෙම පුනරුත්ථාපන වැඩ සටහන යටතේ සටන්කරුවන් 11,664ක් පුනරුත්ථාපනය කරන ලදී. ඉන් 594ක් එනම්, මුළු සංඛ්‍යාවෙන් සියය 5ක ප්‍රතිශතයක් අවු.12-18ත් අතර ළමා සොල්දාදුවන් වූ අතර එම සංඛ්‍යාවෙන් 231ක් ගැහැණු සාමාජිකයන් විය. මොවුන් සඳහා වන පුනරුත්ථාපන වැඩ සටහන් පහත සඳහන් ක්ෂේත්‍ර ඔස්සේ ලබා දෙන ලදී.

1. අධ්‍යාත්මික, ආගමික හා සංස්කෘතික
2. අධ්‍යාපනික
3. වෘත්තීය පුහුණු
4. ධනාත්මක චින්තනය
5. ක්‍රීඩා හා බාහිර ක්‍රියාකාරකම්

(ආ) මෙම ප්‍රශ්නයෙන් (i) හා (ii) කොටස් සඳහා සාරාංශ වාර්තාවක් පහත දක්වා ඇති අතර සවිස්තරාත්මක වාර්තාව සඳහා ඇමුණුම* බලන්න.

**උතුරු වසන්තය : ආංශික ආයෝජන 2009-2011**

| අංශය | සමස්ත ආයෝජනය රු.මි. | | | සමස්ත ආයෝජනයන්හි එකතුව රු.මි. |
|---|---|---|---|---|
| | 2009 | 2010 | 2011 | |
| ආර්ථික යටිතල පහසුකම් සංවර්ධනය | 1,801.26 | 3,249.01 | 39,989.51 | 45,039.78 |
| සමාජීය යටිතල පහසුකම් සංවර්ධනය | 1,755.23 | 1,843.64 | 6,380.27 | 9,979.14 |
| කෘෂිකර්මය | 983.64 | 1,080.38 | 2,585.79 | 4,649.81 |
| නැවත පදිංචි කිරීම | 567.24 | 365.93 | 2,847.01 | 3,780.18 |
| වෙනත් | 341.65 | 1,792.49 | 682.27 | 2,816.41 |
| **එකතුව** | **5,449.02** | **8,331.45** | **52,484.85** | **66,265.32** |

(ඇ) ඉහතින් දක්වන ලද සංවර්ධන වැඩ සටහන් ප්‍රමාණවත් බව සඳහන් කිරීමට කැමැත්තෙමි. එමෙන්ම 2009 වර්ෂයේ සිට 2011 වර්ෂය දක්වා උතුරු වසන්තය වැඩසටහන යටතේ ක්‍රියාත්මක කරන ලද සංවර්ධන ක්‍රියාවලිය 2012 හා 2013 වර්ෂවලදීද අඛණ්ඩව ක්‍රියාත්මක වූ අතර නව ව්‍යාපෘති රැසක් ක්‍රියාත්මක කිරීමෙන් උතුරු පළාතට දැවැන්ත සංවර්ධනයක් ළඟා කර දෙන ලදී. 2012 හා 2013 වර්ෂවල විවිධ ක්ෂේත්‍රවල ක්‍රියාත්මක කරන ලද සංවර්ධන ව්‍යාපෘතිවල සාරාංශගත වාර්තාවක් පහත දැක්වේ.

| අංශය | සමස්ත ආයෝජනය රු.මි. | | සමස්ත ආයෝජනයන්හි එකතුව රු.මි. |
|---|---|---|---|
| | 2012 | 2013 | |
| ආර්ථික යටිතල පහසුකම් සංවර්ධනය | 29,158.89 | 17,602.44 | 46,761.33 |
| සමාජීය යටිතල පහසුකම් සංවර්ධනය | 1,430.04 | 1,917.82 | 3,347.86 |
| කෘෂිකර්මය | 2,752.31 | 3,209.01 | 5,961.32 |
| නැවත පදිංචි කිරීම | 2,648.71 | 7,568.42 | 10,217.13 |
| වෙනත් | 550.93 | 60.17 | 1,511.10 |
| එකතුව | 36,540.88 | 31,257.86 | 67,798.74 |

තවද, ආර්ථික යටිතල පහසුකම් සංවර්ධනය, සමාජයීය යටිතල පහසුකම් සංවර්ධනය, කෘෂිකර්මය, නැවත පදිංචි කිරීම් සහ අනෙකුත් සංවර්ධන කාර්යයන් වෙනුවෙන් 2014 වර්ෂයේදීද, ව්‍යාපෘති හඳුනා ගෙන ක්‍රියාත්මක කිරීමට කටයුතු කරමින් පවතී.

(ඈ) අදාළ නැත.

[ගරු සුසන්ත පුංචිනිලමේ මහතා]

ඇමුණුම:

**උතුරු වසන්තය,** යටතේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමින් ආයෝජන **-2009-2011**

**දිස්ත්‍රික්කයː යාපනය**

| අනු අංකය | ප්‍රා. ලේ. කොට්ඨාශය | 2009 සමස්ත ආයෝජනය (රු. මිලියන) - සංවර්ධන ක්‍රියාකාරකම් (අංශ අනුව) | | | | | 2010 සමස්ත ආයෝජනය (රු. මිලියන) - සංවර්ධන ක්‍රියාකාරකම් (අංශ අනුව) | | | | | 2011 සමස්ත ආයෝජනය (රු. මිලියන) - සංවර්ධන ක්‍රියාකාරකම් (අංශ අනුව) | | | | | එකතුව |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | ආර්ථික යටිතල පහසුකම් | සමාජ යටිතල පහසුකම් | කෘෂිකර්මය | නැවත පදිංචි කිරීම් | වෙනත් | ආර්ථික යටිතල පහසුකම් | සමාජ යටිතල පහසුකම් | කෘෂිකර්මය | නැවත පදිංචි කිරීම් | වෙනත් | ආර්ථික යටිතල පහසුකම් | සමාජ යටිතල පහසුකම් | කෘෂිකර්මය | නැවත පදිංචි කිරීම් | වෙනත් | |
| 1 | ඩෙල්ෆ්ට් | 18.33 | 6.79 | 12.89 | 1.29 | 2.70 | 7.98 | 3.87 | 1.54 | 0.10 | | 54.64 | 8.84 | 10.00 | 44.82 | 95.60 | **269.39** |
| 2 | වේලානෙයි | 81.56 | 26.32 | 25.40 | 4.51 | 1.58 | 8.25 | 53.42 | 11.06 | 2.29 | 0.80 | 105.85 | 19.77 | 26.21 | 61.55 | 74.91 | **503.48** |
| 3 | කයිට්ස් | 69.429 | 4.91 | 19.98 | 3.00 | 1.02 | 5.844 | 24.09 | 1.48 | 0.27 | 0.70 | 53.34 | 9.27 | 1.37 | 40.86 | 33.57 | **269.13** |
| 4 | කරෙයිනගර් | 16.61 | 13.07 | 40.66 | 6.26 | 30.00 | 13.93 | 3.67 | 3.48 | 3.88 | 2.50 | 211.42 | 8.96 | 28.09 | 14.25 | 33.64 | **430.42** |
| 5 | යාපනය | 16.2 | 61.45 | 70.29 | 16.02 | 6.48 | 18.12 | 172.74 | 124.15 | 23.00 | 27.05 | 24724.56 | 3188.26 | 165.47 | 58.02 | 55.39 | **28727.20** |
| 6 | නල්ලූර් | 21.658 | 39.26 | 13.55 | 12.27 | 1.00 | 23.883 | 53.28 | 0.76 | 11.87 | 30.94 | 219.79 | 83.87 | 19.95 | 39.94 | 35.78 | **607.80** |
| 7 | සන්දිලිපායි | 24.13 | 59.13 | 85.68 | 8.25 | 14.63 | 20.009 | 26.48 | 114.16 | 3.24 | 11.66 | 85.97 | 19.52 | 52.62 | 64.68 | | **590.15** |
| 8 | සංකානෙයි | 30.897 | 19.15 | 89.00 | 9.82 | 2.99 | 15.90 | 50.30 | 39.13 | 5.63 | | 95.53 | 43.89 | 47.10 | 117.62 | 10.76 | **577.70** |
| 9 | උඩුවිල් | 23.01 | 12.12 | 28.96 | 15.75 | 30.31 | 21.67 | 16.20 | 5.64 | 5.59 | 53.69 | 130.07 | 56.06 | 4.98 | 71.78 | | **475.83** |
| 10 | තෙල්ප්පලෙයි | 27.16 | 30.10 | 24.87 | 64.48 | 2.06 | 12.284 | 46.00 | 23.59 | 1.86 | 0.29 | 1734.92 | 101.85 | 10.67 | 76.48 | 20.92 | **2177.53** |
| 11 | කෝපායි | 59.31 | 26.93 | 31.14 | 9.10 | 0.20 | 17.753 | 53.91 | 5.68 | 5.37 | 0.61 | 818.93 | 69.41 | 44.00 | 170.21 | 0.16 | **1312.71** |
| 12 | චාවකච්චේරි | 106.698 | 109.44 | 48.28 | 15.75 | 11.37 | 37.1 | 107.46 | 23.08 | 7.53 | 1.56 | 1810.78 | 136.87 | 22.88 | 262.36 | 4.44 | **2705.59** |
| 13 | කරවෙඩ්ඩි | 23.03 | 47.12 | 18.26 | 10.61 | 0.70 | 25.40 | 38.57 | 8.00 | 2.89 | | 100.52 | 40.20 | 3.01 | 133.35 | | **451.64** |
| 14 | පේදුරුතුඩුව | 44.031 | 56.14 | 65.85 | 16.40 | 2.30 | 43.768 | 52.91 | 15.72 | 5.11 | 11.88 | 514.66 | 109.58 | 12.73 | 1016.44 | 18.14 | **1985.65** |
| 15 | මරදන්කර්නි | 17.079 | 10.41 | 12.21 | 1.97 | 1.00 | 10.956 | 15.89 | 1.13 | 0.36 | 77.51 | 283.32 | 126.71 | 19.87 | 25.29 | | **603.70** |
| | **එකතුව** | **579.14** | **522.33** | **587.02** | **195.46** | **108.34** | **282.84** | **718.79** | **378.59** | **78.97** | **219.19** | **30944.30** | **4023.06** | **468.95** | **2197.65** | **383.31** | **41687.92** |

**උතුරු වසන්තය,** යටතේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමින් ආයෝජන **-2010-2011**

**දිස්ත්‍රික්කයː කිළිනොච්චි**

| අනු අංකය | ප්‍රා. ලේ. කොට්ඨාශය | 2010 සමස්ත ආයෝජනය (රු. මිලියන) - සංවර්ධන ක්‍රියාකාරකම් (අංශ අනුව) | | | 2011 සමස්ත ආයෝජනය (රු. මිලියන) - සංවර්ධන ක්‍රියාකාරකම් (අංශ අනුව) | | | | එකතුව |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | ආර්ථික යටිතල පහසුකම් | කෘෂිකර්මය | වෙනත් | ආර්ථික යටිතල පහසුකම් | සමාජ යටිතල පහසුකම් | කෘෂිකර්මය | වෙනත් | |
| 1 | කරච්චි | 27.63 | 123.14 | 720.51 | 273.33 | 335.26 | 577.89 | 6.69 | 2064.45 |
| 2 | කණ්ඩාවලෙයි | 34.02 | 130.57 | 277.12 | 41.68 | 49.07 | 274.23 | 0.63 | 807.32 |
| 3 | පච්චිලෙයිපලෙයි | 11.92 | 29.00 | 111.97 | | 54.26 | 175.85 | 11.17 | 394.17 |
| 4 | පූනාකරෙයි | 57.33 | 108.44 | 225.10 | 127.50 | 91.98 | | 19.99 | 630.34 |
| | එකතුව | 130.90 | 391.15 | 1334.70 | 442.51 | 530.57 | 1027.97 | 38.48 | 3896.28 |

**උතුරු වසන්තය,** යටතේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමින් ආයෝජන -2009-2011

**දිස්ත්‍රික්කය: මුලතිවු**

| අනු අංකය | ප්‍රා. ලේ. කොට්ඨාශය | 2009 සමස්ත ආයෝජනය (රු. මිලියන) | | | | 2010 සමස්ත ආයෝජනය (රු. මිලියන) | | | 2011 සමස්ත ආයෝජනය (රු. මිලියන) | | | | | එකතුව |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | සංවර්ධන ක්‍රියාකාරකම් (අංශ අනුව) | | | | සංවර්ධන ක්‍රියාකාරකම් (අංශ අනුව) | | | සංවර්ධන ක්‍රියාකාරකම් (අංශ අනුව) | | | | | |
| | | ආර්ථික යටිතල පහසුකම් | සමාජ යටිතල පහසුකම් | කෘෂිකර්මය | වෙනත් | ආර්ථික යටිතල පහසුකම් | සමාජ යටිතල පහසුකම් | කෘෂිකර්මය | ආර්ථික යටිතල පහසුකම් | සමාජ යටිතල පහසුකම් | කෘෂිකර්මය | නැවත පදිංචි කිරීම් | වෙනත් | |
| 01 | මෙරිටමෙපත්තු | | | | | | | | 120.58 | 86.39 | 12.93 | 2.00 | | **221.90** |
| 02 | පුදුකුඩිඉරිප්පු | | | | | | | | 0.70 | 26.30 | 12.50 | | | **39.50** |
| 03 | ඔඩ්ඩුසුඩාන් | 78.36 | 55.76 | | | 31.35 | 7.51 | 1.76 | 14.01 | 15.20 | 12.84 | 0.42 | 32.80 | **250.01** |
| 04 | තුනුක්කායි | 60.06 | 29.84 | 9.87 | 7.15 | 57.38 | 29.71 | 5.30 | 7.14 | 116.82 | 7.60 | 0.57 | 16.76 | **348.20** |
| 05 | මාන්තෙයි - නැගෙනහිර | 31.37 | 48.01 | 5.36 | 12.43 | 28.06 | 11.50 | 4.71 | 98.70 | 4.67 | 12.24 | 0.35 | 12.37 | **269.77** |
| 06 | වැලිඔය | | | | | | | | | | 1.02 | | 0.45 | **1.47** |
| | එකතුව | **169.79** | **133.61** | **15.23** | **19.58** | **116.79** | **48.72** | **11.77** | **241.13** | **249.38** | **59.13** | **3.34** | **62.38** | **1130.85** |

**උතුරු වසන්තය,** යටතේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමින් ආයෝජන -2009-2011

**දිස්ත්‍රික්කය: වවුනියාව**

| අනු අංකය | ප්‍රා. ලේ. කොට්ඨාශය | 2009 සමස්ත ආයෝජනය (රු. මිලියන) | | | | | 2010 සමස්ත ආයෝජනය (රු. මිලියන) | | | | | 2011 සමස්ත ආයෝජනය (රු. මිලියන) | | | | | එකතුව |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | සංවර්ධන ක්‍රියාකාරකම් (අංශ අනුව) | | | | | සංවර්ධන ක්‍රියාකාරකම් (අංශ අනුව) | | | | | සංවර්ධන ක්‍රියාකාරකම් (අංශ අනුව) | | | | | |
| | | ආර්ථික යටිතල පහසුකම් | සමාජ යටිතල පහසුකම් | කෘෂිකර්මය | නැවත පදිංචි කිරීම් | වෙනත් | ආර්ථික යටිතල පහසුකම් | සමාජ යටිතල පහසුකම් | කෘෂිකර්මය | නැවත පදිංචි කිරීම් | වෙනත් | ආර්ථික යටිතල පහසුකම් | සමාජ යටිතල පහසුකම් | කෘෂිකර්මය | නැවත පදිංචි කිරීම් | වෙනත් | |
| 01 | වවුනියාව | 330.87 | 238.57 | 155.20 | 20.96 | 37.91 | 1403.44 | 195.28 | 49.41 | 9.48 | 89.38 | 577.83 | 234.06 | 77.57 | 37.48 | | **3457.43** |
| 02 | වවුනියාව දකුණ | 85.67 | 50.23 | 64.25 | 31.45 | 32.11 | 44.29 | 32.82 | 26.57 | 2.20 | 20.98 | 179.36 | 30.50 | 42.81 | 11.01 | | **654.26** |
| 03 | වෙංගලායිෙ චට්ටිකුලම් | 150.52 | 78.56 | 75.12 | 52.39 | 42.39 | 842.08 | 79.51 | 99.49 | 1.82 | 24.64 | 194.27 | 41.41 | 164.54 | 6.18 | | **1852.91** |
| 04 | වවුනියාව උතුර | 6.44 | 39.76 | 0.96 | 0.00 | 23.93 | 44.10 | 140.27 | 40.52 | 0.00 | 69.04 | 32.09 | 124.04 | 62.74 | 8.11 | | **592.01** |
| 05 | වවුනියාව දිස්ත්‍රික්කය සඳහා පොදු වියදම් | | | | | | 47.7 | | | | | 5272.2 | 2.2 | | | 49.7 | **5371.78** |
| | එකතුව | **573.50** | **407.12** | **295.53** | **104.80** | **136.35** | **2381.60** | **447.89** | **215.99** | **13.50** | **204.04** | **6255.76** | **432.19** | **347.66** | **62.77** | **49.70** | **11928.39** |

**උතුරු වසන්තය,** යටතේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමින් ආයෝජන -2009-2011

**දිස්ත්‍රික්කය: මන්නාරම**

| අනු අංකය | ප්‍රා. ලේ. කොට්ඨාශය | 2009 සමස්ත ආයෝජනය (රු. මිලියන) | | | | | 2010 සමස්ත ආයෝජනය (රු. මිලියන) | | | | | 2011 සමස්ත ආයෝජනය (රු. මිලියන) | | | | | එකතුව |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | සංවර්ධන ක්‍රියාකාරකම් (අංශ අනුව) | | | | | සංවර්ධන ක්‍රියාකාරකම් (අංශ අනුව) | | | | | සංවර්ධන ක්‍රියාකාරකම් (අංශ අනුව) | | | | | |
| | | ආර්ථික යටිතල පහසුකම් | සමාජ යටිතල පහසුකම් | කෘෂිකර්මය | නැවත පදිංචි කිරීම් | වෙනත් | ආර්ථික යටිතල පහසුකම් | සමාජ යටිතල පහසුකම් | කෘෂිකර්මය | නැවත පදිංචි කිරීම් | වෙනත් | ආර්ථික යටිතල පහසුකම් | සමාජ යටිතල පහසුකම් | කෘෂිකර්මය | නැවත පදිංචි කිරීම් | වෙනත් | |
| 1 | මන්නාරම | 171.83 | 453.06 | 33.56 | 105.99 | 40.03 | 116.48 | 321.53 | 22.18 | 66.65 | 23.91 | 897.99 | 717.54 | 40.67 | 140.37 | 77.41 | **3229.20** |
| 2 | නානාටාන් | 208.41 | 60.16 | 18.31 | 55.11 | 26.36 | 45.73 | 69.72 | 14.77 | 125.81 | 4.22 | 47.89 | 77.76 | 320.45 | 60.28 | 18.95 | **1153.93** |
| 3 | මාන්තෙයි බටහිර | 48.16 | 98.95 | 2.00 | 0.00 | 4.87 | 114.92 | 143.61 | 8.63 | 0.00 | 0.93 | 73.31 | 279.74 | 75.73 | 161.42 | 23.26 | **1035.53** |
| 4 | මුසාලි | 4.00 | 68.64 | 23.79 | 85.15 | 0.50 | 5.23 | 74.48 | 27.42 | 56.00 | 1.00 | 20.28 | 26.06 | 30.57 | 134.48 | 0.47 | **558.07** |
| 5 | මඩු | 46.43 | 11.36 | 8.20 | 20.73 | 5.62 | 54.52 | 18.90 | 9.88 | 25.00 | 4.50 | 1066.34 | 43.97 | 214.66 | 86.70 | 28.31 | **1645.12** |
| | එකතුව | **478.83** | **692.17** | **85.86** | **266.98** | **77.38** | **336.88** | **628.24** | **82.88** | **273.46** | **34.56** | **2105.81** | **1145.07** | **682.08** | **583.25** | **148.40** | **7621.85** |

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
මට අතුරු ප්‍රශ්න අහන්න පුළුවන්ද?

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
පළමුවැනි අතුරු ප්‍රශ්නය අහන්න.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, ඔබතුමන්ලා සඳහන් කර තිබෙනවා "උතුරු වසන්තය" කියන වැඩසටහන ගැන. ඒ කියන්නේ උතුරට වසන්තයක් ගෙන ඒම. ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයෙන් මෙපමණ වැඩ කළාය කියලා කොපමණ කිව්වත් තවම උතුරු පළාතේ ජනතාවට තමන්ගේ ඉඩම් හිමිකම් ලබා දෙන්නේ නැතිව ඔබතුමන්ලා උතුරු වසන්තයක් ගැන කථා කරන්නේ කොහොමද කියලා මම අහන්න කැමැතියි.

**ගරු සුසන්ත පුංචිනිලමේ මහතා**
(மாண்புமிகு சுசந்த புஞ்சிநிலமே)
(The Hon. Susantha Punchinilame)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ ප්‍රශ්නය යොමු කළ යුත්තේ ඉඩම් හා ඉඩම් සංවර්ධන ඇමතිතුමාටයි. ඒ නිසා ගරු සජිත් ප්‍රේමදාස මන්ත්‍රීතුමා නැවත වතාවක් අපෙන් ඒ ප්‍රශ්නය අහනවා නම් ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය වශයෙන් අපට උත්තර දෙන්න පුළුවන්.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
මම ඔබතුමාගෙන් ඇහුවේ ආර්ථික සංවර්ධනය පිළිබඳවයි. උතුරේ ජනතාවගේ ඉඩම් අයිතිය ලබා දෙන්නේ නැතිව ආර්ථිකයක් සංවර්ධනය කරන්නේ කොහොමද? ඒකයි මම අහන්නේ. ඔබතුමා ඒකට උත්තරයක් දෙන්න.

**ගරු සුසන්ත පුංචිනිලමේ මහතා**
(மாண்புமிகு சுசந்த புஞ்சிநிலமே)
(The Hon. Susantha Punchinilame)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඉඩම් ප්‍රශ්නය එකක්. ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය විසින් ක්‍රියාත්මක කර තිබෙන සංවර්ධන කටයුතු පිළිබඳව ප්‍රශ්නය තව එකක්. මෙය කාරණා දෙකක්. ගරු සජිත් ප්‍රේමදාස මන්ත්‍රීතුමාට ඒක වැටහෙන්නේ නැත්නම් මට ඒ පිළිබඳව තේරුම් කර දෙන්න අමාරුයි. හැබැයි, මම කියන විධියට ඔබතුමා මේ ප්‍රශ්නය නැවත අපෙන් අහනවා නම් ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය විධියට අපි ඒකට උත්තර දෙන්න සූදානම්.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
දෙවැනි අතුරු ප්‍රශ්නය.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මෙතුමන්ලා දිවිනැගුම වැඩසටහන ක්‍රියාත්මක කරනවා ඉඩම් -භූමිය- උපයෝගි කරගෙන. ඒකයි මා ඉඩම් ප්‍රශ්නය ගැන කථා කළේ. ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, ඔබතුමාට ඒ ප්‍රශ්නයට පිළිතුරු ලබා දෙන්නට නොහැකි වීම ගැන මා කනගාටු වෙනවා.

මගේ දෙවන අතුරු ප්‍රශ්නය මෙයයි. ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයෙන් විශාල ප්‍රතිපාදන ප්‍රමාණයක් උතුරට ලබා දෙනවා කියලා ඔබතුමන්ලා කියනවා. දැන් මා අහන්න කැමැතියි, "ආර්ථික සංවර්ධනය උතුරේ ක්‍රියාත්මක කරන කොට, ඒ ආර්ථික සංවර්ධන ක්‍රියාවලියට උතුරේ ජනතාවගේ සර්වජන ඡන්ද බලයෙන් පත් වුණු උතුරේ මහ ඇමතිවරයාත් සම්බන්ධ කරගෙන, පළාත් සභාවත් සම්බන්ධ කරගෙන ඒ සංවර්ධන ක්‍රියාවලිය ඉදිරියට ගෙන යන්න බැරි ඇයි?" කියලා.

**ගරු සුසන්ත පුංචිනිලමේ මහතා**
(மாண்புமிகு சுசந்த புஞ்சிநிலமே)
(The Hon. Susantha Punchinilame)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ ප්‍රශ්නයට අපට කෙටියෙන් උත්තරයක් දෙන්න පුළුවන්. පළාත් සභාව ස්ථාපිත වෙලා තවම මාස ගණනයි වෙන්නේ. දැනටමත් අපි ඒ අය සම්බන්ධ කරගෙන, ඒ අමාත්‍යාංශ ලේකම්වරුන් එක්කත් සම්බන්ධීකරණ වෙලා තමයි ඒ ඒ විෂයයන් යටතේ කටයුතු කරගෙන යන්නේ.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ඔබතුමා වග කීමෙන්ද ඒ උත්තරය දෙන්නේ?

**ගරු සුසන්ත පුංචිනිලමේ මහතා**
(மாண்புமிகு சுசந்த புஞ்சிநிலமே)
(The Hon. Susantha Punchinilame)
ඔව්. මගේ දැනීමේ හැටියට වග කීමෙන් උත්තර දෙනවා.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මට ප්‍රශ්නය අහන්න ඉඩ නොදී mike එක ඉක්මනින් off කරනවා. මොකද දන්නේ නැහැ.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ගරු මන්ත්‍රීතුමා තුන්වැනි අතුරු ප්‍රශ්නය අහනවාද?

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ඔව්. නමුත් mike එක ඉක්මනින් off කරනවා. එතකොට ප්‍රශ්නය අහන්න බැහැ.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ගරු මන්ත්‍රීතුමා, තුන්වැනි අතුරු ප්‍රශ්නය අහනවා ද?

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
අහනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ ගරු සභාවේ ඒ පැත්තට එක නීතියක්. මේ පැත්තට එක නීතියක්. එහෙමද?

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ප්‍රශ්නය අහන්න. අහලා ඉවර වෙන කොටම mike එක off වෙනවා.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
මගේ තුන්වන අතුරු ප්‍රශ්නය මෙයයි. ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, මේ ප්‍රශ්නයෙන් පැන යන්න එපා. මේ ප්‍රශ්නයට පිළිතුරු හැටියට ඔබතුමා පිටු අටක වට්ටෝරුවක් ලබා දීලා තිබෙනවා. උතුරේ ජනතාවට ලබා දෙන ඒ මහා ආර්ථික ශක්තිය ගැනයි එහි සඳහන් වන්නේ. ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයෙන්ම ඒක ලබා දෙනවා කියලා කියනවා. නමුත්, ආර්ථික ශක්තියක් ලබා දෙන්නේ කොහොමද නැවත පදිංචි කරවීමේ ක්‍රියාවලිය සම්පූර්ණ කරන්නේ නැතිව. යුද්ධය අවසන් වෙලා වසර පහකට වැඩි කාලයක් ගිහිල්ලාත් තවමත් උතුරේ ජනතාව නැවත පදිංචි කරවලා නැහැ. "නැවත පදිංචි කරවීමේ ක්‍රියාවලිය සම්පූර්ණ කරන්නේ නැතිව උතුරට වසන්තයක් උදා කරන්නේ කොහොමද?" කියලා මම අහන්න කැමැතියි.

**ගරු සුසන්ත පුංචිනිලමේ මහතා**
(மாண்புமிகு சுசந்த புஞ்சிநிலமே)
(The Hon. Susantha Punchinilame)
ගරු මන්ත්‍රීතුමනි, ලෝක ඉතිහාසයේ ලංකාවේ තමයි අවතැන් වූ අය මෙපමණ ඉක්මනට නැවත පදිංචි කරවලා තිබෙන්නේ. ඒ අයට අවශ්‍ය කරන යටිතල පහසුකම් සියල්ල අපි ලබා දීලා තිබෙනවා. ඔබතුමා මේ ප්‍රශ්නය අහන්නේ ඒ පිළිබඳව නිවැරදි අවබෝධයක් නැතිවයි. කවුරු හරි කිව්ව දෙයක් අනුවයි ඔබතුමා මේ ප්‍රශ්නය අහන්නේ. ඔබතුමා ඒ ප්‍රදේශවලට ගිහිල්ලා, ඒ ජනතාවගෙන් මේ ගැන අහලා, එහෙම නැත්නම් ඒ ප්‍රදේශ නිරීක්ෂණය කරලා ඇවිල්ලා අපෙන් ඔය ප්‍රශ්න ටික අහනවා නම් ඉතා වැදගත් වෙයි කියලා මම හිතනවා.

## ශ්‍රී ලංකා වරාය අධිකාරිය : ප්‍රාග්ධන සහ සාමාන්‍ය සංචිත විචලනයන්
## இலங்கைத் துறைமுக அதிகாரசபை : முதலீடு மற்றும் பொது ஒதுக்கு நகர்வுகள்
## SRI LANKA PORTS AUTHORITY : CAPITAL AND GENERAL RESERVE MOVEMENTS

3152/'12

**2. ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
මහාමාර්ග, වරාය හා නාවික අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (3) :

(අ) (i) ඔලුවිල් වරායේ සම්පූර්ණ ඉදිකිරීම් පිරිවැය කොපමණද;

(ii) අඛණ්ඩව මූල්‍යමය අලාභ ලබමින් සිටින ශ්‍රී ලංකා වරාය අධිකාරියට තරගකාරී විය හැකිද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) 2007 වර්ෂයේ සිට මේ දක්වා එක් එක් වර්ෂය තුළ ශ්‍රී ලංකා වරාය අධිකාරියේ ප්‍රාග්ධන සහ සාමාන්‍ය සංචිත විචලනයන් කවරේද යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නො එසේ නම්, ඒ මන්ද?

நெடுஞ்சாலைகள், துறைமுகங்கள் மற்றும் கப்பற்றுறை அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) ஒலுவில் துறைமுகத்தின் மொத்த நிர்மாணச்செலவு எவ்வளவென்பதையும்;

(ii) இலங்கைத் துறைமுக அதிகாரசபையானது தொடர்ச்சியாக பணத்தை இழந்துவரும் நிலையில் இது போட்டித்தன்மையாக இருக்க முடியுமா என்பதையும்

அவர் கூறுவாரா?

(ஆ) 2007ஆம் ஆண்டிலிருந்து இற்றைவரைக்கும் ஆண்டு அடிப்படையில் இலங்கைத் துறைமுக அதிகாரசபையின் முதலீடு மற்றும் பொது ஒதுக்குகளின் நகர்வுகளை அவர் கூறுவாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Highways, Ports and Shipping:

(a) Will he state -

(i) the total construction cost of the Oluvil Port; and

(ii) whether Sri Lanka Ports Authority can be competitive while sustaining continuous loss of money?

(b) Will he also state capital and general reserve movements of the Sri Lanka Ports Authority from the year 2007 to date on per year basis?

(c) If not, why?

**ගරු රෝහිත අබේගුණවර්ධන මහතා (මහාමාර්ග, වරාය හා නාවික අමාත්‍යතුමා)**
(மாண்புமிகு ரோஹித அபேகுணவர்தன - நெடுஞ்சாலைகள், துறைமுகங்கள் மற்றும் கப்பற்றுறை அமைச்சர்)
(The Hon. Rohitha Abeygunawardana - Minister of Highways, Ports and Shipping)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේය.

(අ) (i) ඔලුවිල් වරාය සංවර්ධන ව්‍යාපෘතිය සඳහා අනුමත වී තිබුණු මුළු මුදල යූරෝ 46,095,369.49ක් වූ අතර, ව්‍යාපෘතිය 2012 දෙසැම්බර් මස අවසන් කරන විට සම්පූර්ණ ඉදිකිරීම් සඳහා වැය වූ මුදල යූරෝ 42,206,379.09ක් විය.

[ගරු රෝහිත අබේගුණවර්ධන මහතා]

(ii)

(රු.මිලියන)

| වර්ෂය | 2007 | 2008 | 2009 | 2010 සංශෝධිත | 2011 සංශෝධිත | 2012 | 2013 |
|---|---|---|---|---|---|---|---|
| ලාභය (විදේශ විනිමය විචල්‍යතාවයට පෙර) | 2,357 | 1,729 | 783 | 3,162 | 3,647 | 9,778 | 4,945 |
| විදේශ විනිමය (ලාභ / අලාභ) | (3,944) | (11,791) | 591 | (4,410) | (3,390) | (4,567) | (2,518) |
| ලාභ /අලාභ (විදේශ විනිමය විචල්‍යතාවයට පසු) | (1,587) | (10,062) | 1,374 | (1,248) | 257 | 5,211 | 2,427 |

ශ්‍රී ලංකා වරාය අධිකාරියේ මූල්‍ය ලාභ/අලාභ සැලකීමේදී, විදේශ විනිමය විචල්‍යතා ලාභ/ අලාභවලට පෙර ලාභයට/අලාභයට සැලකිය යුතුය. විදේශ විනිමය විචල්‍යතා ලාභය/අලාභය පොත් අගයට පමණක් සීමා වන්නක් බැවින් මූල්‍ය ලාභය ගණනය කිරීමේදී එය සැලකිය යුතු නොවේ.

ඒ අනුව ඉහත වර්ෂ 07ක කාලය තුළ එක් එක් වර්ෂයට සාපේක්ෂව බලන කළ ශ්‍රී ලංකා වරාය අධිකාරිය මූල්‍යමය අලාභයක් ලබන බව අසත්‍යයක් වේ. විදේශ විනිමය විචල්‍යතාවලට පෙර එක් එක් වර්ෂයන් තුළ විශාල ලෙස ලාභය වැඩි වී ඇත. 2007 සිට 2013 යන වර්ෂයන්හිදී අධිකාරිය මූල්‍යමය අතින් ඉතා ශීඝ්‍ර වර්ධනයක් හිමි කරගෙන ඇත. (2009 වර්ෂය හැර) 2013 වර්ෂයේ ලාභය අඩු වීමක් පෙන්නුම් කිරීමට හේතු වූයේ සංවර්ධන කටයුතු සඳහා ලබා ගත් ණය සඳහා දැරූ පොලී වියදමයි. මෙය අනාගතය සඳහා කරන ලද ආයෝජනයක් ලෙස සැලකිය හැකි අතර, අධිකාරියේ ලාභදායීත්වයද ධන අගයක් පෙන්නුම් කරනු ලැබේ.

(ආ)

(රු.මිලියන)

| වර්ෂය | 2007 | 2008 | 2009 | 2010 සංශෝධිත | 2011 සංශෝධිත | 2012 | 2013 |
|---|---|---|---|---|---|---|---|
| ප්‍රාග්ධන සංචිත | 7,703.92 | 7,703.92 | 7,703.92 | 7,703.92 | 8,303.42 | 8,303.42 | 8,303.42 |
| සාමාන්‍ය සංචිත | 70,383.18 | 61,074.89 | 78,053.59 | 67,696.46 | 66,803.13 | 69,348.87 | 71,297.12 |

(ඇ) පැන නොනඟී.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
පළමුවැනි අතුරු ප්‍රශ්නය.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ගරු ඇමතිතුමනි, මම හිතන හැටියට මේ වරාය අධිකාරිය තිබෙන්නේ ඔබතුමාගේ පාලනය යටතේයි. වරායෙන් වරායට ලාභ - අලාභ ගිණුම් තියන්න බැරි ඇයි කියලා කරුණාකර අපට කියන්න පුළුවන්ද? 2005 වර්ෂය වන තුරු මේ ගිණුම් ක්‍රමය තිබුණා. මේ ගිණුම් ක්‍රමය අහෝසි කරලා ඒකාබද්ධ ගිණුමක් තමයි ඇති කරලා තිබෙන්නේ. වරායෙන් වරායට ගිණුම් ඇති කරන්න ඔබතුමාට බැරි ඇයි?

**ගරු රෝහිත අබේගුණවර්ධන මහතා**
(மாண்புமிகு ரோஹித அபேகுணவர்தன)
(The Hon. Rohitha Abeygunawardana)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, රවි කරුණානායක මන්ත්‍රීතුමා අහලා තිබෙන්නේ සම්පූර්ණ වරාය අධිකාරිය ගැනයි.

ගරු මන්ත්‍රීතුමනි, මම ඔබතුමාගෙන් ගෞරවයෙන් ඉල්ලීමක් කරනවා. කොළඹ වරාය, හම්බන්තොට වරාය, ගාලු වරාය, ත්‍රිකුණාමල වරාය සහ ඔළුවිල් වරාය ආදිය ගැන වෙන් වෙන් වශයෙන් කොපමණද කියා විස්තර ඉල්ලනවා නම් ඉදිරිපත් කරන්න හැකියාවක් තිබෙනවා. ඒ පිළිබඳ ගැටලුවක් නැහැ.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
දෙවන අතුරු ප්‍රශ්නය. ගරු මන්ත්‍රීතුමනි, කාලය පිළිබඳව ප්‍රශ්නයක් තිබෙනවා.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මගේ දෙවන අතුරු ප්‍රශ්නය මෙයයි. "එදා එක්සත් ජාතික පක්ෂ රජය කාලයේදී ඔළුවිල් වරාය වෙනුවෙන් ඩෙන්මාර්කයෙන් ණය ලබා ගන්නකොට කිසිදු පොලී අය කිරීමක් නොමැතිව ඒ ණය මුදල් ගන්න පුළුවන් වුණා නම්, වර්තමාන ජනාධිපතිතුමාට හම්බන්තොට වරාය වෙනුවෙන් පොලී රහිතව එවැනි ප්‍රාග්ධනයක් ලබා ගන්න බැරි ඇයි?" කියා මම අහනවා.

**ගරු රෝහිත අබේගුණවර්ධන මහතා**
(மாண்புமிகு ரோஹித அபேகுணவர்தன)
(The Hon. Rohitha Abeygunawardana)
ගරු මන්ත්‍රීතුමනි, මේ අවස්ථාවේදී අපි බොහොම පැහැදිලිව ඔබතුමාට මතක් කරනවා, මේ ගරු සභාව නොමඟ යවන විධියට කථා කරන්න එපාය කියා. ඔබතුමා අසා තිබෙන ප්‍රශ්නයේ (අ) (ii) වන කොටසින් ඔබතුමා කියා තිබෙනවා, ශ්‍රී ලංකා වරාය අධිකාරිය පාඩු ලබනවාය කියා. විදේශ විචල්‍යතාවයන්ට පෙර වරාය අධිකාරිය ලාභ ලබනවා. අපි ලාභ ලබනවා. [බාධා කිරීමක්] ඒකට හේතුව, එදා ඔබතුමන්ලාගේ රජය කාලයේදී ජපානයෙන් යෙන්වලින් ගත්තු ණය -අද යෙන් එකේ මිල එන්න එන්නම ඉහළ ගොස් තිබෙනවා. - 2044 වනතෙක් අපට ගෙවන්න වෙලා තිබීමයි. ඒ පාප කර්ම තමයි මේ ගෙවන්නේ. ඉතිහාසයේ කරපු පාප කර්ම තමයි මේ ගෙවන්නේ.

ගරු මන්ත්‍රීතුමාට තව කාරණයක් කියන්න ඕනෑ. හම්බන්තොට, මාගම්පුර, මහින්ද රාජපක්ෂ වරායට ගත්තු ණය ගෙවලාත් 2013 වර්ෂයේ අපි රුපියල් මිලියන 2,427ක් ලාභ ලබා තිබෙනවා. නමුත් තමුන්නාන්සේලා කියනවා, අපට ණය ගෙවන්න බැහැ කියලා. අපි ණය ගෙවනවා. ණය ගෙවලත් ලාභ ලබා තිබෙනවා.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
තුන් වන අතුරු ප්‍රශ්නය.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

ගරු ඇමතිතුමනි, මම ඔබතුමාට ලොකු ගෞරවයක් දක්වනවා. නමුත් ඔබතුමා දුන් පිළිතුරෙන් නැඟෙන කාරණයක් තිබෙනවා. කරුණාකර මතක තබා ගන්න, ගරු ලලිත් ඇතුලත් මුදලි මැතිතුමා එදා ලෝකයේ 128 වන ස්ථානයේ තිබුණු ලංකාවේ වරාය, 28 වන ස්ථානයට ගෙනාවාය කියන එක. කෝටි 210යි වියදම් කළේ. ඒ ණය අවුරුදු 30කින් ගෙවන්නයි ලබා ගත්තේ. අවුරුදු 30ක් කියන්නේ, 1980 සිට 2010 වෙනකොට ගෙවලා ඉවරයි. ඔබතුමන්ලා ඊට පසුව ගත් ණය තමයි දැන් ගෙවා ගෙන යන්නේ. එදා සියයට දශම 025ට ගත් ණය මෙච්චර ප්‍රශ්නයක් නම් ඔබතුමන්ලා සියයට නවයකට හම්බන්තොට වරායට ගන්න ණය කොයි ආකාරයකට ද ගෙවන්නේ? කවදා ද මේ ණය ගෙවා අවසාන කරන්නේ? කවදා ද ලාභයක් ඇති කරන්නට පුළුවන් වන්නේ? මේ වාගේ පට්ටපල් බේගල් කියා පාර්ලිමේන්තුව නොමඟ යවන්නට එපා.

**ගරු රෝහිත අබේගුණවර්ධන මහතා**
(மாண்புமிகு ரோஹித அபேகுணவர்தன)
(The Hon. Rohitha Abeygunawardana)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එතුමා ඉදිරිපත් කරන ප්‍රශ්නයට අප පිළිතුරු ලබා දෙන්නේ වග කීමකින්. මේ සම්බන්ධයෙන් අසත්‍යතාවක් තිබෙනවා නම්, ගරු මන්ත්‍රීතුමාට මා කියනවා -[බාධා කිරීමක්] වග කීමකින් අප පිළිතුරු දෙන්නේ. එම නිසා ඒ ගරු මන්ත්‍රීතුමා කියන විධියට සියයට 9ක මහා ප්‍රතිශතයකට අප ණය ලබා ගෙන නැහැ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. අප ණය ලබා ගන්නේ අපට ගෙවන්නට පුළුවන් විධියටයි.

ගරු මන්ත්‍රීතුමනි, ගරු ලලිත් ඇතුලත් මුදලි මැතිතුමාව අප පිළිගන්නවා. එතුමාට අප ගරු කරනවා. හැබැයි ප්‍රශ්නය තිබෙන්නේ මෙයයි. ඕනෑම කෙනෙක් ණයක් ලබා ගන්නකොට ඒ ණය ලබා ගන්නා භාණ්ඩයට ආයුෂ කාලයක් තිබෙනවා. තමුන්නාන්සේලාගේ කාලයේ ණය ගන්නකොට ආයුෂ කාලයවත් සැලකිල්ලට ගත්තේ නැහැ. Gantry crane එකක කාලය අවුරුදු 15යි. අවුරුදු 40කට ණය ගත්තේ. දැන් යකඩවලටත් විකුණලා ඉවරයි. ඒවා ගැන සැලකිල්ලට නොගෙන, ඒ කාලවල ගත් තීන්දු තීරණ අද වහලා කථා කරන්නේ. අද ඒ ගැන කියන්නේ නැහැ. අප අහන්නේ, ඔබතුමා වාහනයක් ගන්න ණයක් ගන්න කොට, ඒ වාහනය මලකඩවලට දිරුවාට පස්සෙත් ඒ ණය ගෙවෙන ආකාරයටද ණය ගන්නේ? නැහැ. ඔබතුමා ගන්නේ වාහනයේ ඒ ආයුෂ කාලයටයි. තමුන්නාන්සේලා මෙහෙම ගත් ණයවලට තමයි, අප ලබන ලාභය ගෙවන්න සිදුධ වෙලා තිබෙන්නේ. [බාධා කිරීම්]

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)

ප්‍රශ්න අංක 4 -3447/'13- (2), ගරු පී. හැරිසන් මහතා.

**ගරු පී. හැරිසන් මහතා**
(மாண்புமிகு பீ. ஹரிசன்)
(The Hon. P. Harrison)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

**ගරු බන්දුල ගුණවර්ධන මහතා (අධ්‍යාපන අමාත්‍යතුමා)**
(மாண்புமிகு பந்துல குணவர்தன - கல்வி அமைச்சர்)
(The Hon. Bandula Gunawardane - Minister of Education)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මෙය දීර්ඝ පිළිතුරක් බැවින් හා කාලය පිළිබඳ ප්‍රශ්නයක් තිබෙන බැවින් සති දෙකක් කල් ඉල්ලා සිටිනවා. එහෙම නැත්නම් දැන් පිළිතුර සභාගත කරලා පසුව අතුරු ප්‍රශ්න අහන්න ඉඩ දෙන්නත් පුළුවන්.

**ගරු පී. හැරිසන් මහතා**
(மாண்புமிகு பீ. ஹரிசன்)
(The Hon. P. Harrison)

නැහැ, නැහැ. පිළිතුර සභාගත කරන්න එපා. සති දෙකක් කල් අරගෙන මට උත්තරය දෙන්න.

**ගරු බන්දුල ගුණවර්ධන මහතා**
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)

හොඳයි. එම ප්‍රශ්නයට පිළිතුරු දීම සඳහා මා සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

*ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.*
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)

ප්‍රශ්න අංක 5 -3688/'13- (2), ගරු අනුර දිසානායක මහතා.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

**ගරු ටී. බී. ඒකනායක මහතා (සංස්කෘතික හා කලා කටයුතු අමාත්‍යතුමා)**
(மாண்புமிகு ரி. பி. ஏக்கநாயக்க - கலாசார, கலை அலுவல்கள் அமைச்சர்)
(The Hon. T.B. Ekanayake - Minister of Culture and the Arts)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර දීම සඳහා මා සති දෙකක් කල් ඉල්ලා සිටිනවා.

*ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.*
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

## වන අලි උවදුර : පිළියම්
### காட்டு யானைகளின் தொந்தரவு : தீர்வு
### WILD ELEPHANT MENACE: REMEDIES

4313/'13

**6. ගරු තිස්ස අත්තනායක මහතා**
(மாண்புமிகு திஸ்ஸ அத்தநாயக்க)
(The Hon. Tissa Attanayake)

වනජීවී සම්පත් සංරක්ෂණ අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (3):

(අ) (i) උඩවලව, යාල, විල්පත්තුව, වස්ගමුව, ගල්ගමුව හා අනුරාධපුර ආදී ප්‍රදේශවල ජීවත් වන ජනතාව තවමත් වන අලින්ගේ ප්‍රහාරවලට ලක්වන බවත්;

(ii) වන අලින්ගෙන් සිදු වන උවදුරුවලින් එම ප්‍රදේශවල ජනතාව බේරා ගැනීමේ පිළියමක් ලෙස 2002 වර්ෂයේ සිට විදුලි වැටවල් නඩත්තු කිරීම, වන අලි පලවා හැරීම, දඩයම්කරුවන් හා දඩමස් අලෙවි කරන්නන් නීතිය හමුවට ගෙන ඒම ආදී කටයුතු සඳහා වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ සේවය සඳහා අනියම් කම්කරුවන් ලෙස පුද්ගලයින් බඳවා ගත් බවත්;

එතුමා දන්නෙහිද?

[ගරු තිස්ස අත්තනායක මහතා]

(ආ) (i) ඉහත (අ)(ii) හි පරිදි බඳවා ගෙන ඇති සේවකයින් සංඛ්‍යාව කොපමණද;

(ii) 2013.01.01 දින සිට එම සේවකයින්ගේ සේවය අත්හිටුවා ඇති බැවින් එම ප්‍රදේශවල වන අලින්ගෙන් සිදු වන අනතුරු නැවත වර්ධනය වී ඇති බවත්, රැකියා අහිමි වූ එම පිරිස දැඩි අපහසුතාවකට පත්වී ඇති බවත් පිළිගන්නේද;

(iii) එසේ නම්, එම සේවකයින්ට නැවත සේවය ලබා දී, ස්ථිර සේවයේ පිහිටුවා, එම ප්‍රදේශවල පවතින වන අලි ගැටලුව විසඳීම සඳහා කටයුතු කරන්නේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නො එසේ නම්, ඒ මන්ද?

வன சீவராசிகள் வளப் பேணுகை அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i ) உடவளவை, யாலை, வில்பத்து, வஸ்கமுவ, கல்கமுவ மற்றும் அநுராதபுரம் ஆகிய பிரதேசங்களில் வாழும் மக்கள் தொடர்ந்தும் காட்டு யானைகளின் தாக்குதலுக்கு ஆளாகின்றார்கள் என்பதையும்;

(ii) காட்டு யானைகளினால் இடம்பெறுகின்ற தொந்தரவுகளிலிருந்து மேற்படி பிரதேச மக்களைப் பாதுகாப்பதற்கான தீர்வொன்றாக 2002ஆம் ஆண்டு முதல் மின்சார வேலிகளை பராமரித்தல், காட்டு யானைகளை விரட்டுதல், வேட்டையாடுவோர் மற்றும் வேட்டை இறைச்சிகளை விற்பனை செய்பவர்களை சட்டத்தின்முன் நிறுத்துதல் ஆகிய நடவடிக்கைகளுக்காக வனசீவராசிகள் பாதுகாப்புத் திணைக்களத்தில் சேவையாற்றும் பொருட்டு ஆட்கள் அமய ஊழியர்களாக ஆட்சேர்க்கப்பட்டார்கள் என்பதையும்

அவர் அறிவாரா?

(ஆ) (i ) மேலே (அ) (ii) இற்கு அமைய ஆட்சேர்க்கப் பட்டுள்ள ஊழியர்களின் எண்ணிக்கை எவ்வளவு என்பதையும்;

(ii) 2013.01.01ஆம் திகதி முதல் மேற்படி ஊழியர்களின் சேவை இடைநிறுத்தப் பட்டுள்ளதன் காரணமாக குறித்த பிரதேசங்களில் காட்டு யானைகளினால் இடம்பெறுகின்ற விபத்துக்கள் மீண்டும் அதிகரித்துள்ளதையும், தொழிலை இழந்துள்ள மேற்படி ஆட்கள் கடும் அசௌகரியங்களை எதிர்நோக்கி உள்ளதையும் ஏற்றுக்கொள்கின்றாரா என்பதையும்;

(iii ) ஆமெனில், மேற்படி ஊழியர்களுக்கு மீண்டும் சேவையைப் பெற்றுக்கொடுத்து நிரந்தர சேவையில் அமர்த்தி மேற்படி பிரதேசங்களில் காணப்படுகின்ற காட்டு யானைகளின் பிரச்சினைகளைத் தீர்ப்பதற்கு நடவடிக்கை மேற்கொள்வாரா என்பதையும்

அவர் குறிப்பிடுவாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Wildlife Resources Conservation:

(a) Is he aware that -

(i) the people living in areas like Udawalawa, Yala, Wilpattu, Wasgamuwa, Galgamuwa and Anuradhapura still become victims of attacks by wild elephants; and

(ii) as a remedial measure to protect the people of those areas from the wild elephant menace, persons were recruited as casual labourers from the year 2002 to serve in the Department of Wildlife Conservation for activities such as maintenance of electric fences, chasing away wild elephants, bringing to book hunters and sellers of game, etc.?

(b) Will he state -

(i) the number of employees recruited as mentioned in (a)(ii) above;

(ii) whether he admits that the danger caused by wild elephants has increased again in those areas as the service of the said employees has been suspended with effect from 1st January, 2013 and that those people who lost their jobs have been subjected to severe inconvenience; and

(iii) if so, whether action will be taken to re-instate those employees, confirm them in service and solve the wild elephant issue that prevails in those areas?

(c) If not, why?

**ගරු ගාමිණී විජිත් විජයමුණි ද සොයිසා මහතා (වනජීවී සම්පත් සංරක්ෂණ අමාත්‍යතුමා)**
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி த சொய்சா - வனசீவராசிகள் வளப் பேணுகை அமைச்சர்)
(The Hon. Gamini Wijith Wijayamuni De Zoysa - Minister of Wildlife Resources Conservation)
මා එම ප්‍රශ්නයට පිළිතුරු දෙනවා.

(අ) (i) මහ ජනතාවට වන අලින්ගෙන් සිදු වන හානි අවම කිරීමට පහත සඳහන් පියවරයන් ගෙන ඇත.

දැනට පවත්නා විදුලි වැට නඩත්තු කිරීම.

අලුතින් විදුලි වැට ඉදි කිරීම.

දරුණු අලි අල්ලා ඉවත් කිරීම.

ජීව වැට හඳුන්වා දීම.

වනාන්තර තුළ වන සතුන්ට අවශ්‍ය ජලය හා ආහාර සුලභ කිරීමට පියවර ගැනීම.

2014 අය වැය යෝජනා මඟින් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස සඳහා අතිගරු ජනාධිපතිතුමා විසින් රුපියල් මිලියන 10ක් බැගින් ලබා දී වන අලි - මිනිස් ගැටුම මැඩලීමට අවශ්‍ය පියවර ගැනීම.

(ii) වන අලි පළවා හැරීම, වනජීවී අපරාධ කරන අය නීතිය හමුවට පැමිණ වීම ආදී කටයුතු වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ කාර්ය මණ්ඩලය

විසින් සිදු කරයි. වනජීවී රක්ෂිත මායිම්වල විදුලි වැට නඩත්තුව ප්‍රජාවගේ සහභාගීත්වයෙන් සිදු කිරීමට කටයුතු කළ අතර, ඒ සඳහා අනියම් (තත්කාර්යය) කම්කරුවන්ද යොදා ගෙන තිබුණි.

(ආ) (i) 58යි.

(ii) වර්තමානයේ විදුලි වැටවල් නඩත්තු කිරීමේ කටයුතු සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවට භාර දී ඇත. මේ වනවිට ඉදිකර ඇති විදුලි වැටවල් සඳහා සිවිල් ආරක්ෂක භටයින් 950ක් පමණ යොදවා ඇත. අනියම් (තත්කාර්යය) කම්කරුවන්ගේ සේවය අවසන් කිරීම හේතුවෙන් වන අලි අනතුරු වර්ධනය වී ඇති බවට වාර්තා වී නොමැත.

(iii) ඉදිකරන ලද සහ ඉදිකරනු ලබන සියලුම විදුලි වැටවල් සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව විසින් නඩත්තු කරන බැවින්, අනියම් (තත්කාර්යය) කම්කරුවන්ගේ සේවය අවශ්‍ය නොවන බව කාරුණිකව දන්වමි.

තවද, වන සත්ව හා වෘක්ෂලතා ආඥාපනත ක්‍රියාත්මක කිරීමේ කාර්යයන් ඉහත අනියම් (තත්කාර්යය) කම්කරුවන් විසින් සිදු නොකළ අතර, වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ ස්ථිර කාර්ය මණ්ඩලය විසින් දඩයම්කරුවන් හා දඩමස් අලෙවි කරන්නන් නීතිය හමුවට ගෙන ඒම හා දඩයම් පාලන කටයුතු සිදු කරගෙන යනු ලැබේ.

(ඇ) අදාළ නොවේ.

**ගරු තිස්ස අත්තනායක මහතා**
(மாண்புமிகு திஸ்ஸ அத்தநாயக்க)
(The Hon. Tissa Attanayake)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය මෙයයි. ගරු ඇමතිතුමනි, පසු ගිය දවස්වල අලි ඇල්ලීම පිළිබඳව සහ නීති විරෝධීව අලින් ළඟ තබා ගැනීම පිළිබඳව මාධ්‍ය වාර්තාවන් ගණනාවක් දකින්නට ලැබුණා. ඒ පිළිබඳව ගෙන තිබෙන නීතිමය පියවර මොකක්ද?

**ගරු ගාමිණී විජිත් විජයමුණි ද සොයිසා මහතා**
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி த சொய்சா)
(The Hon. Gamini Wijith Wijayamuni De Zoysa)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපට වාර්තා වන සහ තිරසාර වශයෙන්ම අපට තොරතුරු ලැබී ඇති, වන අලින් ළඟ තබාගෙන සිටින්නන් වෙනුවෙන් අපි ඉතාම පැහැදිලි ලෙස නීතිය ක්‍රියාත්මක කර තිබෙනවා. දැනට අධිකරණයේ නඩු තුනක් තිබෙනවා. එසේ ළඟ තබා ගත් අලින් හතර දෙනෙකු පමණ අත් අඩංගුවට ගැනීමට අපි සමත් වෙලා තිබෙනවා. ඒ ස්ථානවල ඔවුන් රඳවා තිබෙනවා.

**ගරු තිස්ස අත්තනායක මහතා**
(மாண்புமிகு திஸ்ஸ அத்தநாயக்க)
(The Hon. Tissa Attanayake)

මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මා අහනවා. මෙවැනි බොහෝ ප්‍රශ්න මතු වෙන්නේ අලින්ගේ කැලෑවල සහ ජලයේ ඇති හිඟකම නිසායි. විශේෂයෙන්ම වනයේ ඉන්න අලි ගම්වලට කඩා වැදිලා දේපළ විනාශ කරන්නේ ඒ නිසායි. ඒ සම්බන්ධයෙන් අරගෙන තිබෙන වැඩ පිළිවෙළ මොකක්ද? මොකද, ඒ නිසා මිනිසුන්ගේ වගාවන්වලට සහ දේපළවලට බරපතළ හානි සිදු වෙනවා. ඒ පිළිබඳව සඳහන් කළාට තවමත් කිසිදු පියවරක් අරගෙන නැහැ. ඒ ගැන ඔබතුමා මොකක්ද කියන්නේ?

**ගරු ගාමිණී විජිත් විජයමුණි ද සොයිසා මහතා**
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி த சொய்சா)
(The Hon. Gamini Wijith Wijayamuni De Zoysa)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඇත්ත වශයෙන්ම වන අලින්ගේ සුපෝෂණය සඳහා අපි ඉතා පැහැදිලි ක්‍රියා මාර්ග අරගෙන තිබෙනවා. විශේෂයෙන්ම ඉතිහාසයේ රජ දරුවන්ගේ කාලයෙන් පසු පළමු වතාවට වනාන්තරයේ කුළු වැව් ඉදි කිරීමට අතිගරු ජනාධිපතිතුමා මෙවර අය වැයෙන් මුදල් වෙන් කරලා තිබෙනවා. අපි පසු ගිය වර්ෂයේ හෙක්ටයාර 2,000ක ලැන්ටානා සහ කලපු අන්දර යන ආක්‍රමණික ශාක ඉවත් කරන්න කටයුතු කර තිබෙනවා. විශේෂයෙන්ම යාල සහ උඩවලවේ වැව් ටික ප්‍රතිසංස්කරණය කිරීමේ සහ වතුර වලවල් ප්‍රතිසංස්කරණය කිරීමේ කටයුතු කරමින් පවතිනවා. හෙක්ටයාර 2,000ක අපි ඒ වැඩ පිළිවෙළ ආරම්භ කරලා දැනට ක්‍රියාත්මක කරගෙන යනවා. කුළු වැව් නිර්මාණය කිරීමේ කටයුත්තත් අපි මේ වර්ෂයේ වග කීමෙන් යුතුව කරගෙන යනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ වාගේම මේ රටේ සිදු වන කඩිනම් සංවර්ධන යෝජනා ක්‍රම නිසා විශේෂයෙන්ම ජල ගැලුම් නිම්න වන අලියාට අහිමි වෙලා තිබෙනවා. ගරු මන්ත්‍රීතුමනි, ජල ගැලුම් නිම්නවල වන අලියාට කෑම නැහැ. උල් දිය දමන තැන්වල තමයි දීර්ඝ තෘණ වර්ග තිබෙන්නේ. ඒ තෘණ වර්ග හිඟ වීම නිසා වන අලියා ගම් වැදීම, නැත්නම් සංවර්ධිත ප්‍රදේශවලට ආක්‍රමණය වීම වෙනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, හේන් ගොවිතැන තහනම් කිරීම නිසා එය තව දුරටත් බරපතළ ලෙස බලපා තිබෙනවා. මොකද, වන අලියාට භූමිය අහිමි වෙලා තිබෙනවා. ඒ වාගේම වනාන්තර ආශ්‍රිත ගම්බදව ජීවත් වන හේන් ගොවියාටත් භූමිය අහිමි වෙලා තිබෙනවා. මේ දෙගොල්ලෝ අතර ඇති වී තිබෙන අරගළය සංහිඳියාවකට පත් කිරීමට නම් භූමිය අහිමි වූ මේ දෙකොට්ඨාසයටම සාධාරණය ඉෂ්ට විය යුතුයි.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)

තුන්වැනි අතුරු ප්‍රශ්නයක් තිබෙනවාද?

**ගරු තිස්ස අත්තනායක මහතා**
(மாண்புமிகு திஸ்ஸ அத்தநாயக்க)
(The Hon. Tissa Attanayake)

නැහැ.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)

ප්‍රශ්න අංක 7 - 4318/'13 - (2), ගරු අනෝමා ගමගේ මහත්මිය.

**ගරු අනෝමා ගමගේ මහත්මිය**
(மாண்புமிகு (திருமதி) அனோமா கமகே)
(The Hon. (Mrs.) Anoma Gamage)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

**ගරු බන්දුල ගුණවර්ධන මහතා**
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා එම ප්‍රශ්නයට පිළිතුර දීම සඳහා සති දෙකක් කල් ඉල්ලා සිටිනවා.

***ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.***
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ප්‍රශ්න අංක 8 - 4433/'13 - (2), ගරු තලතා අතුකෝරල මහත්මිය.

**ගරු තලතා අතුකෝරල මහත්මිය**
(மாண்புமிகு (திருமதி) தலதா அத்துகோரல)
(The Hon. (Mrs.) Thalatha Atukorale)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දීම සඳහා සති දෙකක් කල් ඉල්ලා සිටිනවා.

*ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.*
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

## කොළඹ නගරය තුළ ක්‍රියාත්මක "කැසිනෝ": වාර්ෂික බදු සහ වෙනත් ගාස්තු
### கொழும்பில் இயங்கும் 'கசினோ'க்கள்: வருடாந்த வரிகள் மற்றும் கட்டணங்கள்
### CASINOS OPERATING IN COLOMBO : ANNUAL TAXES AND OTHER FEES

4587/'13

**9. ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)

මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1) :

(අ) කොළඹ නගරය තුළ "කැසිනෝ" කිහිපයක් ක්‍රියාත්මක වන බව එතුමා දන්නෙහිද?

(ආ) (i) 2013.11.29 දින වන විට කොළඹ නගරය තුළ ක්‍රියාත්මක වූ "කැසිනෝ" සංඛ්‍යාව සහ ඒවායේ ලියාපදිංචි නම් කවරේද;

(ii) 2006 වර්ෂයේ සිට 2012 දක්වා සහ 2013 වර්ෂයෙහි මුල් කාර්තු තුන සඳහා ඉහත එක් එක් ආයතනය විසින් ගෙවිය යුතු වාර්ෂික බදු, අයකිරීම් සහ වෙනත් ගාස්තු කවරේද;

(iii) ඉහත එක් එක් ආයතනය විසින් ඉහත කී කාල පරිච්ඡේදය සඳහා ගෙවන ලද වාර්ෂික බදු, අයබදු සහ වෙනත් සියලු ගාස්තු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නො එසේ නම්, ඒ මන්ද?

நிதி, திட்டமிடல் அமைச்சரைக் கேட்ட வினா:

(அ) கொழும்பில் பல சூதாட்ட (கசினோ) விடுதிகள் இயங்குகின்றன என்பதை அவர் அறிவாரா?

(ஆ) (i) 2013.11.29 இலுள்ளவாறு கொழும்பில் இயங்கிய சூதாட்ட விடுதிகளின் எண்ணிக்கையினையும் அவற்றின் பதிவுசெய்யப்பட்ட பெயர்களையும்;

(ii) 2006 முதல் 2012 வரையான ஆண்டுகளிலும் 2013ஆம் ஆண்டின் முதல் மூன்று காலாண்டுகளிலும் இவை ஒவ்வொன்றும் செலுத்தவேண்டிய வருடாந்த வரிகள், அறவீடுகள் மற்றும் ஏனைய சகல கட்டணங்களையும்;

(iii) மேற்குறிப்பிட்ட காலப்பகுதிகளில் மேற்படி சூதாட்ட விடுதி ஒவ்வொன்றும் செலுத்திய வருடாந்த வரிகள், அறவீடுகள் மற்றும் ஏனைய சகல கட்டணங்களையும்

அவர் இச்சபைக்கு அறியத்தருவாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Finance and Planning:

(a) Is he aware that several casinos are operating in Colombo?

(b) Will he inform this House of -

(i) the number of casinos operated in Colombo as at 29.11.2013 and their registered names;

(ii) the annual taxes, levies and all other fees due from each of the above for the years 2006 to 2012 and for the first three quarters of the year 2013; and

(iii) the annual taxes, levies and all other fees paid by each of the above casinos for the aforesaid time period?

(c) If not, why?

**ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා (ජාත්‍යන්තර මූල්‍ය සහයෝගිතා අමාත්‍ය සහ මුදල් හා ක්‍රමසම්පාදන නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு (கலாநிதி) சரத் அமுனுகம - சர்வதேச நிதிய கூட்டிணைப்பு அமைச்சரும் நிதி, திட்டமிடல் பிரதி அமைச்சரும்)
(The Hon. (Dr.) Sarath Amunugama - Minister of International Monetary Co-operation and Deputy Minister of Finance and Planning)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දෙනවා.

(අ) ඔව්.

(ආ) (i) එවැනි ව්‍යාපාර සංඛ්‍යාව 5කි. එක් එක් ව්‍යාපාරික ආයතන නම් සහ ලියාපදිංචි ගොනු අංක පිළිබඳව නිශ්චිත තොරතුරු බාහිර පාර්ශ්වයන්ට ලබා දීම 2006 අංක 10 දරන දේශීය ආදායම් පනතේ **209** වගන්තියේ විධිවිධාන මඟින් වළක්වා ඇත.

(ii) බදු අය කිරීම පිළිබඳව විස්තර ඇමුණුම් 1හි දක්වා ඇත.

**ඇමුණුම 1**

2006 සිට 2012 වර්ෂය දක්වා (ආදායම් බද්ද, වැට් බද්ද සහ ජාතිය ගොඩනැඟීමේ බද්ද)

| වර්ෂය | එක් ආයතනයක් වර්ෂයක් තුළ ගෙවිය යුතු බද්ද (රුපියල් මිලියන) | ලියා පදිංචි කැසිනෝ ව්‍යාපාර සංඛ්‍යාව | ගෙවිය යුතු බද්ද (රුපියල් මිලියන) | ගෙවූ බද්ද (රුපියල් මිලියන) |
|---|---|---|---|---|
| 2006 | 50 | 4 | 200 | 200 |
| 2007 | 50 | 4 | 200 | 200 |
| 2008 | 50 | 4 | 200 | 200 |
| 2009 | 50 | 4 | 200 | 200 |
| 2010 | 50 | 4 | 200 | 200 |
| 2011 | 50 | 4 | 200 | 200 |
| 2012 | 50 | 4 | 200 | 200 |
| එකතුව | | | 1400 | 1400 |

2013 වර්ෂය මුල් කාර්තු 03

| කාර්තුව | එක් ආයතනයක් කාර්තුවක් තුළ ගෙවිය යුතු බද්ද (රුපියල් මිලියන) | ලියා පදිංචි කැසිනෝ ව්‍යාපාර සංඛ්‍යාව | ගෙවිය යුතු බද්ද (රුපියල් මිලියන) | ගෙවූ බද්ද (රුපියල් මිලියන) |
|---|---|---|---|---|
| 2013 පළමු | 12.5 | 4 | 50 | 50 |
| 2013 දෙවන | 25 | 4 | 100 | 100 |
| 2013 තෙවන | 25 | 5 | 125 | 125 |
| එකතුව | | | 275 | 275 |

(iii) ඉහත ඇමුණුම 1හි සඳහන් බදුවලට අමතරව 2013.01.01 දින සිට අතිරේකව අය කරනු ලබන වෙනත් ගාස්තු ලෙස දළ එකතුව මත සියයට 5ක බද්ද අය කිරීම සිදු කරයි.

එම තොරතුරු **ඇමුණුම් 2හි** දක්වා ඇත.

ඇමුණුම 2.
දළ එකතුව මත සියයට 5 බද්ද.

| ආයතනය | **2013** පළමු කාර්තුව (රුපියල් මිලියන | **2013** දෙවන කාර්තුව (රුපියල් මිලියන | **2013** තෙවන කාර්තුව (රුපියල් මිලියන) | එකතුව (රුපියල් මිලියන) |
|---|---|---|---|---|
| ආයතනය 01 | 1.5 | 1.8 | 2.1 | 5.4 |
| ආයතනය 02 | 10.0 | 8.9 | 8.5 | 27.4 |
| ආයතනය 03 | 7.6 | 9.3 | 9.4 | 26.3 |
| ආයතනය 04 | 15.5 | 11.7 | 12.1 | 39.3 |
| ආයතනය 05 | - | - | 3.0 | 3.0 |
| එකතුව | 34.6 | 31.7 | 35.1 | 101.4 |

(ඇ) පැන නොනඟී.

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)
ගරු ඇමතිතුමා, අපට ඔය ඇමුණුමේ තිබෙන නම්වලින් දෙක තුනක් කියන්න පුළුවන්ද?

**ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා**
(மாண்புமிகு (கலாநிதி) சரத் அமுனுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)
ආයතනය 01, ආයතනය 02, ආයතනය 03, ආයතනය 04 සහ ආයතනය 05.

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මාගේ පළමුවෙනි අතුරු ප්‍රශ්නය මෙයයි. ගරු ඇමතිතුමා, ඒ කියන්නේ ඔබතුමා පිළිගන්නවාද, ශ්‍රී ලංකාවේ කොළඹ නගරයේ කැසිනෝ පහක් ක්‍රියාත්මක වන බව?

**ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා**
(மாண்புமிகு (கலாநிதி) சரத் அமுனுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)
ඔව්.

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මාගේ දෙවෙනි අතුරු ප්‍රශ්නය මෙයයි. ඒ කැසිනෝ ක්‍රියාත්මක කරන්නට කිසිම බලපත්‍රයක් නැති බව ඔබතුමා පිළිගන්නවාද, නැද්ද?

**ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා**
(மாண்புமிகு (கலாநிதி) சரத் அமுனுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)
ඔබතුමාගේ ප්‍රශ්නයෙන් අහලා තිබෙන්නේ බදු කොපමණ අය කරලා තිබෙනවාද කියලායි. ඒ අනුව මම අපට ලැබුණු බදු ප්‍රමාණය කියලා තිබෙනවා.

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)
මම අහන්නේ-

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ගරු මන්ත්‍රීතුමා, තුන්වෙනි අතුරු ප්‍රශ්නය අහන්න.

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)
නැහැ, නැහැ. දෙවෙනි අතුරු ප්‍රශ්නය, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

**ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා**
(மாண்புமிகு (கலாநிதி) சரத் அமுனுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)
මම ඒ ප්‍රශ්නයට පිළිතුරක් දුන්නා.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ගරු මන්ත්‍රීතුමා, ගරු ඇමතිතුමා පිළිතුරක් දුන්නා.

**ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා**
(மாண்புமிகு (கலாநிதி) சரத் அமுனுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)
අපි අය කරගෙන තිබෙන බදු මොනවාද කියලා අහලා තිබෙනවා, මම ඒ ප්‍රශ්නයට පිළිතුරක් දුන්නා.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
තුන්වෙනි අතුරු ප්‍රශ්නය අහන්න.

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)
නැහැ, නැහැ. මම අතුරු ප්‍රශ්නය විධියට ඇහුවේ මෙයයි. කොළඹ නගරයේ කැසිනෝ පහක් ක්‍රියාත්මක වෙනවාලු. ඒවා බදු ගෙවනවාලු. ඒ කැසිනෝ ක්‍රියාත්මක කරන්න බලපත්‍ර තිබෙනවාද කියලා පමණයි මම ඇහුවේ.

**ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා**
(மாண்புமிகு (கலாநிதி) சரத் அமுனுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)
මට මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශය වෙනුවෙන් කියන්නට පුළුවන්, ලැබුණු ආදායම ගැන. මම දැන් ඒ කරුණු මේ ගරු සභාවට හෙළිදරවු කළා.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
හරි. තුන්වෙනි අතුරු ප්‍රශ්නය අහන්න.

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)
තුන්වෙනි අතුරු ප්‍රශ්නය සුජීව සේනසිංහ මන්ත්‍රීතුමා අහනවා.

**ගරු සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)
ඇමතිතුමනි, මේ කැසිනෝ පනම නීති විරෝධීයි කියලා ඔබතුමා පිළිගන්නවාද?

**ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා**
(மாண்புமிகு (கலாநிதி) சரத் அமுனுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)
නැහැ, මම පිළිගන්නේ නැහැ.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ප්‍රශ්න අංක 10-4749/'14-(1), ගරු අශෝක් අබේසිංහ මහතා.

**ගරු අශෝක් අබේසිංහ මහතා**
(மாண்புமிகு அசோக் அபேசிங்க)
(The Hon. Ashok Abeysinghe)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

**ගරු නිර්මල කොතලාවල මහතා (මහාමාර්ග, වරාය හා නාවික අමාත්‍යතුමා)**
(மாண்புமிகு நிர்மல கொத்தலாவல - நெடுஞ்சாலைகள், துறைமுகங்கள் மற்றும் கப்பற்றுறை அமைச்சர்)
(The Hon. Nirmala Kotalawala - Minister of Highways, Ports and Shipping)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, දීර්ඝ පිළිතුරක් සපයන්න ඕනෑ නිසා මා එම ප්‍රශ්නයට පිළිතුර දීම සඳහා මාසයක කාලයක් ඉල්ලා සිටිනවා.

*ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.*
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ප්‍රශ්න අංක 11-2627/'12-(2), ගරු සජිත් ප්‍රේමදාස මහතා.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දීම සඳහා මාසයක කාලයක් ඉල්ලා සිටිනවා.

*ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.*
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

## රජය ලබා ගත් ණය : ආපසු ගෙවීමේ කාල සීමාව
### அரசாங்கம் பெற்ற கடன்கள் : மீளச்செலுத்தும் காலம்
### LOANS BORROWED BY GOVERNMENT: PAYBACK PERIOD

3149/'12

**12.ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (4):

(අ) (i) 2010, 2011 සහ 2012 වර්ෂවල රජය විසින් ලබා ගත් ණය මුදල් හා ඒවායේ ආපසු ගෙවීමේ කාල සීමාවන් වාර්ෂික පදනමින් කවරේද;

(ii) ආදායම් උත්පාදනය කර ණය ආපසු ගෙවන ආකාරය ඇතුළුව මුදල් ප්‍රවාහ ප්‍රකාශ කවරේද;

(iii) පැරණි ණය ගෙවීම සඳහා රජය තව තවත් ණය ගැනීම සිදු කරන්නේද;

(iv) ඉහත (i) හි දක්වා ඇති කාල සීමාවන්හිදී ලබා ගෙන ඇති ණය සඳහා පිරිවැය ඉක්මවා ලැබූ ආදායමේ වර්ධනය කොපමණද;

(v) රට ණය උගුලක් කරා ගමන් කරමින් සිටින්නේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) 2009 වර්ෂයේ සිට මේ දක්වා රාජ්‍ය ණය, රජයේ බැඳුම්කර යනාදිය හරහා ඇ.එ.ජ ඩොලර් මිලියන 500 ඉක්මවා ණයට ගෙන ඇති අවස්ථා කවරේද යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නො එසේ නම්, ඒ මන්ද?

நிதி, திட்டமிடல் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) 2010, 2011 மற்றும் 2012ஆம் ஆண்டுகளில் அரசாங்கத்தினால் பெறப்பட்டுள்ள அனைத்து கடன்களினதும் மீளச்செலுத்தும் காலத்தைக் கடன்களுடன் வருடவாரியாகவும்;

(ii) எவ்வாறு வருமானம் ஈட்டப்பட்டு கடன்கள் மீள்செலுத்தப்படும் என்பதை உள்ளடக்கிய காசுப் பாய்ச்சல் கூற்றுக்களையும்;

(iii) அரசாங்கம் பழைய கடன்களை செலுத்துவதற்காக மேலும் கடன் பெறப்போகின்றதா என்பதையும்;

(iv) மேற்படி (i) இல் கூறப்பட்டுள்ள காலத்தில் பெறப்பட்ட கடன்களுக்கான செலவினத்தைவிட வருமானத்தில் ஏற்பட்டுள்ள அதிகரிப்பையும்;

(v) நாடு கடன் பொறியொன்றை நோக்கிச் செல்கின்றதா என்பதையும்

அவர் கூறுவாரா?

(ஆ) 2009ஆம் ஆண்டுமுதல் இற்றைவரை அரசாங்கக் கடன்கள், அரசாங்க முறிகள் போன்றவற்றின்மூலம் 500 மில்லியன் அமெரிக்க டொலர்களுக்கு அதிகமாக கடன் பெற்றுள்ள சந்தர்ப்பங்களையும் அவர் கூறுவாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Finance and Planning:

(a) Will he state -

(i) the payback period for all the loans borrowed by the Government for the years 2010, 2011 and 2012 on per year basis along with the borrowings;

(ii) the cash flow statements including as to how the revenues will be generated and loans will be paid;

(iii) whether the Government is resorting to borrow more to pay the old loans;

(iv) the increase in revenue over cost for the loans that have been borrowed from the period as per (i) above; and

(v) whether the country is heading towards a debt trap?

(b) Will he also state the occasions in which the Government has borrowed more than US Dollars 500 million through loans, Government bonds et cetera from the year 2009 to date?

(c) If not, why?

**ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා**
(மாண்புமிகு (கலாநிதி) சரத் அமுனுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා එම ප්‍රශ්නයට පිළිතුර සභාගත* කරනවා.

** සභාමේසය මත තබන ලද පිළිතුර:*
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) (i) **ණය ලබා ගැනීමේ උපකරණ මගින් ලබාගත් ණය:**
2010, 2011 සහ 2012 වර්ෂවල රජය විසින් ණය උපකරණ මගින් ලබාගත් ණය ප්‍රමාණයන් සහ එම ණයවල වාර්ෂික පදනම මත ආපසු ගෙවීම් කාලසීමාවන්, සංඛ්‍යා සටහන 1 මගින් දක්වා ඇත.

**සංඛ්‍යා සටහන 1: කාල පරිච්ඡේද පදනම මත ණය උපකරණ නිකුත් කිරීම**

| ණය උපකරණය | පරිණත කාලය | 2010 | 2011 | 2012 |
|---|---|---|---|---|
| භාණ්ඩාගාර බිල්පත් (රුපියල් මිලියන) (ශුද්ධ වටිනාකම) | දින 91 | 9,110 | 50,663 | -67,423 |
| | දින 182 | 26,708 | 22,994 | 172,656 |
| | දින 364 | 54,499 | 15,593 | -56,987 |
| | | 90,317 | 89,250 | 48,246 |
| භාණ්ඩාගාර බැඳුම්කර (රුපියල් මිලියන) | අවු. 1 | 28,865 | 29,832 | 102,640 |
| | අවු. 2 | 98,816 | 40,644 | 72,529 |
| | අවු. 3 | 121,158 | 119,364 | 78,701 |
| | අවු. 4 | 66,889 | 57,353 | 87,016 |
| | අවු. 5 | 104,767 | 99,450 | 153,642 |
| | අවු. 6 | 68,265 | 44,194 | 101,734 |
| | අවු. 7 | 1,950 | 45,261 | 39,994 |
| | අවු. 8 | 11,280 | 60,866 | 29,659 |
| | අවු. 9 | 68 | 32,869 | 4,801 |
| | අවු. 10 | 6,518 | 19,358 | 44,445 |
| | අවු. 11 | - | - | - |
| | අවු. 12 | - | 50,022 | 9,241 |
| | අවු. 13 | - | 62 | 39,814 |
| | අවු. 14 | - | 2,282 | 16,059 |
| | අවු. 15 | - | 1,394 | - |
| | අවු. 19 | - | - | 53,215 |
| | අවු. 20 | - | - | 14,410 |
| | | 508,576(අ) | 602,951(ආ) | 847,900(ඇ) |
| ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර (එ.ජ. ඩොලර් මිලියන) | අවු. 1 | - | - | - |
| | අවු. 2 | 276 | - | - |
| | අවු. 3 | 352 | 321 | 445 |
| | අවු. 4 | - | 146 | 12 |
| | අවු. 5 | - | 80 | - |
| | | 628(ඈ) | 547(ඉ) | 457(ඊ) |
| ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර (එ.ජ. ඩොලර් මිලියන) | අවු. 10 | 1000 | 1000 | 1000 |

මූලාශ්‍රය: ශ්‍රී ලංකා මහ බැංකුව

(අ) රුපියල් මිලියන 339,787 ක පරිණත වූ භාණ්ඩාගාර බැඳුම්කර නැවත නිකුතුවක් ඇතුළත් වේ

(ආ) රුපියල් මිලියන 411,594 ක පරිණත වූ භාණ්ඩාගාර බැඳුම්කර නැවත නිකුතුවක් ඇතුළත් වේ

(ඇ) රුපියල් මිලියන 454,023 ක පරිණත වූ භාණ්ඩාගාර බැඳුම්කර නැවත නිකුතුවක් ඇතුළත් වේ

(ඈ) එ.ජ. ඩොලර් මිලියන 530.30ක පරිණත වූ ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර නැවත නිකුතුවක් ඇතුළත් වේ

(ඉ) එ.ජ. ඩොලර් මිලියන 500.05ක පරිණත වූ ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර නැවත නිකුතුවක් ඇතුළත් වේ

(ඊ) එ.ජ. ඩොලර් මිලියන 317.00ක පරිණත වූ ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර නැවත නිකුතුවක් ඇතුළත් වේ

**ව්‍යාපෘති ආශ්‍රිත විදේශ ණය:**
විදේශ සංවර්ධන පාර්ශ්වකරුවන් හා ණය දෙන ආයතන මගින් 2010, 2011 හා 2012 යන වර්ෂවලදී ලබා දීමට එකඟ වූ ණය ප්‍රමාණය පිළිවෙලින් ඇමරිකානු ඩොලර් මිලියන 3,135.2, 1,944.7 හා 2,445.2 ක් වේ. මෙසේ එකඟතාව පළකළ ණය සංවර්ධන ව්‍යාපෘති සඳහා යොදා ගනු ලැබේ. සාමාන්‍යයෙන් සංවර්ධන ව්‍යාපෘතියක් අවුරුදු 2 සිට 5 දක්වා පමණ කාල පරිච්ඡේදයක් පුරා ක්‍රියාත්මක වෙමින් ණය උපයෝජනය කරයි. එම ණය ප්‍රමාණයට රජය සතු ව්‍යාපාර මගින් ලබා ගන්නා ණයද අන්තර්ගත වේ.

ඉහත පරිදි ලබා දීමට එකඟ වූ ණයෙහි ආපසු ගෙවීමේ කාලසීමාවන් පහත වගුවෙන් දැක්වේ.

**සංඛ්‍යා සටහන 2: ණය ආපසු ගෙවීමේ කාල සීමාවන් හා ලබා දීමට එකඟ වූ ණය ප්‍රමාණය**

| ආපසු ගෙවීමේ කාල සීමාව | ණය ආපසු ගෙවීම (ඇ.ඩො. මිලියන) | | |
|---|---|---|---|
| | 2010 දී එකඟතාව පළ කළ ණය | 2011දී එකඟතාව පළ කළ ණය | 2012 දී එකඟතාව පළ කළ ණය |
| 0 - 10 | 607.6 | 524.5 | 792.9 |
| 11 - 20 | 1,392.6 | 844.7 | 1,665.3 |
| 21 - 30 | 335.2 | 256.7 | 392.0 |
| 30ට වැඩි | 109.8 | 318.8 | 285 |

**මූලය: විදේශ සම්පත් දෙපාර්තමේන්තුව**

(ii) "මහින්ද චින්තන - ඉදිරි දැක්ම" රජයේ සංවර්ධන රාමුව මගින් හඳුනා ගන්නා ලද ප්‍රමුඛ සංවර්ධන ව්‍යාපෘති හා වැඩසටහන් මූල්‍යයනය කිරීම සඳහා විදේශ ණය ගැනීම් සිදු කරනු ලැබේ. මෙම ප්‍රතිපත්ති රාමුව යටතේ අධිවේගී මාර්ග, මහා මාර්ග, ප්‍රවාහන, වරාය, විදුලිබල හා බලශක්ති, ජලසම්පාදන හා වාරිමාර්ග ආදී රටේ යටිතල පහසුකම් වැඩි දියුණු කිරීම කෙරෙහි රජයේ ඉහළ ප්‍රමුඛතාව ලබා දී ඇත. මීට අමතරව රටේ පැවති ගැටුම්කාරී තත්ත්වය 2009 වර්ෂයේදී අවසන් වීමෙන් පසුව රජයේ සංවර්ධන උපාය මාර්ගයන් බිම් බෝම්බ ඉවත් කිරීම, නැවත පදිංචි කිරීම, ජීවනෝපාය සංවර්ධනය හා ගැටුම් පැවති ප්‍රදේශවල සිවිල් පරිපාලනය හා යටිතල පහසුකම් යළි ස්ථාපිත කිරීම් ආදිය කෙරෙහිද යොමු විය.

ඉහත සංවර්ධන මූලාරම්භයන් මගින් ජනනය කරනු ලබන සෘජු හා වක්‍ර ප්‍රතිලාභ තුළින් රටේ ආර්ථික සංවර්ධනය කෙරෙහි සුවිශාල බලපෑමක් සිදුවනු ඇතැයි අපේක්ෂා කරනු ලබන අතර, එම ආර්ථික සංවර්ධනය හරහා අත් කරගනු ලබන ප්‍රතිලාභ මගින් මෙම ණය ආපසු ගෙවීමට බලාපොරොත්තු වේ.

(iii) ඉහත (ii) අනුව පැන නොනගී

(iv) 2010 සිට 2012 දක්වා කාලසීමාව තුළ රාජ්‍ය ආදායම සියයට 30 කින් පමණ වර්ධනය වී ඇති අතර එම කාලසීමාව තුළ පොලී ගෙවීම් (ණය පිරිවැය) වර්ධනය වී ඇත්තේ සියයට 16 කින් පමණි.

**සංඛ්‍යා සටහන 3: පොලී වියදමට සාපේක්ෂව රාජ්‍ය ආදායමේ වර්ධනය**

රුපියල් මිලියන

| | 2010 | 2012 | 2010 සිට 2012 දක්වා වර්ධනය (%) |
|---|---|---|---|
| රාජ්‍ය ආදායම | 817,279 | 1,051,460 | 28.7 |
| පොලී ගෙවීම් | 352,592 | 408,498 | 15.9 |

මූලය: මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශය
ශ්‍රී ලංකා මහ බැංකුව

(v) නැත. දළ දේශීය නිෂ්පාදිතයෙන් රාජ්‍ය ණය අනුපාතිකය 2002 වසරේ පැවති සියයට 105.6 ක් වූ ඉහළ අගයක සිට 2012 වන විට සියයට 80 ට වඩා පහත මට්ටමකට අඩු වී ඇත. 2000 සිට 2012 වසර දක්වා දළ දේශීය නිෂ්පාදිතයෙන් රාජ්‍ය ණය අනුපාතිකය සංඛ්‍යා සටහන 4 මගින් දක්වා ඇත.

**සංඛ්‍යා සටහන 4: දළ දේශීය නිෂ්පාදිතයෙන් රාජ්‍ය ණය අනුපාතික**

| වර්ෂය | ද.දේ.නිෂ්පාදිතයෙන් රාජ්‍ය ණය අනුපාතිකය |
|---|---|
| 2000 | 96.9 |
| 2001 | 103.2 |
| 2002 | 105.6 |
| 2003 | 102.3 |
| 2004 | 102.3 |
| 2005 | 90.6 |
| 2006 | 87.9 |
| 2007 | 85.0 |
| 2008 | 81.4 |
| 2009 | 86.2 |
| 2010 | 81.9 |
| 2011 | 78.5 |
| 2012 | 79.1 |

මූලාශ්‍රය: ශ්‍රී ලංකා මහ බැංකුව

[ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා]

රටක විදේශීය ණය අවදනම තක්සේරු කිරීමට ආසියා හා පැසිෆික් කලාපීය එක්සත් ජාතීන්ගේ ආර්ථික හා සමාජීය කොමිසමෙහි ඵලදායී ණය කළමනාකරණය පිළිබඳ අත්පොතේ අවදි අගයන්ගේ නිර්වචනයන්ට අනුව, ශ්‍රී ලංකාව ණය ගැති බවින් අඩු රටක් ලෙස වර්ගීකරණය කළ හැකිය. 2012 වසරේ විදේශීය ණය දර්ශක 6 න් 5 ක් ම ශ්‍රී ලංකාව ණය ගැති බවින් අඩු රටක් ලෙස සනාථ කරන බව විශ්ලේෂණයන් මගින් පෙන්වා දෙයි. ශ්‍රී ලංකාව මධ්‍යස්ථ ණය ගැති බව සහිත රටක් ලෙස වර්ගීකරණය කළ එකම දර්ශකය වන්නේ දළ ජාතික ආදායමෙහි ප්‍රතිශතයක් ලෙස නොපිය වූ මුළු විදේශීය ණය ප්‍රමාණයයි. සියයට 37.2 ක් වූ එම අගයද පහළ ණය ගැති බව සනාථ කරන දර්ශක අගය වන සියයට 35 ට වඩා වැඩි වී ඇත්තේ සුළු අගයකිනි.

මේ අනුව, ගෝලීය ආර්ථිකයේ පසුබෑමත් සමග බොහෝ රටවල රාජ්‍ය ණය අවදනමට ලක් වී ඇති අවධියක, මෙවැනි ණය දර්ශක අගයයන් වාර්තා කිරීමට ශ්‍රී ලංකාවට හැකි වීම අවධානය ලක්විය යුතු කරුණකි.

(ආ) 2009 සිට රජය විසින් එක්සත් ජනපද ඩොලර් මිලියන 500 ඉක්මවා ණය ලබාගෙන ඇත්තේ ස්වෛරීත්ව බැඳුම්කර මගින් පමණක් වන අතර එම අවස්ථා සංඛ්‍යා සටහන 5 මගින් දක්වා ඇත.

සංඛ්‍යා සටහන 5: එ.ජ. ඩොලර් මිලියන 500 ට ඉහළ රාජ්‍ය ණය ගැනීම්

| දිනය | ප්‍රමාණය (එ.ජ.ඩොලර් මිලියන) |
|---|---|
| 2010 ඔක්තෝබර් 04 | 1,000 |
| 2011 ජූලි 27 | 1,000 |
| 2012 ජූලි 25 | 1,000 |
| 2013 | (-500 ආපසු ගෙවා ඇත) |
| 2014 | 1500 |

මූලාශ්‍රය: ශ්‍රී ලංකා මහ බැංකුව

(ඇ) පැන නොනගී.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
That is okay, Hon. Minister. But, I shall be pleased if you can answer the Questions (a) (iv) and (b).

**ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා**
(மாண்புமிகு (கலாநிதி) சரத் அமுனுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)
"(අ) (iv) ඉහත (i) හි දක්වා ඇති කාල සීමාවන්හිදී ලබා ගෙන ඇති ණය සඳහා පිරිවැය ඉක්මවා ලැබූ ආදායමේ වර්ධනය කොපමණද" කියන ප්‍රශ්නයට පිළිතුර නේද ඔබතුමා අහන්නේ? ඒ ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

2010 සිට 2012 දක්වා කාල සීමාව තුළ රාජ්‍ය ආදායම සියයට 30කින් පමණ වර්ධනය වී ඇති අතර, එම කාල සීමාව තුළ පොලී ගෙවීම් (ණය පිරිවැය) වර්ධනය වී ඇත්තේ සියයට 16කින් පමණි. ඒ විස්තර සංඛ්‍යා වශයෙන් දැක්වුවොත් මෙසේයි. 2010දී රාජ්‍ය ආදායම රුපියල් මිලියන 817,279යි. 2012දී රුපියල් මිලියන 1,051,460යි. ඒ කියන්නේ සියයට 28.7ක වර්ධනයක්.

පොලිය ගෙවීම 2010 දී රුපියල් මිලියන 352,592ක්; 2012 දී රුපියල් මිලියන 408,498ක්. ඒ කියන්නේ සියයට 15.9ක්.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
අතුරු ප්‍රශ්න.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ගරු ඇමතිතුමනි, මගේ පළමුවන අතුරු ප්‍රශ්නය මෙයයි.

ඔබතුමන්ලා දන්නවා, මේ අවුරුද්දේ ආදායම ඇස්තමේන්තු කර තිබෙන්නේ රුපියල් කෝටි 1,53,800කට බව. එයින් ප්‍රාග්ධනය ක්ෂය වීම සහ පොලී ප්‍රමාණය බැලුවාම ආදායමෙන් සියයට 98.1ක් ගෙවන්න තිබෙනවාය කියලා පෙනෙනවා. ඇමතිතුමා මෙතැන කිව්වා, ආදායම වැඩි වෙලා තිබෙන්නේ සියයට 30යි, පොලී ප්‍රමාණය වැඩි වෙලා තිබෙන්නේ සියයට 16යි කියලා. නමුත් එහෙම තිබෙනවා නම්, අවුරුදු තුනකට ඉස්සර වෙලා ඔබතුමන්ලාගේ ආදායමෙන් සියයට 87ක් වුණු එක මේ අවස්ථාවේ සියයට 98.3කට වැඩි වෙන්නේ කොහොමද?

**ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා**
(மாண்புமிகு (கலாநிதி) சரத் அமுனுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)
ගරු මන්ත්‍රීතුමා, අපේ ණය ගෙවන කොට ඒ ණය ප්‍රමාණය ආපසු ගෙවන්න අපි සමහර විට - ඔබතුමන්ලාත් මෙහි සඳහන් කර තිබෙන බැඳුම්කර ආදිය ලබා ගන්නවා, මේ ණය ප්‍රමාණය අඩු කරන්නට. සමහර විට වැඩි පොලියට ගත්ත එකක් අඩු පොලියට බැඳුම්කරයක් අරගෙන මුදා හරිනවා. එතකොට ඒ ණය ප්‍රමාණය වෙනස් වෙනවා.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ඔබතුමා ඊට අදාළ විස්තර සභාගත කරනවාද?

**ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා**
(மாண்புமிகு (கலாநிதி) சரத் அமுனுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)
මම සභාගත කරන්නම්. ඒ විස්තර, සංඛ්‍යා ලේඛන සියල්ලක්ම තිබෙනවා.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ලේඛනවල එහෙම සඳහන්ව තිබුණත්, මම ඇහුවේ සියයට 30යි, සියයට 16යි අතර පරතරය සියයට 87 සිට සියයට 98කට වැඩි වෙන්නේ කොහොමද කියලායි. අනිවාර්යයෙන්ම ආදායම අඩු වෙලා පොලී ප්‍රමාණය වැඩි වෙලා තිබෙනවා. නැත්නම් ඒ ප්‍රතිශතය වෙනස් වෙන්න බැහැ.

**ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා**
(மாண்புமிகு (கலாநிதி) சரத் அமுனுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)
මෙහෙම තමයි අපට ලැබිලා තිබෙන සංඛ්‍යා ලේඛනවල දැක්වෙන්නේ. මම මේක අරගෙන තිබෙන්නේ-

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ඔබතුමා හිටපු මුදල් ඇමතිතුමා නේ.

**ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා**
(மாண்புமிகு (கலாநிதி) சரத் அமுனுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)
මේකේ source එක මම දෙන්නම්. සටහන් කරපු එක තිබෙනවා නේ. මට වෙනම සංඛ්‍යා ලේඛන හදන්න බැහැ නේ, ගරු මන්ත්‍රීතුමා. මෙහි සඳහන්ව තිබෙන්නේ ශ්‍රී ලංකා මහ බැංකුවේ වාර්තාව අනුව.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
පට්ටපල් අසත්‍ය ටිකක් නේ.

**ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා**
(மாண்புமிகு (கலாநிதி) சரத் அமுனுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)
එහෙම කියන්න බැහැ නේ. මේ පළ කරපු සංඛ්‍යා ලේඛන.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ඔබතුමා කිව්වා නම් මම පිළිගන්නවා. මහ බැංකුව කිව්ව නිසා මම ප්‍රතික්ෂේප කරනවා.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
දෙවන අතුරු ප්‍රශ්නය.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
මගේ දෙවන අතුරු ප්‍රශ්නය මෙයයි. ඔබතුමා හිටපු මුදල් ඇමති වශයෙන් දන්නවා, අපේ දළ දේශීය නිෂ්පාදනය වර්ධනය වන බව පෙන්වා තිබුණාට අපේ ආදායම දළ දේශීය නිෂ්පාදනයෙන් සියයට 16.8 සිට සියයට 11.7කට මේ අවුරුද්දේ අඩු වෙලා තිබෙනවාය කියලා. මේ අඩු වීම නිසා ලොකු ප්‍රශ්නයක් ඇති වෙලා තිබෙනවා. ඒ සම්බන්ධයෙන් ඔබතුමන්ලා අනුගමනය කරන්න යන නිවැරදි ක්‍රියා මාර්ගය මොකක්ද?

**ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා**
(மாண்புமிகு (கலாநிதி) சரத் அமுனுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)
ගරු මන්ත්‍රීතුමා, ඔබතුමා අහපු ප්‍රශ්නය ඉතාම හොඳ එකක්. මොකද, අපි රජයක් හැටියට අපේ ආදායම වර්ධනය කර ගන්න ඕනෑ. අප වැඩියෙන්ම ඉලක්ක කර ගෙන තිබෙන්නේ compliance. දැන් තිබෙන හැටියට, අපට ලබා ගන්න පුළුවන් ආදායමෙන් සැලකිය යුතු කොටසක් බදු හැටියට අපට ලබා ගන්න බැරි වෙලා තිබෙනවා. ඒ නිසා අපි දැන් ආදායම් බදු දෙපාර්තමේන්තුව ප්‍රතිසංවිධානය කර ඉලක්ක දීලා තිබෙනවා. මේ වර්ෂයේ අය වැය ඉදිරිපත් කරනකොට ඔබතුමාට පෙනෙයි අපේ ආදායම ඉහළට යන බව. ඒක තව තවත් වැඩි කර ගන්න අපි ක්‍රියා මාර්ග ගන්නවා. ඇත්ත වශයෙන්ම ඔබතුමා කියනවා වාගේ අපේ ආර්ථිකය දියුණු වෙනවා නම් අපේ ආදායම් දියුණු වන නිසා අපේ ආදායම වැඩි වෙන්න ඕනෑ.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ඔබතුමා අවංක ප්‍රයත්නයකින් යුතුව උත්තර දෙන බව මම පිළිගන්නවා. මගේ තුන්වන අතුරු ප්‍රශ්නය වන්නේ-[බාධා කිරීමක්]

**ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා**
(மாண்புமிகு (கலாநிதி) சரத் அமுனுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)
නම් කියලා කිව්වාට ඒකේ වැරැද්දක් නැහැ. භාවිතය හැටියට හරි.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ඔබතුමා සියලුම භාෂා සම්බන්ධයෙන් දක්ෂයෙක් නේ. ඒ නිසා මා ඒ ගැන ප්‍රශ්න කරන්නේ නැහැ.

**ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා**
(மாண்புமிகு (கலாநிதி) சரத் அமுனுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)
බොහොම ස්තුතියි. ඒක පොඩි අතුරු ප්‍රශ්නයක්. ඒක මේ ප්‍රශ්නයට වැදගත් නැහැ.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ඔබතුමන්ලාගේ කැබිනට් මණ්ඩලයේ 66 දෙනෙක් සිටිනවා. එතකොට සාමූහික වග කීමක් තිබෙනවා. දෙවන අතුරු ප්‍රශ්නය විමල් වීරවංශ ඇමතිතුමාටත් ප්‍රශ්නයක් වෙනවා. එතුමා බොහොම ඍජුව කියා තිබෙනවා, මුදල් අමාත්‍යාංශය ගන්නා මුදල් -මුදල් ඇමති ගැන මේ කියන්නේ- මුදල් ඇමති පාවිච්චි කරන මුදල් නාස්තිකාර ලෙස තමයි පාවිච්චි කරන්නේ කියා. මගේ ප්‍රශ්නය ඔබතුමාගේ පිළිතුරත් සමඟ සමාගමීව යනවා. මෙයින් විමල් වීරවංශ ඇමතිතුමා කියන දේ සැබෑ වෙලා කැබිනට් මණ්ඩලයේ 66 දෙනෙකුගේ සාමූහික වගකීම කඩා වැටෙනවා. මම ඒ ප්‍රශ්නය නැවත අහනවා. ඊයේ උත්තරයක් දුන්නේ නැහැ, පැනලා ගියා. පී.බී. ජයසුන්දර සිටිනවාද, මුදල් ඇමති සිටිනවාද නැත්නම් විමල් වීරවංශ මේකෙන් පැනලා යනවාද කියා මම අහනවා.

**ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා**
(மாண்புமிகு (கலாநிதி) சரத் அமுனுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා හොඳට දන්නවා, මට එතුමා වෙනුවෙන් කථා කරන්න බැරි බව. මම කථා කරන්නේ මට මුදල් අමාත්‍යාංශයෙන් ලැබුණු සංඛ්‍යා ලේඛන සම්බන්ධවයි. එතුමා වෙනුවෙන් කථා කරන්න මා බලාපොරොත්තු වන්නෙත් නැහැ.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
කවුරු වෙනුවෙන්ද?

**ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා**
(மாண்புமிகு (கலாநிதி) சரத் அமுனுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)
මම කථා කරන්නේ මුදල් අමාත්‍යාංශයෙන් ලැබී තිබෙන සංඛ්‍යා ලේඛන අනුවයි.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
මුදල් අමාත්‍යාංශයේ ලේකම්තුමා ගැන ද කථා කරන්නේ නැත්තේ?

**ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා**
(மாண்புமிகு (கலாநிதி) சரத் அமுனுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)
ගරු මන්ත්‍රීතුමනි, මේ හැම සංඛ්‍යා ලේඛනයකම මූලාශ්‍රය දමා තිබෙනවා. ඔබතුමන්ලාට කිසියම් සැකයක් තිබෙනවා නම් මේවා හැන්සාඩ්ගත කළ ගමන් මූලාශ්‍රය දක්වා ගිහින් සොයා බලන්න පුළුවන්.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
සාමූහික වග කීමක් තිබෙනවා. කැබිනට් මණ්ඩලය කියනවා, -

**ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා**
(மாண்புமிகு (கலாநிதி) சரத் அமுனுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)
මන්ත්‍රීතුමා, සාමූහික වග කීමක් තිබෙනවා නම් මා විතරක් පෙනී සිටින්නේ මොකටද?

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ප්‍රශ්න අංක 14 -3701/'13- (3), ගරු අනුර දිසානායක මහතා.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

**ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා**
(மாண்புமிகு (கலாநிதி) சரத் அமுனுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දීම සඳහා සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

***ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.***
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ප්‍රශ්න අංක 15-2671/'12 - (1), ගරු සජිත් ප්‍රේමදාස මහතා.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

ගරු ඇමතිතුමනි, පිළිතුරු දෙන්න කල් ගන්න එපා.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දීම සඳහා මාසයක් කල් ඉල්ලා සිටිනවා. [බාධා කිරීමක්] ගරු ඇමතිතුමා විදේශගත වී සිටින නිසායි කල් ඉල්ලන්නේ.

***ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.***
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
දෙවන වටය.

## මහනුවර මහ නගර සභාව : අපද්‍රව්‍ය කළමනාකරණය
கண்டி மாநகர சபை : கழிவு முகாமைத்துவம்
KANDY MUNICIPAL COUNCIL : WASTE MANAGEMENT

3213/'12

**3. ගරු ජෝන් අමරතුංග මහතා (ගරු බුද්ධික පතිරණ මහතා වෙනුවට)**
(மாண்புமிகு ஜோன் அமரதுங்க - மாண்புமிகு புத்திக பதிரண சார்பாக)
(The Hon. John Amaratunga on behalf of the Hon. Buddhika Pathirana)
පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (3) :

(අ) (i) මහනුවර මහ නගර සභාව මඟින් එක්රැස් කරන කැළි කසළ හා ඝන අපද්‍රව්‍ය හාරිස්පත්තුව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ පිහිටි ගොහාගොඩ නමැති ස්ථානයට බැහැර කරනු ලබන බවත්;

(ii) එම අපද්‍රව්‍ය මහවැලි ගඟට එකතු වීමෙන් ප්‍රදේශයේ පානීය ජලය අපවිත්‍ර වීම හා දුර්ගන්ධය හේතුවෙන් ප්‍රදේශවාසීන් විවිධ රෝගී තත්ත්වයන්ට පත්වන බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) මහනුවර මහ නගර සභාව මඟින් කැළි කසළ විධිමත් ලෙස කළමනාකරණය කොට එය සම්පතක් බවට පත්කර ගැනීමට කටයුතු කරන්නේද;

(ii) එසේ නම්, එම දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නො එසේ නම්, ඒ මන්ද?

உள்ளூராட்சி, மாகாண சபைகள் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) கண்டி மாநகர சபையினால் சேகரிக்கப்படும் குப்பை கூளங்கள் மற்றும் திண்மக் கழிவுகள் ஹாரிஸ்பத்து பிரதேச சபை ஆளுகைப் பிரதேசத்தில் கொஹாகொட எனும் இடத்தில் அகற்றப்படுகின்றதென்பதையும்;

(ii) இக்கழிவுகள் மகாவலி கங்கையில் சேர்வதால் பிரதேச மக்களின் குடிநீர் மாசடைதல் மற்றும் துர்வாடை காரணமாக பிரதேசவாசிகள் பலவித நோய்களுக்கு ஆளாகின்றனர் என்பதையும்

அவர் அறிவாரா?

(ஆ) (i) கண்டி மாநகர சபையினால் கழிவுகளை முறைப்படி முகாமை செய்து இதை ஒரு வளமாக மாற்றுவதற்கு நடவடிக்கை மேற்கொள்வாரா என்பதையும்;

(ii) அவ்வாறாயின் அத்திகதி யாது என்பதையும்

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Local Government and Provincial Councils:

(a) Is he aware that -

(i) the garbage and the solid waste that are collected by the Kandy Municipal Council are dumped at a place called Gohagoda in Harispattuwa Pradeshiya Sabha area; and

(ii) the residents of that area contract various diseases consequent to the pollution of the sources of drinking water and the odour emitted as a result of the addition of the waste into the Mahaweli River?

(b) Will he inform this House -

(i) whether action will be taken to get the Kandy Municipal Council to manage the waste properly and turn the waste into a resource; and

(ii) if so, of the date on which it is done?

(c) If not, why?

**ගරු ඉන්දික බණ්ඩාරනායක මහතා (පළාත් පාලන හා පළාත් සභා නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு இந்திக பண்டாரநாயக்க - உள்ளூராட்சி, மாகாண சபைகள் பிரதி அமைச்சர்)
(The Hon. Indika Bandaranayake - Deputy Minister of Local Government and Provincial Councils)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

** සභාමේසය මත තබන ලද පිළිතුර:*
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) (i) ඔව්.

(ii) එවැනි තත්ත්වයක් ඇතිවී නොමැත.

(ආ) (i) ඔව්.

(ii) හැකිතාක් කඩිනමින්.

(ඇ) අදාළ නොවේ.

## තුම්පනේ ප්‍රාදේශීය සභාව : කසළ බැහැර කිරීම
### தும்பனே பிரதேச சபை : கழிவகற்றல்
### THUMPANE PRADESHIYA SABHA : GARBAGE DISPOSAL

3218/'12

**13.ගරු ජෝන් අමරතුංග මහතා (ගරු බුද්ධික පතිරණ මහතා වෙනුවට)**
(மாண்புமிகு ஜோன் அமரதுங்க - மாண்புமிகு புத்திக பதிரண சார்பாக)
(The Hon. John Amaratunga on behalf of the Hon. Buddhika Pathirana)

පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (3) :

(අ) (i) මහනුවර දිස්ත්‍රික්කයේ, ගලගෙදර, තුම්පනේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයෙන් ඉවත් කරන ලද කැළි කසළ හා ඝන අපද්‍රව්‍ය පූජාපිටිය ප්‍රාදේශීය සභාවට අයත්, දික්ඔයවත්ත නමැති ඉඩමට බැහැර කරන බවත්;

(ii) බැහැර කරන අපද්‍රව්‍ය එම ප්‍රදේශයේ ජලයට එකතු වීම නිසා අවට ජනතාව රෝගී තත්ත්වයන්ට මුහුණපා ඇති බවත්;

(iii) අපද්‍රව්‍ය මෙම ස්ථානයට ගෙන ගොස් දැමීම නතර කරන ලෙස අදාළ බලධාරීන් දැනුවත් කළද මේ දක්වා විසඳුමක් නොලැබුණු බවට ප්‍රදේශවාසීන් චෝදනා කරන බවත්;

(iv) කැළි කසළ ප්‍රවාහනය කිරීම හේතුවෙන් අවට මාර්ග කිහිපයක්ද මේ වන විට විනාශ වී ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) කසළ ප්‍රවාහනය නිසා විනාශ වූ මාර්ග සංවර්ධනය කිරීමට කටයුතු කරන්නේද;

(ii) ඉවතලන කැළි කසළ ඉහත සඳහන් ස්ථානයට බැහැර කිරීම නතර කිරීමට අවශ්‍ය කටයුතු සිදු කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නො එසේ නම්, ඒ මන්ද?

உள்ளூராட்சி, மாகாண சபைகள் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) கண்டி மாவட்டத்தின் கலகெதர தும்பனே பிரதேச சபை ஆளுகைப் பிரதேசத்திலிருந்து அகற்றப்படுகின்ற குப்பைகூளங்களும் திண்மக் கழிவுப்பொருட்களும் பூஜாபிட்டிய பிரதேச சபைக்குச் சொந்தமான திக்ஒயவத்த எனும் காணியில் இடப்படுவதென்பதையும்;

(ii) அகற்றப்படுகின்ற கழிவுப் பொருட்கள் அப்பிரதேசத்தில் நீருடன் கலக்கின்றமையால் சுற்றிலுமுள்ள மக்கள் நோய்வாய்ப்படுகின்றனர் என்பதையும்;

(iii) கழிவுப்பொருட்கள் இவ்விடத்தில் இடப்படுவதை நிறுத்துமாறு சம்பந்தப்பட்ட அதிகாரிகள் விழிப்புணர்வூட்டப்பட்டுள்ள போதிலும் இற்றைவரை தீர்வொன்று கிடைக்கவில்லையென பிரதேசத்தில் வாழும் மக்கள் குற்றம் சாட்டுகின்றனரென்பதையும்;

(iv) குப்பைகூளங்கள் ஏற்றிச் செல்லப்படுவதால் சுற்றுப்புறத்திலுள்ள பல வீதிகள் தற்போது சேதமடைந்துள்ளதென்பதையும்

அவர் அறிவாரா?

(ஆ) (i) கழிவுப்பொருட்களை ஏற்றிச் செல்வதால் சேதமடைந்துள்ள வீதிகளை அபிவிருத்தி செய்வதற்கு நடவடிக்கை எடுப்பாரா என்பதையும்;

(ii) அகற்றப்படும் கழிவுப்பொருட்கள் மேலே குறிப்பிடப்பட்டுள்ள இடத்தில் இடப்படுவதை நிறுத்துவதற்குத் தேவையான நடவடிக்கைகளை மேற்கொள்வாரா என்பதையும்

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Local Government and Provincial Councils:

(a) Is he aware that -

[ගරු ජෝන් අමරතුංග මහතා]

(i) the garbage and solid waste disposed of from the area of Galagedara Thumpane Pradeshiya Sabha are dumped at the land called Dikoyawatta of Pujapitiya Pradeshiya Sabha in the Kandy District;

(ii) the people of surrounding area have been exposed to illnesses as the water of the aforesaid area has been contaminated with the waste materials that are disposed of;

(iii) the people of the area make allegations to the effect that a solution has not been materialized up to now, even if the officials concerned were made aware to stop dumping of waste materials in the aforesaid place; and

(iv) some nearby roads also have been damaged by now due to the transportation of garbage?

(b) Will he inform this House -

(i) whether action will be taken to develop the roads that were damaged due to the transportation of garbage; and

(ii) whether arrangements will be made to put an end to the dumping of the garbage at the aforesaid place?

(c) If not, why?

**ගරු ඉන්දික බණ්ඩාරනායක මහතා**
(மாண்புமிகு இந்திக பண்டாரநாயக்க)
(The Hon. Indika Bandaranayake)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) (i) නැත.
(ii) නැත.
(iii) නැත.
(iv) නැත.
(ආ) (i) අදාළ නොවේ.
(ii) අදාළ නොවේ.
(ඇ) අදාළ නොවේ.

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, වරප්‍රසාද ප්‍රශ්නයක් ඉදිරිපත් කරන්න තිබෙනවා.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
Have I been informed of the Question of Privilege? You cannot raise it now. You have to give it in writing.

**ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා**
(மாண்புமிகு எம். ஜோசப் மைக்கல் பெரேரா)
(The Hon. M. Joseph Michael Perera)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ පාර්ලිමේන්තුවට අදාළ දැන් තිබෙන ප්‍රශ්නයක් නම් කල් දෙන්න අවශ්‍ය නැහැ. ඔබතුමා 25වන ස්ථාවර නියෝගය කියවා බලන්න.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
About Privilege matters, you can -

**ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා**
(மாண்புமிகு எம். ஜோசப் மைக்கல் பெரேரா)
(The Hon. M. Joseph Michael Perera)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඔබතුමා 25වන ස්ථාවර නියෝගය බලන්න.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ගරු හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමනි, ඔබතුමා ඒ ගැන මූලාසනය දැනුවත් කරන්න. එවිට එය කුමක්ද කියා සලකා බලා අවස්ථාව ලබා දෙන්න පුළුවන්. [බාධා කිරීමක්] 25වන ස්ථාවර නියෝගය අනුව තමයි මා මේ කියන්නේ, ගරු ජෝශප් මයිකල් පෙරේරා මන්ත්‍රීතුමනි. ප්‍රශ්නය පිළිබඳව මූලාසනය දැනුවත් කරන්න. ඉන් පසුව එයට අවස්ථාව ලබා දෙන්න පුළුවන්.

ස්ථාවර නියෝග 23(2) යටතේ ප්‍රශ්නය ඉදිරිපත් කිරීම. ගරු රනිල් වික්‍රමසිංහ මහතා.

## පෞද්ගලිකව දැනුම් දීමෙන් ඇසූ ප්‍රශ්නය
## தனி அறிவித்தல் மூல வினா
## QUESTION BY PRIVATE NOTICE

### ට්‍රාන්ස්පේරන්සි ඉන්ටර්නැෂනල් ශ්‍රී ලංකා ආයතනය දෙමළ භාෂාවෙන් කටයුතු කරන මාධ්‍යවේදීන් උදෙසා පැවැත්වූ වැඩ මුළුව
### ட்ரான்ஸ்பரன்சி இன்ரநெஷனல் ஸ்ரீலங்கா நிறுவனம் நடத்திய தமிழ்மொழிமூல ஊடகவியலாளர்களுக்கான செயலமர்வு
### WORKSHOP CONDUCTED BY TRANSPARENCY INTERNATIONAL SRI LANKA FOR JOURNALISTS WORKING IN TAMIL LANGUAGE

**ගරු රනිල් වික්‍රමසිංහ මහතා (විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා)**
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க - எதிர்க்கட்சி முதல்வர்)
(The Hon. Ranil Wickremasinghe - Leader of the Opposition)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ට්‍රාන්ස්පේරන්සි ඉන්ටර්නැෂනල් ශ්‍රී ලංකා ආයතනය මඟින් ගවේෂණාත්මක මාධ්‍යය පිළිබඳ මෙරට ජනමාධ්‍යවේදීන් පුහුණු කිරීමේ වැඩසටහන් මාලාවක් පවත්වන ලද අතර, ආරම්භයේදී සිංහල භාෂාවෙන් කටයුතු කරන මාධ්‍යවේදීන් සඳහා එම පුහුණුව ලබා දී තිබෙනවා. දෙවනුව උතුරු, නැඟෙනහිර පළාත්වලින් ප්‍රසිද්ධ

අයදුම් පත් කැඳවා තෝරා ගත් දෙමළ භාෂාවෙන් කටයුතු කරන මාධ්‍යවේදින් පිරිසක් පුහුණු කිරීමේ වැඩ මුළුවක් 2014.05.22 දින සිට පොළොන්නරුවේ ගිරිතලේ හෝටලයේ පැවැත්වෙමින් තිබියදී ආරක්ෂක අමාත්‍යාංශයේ නියෝගය මත එම වැඩ මුළුව වහාම අවලංගු කිරීමට සිදු වන බව හෝටල් පාලනාධිකාරිය මඟින් ට්‍රාන්ස්පේරන්සි ඉන්ටර්නැෂනල් ශ්‍රී ලංකා ආයතනය වෙත දන්වා තිබෙනවා. තවද, හඳුනා ගත් දුරකථන අංක ඔස්සේ එම වැඩ මුළුව පැවැත්වූ ජ්‍යෙෂ්ඨ මාධ්‍යවේදින්ට තර්ජනය කර තිබෙනවා.

නැවතත් 2014 ජූනි 07වැනි දින මීගමුවේ ගෝල්ඩ් සැන්ඩ්ස් හෝටලයේදී ඒ හා සමානව දෙමළ භාෂාවෙන් කටයුතු කරන මාධ්‍යවේදින් සඳහා පවත්වන්නට යෙදුණු වැඩ මුළුවට ද සංවිධානාත්මක පිරිස් පොලිස් ආරක්ෂාව ඇතුව හෝටලයට පැමිණ තර්ජනය කරමින් වැඩ මුළුව නවත්වන ලෙස උද්ඝෝෂණය කර තිබෙනවා. මෙහිදී මීගමුව පොලිස් අධිකාරිවරයා ද පැමිණ වැඩ මුළුව නවතා පිටව යන ලෙස දන්වා තිබෙනවා. එසේ පිටව යන්නේ නම් පමණක් ජීවිත ආරක්ෂාව සැපයිය හැකි බවත් වැඩ මුළුව දිගටම පවත්වන්නේ නම් පොලිස් ආරක්ෂාව ඉවත් කර ගන්නා බවටත් අනතුරු අඟවා තිබෙනවා.

ඒ අනුව උතුරු, නැඟෙනහිර පළාත්වලින් පැමිණි දෙමළ මාධ්‍යවේදින් වැඩ මුළුව නවතා ජීවිතාරක්ෂාව පතා කොළඹ නගරයට පැමිණ ගලදාරි හෝටලයේ රාත්‍රී නවාතැන් ගෙන සිටියදී කිසියම් පිරිසක් විසින් හෝටලය වටලෑමට ඉඩ ඇතැයි කියා විනාඩි කීපයක් ඇතුළත හෝටලයෙන් පිටවන ලෙස කළමනාකාරිත්වය මාධ්‍යවේදින්ට දන්වා තිබෙනවා. මෙම සිදුවීම් මාලාව මේ රටේ තිබෙනවාය කියන ඊනියා සාමය, සංහිඳියාව, නීතියේ ආධිපත්‍යය, ප්‍රජාතන්ත්‍රවාදය, අදහස් ප්‍රකාශ කිරීමේ නිදහස හා මානව හිමිකම් පිළිබඳ සම්පූර්ණ චිත්‍රයක් ඉදිරිපත් කරනවා.

මානව හිමිකම් උල්ලංඝනය කිරීම ගැන රජයට ජාත්‍යන්තර වශයෙන් පවා චෝදනා එල්ල වී ඇති මේ අවස්ථාවේදී උක්ත සිදුවීම් මාලාව පිළිබඳව ගරු අගමැතිතුමාගෙන් ප්‍රකාශයක් බලාපොරොත්තු වෙනවා. ඊට මතු සඳහන් කාරණා ද ඇතුළත් කරන ලෙස ඉල්ලා සිටීමට කැමැතියි.

1. ප්‍රසිද්ධ හෝටලයක නීත්‍යානුකූලව පැවැත්වෙන වැඩ මුළුවක් අවලංගු කිරීමට නියෝග කිරීමට ආරක්ෂක අමාත්‍යාංශයට ඇති බලය, එසේ ක්‍රියා කළ නිලධාරින්ට විරුද්ධව ගනු ලබන ක්‍රියාමාර්ග කුමක්ද?

   ඇත්ත වශයෙන්ම ආරක්ෂක අමාත්‍යාංශයට බැහැ, වැඩ මුළුවක් තහනම් කරන්න. ඒක අද මේ රටේ අපට අහන්න තිබෙන ප්‍රධාන ප්‍රශ්නයක්. මොකක් නිසාද ආරක්ෂක අමාත්‍යාංශය මෙතරම් බලතල අරගෙන ක්‍රියාත්මක කරන්නේ? මේක තහනම් කරන්න පුළුවන් වුණාට අලුත්ගම රැස්වීම තහනම් කරන්න නම් ආරක්ෂක අමාත්‍යාංශයට බැරි වුණා. ඒකට ආධාරත් ලැබුණා.

2. අයුතු ජනරාශිය වළක්වනු වෙනුවට ඊට අනුගත වෙමින් නීත්‍යානුකූල වැඩ මුළුවකට ආරක්ෂාව ලබා දීම ප්‍රතික්ෂේප කරමින් එය නවත්වන ලෙසට අනිසි බලපෑම් කළ මීගමුව පොලිස් අධිකාරිවරයා සම්බන්ධයෙන් ගනු ලබන ක්‍රියා මාර්ග කුමක්ද?

3. සිංහල භාෂාවෙන් කටයුතු කරන මාධ්‍යවේදින්ට වෘත්තිය පුහුණුව ලබා ගැනීමට ඇති අයිතිය දෙමළ භාෂාවෙන් කටයුතු කරන මාධ්‍යවේදීන්ට අහිමි කිරීමට ඇති නීතිමය හෝ ව්‍යවස්ථාමය ප්‍රතිපාදන මොනවාද?

4. මෙම සිදුවීම් සම්බන්ධයෙන් මෙතෙක් ගෙන ඇති නීතිමය පියවර හා එහි ප්‍රගතිය මොකක්ද?

5. ජනමාධ්‍යවේදින්ට බාධාවකින් තොරව තමන් කැමති පරිදි තම වෘත්තීය තත්ත්වය ඉහළ නංවා ගැනීමට ඇති නිදහස පිළිබඳව රජය මඟින් දෙනු ලබන සහතිකය කුමක්ද?

**ගරු දි.මු. ජයරත්න මහතා (අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා)**
(மாண்புமிகு டி.எம்.ஜயரத்ன - பிரதம அமைச்சரும் பௌத்த சாசன, மத அலுவல்கள் அமைச்சரும்)
(The Hon. D.M. Jayaratne - Prime Minister, Minister of Buddha Sasana and Religious Affairs)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගරු විපක්ෂ නායකතුමා විසින් කරන ලද ප්‍රකාශය සම්බන්ධයෙන් නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශයෙන් ලැබිලා තිබෙන තොරතුරු ඔබතුමාට ඉදිරිපත් කිරීමට බලාපොරොත්තු වනවා.

1. 2014.05.22 වන දින පොළොන්නරුව ගිරිතලේ හෝටලයේදී පැවැත් වූ වැඩමුළුවකට බාධා කිරීමක් හෝ අවලංගු කිරීමක් පිළිබඳව පොළොන්නරුව කොට්ඨාසයේ කිසිදු පොලිස් ස්ථානයකට මෙතෙක් කිසිදු පැමිණිල්ලක් ලැබී නොමැති බැවින් පිළිතුරු සැපයීමට නොහැක.

2. අයුතු ජනරාශිය වළක්වනු වෙනුවට ඊට අනුගත වෙමින් නීත්‍යානුකූල වැඩමුළුවකට ආරක්ෂාව ලබා දීම ප්‍රතික්ෂේප කරමින් එය නවත්වන ලෙසට මීගමුව පොලිස් අධිකාරිවරයා විසින් අනිසි බලපෑමක් සිදු කර නොමැත.

3. 2014.06.07 වන දින ගෝල්ඩ් සැන්ඩ්ස් හෝටලයේදී පැවැති දෙමළ භාෂාවෙන් කටයුතු කරන මාධ්‍යවේදින්ට වෘත්තීය පුහුණුව ලබාගැනීමට කිසිදු නීතිමය බාධාවක් සිදු කර නොමැත.

4. 2014.06.07 වන දින මීගමුව, ඒත්තුකාල ගෝල්ඩ් සැන්ඩ්ස් හෝටලයේදී පැවැත්වීමට යෙදුණු උද්ඝෝෂණයට අදාළව උද්ඝෝෂකයන්ට විරුද්ධව කිසිදු පැමිණිල්ලක් ලිඛිතව හෝ වාචිකව මෙතෙක් ලැබී නොමැති බැවින් නීතිමය පියවර ගත නොහැක.

5. ජනමාධ්‍යවේදීන්ට බාධාවකින් තොරව තම වෘත්තීය තත්ත්වයන් සිදු කරගෙන යෑමට පොලිස් දෙපාර්තමේන්තුව වෙතින් හැකි උපරිම ආරක්ෂාව හා සහාය මෙතෙක් ලබා දී ඇති අතර, ඉදිරියටත් අවශ්‍ය සහාය සහ ආරක්ෂාව පොලිස් දෙපාර්තමේන්තුව වෙතින් සැලසෙනු ඇත.

**ගරු රනිල් වික්‍රමසිංහ මහතා**
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremasinghe)

ගරු අගමැතිතුමනි, ඒ ආයතනයෙන් ලිඛිතව ඔබතුමාට දැනුම් දුන්නොත් ඒ විභාගය කරනවා ද? අනික, මා දැන ගන්න කැමැතියි, ජුනි මාසයේ 07වන දින මීගමුව පොලිස් අධිකාරිවරයා ගෝල්ඩ් සැන්ඩ්ස් හෝටලයට ගිහින් මේ අය හම්බ වෙලා කථා කළාද කියලා. එතුමා කියනවා, කවුරුත් එන්න කිව්වේ නැහැ කියලා. එහෙනම් ඒ පොලිස් අධිකාරිතුමාට ගෝල්ඩ් සැන්ඩ්ස් හෝටලයට යන්න හේතුවක් නැහැ. මා දන්නේ නැහැ, පොඩි අඩියක් ගහන්න ගියාද කියලා. අපි අහන්න කැමැතියි, එතුමා ගෝල්ඩ් සැන්ඩ්ස් හෝටලයට ගිහින් මේ කණ්ඩායම මුණ ගැසුණා ද නැද්ද කියලා. එතැන උද්ඝෝෂණයක් වුණේ නැත්නම් යන්න වැඩක් නැහැනේ?

සමහර විට Ginger Beer එකක් ගන්න හරි යන්න ඇති. එහෙම මොකකට හරි යන්න ඇති. ඒක අපට කියනවා නම් හොඳයි. ඒ වාගේම, සිද්ධියට සම්බන්ධ අය ලිපියක් දුන්නොත් ඒ ගැන විභාග කරලා බලනවාද? මේ සිද්ධිය මාධ්‍යයෙන් ප්‍රකාශ වුණා. මම මේ ගරු සභාවට එනතෙක් පොලීසියවත්, ආරක්ෂක අමාත්‍යාංශයවත් ඒක අසත්‍ය ප්‍රකාශයක් කියලා කිව්වේ නැහැ. ඔබතුමාට ආරක්ෂක අමාත්‍යාංශයෙන් අහන්න පුළුවන්ද, මාධ්‍යයේ ප්‍රචාරය වූ ඒ ප්‍රකාශය අසත්‍ය ප්‍රකාශයක් කියලා නොකිව්වේ ඇයි කියලා. මිනිසුන්ට තර්ජනය කරනවා. තර්ජනය කළාට පස්සේ කියනවා, අපි මොකුත් බලා ගන්නේ නැහැ කියලා. මෙහෙම වෙනකොට බේරුවල, අලුත්ගම වැනි ප්‍රදේශවල ප්‍රශ්න ඇති වන එක පුදුමයක් නොවෙයි.

# පාර්ලිමේන්තුවේ රැස්වීම්
## பாராளுமன்ற அமர்வு
## SITTINGS OF THE PARLIAMENT

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு  தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"ස්ථාවර නියෝග අංක 7 හි විධිවිධානවල සහ 2010.07.09 වැනි දින පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද යෝජනාවේ කුමක් සඳහන්ව තිබුණ ද, අද දින රැස්වීම් පැවැත්වෙන කාල වේලාව අ. භා. 1.00 සිට අ. භා. 6.00 දක්වා විය යුතු ය. අ. භා. 6.00ට කථානායකතුමා විසින් ප්‍රශ්නය නොවිමසා පාර්ලිමේන්තුව කල් තැබිය යුතුය."

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)

ප්‍රධාන කටයුතු. අද දින න්‍යාය පත්‍රයේ විෂයය අංක 1, කල් තබන ලද විවාදය. ගරු විජයදාස රාජපක්ෂ මහතා.

Before he starts, the Deputy Chairman of Committees will take the Chair.

***අනතුරුව නියෝජ්‍ය කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වුයෙන්,* නියෝජ්‍ය කාරක සභාපතිතුමා [ගරු මුරුගේසු චන්ද්‍රකුමාර් මහතා] *මූලාසනාරූඪ විය.***

*அதன் பிறகு,* பிரதிச் சபாநாயகர் அவர்கள் *அக்கிராசனத்தினின்று அகலவே,* குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் [மாண்புமிகு முருகேசு சந்திரகுமார் ] *தலைமை வகித்தார்கள்.*

*Whereupon* MR. DEPUTY SPEAKER *left the Chair, and* MR. DEPUTY CHAIRMAN OF COMMITTEES [THE HON. MURUGESU CHANDRAKUMAR] *took the Chair.*

## එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් මහ කොමසාරිස් කාර්යාලය මඟින් ශ්‍රී ලංකාවට එරෙහිව පැවැත්වීමට නියමිත පරීක්ෂණය සිදු නොකළ යුතු බව
## ஐக்கிய நாடுகளின் மனித உரிமைகள் ஆணையாளர் அலுவலகத்தினால் இலங்கைக்கு எதிரான விசாரணை மேற்கொள்ளப்படக்கூடாது
## THE INVESTIGATION AGAINST SRI LANKA BY THE OFFICE OF THE UNITED NATIONS HIGH COMMISSIONER FOR HUMAN RIGHTS SHOULD NOT BE HELD

***කල් තබන ලද විවාදය තවදුරටත් පවත්වනු පිණිස නියෝගය කියවන ලදී.***
*ඊට අදාළ ප්‍රශ්නය - **[2014 ජුනි 17]***
*ஒத்திவைக்கப்பட்ட விவாதம் மீளத் தொடங்குதற்கான கட்டளை வாசிக்கப்பட்டது.*
*சம்பந்தப்பட்ட வினா - [ 2014 யூன் 17]*
*Order read for resuming Adjourned Debate on Question - [17th June,2014]*

"එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් මහ කොමසාරිස් කාර්යාලය මඟින් ශ්‍රී ලංකාවට එරෙහිව පැවැත්වීමට නියමිත පරීක්ෂණය ශ්‍රී ලංකාවේ සංහිඳියාවේ ක්‍රියාදාමයට හා සාමයට හානිකර වන හෙයින්ද, ශ්‍රී ලංකාවේ ස්වාධීනත්වයට, අභිමානයට හා උදාරත්වයට අභියෝගයක් වන හෙයින්ද, එකී පරීක්ෂණය සිදු නොකළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කරයි." [ගරු ජානක බණ්ඩාර මහතා]

"ஐக்கிய நாடுகளின் மனித உரிமைகள் ஆணையாளர் அலுவலகத்தினால் இலங்கைக்கு எதிராக நடத்தப்படவுள்ள விசாரணை இலங்கையின் நல்லிணக்கச் செயற்பாட்டிற்கும் சமாதானத்திற்கும் பாதகமானதாக உள்ளதாலும் இலங்கையின் இறைமைக்கும் கண்ணியத்திற்கும் மேன்மைக்கும் சவாலாக உள்ளதாலும், குறிப்பிட்ட விசாரணை மேற்கொள்ளப்படக்கூடாது என இப்பாராளுமன்றம் தீர்மானிக்கின்றது." [மாண்புமிகு ஜானக பண்டார]

"That this Parliament resolves that the investigation to be conducted against Sri Lanka by the Office of the United Nations High Commissioner for Human Rights should not be carried out on the ground that such a course of action is detrimental to the process of reconciliation and peace and that it erodes the sovereignty, dignity and stature of Sri Lanka." [The Hon. Janaka Bandara]

***ප්‍රශ්නය යළිත් සභාභිමුඛ කරන ලදී.***
*வினா மீண்டும் எடுத்தியம்பப்பட்டது.*
*Question again proposed.*

[අ.භා. 1.51]

**ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා**
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, පාර්ලිමේන්තුවේ ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරුන් නව දෙනෙකු ඉදිරිපත් කරපු මේ යෝජනාව විවාදයට ගන්නා අවස්ථාවේදී මම අපේ ස්ථාවරය ඉදිරිපත් කරමින් මේ ගරු සභාවට කියන්න කැමැතියි, අපේ රටේ වසර 30ක යුද්ධයක් තිබුණු කාලයේ අපේ රටේ විදේශ කටයුතු අමාත්‍යාංශය රාජ්‍යතාන්ත්‍රිකභාවය ආරක්ෂා කර ගෙන දිගින් දිගටම සාර්ථකව ඒ යුද්ධයට මුහුණ දුන්නත්, යුද්ධය අවසාන කාලයේ සිදු වුණාය කියන යුද අපරාධ සහ මානව හිමිකම් පිළිබඳව ජාත්‍යන්තර වශයෙන් පරීක්ෂණයක් පවත්වා අපේ රටේ රාජ්‍ය නායකයා නොහොත් සේනාධි නායකයාගේ ඉඳලා යුද පිටියේ සටන් කළ සෙබළා දක්වා වූ පුද්ගලයන්ට විරුද්ධව ජාත්‍යන්තර පරීක්ෂණයක් කර එයින් ලැබෙන ප්‍රතිඵල අනුව ඔවුන්ට දඬුවම් කළ යුතුයි කියලා මේ වන කොට ජාත්‍යන්තරයේ නීති ක්‍රියාදාමයක් සිදු වෙමින් පවතින බව. දැන් ආණ්ඩුව මේ ක්‍රියාදාමය නතර කරන්න උත්සාහ කරනවා. මේ ක්‍රියාදාමය නතර කරන්නට කලින් මේක ඇති වුණේ කොහොමද කියලාත් මේ ගරු සභාව දැන ගත යුතුව තිබෙනවා.

අපි දන්නවා, යම්කිසි රටක තිබුණු යුද්ධයකදී යුද අපරාධ සිද්ධ වුණා නම් ඒ යුද අපරාධ පිළිබඳව පරීක්ෂණ පවත්වන්න, දඬුවම් කරන්න, ඒවාට මැදිහත් වෙලා කටයුතු කරන්න, ජාත්‍යන්තර අපරාධ අධිකරණයට නඩු ඉදිරිපත් කරන්න එක්සත් ජාතීන්ගේ සංවිධානයට බලයක් තිබෙන බව. ඒ සඳහා මූලික වශයෙන් තිබෙන නීතිය තමයි අපත් සාමාජිකත්වය දරන, ලෝකයේ රටවල් 193ක් සාමාජිකත්වය දරන එක්සත් ජාතීන්ගේ ප්‍රඥප්තිය. මේ එක්සත් ජාතීන්ගේ ප්‍රඥප්තීන්වලට අනුකූලව එක්සත් ජාතීන්ගේ ආරක්ෂක මණ්ඩලය විසින් යම්කිසි යෝජනා සම්මතයක් ඇති කර ගත්තොත් රටකට විරුද්ධව යුද අපරාධ චෝදනා ඉදිරිපත් කරන්න පුළුවන්. හැබැයි, අපි දන්නවා එක්සත් ජාතීන්ට ඒක කරන්න බැරි බව, රුසියාවයි චීනයයි ඉන්න නිසා. ඔවුන්ට නිෂේධ බලය තිබෙනවා. එහෙම තියෙද්දීත් යුද්ධයේ අවසාන කාලයේදී විශේෂයෙන්ම ඇමෙරිකාව ඇතුළු යුරෝපීය රටවල්, ඉන්දියාව වාගේ ලෝකයේ බලගතු රටවල් පෙළ ගැහුණා, කොයි මොහොතේ හෝ ලංකාව යුද අපරාධවලට කොටු කර ගන්නට ඕනෑය කියලා.

ඒ සඳහා පළමුවැනි ක්‍රමය අසාර්ථක වුණු නිසා දෙවැනි ක්‍රමය උත්සාහ කරලා බැලුවා. දෙවැනි එක තමයි රෝම ප්‍රඥප්තිය. අපි රෝම ප්‍රඥප්තියට අත්සන් නොකරපු නිසා, ඒ දෙවැනි ක්‍රමය යටතේත් අප කොටු කර ගන්නටත් එක්සත් ජාතීන්ට හැකියාව ලැබුණේ නැහැ. එහෙම කරන්න බැරි වුණේ එදා අග්‍රාමාත්‍ය රනිල් වික්‍රමසිංහ මැතිතුමා ඒ ගිවිසුමට අත්සන් කිරීම ප්‍රතික්ෂේප කරපු නිසායි. ඊයේ ආණ්ඩු පක්ෂයේ මැති ඇමතිවරු ඒක සමච්චලයට භාජන කරමින්, ඒ ක්‍රියාව උපහාසයට, අපහාසයට ලක් කළා. නමුත් ඒ උදවිය දැන ගන්න ඕනෑ, මේ දක්වා ඒ වාගේ තර්ජනවලින් රට ආරක්ෂා වුණේ එතුමා එදා ගත්ත ඒ තීරණය නිසා බව. නමුත් අපි ස්තුතිවන්ත වනවා, සභානායක ගරු නිමල් සිරිපාල ද සිල්වා ඇමතිතුමාට. එතුමා ඒ තීරණය අගය කරලා ඊයේ කථා කළා. මුල් ක්‍රම දෙක යටතේම අප කොටු කර ගන්න එක්සත් ජාතීන්ගේ සංවිධානයට බැරි වුණු නිසා ඒගොල්ලන් වෙන විකල්පයක් දිහා බලාගෙන හිටියා. මොකක්ද ඒ විකල්පය? විකල්පය මේකයි. රෝම ප්‍රඥප්තියේ 12වැනි වගන්තියේ තිබෙනවා, රෝම ප්‍රඥප්තියට අත්සන් නොකරපු රටක වුණත් මූලික අයිතිවාසිකම් කඩ වෙලාය, යුද අපරාධ සිද්ධ වෙලාය කියලා ඒවා ගැන හොයන්න, පරීක්ෂණ පවත්වන්න ජාත්‍යන්තරයට ඒ රට කැමැත්ත දුන්නොත්, ඒ රටේ යුද අපරාධ පිළිබඳව සොයන්න පුළුවන් කියලා.

අපි දැක්කා, යුද්ධය අවසාන කාලයේ අපේ රටේ ආණ්ඩුවේ මැති ඇමතිවරු විදේශ රටවලට අභියෝග කළ ආකාරය. ඇමෙරිකාවේ රාජ්‍ය ලේකම්ට කිව්වා, "තමුන් තමුන්ගේ වැඩක් බලාගෙන ඉන්න" කියලා. බැන් කී මූන්ට තර්ජනය කළා; බැන් කී මූන්ගේ රූප හදලා පිච්චුවා. මේ සම්බන්ධව කථා කරන්න ලංකාවට කවුද ආවේ? ජෝන් හෝම්ස් ආවා; විජය නම්බියාර් ආවා; නවනීදන් පිල්ලේ ආවා. මේ ඔක්කොම කොටින්ය කියලා ලේබල් ගැහුවා. රට වටේ පෝස්ටර් ඇලෙව්වා. ටෝනි බ්ලෙයාර් කොටියෙක්ය කිව්වා. හිලරි ක්ලින්ටන් කොටියෙක්ය කිව්වා. කොටියාගෙ සල්ලිවලින් තමයි නඩත්තු වෙන්නේ කිව්වා. ඒ විධියට අපි මුළු ජාත්‍යන්තරයම තරහ කර ගත්තා.

2007 පෙබරවාරි මාසයේ 14 වැනි දා මම අතිගරු ජනාධිපතිතුමා හම්බ වෙලා කිව්වා, ඔබතුමා මේ ගෙන යන යුද්ධය බොහොම හොඳයි. මේ යුද්ධය දිනන්න පුළුවන්. මේක අවසන් වෙනවා. හැබැයි, මේ යුද්ධය ඉවර වෙලා යුද ගින්නේ අළු නිවෙන්නත් කලින්, ඔබතුමාට එරෙහිව, රටට එරෙහිව යුද අපරාධ චෝදනා එන බව ඔබතුමා හොඳින් මතක තියා ගන්න කියලා. ඒක මම එදා අතිගරු ජනාධිපතිතුමාට දැනුම් දුන්නා. ඒකට හේතුව තමයි, වගකීමෙන් තොරව, ප්‍රඥාගෝචර නොවන විධියට ජාත්‍යන්තරයට අභියෝග කරන, අපේ රට මෙවැනි අහිතකර තත්ත්වයට ගෙනෙන්න පුළුවන් ප්‍රකාශ කරපු ඇමතිවරු රාශියක් හිටපු එක. එහි ප්‍රතිඵලය විධියට අද අතිගරු ජනාධිපතිතුමා හිර වෙලා ඉන්නවා. කොහොමද මේ හිර වීම වුණේ?

2009 මැයි මාසයේ 19 වැනි දා නන්දිකඩාල්වලදී යුද්ධය ඉවර වෙලා යුද පිටියේ හිටපු සෙබළා තමන්ගේ ගෙදරට යන්න කලින්, යුද පිටියේ හිටපු සේනාධිපතියා කොළඹට එන්න කලින් ආණ්ඩුව බැන් කී මූන් ලංකාවට ගෙන්වා ගත්තා. පැය 48ක් ඇතුළත බැන් කී මූන් ලංකාවට ගෙන්වා ගෙන කිලිනොච්චියට එක්කගෙන ගිහින්, 22 වැනි දා කොළඹට එක්කගෙන ඇවිල්ලා ගිවිසුමක් අත්සන් කළා. ඒ ගිවිසුමේ කොන්දේසි දෙකක් තිබෙනවා. මොකක්ද කොන්දේසි දෙක? එකක් තමයි යුද්ධය අවසාන කාලයේදී උතුරු ප්‍රදේශයේ සිද්ධ වුණු යුද අපරාධ සොයන්න, මානව හිමිකම් ගැන සොයන්න දේශීය වශයෙන් යාන්ත්‍රණයක් ඕනෑය කියන එක. ඒ යාන්ත්‍රණය පත් කරන එක, යාන්ත්‍රණය හදන එක ශ්‍රී ලංකාවේ ජනාධිපතිතුමා භාර ගත්තා. ඒ එක්කම, ශ්‍රී ලංකාවේ ජනාධිපතිතුමා එක්සත් ජාතීන්ගේ මහලේකම්ට බලය දෙනවා, අපි ඒක දේශීය වශයෙන් කළාට මදි, තමුන්නාන්සේ ගිහින් ජාත්‍යන්තර කමිටුවක් දමන්න කියලා. මේ රටේ වුණු යුද අපරාධ පිළිබඳව ඒ කමිටුවෙන් සොයන්න කියලා ඒ බලය දුන්නා. රෝම ගිවිසුමේ 12 වන වගන්තියට අනුව තමයි බැන් කී මූන් ගිහිල්ලා දරුස්මාන් කමිටුව පත් කළේ. එහෙම පත් කරලා බැන් කී මූන් ශ්‍රී ලංකාවේ ජනාධිපතිතුමාට කිව්වා, මට කියපු විධියට, එක්සත් ජාතීන්ගේ සංවිධානයේ මහලේකම් විධියට මම ජාත්‍යන්තර වග වීම පිළිබඳව දරුස්මාන් කමිටුව පත් කළා, දැන් තමුන්නාන්සේගේ යුතුකම ඉෂ්ට කරන්න කියලා. ඒක ඉෂ්ට කරන්න කියනකොට අපට සිද්ධ වුණා, LLRC එක පත් කරන්න. ඒක කැමැත්තෙන් කළත්, ඒක අකමැත්තෙන් කළත් අප පිළිගන්නවා. ඒක හොඳයි. ඒකේ හොඳ නිර්දේශ තිබෙනවා. ඒකේ හොඳ කරුණු අන්තර්ගත වෙලා තිබෙනවා. ඒක අප පිළිගන්නවා. ඒකට සුජාතභාවයක් තිබෙනවා. අපේ ස්වෛරීභාවයට හානියක් නොවන විධියට දේශීය වශයෙන් සිද්ධ කළ යාන්ත්‍රණයක් නිසා ඒක සුජාතයි. නමුත් ප්‍රශ්නය තිබෙන්නේ ඒක නොවෙයි.

ඊට පස්සේ ගිහිල්ලා බැන් කී මූන් මැතිතුමා දරුස්මාන්ට බලය දෙනවා. කොහොමද බලය දෙන්නේ? "මට ශ්‍රී ලංකාවේ ජනාධිපතිතුමා, 2009 මැයි 23 වෙනිදා දුන් mandate එක උඩ කමිටුව පත් කරනවා. පත් කරලා කියනවා, විශේෂඥ කමිටුවක් විධියට උපදෙස් දෙන්න කියලා. උතුරුකරයේ වුණු යුද්ධ අපරාධ මොනවාද කියලා මානව හිමිකම් මොනවාද කියලා වාර්තාවක් හදා දෙන්න කියලා, ඒ බලය දෙනවා. දරුස්මාන් වාර්තාවක් හදනවා. ඒ වාර්තාව හදපු ක්‍රමවේදය ගැන ප්‍රශ්න තිබෙනවා. අප කාටත් ප්‍රශ්නයක් තිබෙනවා. රට ගැන ආදරයක් තිබෙන හැමෝටම ප්‍රශ්නයක් තිබෙනවා. ඒ ප්‍රශ්න මොනවා තිබුණත් අවසාන ප්‍රතිඵලය හැටියට දරුස්මාන් කියනවා, civiliansලා හතළිස්දාහක් මැරුවාය, සුදු කොඩි අර ගෙන එන අය මරන්නේ නැහැයි කියා ආරක්ෂක ඇමතිතුමා, පාලිත කොහොන මැතිතුමා - ආරක්ෂක ලේකම්තුමා- සහතිකයක් දුන්නාය කියලා. ඒ දුන්නාට පස්සේ සුදු කොඩි අරගෙන එනකොටත් වෙඩි තියලා මැරුවාය කියා ඒකේ කියනවා. ආරෝග්‍යශාලාවලට උඩින් බෝම්බ දැම්මාය කියනවා. ලංකාවේ ආණ්ඩුවට විරුද්ධව චෝදනා පහක් තිබෙනවා. ඒ වාගේම ඒක සාධාරණීකරණය කරන්න දරුස්මාන් එල්ටීටීඊ එකට විරුද්ධව චෝදනා 6ක් ඉදිරිපත් කර තිබෙනවා. දැන් ප්‍රශ්නයක් තිබෙනවා. මොකක්ද ප්‍රශ්නය? එල්ටීටීඊ එකට විරුද්ධව ඉදිරිපත් කරපු චෝදනා සම්බන්ධව මොකුත් නැහැ. පියවරක් ගන්න බැහැ. ඒ ගැන කථා කරන්නේ නැහැ. ඇයි? එදා එල්ටීටීඊ එකට නායකත්වය දුන් උදවිය අද ආණ්ඩුව පැත්තේයි ඉන්නේ. එම නිසා එල්ටීටීඊ එකට විරුද්ධව තිබෙන චෝදනා හය අද ආණ්ඩුව පැත්තටම හරවා තිබෙනවා. ආණ්ඩුව පැත්තට කියන්නේ තමුන්නාන්සේලාගේ පැත්තට නොවෙයි. මේ රටේ පුරවැසියන් වන අපේ පැත්තට. ඒක තමයි ආණ්ඩුවකට රාජ්‍ය තාන්ත්‍රිකභාවයක් ඕනෑය කියන්නේ.

ආසියාවේ තිබුණු හොඳම විදේශ සේවයට අයිතිවාසිකම් කියපු අපට අද විදේශ සේවයක් තිබෙනවාද? විදේශ සේවය කියන්නේ මොකක්ද කියා තේරුම් ගත් කී දෙනෙක් ඉන්නවාද ඔතැන? මොනවාද තිබෙන සුදුසුකම්? මෙතැන තිබෙන්නේ ඥාති සංග්‍රහය. දේශපාලන නෂ්ටාවශේෂවලට රක්ෂාවල් දෙන්න ඕනෑ නිසා විදේශීය තානාපති කාර්යාල පුරවලා තිබෙනවා. මේ ඔක්කොම කරලා තිබෙද්දී නවනීදන් පිල්ලේ ඇමෙරිකාවෙන් ගෙනාපු යෝජනා සම්මත කළාට පස්සේ, ගරු මහින්ද සමරසිංහ ඇමතිතුමා රට වෙනුවෙන් විශාල කැප කිරීමක් කළ බව අප දන්නවා. හැබැයි ප්‍රශ්නයක් තිබෙනවා. එතුමා නොවෙයි අපේ රටේ විදේශ කටයුතු ඇමතිතුමා. මොකක්ද, ප්‍රශ්නය? විදේශ කටයුතු ඇමතිතුමාට මෙයට මුහුණ දෙන්න බැරි ඇයි? ජිනීවා ගිහින් ලංකාව වෙනුවෙන් පෙනී සිටින්න විදේශ කටයුතු ඇමතිතුමාට අයිතියක් තිබෙනවාද?

[ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා]

ඒ අයිතිය නැති කර ගත් නිසා ආණ්ඩුවට සිද්ධ වුණා, අපේ ගරු මහින්ද සමරසිංහ මැතිතුමා ජිනීවාවලට යවන්න. ඒක හොඳයි. ඒක හොඳ තීරණයක්. බැරි වෙලාවත් විදේශ කටයුතු ඇමතිතුමා අපේ රට නියෝජනය කරන්න ජිනීවාවලට ගියා නම් අපි ලොකු අමාරුවක වැටෙනවා. අමාරුවක වැටෙන්නේ ඇයි? අපේ රටේ විදේශ කටයුතු ඇමති ගරු මහාචාර්ය ජී.එල්. පීරිස් මැතිතුමා 2011 පෙබරවාරි 15වන දා බැන් කී මූන් වෙත ලිපියක් ලියනවා. මොකක්ද, මේ ලිපියෙන් කියන්නේ? මා දන්නේ නැහැ, එවැනි නියෝගයක් දුන්නාද නැද්ද කියලා. ඒ ලිපියේ තිබෙනවා, "මට අතිගරු මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමා නියෝගයක් දුන්නා"යි කියලා. මොකක්ද? බැන් කී මූන් විසින් ලංකාවේ යුද්ධයේ අවසාන භාගයේ වුණු යුද අපරාධ පිළිබඳව LLRC එකයි, දරුස්මාන් කමිටුවයි පත් කරලා ඉතාමත් සාර්ථකව කටයුතු නිමා කිරීම පිළිබඳව බැන් කී මූන් මැතිතුමාට ස්තුති කරන්නේ අපේ රටේ විදේශ කටයුතු ඇමතිතුමා. එතුමා එදා එක්සත් ජාතීන්ගේ සංවිධානයේ මහ ලේකම්ට දෙකට නොවෙයි, හතරට නැවිලා මේ ලිපිය දීලා රට පාවා දුන්නා. මා මෙම ලිපිය හැන්සාඩගත කිරීම සඳහා **සභාගත*** කරනවා, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි.

පසු ගිය දෙසැම්බර් මාසයේත් මා එම ලිපිය සභාගත කළා. අපේ රට නියෝජනය කරන්න එතුමා ජිනීවාවලට ගියා නම්, මේ ලිපිය පෙන්වූ ගමන් එතුමාට ඉල්ලා අස් වෙලා එන්න වෙනවා. අපේ රටේ ජනතාව නොමඟ යවන්න එපා. මෙරටට ඇවිල්ලා කියන්න එපා, ජාත්‍යන්තරය හිතුවක්කාර විධියට මේ කටයුතු කරනවාය කියලා. ජාත්‍යන්තරය නොවෙයි, ආණ්ඩුව මෙය වරද්දා ගත්ත තැන, ආණ්ඩුව අඥානව කටයුතු කරපු තැන අද මේ ආණ්ඩුව නවක මන්ත්‍රීවරුන් 9දෙනකු බිල්ලට දීලා තිබෙනවා. මේකද, ආණ්ඩුවේ ස්ථාවරය? ආණ්ඩුවේ ස්ථාවරය මෙය නම් ගරු අගමැතිතුමා මේ ගරු සභාවට යෝජනාවක් ගෙනෙන්න ඕනෑ, එහෙම නැත්නම් විදේශ කටයුතු ඇමතිතුමා මේ ගරු සභාවට යෝජනාවක් ගෙනෙන්න ඕනෑ. ගරු අගමැතිතුමා හෝ විදේශ කටයුතු ඇමතිතුමා යෝජනාවක් ගෙනාවාද? නැහැ. පසු පෙළ සිටින නවක මන්ත්‍රීවරුන් 9දෙනකු බිල්ලට දීලා, ඒ පරීක්ෂණ නතර කරන්න කියලා මේ ආණ්ඩුවේ ස්ථාවරය පිළිබඳව යෝජනාවක් අද ගෙනැවිත් තිබෙනවා. ඒ පරීක්ෂණ කටයුතු -

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
Sir, I rise to a point of Order.

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
Yes, Hon. Member, what is your point of Order?

**ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා**
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)
Hon. Azwer, please do not waste my time.

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
I am not wasting your time. It is my duty to point out that you are on the wrong track.

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
That is not a point of Order.- [*Interruption*.]

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
Sir, I have still not finished my point of Order.

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
You did not raise any point. What is your point of Order?

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
Sir, he is referring to the conduct of the Members. The Members have the right to bring in any Motion. He cannot question that. He does not know the Standing Orders. He may be a lawyer but - [*Interruption*.]

**ගරු ශාන්ත බණ්ඩාර මහතා**
(மாண்புமிகு சாந்த பண்டார)
(The Hon. Shantha Bandara)
Sir, I rise to a point of Order.

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
Yes, Hon. Shantha Bandara, what is your point of Order? - [*Interruption*.] Hon. Azwer, please sit down.

**ගරු ශාන්ත බණ්ඩාර මහතා**
(மாண்புமிகு சாந்த பண்டார)
(The Hon. Shantha Bandara)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඊයේ මේ ගරු සභාවේ මංගල සමරවීර මන්ත්‍රීවරයා කථා කරද්දීත්, අද මෙතුමා කථා කරද්දීත්, මේ යෝජනාව නවක මන්ත්‍රීවරුන් ගෙනාපු, පසු පෙළ මන්ත්‍රීවරුන් ගෙනාපු යෝජනාවක් බව කිව්වා. අපි අහනවා, ස්ථාවර නියෝගවලට අනුව - [බාධා කිරීමක්] ඔබතුමා උත්තරයක් දෙන්න.

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
Hon. (Dr.) Wijeyadasa Rajapakshe, you carry on with your speech.

**ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා**
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, පාර්ලිමේන්තු ප්‍රජාතන්ත්‍රවාදය තේරුම් ගන්නට ඕනෑ. පසු පෙළ මන්ත්‍රීවරයාටත් පුළුවන්; ඉස්සරහ පෙළේ සිටින එක්කෙනාටත් පුළුවන්. හැබැයි මේ යෝජනාව ගෙනාවේ කවුද කියලා රටට කියන්නට ඕනෑ. එහි අරමුණ මොකක්ද කියන එක කියන්නට ඕනෑ.

---

*** පුස්තකාලයේ තබා ඇත.**
* *நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
* *Placed in the Library.*

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මෙතැන ප්‍රශ්නය තිබෙන්නේ ඒක නොවෙයි. [බාධා කිරීමක්] Please do not talk nonsense. ජාතික ලැයිස්තුවේ මන්ත්‍රී මස් කටුව ලෙව කන්න දීලා, දැන් නම කියනකොට බුරන්න එපා. [බාධා කිරීමක්] ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, දැන් මෙතැන ප්‍රශ්නය තිබෙන්නේ මේකයි.

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
ප්‍රශ්නයක් නැහැ.

**ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා**
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)
පිස්සෝ වාගේ වැඩ කරපු අයට අහගෙන ඉන්න බැරි ප්‍රශ්නයක් තිබෙන්නේ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මෙතැන ප්‍රශ්නය තිබෙන්නේ මේකයි. මෙතැන ගිවිසුමක් තිබෙනවා. මේ ගිවිසුම අවලංගු කරන්නය කියලා ඉල්ලන්නේ නැහැ. ගිවිසුම තියන්න කියනවා. ගිවිසුම තිබෙද්දී පරීක්ෂණ නතර කරන්න කියනවා. මේක කරන්න පුළුවන්ද? මේක දේශීය නීතිය යටතේ කරන්න පුළුවන්ද? මේක ජාත්‍යන්තර නීතිය යටතේ කරන්න පුළුවන්ද? එහෙම නම් ආණ්ඩුවට යුතුකමක් සහ වගකීමක් තිබුණා, ඇත්ත කියන්න. "අපි වැරැද්දක් කළා. අපි මේ බැන් කී මූන් එක්ක ගහපු ගිවිසුම අවලංගු කරන්නට ඕනෑ. මෙන්න මේවා තමයි හේතු" කියලා ආණ්ඩුවට කියන්න තිබුණා. ආණ්ඩුව එච්චර නිහතමානී වුණේ නැහැ. ආණ්ඩුව ඒක නොකරන්න හේතුවක් තිබෙනවා. මොකක්ද හේතුව? මේ ගිවිසුම ගැන ජනතාව හරියට දැනුවත් කළොත්, මේ රටේ ජනතාව දැන ගන්නවා, මේක 1815 දී උඩරට පාවා දෙන්නට ගහපු දේශද්‍රෝහී ගිවිසුමට වැඩිය බරපතළ ගිවිසුමක් බව; මේක දොන් ජුවන් ධර්මපාල මේ රට පාවා දෙන්නට කරපු වැඩ පිළිවෙළට වැඩිය, ඉන් ඔබ්බට ගිය බරපතළ පාවා දීමක් බව. මේ, අපේ රටේ සේනාධි නායකයාගේ ඉඳලා සොල්දාදුවා දක්වා - එච්චර විතරක් නොවෙයි, මේ ප්‍රශ්නය දුර දිග යනකොට අපට අහම්බෙන් හරි සම්බාධකයක් වැටුණොත්- අපි ඔක්කොටම විඳවන්නට වන ප්‍රශ්නයක්.

ඊයේ අපෙන් ප්‍රශ්න කළා. මේ චෝදනාවේ රතුපස්වල ගැන කියලා නැහැ, මේ චෝදනාවේ රොෂේන් චානකට වෙඩි තියපු එක ගැන කියලා නැහැ. අපි මේක තේරුම් ගත්තේ නැහැ කියලා හිතාගෙන ආණ්ඩුවේ සමහර ඇමතිවරු කථා කළා. මේක ගැන අපි හොඳට දන්නවා. රතුපස්වල සිද්ධිය මේ චෝදනාවේ නැති බව ඇත්ත. හැබැයි, යුද්ධය අවසන් වුණාට පස්සේ සංහිඳියාව ඇති කරනවා කියපු ආණ්ඩුව මොකක්ද කරන්නේ කියලා ජාත්‍යන්තරය බලාගෙන ඉන්නවා. ජාත්‍යන්තරයට අපි බලය දීලා තිබෙනවා, අපි ගැන සොයන්න; අපි ගැන පරීක්ෂා කරන්න ලිඛිතව බලය දීලා තිබෙනවා. අද මොකද වෙලා තිබෙන්නේ? මම ගරු කරනවා. අපේ රටේ අතිගරු ජනාධිපතිතුමා,-

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
Hon. Member, your time is over; please wind up now.

**ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා**
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)
Give me five more minutes, Sir.

**ගරු ජෝන් අමරතුංග මහතා**
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)
Sir, give him five more minutes.

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
Okay. You can continue with your speech.

**ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා**
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අවුරුදු 30ක් තිස්සේ පැවැති කුරිරු යුද්ධය දිනලා අතිගරු ජනාධිපතිතුමා මේ ගරු සභාවට ඇවිල්ලා කරපු කථාව තමයි පසු ගිය අවුරුදු 8 ඇතුළත එතුමා කළ වැදගත්ම කථාව හැටියට මම දකින්නේ. ඒ කථාවේදී මොකක්ද කිව්වේ? "අපි යුද්ධය ඉවර කළා. අපේ රටේ ශබ්ද කෝෂයෙන් සුළු ජාතිය කියන වචනය කැපුවා. මින් ඉදිරියට සුළු ජාතියක් නැහැ. මින් ඉදිරියට ඉන්නේ ඔක්කෝම මහ ජාතිය විතරයි" කියලා කිව්වා. නමුත් අවුරුදු 5ක් තිස්සේ ඇති කරපු සංහිඳියාව කෝ? උතුරුකරයේ ද්‍රවිඩ ජනතාවට අප කෙරෙහි වෛරයක්, කෝපයක් ඇති වන විධියට හන්දි ගානේ සන්දර්ශන පැවැත්වූවා. මුළු ලෝකයේම මාධ්‍යවල ඒවා පෙන්වූවා. ඒවා පෙන්වන අතර තුරේ යාපනයේ අනාථ කඳවුරුවල අහිංසක මිනිස්සු පාන් කෑල්ල ගන්න බෙලෙක් තැටිය අරගෙන ඉන්න හැටිත් ජාත්‍යන්තර මධ්‍යවල පෙන්වූවා. ඒවා පෙන්වන කොට මොළය තිබෙන ආණ්ඩුවක් කල්පනා කරන්න ඕනෑ, අනාගතයේදී මේ ප්‍රශ්න ඇති වෙනවා කියලා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අද මේ රටේ නීතිය රකින්න ඉන්නේ, මේ රටේ යුක්තිය රකින්න ඉන්නේ අපේ ගරු රවුෆ් හකීම් ඇමතිතුමායි. එතුමා තමයි අධිකරණ ඇමතිතුමා. එදා එක්සත් ජාතික පාක්ෂිකයන්ගේ ඡන්ද ටික අරගෙන පාර්ලිමේන්තුවට ඇවිල්ලා ඇමතිකම ගන්න ආණ්ඩුව පැත්තට යන කොට ගරු මෛත්‍රීපාල සිරිසේන ඇමතිතුමා, ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ මහ ලේකම්තුමා වැදගත් ප්‍රකාශයක් කළා. මොකක්ද ඒ වැදගත් ප්‍රකාශය? "මට මේ ලෝකයේ තිබෙන විළි ලජ්ජා නැතිම වැඩේ තමයි එක්සත් ජනතා නිදහස් සන්ධානයේ ඇමතිවරයෙක් කියලා කියන එක". ඔය කර පිනුම් ගහන කට්ටිය ඇවිල්ලා ජනාධිපති වටේට වට වෙලා එදා ආණ්ඩුව හදපු ශ්‍රී ලංකා නිදහස් පාක්ෂිකයෝ ටික එළවලා, තමන්ට ඕනෑ, තමන්ගේ පෞද්ගලික වැඩ කටයුතු ටික කර ගන්න කොට එතුමාට ඒක කියන්න සිද්ධ වුණා. ඒක කිව්ව එක සාධාරණයි; ඒක කිව්ව එක හොඳයි. [බාධා කිරීමක්] බලන්න, දෛවයේ සරදම? එතුමා ඒක කියලා අවුරුදු 4ක්, 5ක් යන කොට අපේ රටේ අධිකරණ ඇමතිතුමා ඊයේ මාධ්‍යයට ප්‍රකාශයක් කරනවා, ඊයේ මේ පාර්ලිමේන්තුවට ප්‍රකාශයක් කරනවා. මොකක්ද කියන්නේ? "මේ ආණ්ඩුවේ ඇමතිවරයෙකු වුණු එක ගැන මට ලජ්ජයි. අද මම අඬනවා මේ ආණ්ඩුවේ ඇමතිවරයෙකු වීම ගැන. අලුත්ගම ප්‍රදේශයේ ඉන්න, දර්ගා නගරයේ ඉන්න මගේ ජනතාව මරනවා. අධිකරණ ඇමති වුණත් මට අද මගේ රටේ ජනතාවට ආරක්ෂාව දී ගන්න බැහැ." කියලා එතුමා කිව්වා. එතුමා, "මගේ ජනතාව" කිව්වාට කමක් නැහැ. අපි කියනවා, "අපේ ජනතාව" කියලා. මුස්ලිම් ජනතාව කාගේවත් ජනතාවක් නොවෙයි. මේ රටේ ජීවත් වන අපේ ජනතාව. අද ජාතිවාදය අවුළුවන්නේ කවුද?

එදා හකීම් මහත්මයා ඒ පැත්තට ගිහින් දහඅටවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයට අත ඔසවලා යකඩ හස්තයක් හදන්න උදවු කළා. අද මේ රටේ ජාතිවාදී කණ්ඩායම් ඇති කරලා

[ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා]

ජාතිවාදය අවුළුවන කොට, සුළු ජාතිකයෝ ගිනි තියන කොට, සුළු ජාතිකයන්ගේ දේපළවලට ගිනි තියන කොට ඒ යකඩ හස්තයේ ආවරණයේ ඉඳගෙන හකීම් මහත්මයාට පසුතැවිලි වෙන්න සිදු වෙලා තිබෙනවා; අඬන්න වෙලා තිබෙනවා. අපි ගරු කරන මුස්ලිම් ජාතික ඇමතිතුමන්ලාට, මන්ත්‍රීතුමන්ලාට මම අනාවැකියක් කියන්නම්. එදා 2007 දී ජනාධිපතිතුමාට කිව්වා වාගේම අනාවැකියක් කියන්නම්. හොඳට මතක තියා ගන්න. සන්ධාන ආණ්ඩුවට ගැවුණු කිසිම ඇමතිවරයෙකුට, කිසිම මන්ත්‍රීවරයෙකුට ඊළඟ මහ මැතිවරණයෙන් පාර්ලිමේන්තුවට එන්න මේ රටේ මුස්ලිම් ජනතාව ඉඩ තියන්නේ නැහැ. ඒක හොඳට මතක තියා ගන්න. හැබැයි ව්‍යතිරේකයක් තිබෙනවා. අපේ ෆවුසි ඇමතිතුමාට ව්‍යතිරේකයක් තිබෙනවා. එතුමාට ජාති භේදයක් නැතුව හැමෝම ඡන්දය දෙන නිසා සන්ධානයෙන් ඉල්ලා ඊළඟ මැතිවරණයෙන් ඔය කට්ටියගෙන් පාර්ලිමේන්තුවට එන්නේ ෆවුසි ඇමතිතුමා විතරයි කියලා මම පැහැදිලිව කියනවා.

අපි ආණ්ඩුවට කියනවා, දේශ ප්‍රේමීන් තමුන්නාන්සේලා විතරක් නොවෙයි කියා. අපත් දේශ ප්‍රේමීන්. තමුන්නාන්සේලා දේශ ප්‍රේමීන් වෙලා තිබෙන්නේ ජේම්ස් පැකර්ට කැසිනෝ දාලා දෙන නිසාද? තමුන්නාන්සේලා දේශ ප්‍රේමීන් වෙලා තිබෙන්නේ මැති ඇමතිවරු එකතු වෙලා කුඩු රාජ්‍යයක් හදනවාටද? තමුන්නාන්සේලා ඇත්ත කුඩුකාරයෝ වසන් කරන්න අපේ ගරු අගමැතිතුමාට බොරුවට චෝදනා කළා. එතුමා වැදගත් දේශපාලනඥයෙක්. එතුමා කවදාවත් වැරදි දෙයකට අනුබල දෙන්නේ නැහැ. එතුමා එදා ශ්‍රී ලංකා නිදහස් පක්ෂය ආරම්භයේ ඉඳලා වැදගත් විධියට දේශපාලනය කළ මැතිතුමෙක්. ඇත්ත කුඩුකාරයෝ ටික වසන් කරන්න ඕනෑ නිසා චෝදනාව එතුමාගේ පැත්තට හැරෙව්වා. ඒ හැරෙව්වේ වෙන දෙයකට නොවෙයි. එතුමාගේ අගමැති තනතුරට තව කීප දෙනෙකු ඇහැ ගහ ගෙන ඉන්නවා. ඒක නිසා එතුමාව කපා දමන්නයි ඒ චෝදනාව ගෙනාවේ. මේ රටේ ජනතාව බබ්බු නොවෙයි. ඇත්ත දේශ ප්‍රේමියා කවුද, බොරු දේශ ප්‍රේමියා කවුද කියලා අපි මේ රටේ ජනතාව දැනුවත් කරනවාය කියන කාරණය තමුන්නාන්සේලාට මතක් කරමින්, මට අවස්ථාව ලබා දීම ගැන ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමාට ස්තුතිවන්ත වෙමින් මගේ කථාව අවසන් කරනවා.

[අ.භා. 2.13]

**ගරු මහින්ද සමරසිංහ මහතා (වැවිලි කර්මාන්ත අමාත්‍යතුමා)**
(மாண்புமிகு மஹிந்த சமரசிங்க -பெருந்தோட்டக் கைத்தொழில் அமைச்சர்)
(The Hon. Mahinda Samarasinghe - Minister of Plantation Industries)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මම ප්‍රථමයෙන්ම ස්තුතිවන්ත වෙනවා, ගරු මන්ත්‍රීවරුන් අට දෙනෙකු සහ ගරු මන්ත්‍රීවරියක විසින් අත්සන් කරලා බොහොම කාලෝචිත යෝජනාවක් අත්‍යවශ්‍ය යෝජනාවක් හැටියට ඉදිරිපත් කිරීමෙන් අනතුරුව, බොහොම වැදගත් විවාදයක් මේ පාර්ලිමේන්තුවේදී පැවැත්වීමට අවස්ථාව ලබා දීම පිළිබඳව.

මගේ කථාව ආරම්භ කිරීමට පෙර මගේ මිත්‍ර ගරු විජයදාස රාජපක්ෂ මන්ත්‍රීතුමාට පිළිතුරක් දෙන්නට ඕනෑ. රෝම ප්‍රඥප්තිය අත්සන් කළේ නැති එක බොහොම හොඳයි. ඒ ගැන විවාදයක් නැහැ. නමුත් ඒ එක්කම අපි මතකයට ගන්නට ඕනෑ කාරණයක් තිබෙනවා. රෝම ප්‍රඥප්තිය අත්සන් කිරීමට ජාත්‍යන්තරයේ වැඩ පිළිවෙළ ආරම්භ කරන විට ඇමෙරිකාව දැවැන්ත වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කළා, අපි වාගේ රටවලට ඇවිල්ලා කියන්න, -සමහර රටවලට ගිහින් බලපෑම් කළා- රෝම ප්‍රඥප්තියට අත්සන් කරන්න එපා කියලා. ඒ එක්කම ඇමෙරිකාව විවිධ රටවලට ගිහින් ඒ රටවල් සමඟ වෙනම ගිවිසුම් අත්සන් කළා, ඒ අයගේ කවුරු හෝ යුද අපරාධවලට චෝදනා ලැබුවා නම්, ඒ රටවල සහාය ජාත්‍යන්තර අධිකරණයට ලබා දෙන්නේ නැහැ කියා, ඒ අයව ජාත්‍යන්තර අධිකරණය ඉදිරියට ගෙන යන්නට. මම දන්නේ නැහැ ඒක බලපෑමක් ඇතිව අත්සන් කළාද, සද් භාවයෙන් අත්සන් කළාද කියලා. කොහොම වුණත් එය හොඳ ක්‍රියාවක්. ඒක හොඳ ක්‍රියාවක්. අපි ඒක හොඳ ක්‍රියාවක් කියලා ඕනෑම තැනකදී කියන්න සූදානම්. [බාධා කිරීමක්] ඇත්ත කියන්න ඕනෑ නේ. ඒ නිසා මම හිතුවා පසු බිමත් කියන්න ඕනෑ කියලා. මොකද, මේ ගෞරවනීය සභාව දැන ගන්න ඕනෑ මොන වාගේ පසු බිමක් සමඟද රෝම ප්‍රඥප්තිය අත්සන් කළේ කියලා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මම කිව්වා අද දින විවාදයට ගැනෙන යෝජනාව කාලෝචිතයි, අත්‍යවශ්‍යයි කියලා. ඇත්ත වශයෙන්ම අද සවස මේ යෝජනාව සම්බන්ධයෙන් ඡන්දය විමසන විට අපට පැහැදිලිවම බලා ගන්නට පුළුවන් මේ ගරු සභාවේ කවුද රට පළමු තැනට තියලා කටයුතු කරන්නේ, කවුද රටට මුල් තැන දෙන්නේ නැත්තේ කියලා. අපි දන්නවා, මේ වන විට නොයෙකුත් රටවල ජාත්‍යන්තර පරීක්ෂණ පවත්වා තිබෙන බව. අපේ රටටත් -ලංකාවටත්- එක කණ්ඩායමක් ආවා. අපේ දේශයේ යුද්ධය කාලයේ සිදුවූ මානව හිමිකම් සිද්ධීන් 19ක් පිළිබඳව සොයා බලන්න උදලාගම කොමිසම පත් කළා. ඒ කොමිසමේ කටයුතු සොයා බලන්න ඉන්දියාවේ හිටපු අග විනිසුරු භග්වතී මහත්මයාගේ ප්‍රධානත්වයෙන් IIGEP කියන කණ්ඩායම පත් කළා. විවිධ රටවලින් නියෝජිතයන් ඒ කණ්ඩායමට පත් කළා. දරුස්මාන්ව පත් කළා, මානව හිමිකම් මහ කොමසාරිස් කාර්යාලයෙන්. ඒක හුඟ දෙනෙක් දන්නේ නැහැ. ඊට පස්සේ තමයි, එක්සත් ජාතීන්ගේ සංවිධානයේ මහ ලේකම්තුමා දරුස්මාන්ව තවත් කණ්ඩායමකට පත් කළේ. කාව හරි නම් කරන්නය කියලා මානව හිමිකම් මහ කොමසාරිස් කාර්යාලයට අප කිව්වාම ඒ අය ලෝකයේ ඉන්න සියලු විශේෂඥයන් අතරින් තෝරා ගත්තේ දරුස්මාන්වයි. දරුස්මාන් සහ භග්වතී මහත්මයා ඇතුළුව, බටහිර රටවල කණ්ඩායමක් ලංකාවට ඇවිල්ලා උදලාගම කොමිසම ජාත්‍යන්තර ප්‍රමිතීන් අනුව කටයුතු කරනවාද නැද්ද කියන එක සොයා බලන්න කටයුතු කළා. අන්තිමට එතැනදී මොකක්ද වුණේ? අවසාන කාලයේදී අතුරු වාර්තාවක් ඉදිරිපත් කළා, භග්වතී මහත්මයාටවත් කියන්නේ නැතිව. ඒ කමිටුවේ සභාපතිට කියන්නේ නැතිව දරුස්මාන් ඇතුළු තවත් දෙදෙනෙක් තුන්දෙනෙනෙක් එක්කාසු වෙලා දේශපාලන වාර්තාවක් හදාගෙන අපේ රජයට ඇඟිල්ල දිගු කරලා අපේ රජය උදලාගම කොමිසමේ වැඩ කටයුතු කරන්න ඉඩ දෙන්නේ නැහැ, අපි දේශපාලන ඇඟිලි ගැසීම් කරනවාය කියලා සභාපතිවරයාටවත් කියන්නේ නැතිව අතුරු වාර්තාවක් ඉදිරිපත් කළා. අන්තිමට භග්වතී මහත්මයා-

**ගරු සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)
දරුස්මාන් ආවාද?

**ගරු මහින්ද සමරසිංහ මහතා**
(மாண்புமிகு மஹிந்த சமரசிங்க)
(The Hon. Mahinda Samarasinghe)
දරුස්මාන් ආවා.

**ගරු සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)
ඇයි, එන්න දුන්නේ?

**ගරු මහින්ද සමරසිංහ මහතා**
(மாண்புமிகு மஹிந்த சமரசிங்க)
(The Hon. Mahinda Samarasinghe)
ඒ කාලයේ අපි දන්නේ නැහැ නේ දරුස්මාන් කවුද කියලා. මානව හිමිකම් මහ කොමසාරිස් කාර්යාලයෙනුයි ඔහුව යෝජනා කළේ. එතුමා ආවේ ඉන්දුනීසියාවේ හිටපු නීතිපතිවරයකු හැටියටයි. අපි නොවෙයි දරුස්මාන්ව තෝරා ගත්තේ. දරුස්මාන්ව තෝරා ගත්තේ මානව හිමිකම් මහ කොමසාරිස් කාර්යාලයෙනුයි. අන්තිමට මේ වාර්තාව නිකුත් කළාම භග්වතී මහත්මයාට සිද්ධ වුණා ඉන්දියාවේ ඉඳලා අපට ලිපියක් නිකුත් කරලා කියන්න, මේ වාර්තාව කිසිසේත් පිළිගන්නේ නැහැ, එතුමා සභාපතිවරයා හැටියට මේ වාර්තාව ප්‍රතික්ෂේප කරනවා කියලා. ඇත්ත වශයෙන් මෙය පැහැදිලි උදාහරණයක්, ජාත්‍යන්තර පරීක්ෂණවලට ඉඩ දෙන කොට මොකක්ද වෙන්නේ කියන එකට. මොකද, මේ ජාත්‍යන්තර පරීක්ෂණ කිසිසේත්-

**ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා**
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)
ගරු ඇමතිතුමනි, ඔබතුමාගේ අවසරය ඇතිව කාරණයක් කියන්න කැමැතියි.

**ගරු මහින්ද සමරසිංහ මහතා**
(மாண்புமிகு மஹிந்த சமரசிங்க)
(The Hon. Mahinda Samarasinghe)
කියන්න, කියන්න. කමක් නැහැ. ඔබතුමා ඉතින් මගේ යාළුවා නේ.

**ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා**
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)
අපේ ලංකාවේ යුද අපරාධ ගැන සොයන්න දරුස්මාන්ව පත් කරන කොටම ඊශ්‍රායලය සහ පලස්තීනය අතර ප්‍රශ්නය සම්බන්ධයෙන් ගාසා තීරයේ යුද අපරාද ගැන සොයන්න කියලා කමිටුවක් පත් කළා. බැන් කී මූන් මහත්තයා, කපටිකමට වෙන්න ඇති, ඒ කමිටුවේ සභාපතිවරයා හැටියට අපේ රටේ එක්සත් ජාතීන්ගේ නියෝජිත පාලිත කොහොන මහත්මයා පත් කළේ. පාලිත කොහොනත්, දරුස්මාන් වාර්තාව විධියේම යුද අපරාධ ගැන වාර්තාවක් දීලා තිබෙනවා. ගාසා තීරය සම්බන්ධව බැන් කී මූන් පත් කරපු කොමිටියේ වලංගුභාවය අපේ රට පිළිගෙන ක්‍රියාත්මක වෙලා දැන් කොහොමද, දරුස්මාන් වාර්තාව විතරක් වැරදියි කියන්නේ?

**ගරු මහින්ද සමරසිංහ මහතා**
(மாண்புமிகு மஹிந்த சமரசிங்க)
(The Hon. Mahinda Samarasinghe)
මන්ත්‍රීතුමා, එතැනත් ඔබතුමා ටිකක් background එක බලන්න. දැනට අවුරුදු ගණනක් තිස්සේ අපි තමයි ඊශ්‍රායලය සම්බන්ධ කමිටුවේ සභාපතිකම දරන්නේ. නිව්යෝර්ක්වල ඉන්න අපේ නිත්‍ය නියෝජිතයාට තමයි - අද ඊයේ සිට නොවෙයි - ජයන්ත ධනපාල ඉන්න කාලයේත්, ඊට පෙරත් සිට දිගටම ඒ අවස්ථාව ලබා දීලා තිබෙන්නේ. ඒ අනුව තමයි පාලිත කොහොන මහත්මයාව එතැනට පත් කරන්නට සිද්ධ වුණේ. ඒ නිසා ඒ පසු බිම දිහාත් අපි හැම වෙලාවේම බලන්න ඕනෑය කියන එක මා කියන්න කැමැතියි.

කොහොම වුණත් මේ ගැන මම දකින්නේ - ඇත්ත වශයෙන්ම මට අනෙක් අය ගැන කියන්න බැහැ - විශාල කුමන්ත්‍රණකාරී වැඩ පිළිවෙළක් හැටියට දේශපාලන න්‍යාය පත්‍රයක් නැවත වතාවක් අපේ රටේ ක්‍රියාත්මක වන බවයි. යුද්ධ කාලයේදී මේ ගොල්ලෝ බැලුවා, අර කණ්ඩායම මෙහාට ගෙන්වලා, ඇඟිලි ගහලා, රජය අපකීර්තියට පත් කරලා, ඒක ජාත්‍යන්තරයට පෙන්වලා තව න්‍යාය පත්‍රයක් ක්‍රියාත්මක කරන්න. ඒක හරි ගියේ නැහැ, මොකද භග්වතී මහත්මයා කෙළින් ඉඳලා ඒකට ඉඩ දුන්නේ නැති නිසා.

අපේ විජයදාස රාජපක්ෂ මන්ත්‍රීතුමා කිව්වා, දරුස්මාන්ගේ Panel එක පත් කළේ ජනාධිපතිතුමායි, එක්සත් ජාතීන්ගේ මහ ලේකම් බැන් කී මූන් මහතායි අත්සන් කළ ගිවිසුමක් පදනම් කර ගෙන කියලා. දැන් මා ළඟ ඒ ගිවිසුම -ඒකාබද්ධ නිවේදනය- තිබෙනවා. මේ ගිවිසුමේ එහෙම කිසිම දෙයක් නැහැ. මම මේ ගිවිසුම හැමෝටම කියවන්න හැන්සාඩගත කිරීම සඳහා **සභාගත*** කරනවා. මේ ලේඛනයේ ඒ වාගේ කිසිම දෙයක් සඳහන් කරලා නැහැ.

**ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා**
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)
මේ ගිවිසුමේ තිබෙනවා,-[බාධා කිරීමක්]

**ගරු මහින්ද සමරසිංහ මහතා**
(மாண்புமிகு மஹிந்த சமரசிங்க)
(The Hon. Mahinda Samarasinghe)
නැහැ, නැහැ. මේ ගිවිසුමේ ඒ ගැන කිසිම සඳහනක් නැහැ. කොහොම වුණත් මම මේ ගිවිසුම හැන්සාඩගත කිරීම සඳහා සභාගත කරන්න කැමැතියි.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඒ වාගේම අපේ රටට අහිතකර දෙයක් මේ ඒකාබද්ධ ගිවිසුමේ කිසිම තැනක අපේ පැත්තෙන් ඇතුළු කරලා නැහැයි කියන එක අපි පැහැදිලිව කියනවා. මේ ගිවිසුම හැන්සාඩගත කළාට පස්සේ මේ රටේ ඕනෑම කෙනකුට කියවන්න පුළුවන්, ඇත්ත වශයෙන්ම මෙතැන මොකක්ද තිබෙන්නේ කියලා.

අපි මේ ඒකාබද්ධ ගිවිසුමේ කියලා තිබෙනවා, මානව හිමිකම් උල්ලංඝනය වීමක් වුණා නම් අපි වගකීමක් දරනවා කියලා. අපි මේ වන කොටත් ඒ වැඩ පිළිවෙළ ආරම්භ කර තිබෙනවා.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු ඇමතිතුමනි, ඒකාබද්ධ ගිවිසුමේ-

**ගරු මහින්ද සමරසිංහ මහතා**
(மாண்புமிகு மஹிந்த சமரசிங்க)
(The Hon. Mahinda Samarasinghe)
මන්ත්‍රීතුමා, ඉක්මනින් කියන්න. මොකද, මාගේ කාලය සීමිත ප්‍රමාණයක් තිබෙන්නේ.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ඇමතිතුමනි, එක්සත් ජාතීන්ගේ මහ ලේකම්වරයා ඔය ඒකාබද්ධ නිවේදනයේ අවසාන වාක්‍ය දෙකේ කියනවා, මානව හිමිකම් කඩවීම් සිදු වුණාය කියලා.

---

** කථාව අවසානයේ පළ කර ඇත.*
** உரையினிறுதியில் தரப்பட்டுள்ளது.*
** Produced at end of speech.*

**ගරු මහින්ද සමරසිංහ මහතා**
(மாண்புமிகு மஹிந்த சமரசிங்க)
(The Hon. Mahinda Samarasinghe)
නැහැ, නැහැ, "alleged" කියලා තිබෙන්නේ.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ශ්‍රී ලංකා රජය කියනවා, "ඔව්, අපි ඒවාට ප්‍රතිකර්ම යොදනවා" කියලා. ඒ වාක්‍ය දෙකෙන්ම -

**ගරු මහින්ද සමරසිංහ මහතා**
(மாண்புமிகு மஹிந்த சமரசிங்க)
(The Hon. Mahinda Samarasinghe)
මම මේක කියවන්නද?

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ඒ වාක්‍ය දෙකෙන්ම-

**ගරු මහින්ද සමරසිංහ මහතා**
(மாண்புமிகு மஹிந்த சமரசிங்க)
(The Hon. Mahinda Samarasinghe)
නැහැ, මම මේක ඔබතුමාට කියවන්නද?

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
මේ වාක්‍ය දෙකෙන්ම ශ්‍රී ලංකාව පිළිගෙන තිබෙනවා, මානව හිමිකම්-

**ගරු මහින්ද සමරසිංහ මහතා**
(மாண்புமிகு மஹிந்த சமரசிங்க)
(The Hon. Mahinda Samarasinghe)
ඔබතුමා වාඩි වෙන්න කෝ, මට මේක කියවන්න දීලා. [බාධා කිරීමක්]

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
Order, please! Hon. Sajith Premadasa, please sit down.

**ගරු මහින්ද සමරසිංහ මහතා**
(மாண்புமிகு மஹிந்த சமரசிங்க)
(The Hon. Mahinda Samarasinghe)
ගරු මන්ත්‍රීතුමනි, දැන් මෙය අහගන්න. මේ ඒකාබද්ධ ගිවිසුමේ අවසාන ඡේදය මා කියවන්නම්.

> "Sri Lanka reiterated its strongest commitment to the promotion and protection of human rights, in keeping with international human rights standards and Sri Lanka's international obligations......"

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
අන්තිම වාක්‍යය කියවන්න.

**ගරු මහින්ද සමරසිංහ මහතා**
(மாண்புமிகு மஹிந்த சமரசிங்க)
(The Hon. Mahinda Samarasinghe)
අන්තිම වාක්‍යය තමයි මා මේ කියවන්නේ.

> ".....The Secretary-General underlined the importance of an accountability process for addressing violations of international humanitarian and human rights law. The Government will take measures to address those grievances."

එච්චරයි මෙතැන කියලා තිබෙන්නේ.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
Hon. Minister, that is an admission.

**ගරු මහින්ද සමරසිංහ මහතා**
(மாண்புமிகு மஹிந்த சமரசிங்க)
(The Hon. Mahinda Samarasinghe)
No, that is not an admission.- [*Interruption*.] Hon. Sajith Premadasa, please read this again and, if you want, I will go through it with you outside the framework of this House.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
No, no, I do not want interpretations.

**ගරු මහින්ද සමරසිංහ මහතා**
(மாண்புமிகு மஹிந்த சமரசிங்க)
(The Hon. Mahinda Samarasinghe)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේ වන කොට අපි මේ ඒකාබද්ධ ගිවිසුමේ හැම පැත්තක්ම ක්‍රියාත්මක කරන්න පටන් ගෙන තිබෙනවා කියන එක මම වගකීමෙන් කියන්න කැමැතියි. උදාහරණයක් හැටියට විජයදාස රාජපක්ෂ මන්ත්‍රීතුමා කිව්වා, Darusman Panel එක පත් කළාට පසුව තමයි, LLRC එක පත් කළේ කියා. ඒක වැරදියි. LLRC එක පත් කර මාස දෙකකට පසුව තමයි, Darusman Panel එක පත් කළේ. එක්සත් ජාතීන්ගේ සංවිධානයේ මහ ලේකම්වරයා ඒ ගැන හිතන්නටත් කලින් අපි දේශීය වශයෙන් අවශ්‍ය පියවර අරගෙන තිබෙනවා. අප කියන්නේ එහෙම දේශීය වැඩ පිළිවෙළක් පටන් ගත් අවස්ථාවකදී ජාත්‍යන්තර පරීක්ෂණයක් කිසිසේත්ම අවශ්‍ය නැහැ කියලායි. මොකද, ජාත්‍යන්තර පරීක්ෂණයක් පවත්වන්නේ සාමාන්‍යයෙන් දේශීය වශයෙන් යම්කිසි දෙයක් කරන්නේ නැති අවස්ථාවකදීයි; දේශීය වශයෙන් ප්‍රතිඵලයක් ලබා ගන්න බැරි වුණු අවස්ථාවකදීයි.

බ්‍රිතාන්‍යයෙන් පත් කළ චිල්කොට් කොමිසම උදාහරණයක් හැටියට ගනිමු. චිල්කොට් කොමිසම පත් කළේ 2009 දීයි. දැනට අවුරුදු 6ක් වෙනවා, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, තවම චිල්කොට් කොමිසමේ වාර්තාව ඉදිරිපත් කර නැහැ. චිල්කොට් කොමිසම ඒ අයට අවශ්‍යයි කියා බ්‍රිතාන්‍ය රජයෙන් ලියුම් කියුම් ඉල්ලුවා; බ්ලෙයාර් අගමැතිතුමායි ජෝර්ජ් බුෂ් ජනාධිපතිතුමායි කළ දුරකථන සාකච්ඡා පිළිබඳ ටේප් එක ඒ අයට අවශ්‍යයි කිව්වා. අන්තිමට මොකක්ද වුණේ? බ්‍රිතාන්‍යයේ විදේශ කටයුතු අමාත්‍යාංශය උසාවියට ගිහින් මේක බ්‍රිතාන්‍යයයි ඇමෙරිකාවයි අතර තිබෙන සම්බන්ධතා දුර්වල කිරීමේ වැඩ පිළිවෙළක් වෙන්න පුළුවන්, ඒ නිසා ඒවා දෙන්න බැහැ කියලා නියෝගයක් ගත්තා. උසාවියෙන් කිව්වා, "දෙන්න ඕනෑ නැහැ" කියා. මේ වන විටත් චිල්කොට් වාර්තාව ඉදිරිපත් කරන්න බැරි වෙලා තිබෙන්නේ ඩේවිඩ් කැමරන් අගමැතිතුමාගේ ආණ්ඩුව ඒ ලියුම් කියුම් එකක්වත් දෙන්නේ නැහැ කියලා තීරණයක් අරගෙන තිබෙන නිසායි. මම ඔබතුමාගෙන් අහන්න කැමැතියි, ඒ ගොල්ලන්ට එක ප්‍රමිතියකුත් අපට තව ප්‍රමිතියකුත් ක්‍රියාත්මක කිරීම සාධාරණද කියා.

ඇත්ත වශයෙන්ම මෙතැන දෙබිඩි පිළිවෙතක් තමයි, ක්‍රියාත්මක වන්නේ. මේ වන විට අප දේශීය කොමිෂන් ගණනාවක් පිහිටුවා තිබෙනවා. තවම අවුරුදු පහක්වත් ගිහින් නැහැ. දේශීය වැඩ පිළිවෙළක් තියෙද්දී ජාත්‍යන්තර කොමිසමක් ඕනෑය කියා අපට විරුද්ධව යෝජනාවක් ගෙනෙනවා. බ්‍රිතාන්‍ය දෙස බලා කියන්නේ නැහැ. ඉරාකයට ගිහින් ඉරාකයේ න්‍යෂ්ටික අවිආයුධ තිබෙනවා, භයානක අවිආයුධ තිබෙනවාය කියා බොරුවට ඒ රට සම්පූර්ණයෙන්ම අවුල් කර තිබෙනවා; විනාශ කර දමා තිබෙනවා. අද BBC එක දැම්මත් CNN එක දැම්මත් දකින්නේ මොනවාද? ඉරාකයේ තිබෙන ප්‍රශ්නය ඒ ගොල්ලෝ තත්පරයෙන් තත්පරය ප්‍රකාශයට පත් කරනවා. ඒ රට අද කෑලි කෑලිවලට කැඩී ගිහින් තිබෙන්නේ. ඉරාකයේ මේ වාගේ භයානක අවිආයුධ තිබෙනවාය කියා ඒක සාධාරණීකරණය කරලා ඊට පසු ඉරාකයට ගිහින් දහස් සංඛ්‍යාවක් මරා දමා ඒ රට සම්පූර්ණයෙන්ම විනාශ කර දමා තිබෙනවා. ඒ වාගේ අවිආයුධ හම්බ වුණේ නැති වුණාට පසු තමයි චිල්කොට් කොමිසම 2009 දී පත් කළේ. තවම ඒ වාර්තාවවත් මේ ගොල්ලන්ට දී ගන්න බැරි වෙලා තිබෙනවා.

1972 දී ඒ අර්බුදකාරී කාලයේදී අයර්ලන්තයේ බෙල්ෆාස්ට් නගරයේ දහතුන් දෙනෙක් අමු අමුවේ මරා දැම්මා. 1972 ඉඳලා අවුරුදු 25ක් කිසිම දෙයක් කළේ නැහැ. සැවයිල් කියන මහත්මයාගේ ප්‍රධානත්වයෙන් කමිටුවක් පත් කරලා අවුරුදු දහහතරක් ගිහින් තමයි අන්තිමට වාර්තාව ඉදිරිපත් කළේ. ඒ වාර්තාව ඉදිරිපත් කරන කොට ඩේවිඩ් කැමරන් මහත්මයා මොකක්ද කළේ? එතුමා බ්‍රිතාන්‍ය පාර්ලිමේන්තුවට ගිහින් කිව්වා, "අප සමාව ගන්නවා" කියා. එතැනින් එහාට කිසිම දෙයක් නැහැ. අවුරුදු 14ක් ගියා, ඒ වාර්තාව ඉදිරිපත් කරන්න. එතකොට නවනීදන් පිල්ලේ මහත්මියට ඕවා මතක් වුණේ නැද්ද කියා මා අහන්න කැමැතියි.

ශ්‍රී ලංකාව විශේෂ සැසි වාරයකට 16 දෙනෙක් අත්සන් කර තිබුණු අවස්ථාවේදී, ඒ කමිටුව රැස් වුණු අවස්ථාවේදී නවනීදන් පිල්ලේ මහත්මිය මොකක්ද කිව්වේ? Video conference එකක් හරහා message එකක් දුන්නා. එතුමිය ඒ වෙලාවේ ජිනීවාහි හිටියේ නැහැ. එතුමිය කිව්වා, ලංකාවේ යුද්ධය අවසන් වෙලා තිබෙනවා, ඒ ගැන ජාත්‍යන්තර පරීක්ෂණයක් ඕනෑය කියා. සාමාන්‍යයෙන් ජාත්‍යන්තර පරීක්ෂණයක් ඉල්ලන්නේ දේශීය පරීක්ෂණයක් තියලා ඒකෙන් ප්‍රතිඵල ඉදිරිපත් කරන්න බැරි වුණු අවස්ථාවලදීයි. නවනීදන් පිල්ලේ මහත්මිය මහ කොමසාරිස් හැටියට ඒ ගැන හිතුවේවත් නැහැ. එතුමියගේ හිතේ හැම වෙලාවේම තිබුණේ ලංකාවට ඇවිත් මේ කුමන්ත්‍රණකාරී වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කරන්නයි. මේවා දැන දැන, දරුස්මාන් වාර්තාව හදපු විධිය දැන දැන, අවුරුදු 20ක් තිස්සේ ඒ සාක්ෂි දුන්නු අයට රැකවරණයක් දෙමින් තමයි මේ දේවල් කළේ. කවුද සාක්ෂි දුන්නේ, ලැබුණු තොරතුරු මොනවාද කියලා අප දන්නේ නැහැ.

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
Hon. Minister, please wind up now.

**ගරු මහින්ද සමරසිංහ මහතා**
(மாண்புமிகு மஹிந்த சமரசிங்க)
(The Hon. Mahinda Samarasinghe)
අවුරුදු 20ක් තිස්සේ කාටවත් ඕක දැක බලා ගන්න බැරි වුණා. ඒ වාගේ පූර්වාදර්ශ තියෙද්දි අප සූදානම් නැහැ, මේ රට පාවා දෙන්න. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මට තව විනාඩියක් දෙන්න.

ඇත්ත වශයෙන්ම රජයක් හැටියට ජනාධිපතිතුමාට තිබුණා මේ යෝජනාව එන්නේ නැති වෙන්න වැඩ කරන්න.

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
ඔබතුමා ඒකට හේතුවත් කියන්න.

**ගරු මහින්ද සමරසිංහ මහතා**
(மாண்புமிகு மஹிந்த சமரசிங்க)
(The Hon. Mahinda Samarasinghe)
මම කියන්නම්.

ඇමෙරිකාවට ගිහින් එතුමාට කියන්න තිබුණා, "හරි, ඔබතුමන්ලා කියන හැම දෙයක්ම අප කරන්න සූදානම්, ඔබතුමන්ලා කියන අය පමණයි අප ආශ්‍රය කරන්නේ, එක්සත් ජාතීන්ගේ සංවිධානය යෝජනාවක් ගේන කොට ඔබතුමන්ලා කියන විධියට තමයි අප අත උස්සන්නේ, ඔබතුමන්ලාට පුළුවන් ඔබතුමන්ලාගේ නාවික හමුදාව ත්‍රිකුණාමලයට ගෙනැත් එතැන රඳවලා තියලා මේ දකුණු ආසියාවේ හැමෝම යටත් කරගෙන කටයුතු කරන්න, ඔබතුමන්ලා කියනවා නම් චීනයත් එක්ක ආශ්‍රය කරන්න අපට ඕනෑ නැහැ, ඔබතුමන්ලා කියනවා නම් රුසියාවත් එක්ක ආශ්‍රය කරන්න ඕනෑ නැහැ, ඔබතුමන්ලා කියනවා නම් කියුබාව එක්ක ආශ්‍රය කරන්න ඕනෑ නැහැ" කියලා. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අන්න ඒ විධියට කිව්වා නම් අද මේ යෝජනාව එන්නේ නැහැ කියන එක මම වග කීමෙන් මතක් කරන්න කැමැතියි.

යුද්ධ කාලයේත් ඒ ගොල්ලෝ, "අරෙහෙට බඩු එවන්න, මේ බඩු එවන්න, එක්සත් ජනපදයේ කණ්ඩායමක් ලංකාවට ගෙනැත් අර තීරුවේ හිර වෙලා ඉන්න අයව බේරා ගන්න අවස්ථාව දෙන්න" කියලා අපට කිව්වාම, එහෙම කළා නම් මොන යුද අපරාධ නඩුවක්වත් අපට පැවරෙන්නේ නැහැ කියන එක මම කියන්න කැමැතියි.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අවසාන වශයෙන් මම ඔබතුමාට මේ කාරණයත් කිව යුතුයි. අපේ රජය සූදානම් නැහැ කිසිම විදේශයකට යටත් වෙලා මේ රට පාලනය කරන්න. අප ස්වාධීන රටක්. අපේ විදේශ ප්‍රතිපත්තිය ස්වාධීන විදේශ ප්‍රතිපත්තියක්. ජී.එල්. පීරිස් ඇමතිතුමා විදේශ කටයුතු ඇමතිවරයා හැටියට ඒ කටයුත්ත හොඳට කරනවා. අපට ලබා දුන්නු මේ නිදහස, අපට ලබා දී තිබෙන මේ ස්ථාවරභාවය, අපට ලබා දුන්නු ආර්ථික සංවර්ධනය අප කවදාවත් අමතක කළ යුතු නැහැ. ජීවිත පරිත්‍යාගයෙන් කටයුතු කළ ඒ රණ විරුවන්ව අපේ රජය කවදාවත් පාවා දෙන්නේ නැහැ කියන කාරණයත් මතක් කරමින් මගේ කථාව අවසන් කරනවා.

*සභාමේසය මත තබන ලද ලියවිල්ල :*
*சபாபீடத்தில் வைக்கப்பட்ட ஆவணம்:*
*Document tabled:*

**26 May 2009**

**Secretary-General**
**SG/2151**
United Nations
**Department of Public Information • News and Media Division • New York**

**JOINT STATEMENT BY UN SECRETARY-GENERAL, GOVERNMENT OF SRI LANKA**

Following is the joint statement by the Government of Sri Lanka and the United Nations at the conclusion of UN Secretary-General Ban Ki-moon's visit to Sri Lanka on 23 May:

At the invitation of Mahinda Rajapaksa, President of Sri Lanka, the Secretary-General of the United Nations, Ban Ki-moon, paid a visit to Sri Lanka. During the course of his visit, he held talks with the President, Foreign Minister as well as other senior leaders of Sri Lanka. During his stay, he also consulted other relevant stakeholders, members of international humanitarian agencies and civil society. The Secretary-General visited the internally displaced persons (IDP) sites at Vavuniya and overflew the conflict area, near Mullaitivu that was the scene of the conflict.

[ගරු මහින්ද සමරසිංහ මහතා]

President Rajapaksa welcomed the Secretary-General as the highest dignitary to visit Sri Lanka in the post-conflict phase. This was a reflection of the close cooperation between Sri Lanka and the United Nations as well as Sri Lanka's commitment to work with the United Nations in the future.

President Rajapaksa and Secretary-General Ban Ki-moon agreed that following the end of operations against the Liberation Tigers of Tamil Eelam (LTTE), Sri Lanka had entered a new post-conflict beginning. In this context, the Government of Sri Lanka faced many immediate and long-term challenges relating to issues of relief, rehabilitation, resettlement and reconciliation. While addressing these critical issues, it was agreed that the new situation offered opportunities for long-term development of the north and for re-establishing democratic institutions and electoral politics after 2 ½ decades. The Government expressed its commitment to ensure the economic and political empowerment of the people of the north through its programmes.

President Rajapaksa and the Secretary-General agreed that addressing the aspirations and grievances of all communities and working towards a lasting political solution was fundamental to ensuring long-term socio-economic development. The Secretary-General welcomed the assurance of the President of Sri Lanka contained in his statement in Parliament on 19 May 2009 that a national solution acceptable to all sections of people will be evolved. President Rajapaksa expressed his firm resolve to proceed with the implementation of the 13th Amendment, as well as to begin a broader dialogue with all parties, including the Tamil parties in the new circumstances, to further enhance this process and to bring about lasting peace and development in Sri Lanka.

President Rajapaksa and Secretary-General Ban Ki-moon discussed a series of areas in which the United Nations will assist the ongoing efforts of the Government of Sri Lanka in addressing the future challenges and opportunities.

With regard to IDPs, the United Nations will continue to provide humanitarian assistance to the IDPs now in Vavuniya and Jaffna. The Government will continue to provide access to humanitarian agencies. The Government will expedite the necessary basic and civil infrastructure as well as means of livelihood necessary for the IDPs to resume their normal lives at the earliest. The Secretary-General welcomed the announcement by the Government expressing its intention to dismantle the welfare villages at the earliest, as outlined in the Plan to resettle the bulk of IDPs and call for its early implementation.

The Government seeks the cooperation of the international community in mine clearing, which is an essential prerequisite to expediting the early return of IDPs.

The Secretary-General called for donor assistance towards the Common Humanitarian Action Plan (CHAP) jointly launched by the Government of Sri Lanka and the United Nations, which supports the relief, shelter and humanitarian needs of those in IDP sites.

President Rajapaksa and the Secretary-General recognized the large number of former child soldiers forcibly recruited by the LTTE as an important issue in the post-conflict context. President Rajapaksa reiterated his firm policy of zero tolerance in relation to child recruitment. In cooperation with the United Nations Children's Fund (UNICEF), child-friendly procedures have been established for their "release and surrender" and rehabilitation in Protective Accommodation Centres. The objective of the rehabilitation process presently underway is to reintegrate former child soldiers into society as productive citizens. The Secretary-General expressed satisfaction on the progress already made by the Government in cooperation with UNICEF and encouraged Sri Lanka to adopt similar policies and procedures relating to former child soldiers in the north.

President Rajapaksa informed the Secretary-General regarding ongoing initiatives relating to rehabilitation and reintegration of ex-combatants. In addition to the ongoing work by the Office of the Commissioner General for Rehabilitation, a National Framework for the Integration of Ex-combatants into Civilian Life is under preparation, with the assistance of the United Nations and other international organizations.

Sri Lanka reiterated its strongest commitment to the promotion and protection of human rights, in keeping with international human rights standards and Sri Lanka's international obligations. The Secretary-General underlined the importance of an accountability process for addressing violations of international humanitarian and human rights law. The Government will take measures to address those grievances.

[අ.භා. 2.32]

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මෙවැනි වැදගත් විවාදයකට එකතු වෙන්න මටත් අවස්ථාවක් ලැබීම ගැන සතුටුයි. මහින්ද සමරසිංහ ඇමතිතුමාගේ කථාවෙන් පසුව කථා කරන්න ලැබීම ගැන මට ඊටත් වඩා සතුටුයි. එතුමාගේ කථාවේ අන්තිමට කිව්වේ ජනාධිපතිතුමාට මේ යෝජනාව එන එක නවත්වන්න තිබුණාය කියන එකයි. ඇමෙරිකාවට නැමුණේ නැති නිසායි මේ යෝජනාව ආවේ කියලා තමයි එතුමා කිව්වේ. ගරු මහින්ද සමරසිංහ ඇමතිතුමාට අමතක වුණා, එතුමාගේ අයියා සහ මල්ලි දෙන්නාම ඇමෙරිකන් පුරවැසියන් බව. ඒවා ගැන කියලා මොකක්ද මේ කියන්න හදන්නේ? කාටවත් දණ ගහලා මේක නවත්වන්න අවශ්‍ය නැහැ. ඔබතුමන්ලා වාගේ අපත් මේ රටට ආදරෙයි. "ශ්‍රී ලංකා නිදහස් පක්ෂයට විතරක් මේ ශ්‍රී ලංකාව බද්ධ කර තිබෙනවා, අපට විතරක් කැක්කුමක් තිබෙනවා" කියලා ඔබතුමන්ලා පෙන්වන්න අවශ්‍ය නැහැ. ඉතාම ඕනෑකමින් අප කියනවා අපත් මේ විදේශ ඇඟිලි ගැසීම් තරයේම ප්‍රතික්ෂේප කරන බව. ඔබතුමන්ලාට වාගේම අපටත් මේ සම්බන්ධයෙන් කැක්කුමක් තිබෙන නිසායි අප මේ කථා කරන්නේ.

මේක ඉතාම කනගාටුදායක තත්ත්වයක්. මේ කනගාටුදායක තත්ත්වය -

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)

Sir, I rise to a point of Order.

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)

Hon. Azwer, what is your point of Order?

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)

Sir, he is referring to the conduct of His Excellency the President. I would also like to say that his brothers are not American citizens, they are Sri Lankan citizens.

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)

Hon. Karunanayake, you carry on.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

යුද්ධය අවසන් කළ ජනරාල් සරත් ෆොන්සේකා මැතිතුමාත් American පුරවැසියෙක් බව දන්නේ නැද්ද? ඒ නිසා මෙවැනි විහිළු කථා කියන්න අවශ්‍ය නැහැ. ඉතාම කනගාටුදායක තත්ත්වයක් තමයි මේ ඇති වෙලා තිබෙන්නේ. මේ වෙලාවේ අපේ රට ඉතාම තීරණාත්මක අවස්ථාවකටයි ඇවිත් තිබෙන්නේ. මේ රට ඉදිරියට ගෙන යන්නේ කොහොමද, එක්කෙනෙක් දෙන්නෙක් ආරක්ෂා කරලා රට පාවා දෙනවාද, නැද්ද කියන එක අප පෙන්වා දී තිබෙනවා. ඒ නිසා අප අහන්න අවශ්‍යයි ඇයි මේක ගේන්නේ කියලා. මහින්ද සමරසිංහ ඇමතිතුමා ඒ ගැන කොටසක් කිව්වා. නොකිව්ව කොටස ගැන තමයි අප අහන්නේ. ඇයි මේක අත්සන් කරලා මේකට ඉඩ දුන්නේ? විදේශ කටයුතු ඇමතිතුමා මේ ගරු සභාවේ ඉන්නවා. එතුමා දන්නවා. මහින්ද සමරසිංහ ඇමතිතුමා මේ සම්බන්ධයෙන් ඉමහත් සේවයක් ඉෂ්ට කරන්න හදලා තිබෙනවා. ඒ වාගේම අපේ ජී.එල්. පීරිස් ඇමතිතුමාත් ඒ වාගේ කරන්න හදලා තිබෙනවා. නමුත් කරන්න බැරි වී තිබෙන කොටස නිසා තමයි අද මේ වාගේ තත්ත්වයක් උද්ගත වෙලා තිබෙන්නේ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඒ නිසා අපි මේ අවස්ථාවේ නැවත මතක් කරන්නේ මේ වාගේ පිට රටින් ඇවිල්ලා ඇඟිලි ගැසීම එක්සත් ජාතික පක්ෂය තරයේම ප්‍රතික්ෂේප කරන බවයි. මේක ගේන්න අඩිතාලම හදලා දීලා තිබෙන්නේ ඔබතුමන්ලායි. අන්න ඒක නිසා තමයි අද මෙවැනි යෝජනාවක් ඉදිරිපත් කරලා මේ විවාදය කරන්නේ. මේ ගැන අපි කියලා තිබෙන දේ මොකක්ද කියලා කරුණාකර බලන්න. එදා ජිනීවාවලට යන කොට විපක්ෂයක් වශයෙන් අපි උදවු කරනවා කියලා කිව්වා. එතකොට ඔබතුමන්ලා කිව්වේ මොනවාද? අපට උදවු අවශ්‍ය නැහැයි කිව්වා. එහෙම ගිහිල්ලා 2012 දී පැරදුණා.

කරුණාකර බලන්න, මේ පසු බිම හරි නැහැ, ඒ නිසා අපේ සහයෝගයත් එක්ක ගියොත් ඊට වඩා හොඳයි නේද කියලා 2013 දීත් කිව්වා. එදත් කිව්වා අවශ්‍ය නැහැයි කියලා. ඒක නැති වුණා. ඒකේ ප්‍රතිවිපාක විධියට තමයි අද මේ යෝජනාව පාර්ලිමේන්තුවට ගෙනැවිත් තිබෙන්නේ. මහින්ද රාජපක්ෂ මැතිතුමා 1989 දී කරපු දෙයින් ඇති වුණ ප්‍රතිවිපාකයක් තමයි මේ පෙනෙන්න තිබෙන්නේ කියන එක මේ අවස්ථාවේ මතක් කරන්න ඕනෑ. එදා ඒ කළා වාගේ එක්සත් ජාතික පක්ෂය පස්ස දොරෙන් ගිහිල්ලා ජිනීවාවලට මෙන්න මේ වාගේ තොරතුරු දුන්නා නම් අන්න ඒක තමයි පාවා දීමක් කියන්නේ. අපි කියන්න ඕනෑ දේ කෙළින් කියනවා. අපි කියලා තිබෙනවා, රට ආරක්ෂා කරමු කියලා. මේක අපේ රට, ඔබේ රට. ඒ නිසා දැන් ඇත්ත තත්ත්වය හෙළිදරව් වීම තමයි තිබෙන්නේ. 1989 දී මහින්ද රාජපක්ෂ මැතිතුමා තමයි මේකට දොර විවෘත කළේ. එදා කිව්ව දේවල් අද සිදු වෙලා තිබෙනවා. නමුත් එදා ආණ්ඩුව විවෘතව කිව්වා, එහෙම සිදුවෙලා තිබෙනවා නම් සොයලා බලමු කියලා. අන්න ඒකෙන් ඇති වෙලා තිබෙන දේ තමයි ඔබතුමන්ලාට මේ කරන්න වෙලා තිබෙන්නේ. මොකද, ත්‍රිවිධ හමුදාවෙන් වැරැද්දක් වෙලා නැහැයි කියලා අපි දන්නවා. පොලීසියෙනුත් කිසි වැරැද්දක් සිදු වෙලා නැහැයි කියලා අපි දන්නවා. ඒක ආණ්ඩුවත් කියනවා. අපත් කියනවා. එහෙම නම් එතැන ප්‍රශ්නයක් නැත්නම්, දේශපාලන නායකත්වයේ එක්කෙනෙක් දෙදෙනෙක් මේ වැඩේ කරලා තිබෙනවා නම් ඒක ආරක්ෂා කරන්නද මේ අවශ්‍යතාව තිබෙන්නේ? අපට තිබෙන්නේ රට ආරක්ෂා කිරීම මිසක් ශ්‍රී ලංකා නිදහස් පක්ෂය ආරක්ෂා කරන්න හරි, සන්ධානය ආරක්ෂා කරන්න හරි නොවෙයි කියන එක මේ අවස්ථාවේදී මතක් කරන්න කැමැතියි. [බාධා කිරීම්] දැන් අපි මේ නායකයින්ට මතක් කරන්න තිබෙන්නේ ලංකාව තිබෙන්නේ ලෝකය ඇතුළේ මිසක්, ලෝකය තිබෙන්නේ ලංකාව ඇතුළේ නොවෙයි කියන එකයි. මෙන්න මේ වැරදි වැටහීම නිසා තමයි ගමේ චණ්ඩියා වාගේ හැසිරෙන්න පටන් ගෙන තිබෙන්නේ. මේ නිසා තමයි හිතන්නේ අපි කෑ ගැහුවාම ලෝකය නැවෙයි කියලා.

මම ඉතාමත් ඕනෑකමින් අහනවා, අපේ අගමැතිතුමාට මෙවැනි යෝජනාවක් ගේන්න බැරි වුණේ ඇයි කියලා. එතුමා දැන් මේ ගරු සභාවේ මේවා අහගෙන සිටිනවා. මන්ත්‍රීවරු නව දෙනෙක් මෙම යෝජනාව ඉදිරිපත් කර තිබෙනවා. ඇයි, අගමැතිතුමාට දෙන්න බැරි වුණේ? එතුමා දක්ෂයි. මේක ලස්සනට කථා කරලා මේ ප්‍රශ්නයට නායකත්වය දීලා වැඩේ කරන්න තිබුණා. එතුමාට බැරි නම් එතුමාව අයින් කරලා, දැන් අගමැති ධුරය දෙනවා කියලා බොරුවට පෙන්වන්න හදන අපේ මෛත්‍රීපාල සිරිසේන මැතිතුමාට දෙන්න තිබුණා. එතුමා ඉතාමත් ජ්‍යෙෂ්ඨ ඇමතිවරයෙක්. එතුමා අගමැති වෙන්න පුළුවන්. නැත්නම් නිමල් සිරිපාල ද සිල්වා මැතිතුමා, නැත්නම් ෆවුසි ඇමතිතුමා නැත්නම් ජෝන් සෙනෙවිරත්න මැතිතුමා, නැත්නම් දිනේෂ් ගුණවර්ධන මැතිතුමා ඉන්නවා. ඇයි නැත්තේ බැසිල් රාජපක්ෂ, ඇයි නැත්තේ නාමල් රාජපක්ෂ? ඇයි මේ අය මේක ගෙනාවේ නැත්තේ? මේ අහිංසක නව දෙනෙකු විතරනේ ඉන්නේ.

දැන් බලන්න, එතැනත් ඉන්නේ කවුද කියලා. ඇත්ත වශයෙන්ම ශාන්ත බණ්ඩාර මන්ත්‍රීතුමා විතරයි real SLFP කියලා කියන්නේ. අනෙක් අය එහෙමද? අචල ජාගොඩගේ මන්ත්‍රීතුමා විමල් වීරවංශ මැතිතුමාගේ පක්ෂයේ. මාලිනී ෆොන්සේකා මහත්මිය ඉල්ලා අස්වීමේ ලිපිය දීලා නැවත ආපු මන්ත්‍රීවරියක්. ඊළඟට ජානක බණ්ඩාර මන්ත්‍රීතුමා ඉන්නවා. එතුමා හොඳ කෙනෙක්. එතකොට උදිත් ලොකුබණ්ඩාර මන්ත්‍රීතුමා වුණත් එක්සත් ජාතික පක්ෂයෙන් තමයි ඇවිල්ලා තිබෙන්නේ. ඊට පස්සේ ඉන්න අස්වර් මන්ත්‍රීතුමා ගැන අහලා වැඩක් නැත. ඊළඟට ජේ.ආර්.පී. සූරියප්පෙරුම මන්ත්‍රීතුමාත් ඒ වාගේමයි. ඊට පස්සේ නිමල් විජේසිංහ මන්ත්‍රීතුමා ඉන්නවා. එක්සත් ජාතික පක්ෂයේ ඡන්දවලින් ඒ පැත්තට පැනලා ගිය අය තමයි හුඟක් ඉන්නේ. ඊළඟට දුමින්ද සිල්වා මන්ත්‍රීතුමා ඉන්නවා. එතුමා ගැන කථා කරන්න අවශ්‍යතාවක් තිබෙනවාද? මේ වාගේ කටයුත්තක් කරන්න අපේ අගමැතිතුමාට දෙන්න බැරි ඇයි? මෙතැන තමයි ප්‍රශ්නය ඇති වෙලා තිබෙන්නේ. කමක් නැහැ, ඒක ඔබතුමන්ලාගේ ප්‍රශ්නයක් නේ.

තමුන්නාන්සේලා දන්නවා, තමුන්නාන්සේලාට මන්ත්‍රීවරු 145ක් ඉන්නවා කියලා. විපක්ෂය විරුද්ධ වුණත් නැතත් මේ යෝජනාව දිනනවා කියන එක තමුන්නාන්සේලා දන්නවා. මෙතැන පෙන්වන්න යන්නේ මේ යෝජනාව සම්බන්ධයෙන් එක්සත් ජාතික පක්ෂයේ ස්ථාවරය මොකක්ද කියන එකයි. අපි අනිවාර්යෙන්ම මේ වෙනුවෙන් පිට රටින් මෙහාට එන අය ප්‍රතික්ෂේප කරනවා. ඒක කිසි සේත්ම අවශ්‍ය නැහැ. නමුත් අපි කියලා තිබෙනවා, ඔබතුමන්ලා මේ කොන්දේසි ඇති කරපු නිසා තමයි මේ සඳහා දොර විවෘත වෙලා තිබෙන්නේ කියලා. ඒක නැවැත්වුවොත්, අපේ සංශෝධනය පිළිගත්තොත් අපේ සම්පූර්ණ සහයෝගය අද සවස 6.00ට පෙන්වනවා කියන එක මා මේ අවස්ථාවේදී නිර්භීතව කියන්න කැමැතියි. ඔබතුමන්ලා කරපු අපරාධය නිසා තමයි අද රට අපකීර්තිය කරා ගෙන යන්න හදන්නේ. [බාධා කිරීමක්] යූඑන්පී එක, ජේවීපී එක මොකක්ද කරන්නේ කියන එක අවශ්‍ය නැහැ. අපි තමයි මේ අවස්ථාවේදී සැබෑ දේශානුරාගයෙන් කටයුතු කරන්නේ. ඔබතුමන්ලා 1989 කරපු වැඩේ දැන් අපි කළා නම් එතැන තමයි ඉවර වෙන්නේ.

දැන් මේකට visa දෙනවා ද, නැද්ද කියන එක ගැන නොවෙයි, සැන්ඩ්‍රා බීඩාස් මැතිනිය මෙහාට එනවා ද, නැද්ද කියන එක ගැන නොවෙයි, නවනීදන් පිල්ලේ මෙහාට ඇවිල්ලා ආයෙත් ජොලියක් ඇති කිරීම ගැන නොවෙයි කථා කරන්න අවශ්‍ය වන්නේ. ඒ ගොල්ලන් US Dollars 1.5 million වෙන් කරලා තිබෙනවා මේක

[ගරු රවි කරුණානායක මහතා]

කරපල්ලා කියලා. ජුනි මාසයේ පටන් ගන්නවා. දැන් අපි හිතමු ඔබතුමන්ලා, අපේ යෝජනාත් එකතු කරගෙන මේක නැවැත්තුවා කියලා. නමුත් ඒ අය නවත්වනවා ද? ඉතින් එහෙනම් මොනවාද කරලා තිබෙන්නේ? ඇයි, ඒ තත්ත්වය ඇති කර තිබෙන්නේ? මේක තමයි සැබෑ තත්ත්වය.

අපේ ගරු විජයදාස රාජපක්ෂ මන්ත්‍රීතුමා බොහොම ඕනෑකමින් පෙන්වා දුන්නා මොනවාද වෙලා තිබෙන්නේ කියලා. බැන් කී මූන් මැතිතුමාට යවාපු ලිපියේ කෙළින්ම කියලා තිබෙන්නේ මොකක්ද? They have basically sacrificed the armed forces for protecting their policies, for their own protection and family protection. Only when they have to sacrifice their own selves, everything becomes bad.

අර කියනවා වාගේ මේ ප්‍රශ්නය ලොක්කන්ට නැතිව බට්ටන්ට දැම්මා නම් ප්‍රශ්නයක් නැහැ. නමුත් බට්ටන්ට නැතිව මේක ලොක්කන්ට යන විට ඉතාමත් ලොකු ප්‍රශ්නයක් වෙලා. මෙන්න මේක තමයි සැබෑ ප්‍රශ්නය. මේ ප්‍රශ්නයට උත්තර දෙන්න පුළුවන්ද අපේ විදේශ කටයුතු ඇමතිතුමාට. මේ ප්‍රශ්නයට මහින්ද සමරසිංහ ඇමතිතුමාට උත්තර දෙන්න පුළුවන්ද? මෙන්න මේකට තමයි රට පාවා දෙනවා කියලා කිව්වේ. 1815 උඩරට ගිවිසුම අත්සන් කළාට පස්සේ මේක තමයි සැබෑ පාවා දීම කියන්නේ. දේශානුරාගයක් තිබෙන කෙනෙක් මේ වාගේ දෙයක් කරනවාද? මෙන්න මේක තමයි අපි අහන්නේ.

මේ ලිපිවල තිබෙන දේවල් මා නැවත කියන්නේ නැහැ. මා ඒවා කියෙව්වා. ඒවාට උත්තර දුන්නා. නමුත් මෙතැන කියන්නේ "a credible domestic investigation" කියලායි. මේකට තමයි ඔබතුමන්ලා දොර විවෘත කර තිබෙන්නේ. ඇයි, මේක කරන්න ඉඩ දුන්නේ? කියන්න තිබුණා නේ, "අපට හංගන්න කිසිම දෙයක් නැහැ. අපේ කවුරුත් වැරදි කරලා නැහැ" කියලා. වැරදි කළා කියලා ඔප්පු වෙලා තිබෙනවා නම් ඒ කරලා තිබෙන්නේ ත්‍රිවිධ හමුදාවත්, පොලීසියත් නොවෙයි. ඒක කරලා තිබෙන්නේ රජයේ ඉන්න එක් කෙනකු, දෙන්නකු මිසක වෙන කවුරුවත් නොවෙයි කියන එක විපක්ෂය වශයෙන් අපි මෙතැනදී මතක් කරනවා. අපේ කාර්ය භාරය වන්නේ රටත්, ත්‍රිවිධ හමුදාවත් ආරක්ෂා කිරීම මිස ආණ්ඩුව ආරක්ෂා කරන එක නොවෙයි කියන එකත් අපි මෙතැනදී මතක් කරනවා. [බාධා කිරීම්] ඔබතුමන්ලා කෑ ගැහුවාට වැඩක් නැහැ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඔබතුමාගේ අවසරය පරිදි, මා **සභාගත*** කරනවා, 2009 මැයි 26 දිනැති "Joint Statement by UN Secretary-General, Government of Sri Lanka" නමැති ඒකාබද්ධ නිවේදනය.

එහි මෙසේ සඳහන් වෙනවා:

> "President Rajapaksa expressed his firm resolve to proceed with the implementation of the 13th Amendment, as well as to begin a broader dialogue with all parties, including the Tamil parties in the new circumstances, to further enhance this process and to bring about lasting peace and development in Sri Lanka."

This obviously opened the door for a Thirteen plus solution. This promise was not given by anybody else, but you all.

I am only trying to give five or six facts that have led to the investigation that has come up today owing to the breach of the confidence they had in the Government of Sri Lanka under President Mahinda Rajapaksa. That is why I tabled that Joint Statement by the UN Secretary-General and the Government of Sri Lanka.

Then, there is an article written by the Hon. (Prof.) Rajiva Wijesinha, a person who has credible information. He headed the Peace Secretariat. He had written a lovely article published on the 19th of May, 2014. Sir, with your permission, I **table*** it.

Sir, let me quote two paragraphs from that article:

> "I had been summoned there urgently, because some Western nations had been trying to get sufficient signatures to hold a Special Session of the Human Rights Council in an attempt to stop our imminent conquest of the Tigers. By the time I got to Geneva though, the danger was over, and there was much to celebrate. The superb diplomacy of Dayan Jayatilleka, our Representative in Geneva, supported admirably by the international coalition he had built up, had ensured that the West did not get the required number of signatures, and the danger passed."
>
> "But before that I, had been asked up to Kandy, for dinner at President's House where Ban Ki-Moon was being entertained."

කවුද බැන් කී මූන් කියන්නේ? එතුමාට විරුද්ධ වෙලා, ඔබතුමන්ලාගේ ආණ්ඩුවේ කෙනකු මැරෙන්නත් ගියා. මහින්ද රාජපක්ෂ මහත්මයා තැඹිලි ටිකක් පොවලා ආරක්ෂා කර ගත්තා. අද එවැනි පුද්ගලයින්ට විරුද්ධව කථා කරනවා.

The Hon. (Prof.) Rajiva Wijesinha further says in his article, I quote:

> "When I got there, the great man was deep in discussion with Foreign Ministry officials, and it took some time before they emerged with a joint communiqué, which was duly signed before dinner."

එතැනදී රාජීව විජේසිංහ කියනවා, "මේක අත්සන් කරන්න මම එපා කිව්වා. දයාන් ජයතිලක මහත්මයාත් මේක අත්සන් කරන්න එපා කිව්වා" කියලා. එතැන හිටපු සියලුම විශේෂ නියෝජිතයින් මේක අත්සන් කරන්න එපාය කිව්වාට මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමා කිව්වා ලු, "නැහැ, මේක අත්සන් කරන්න ඕනෑ" කියලා. මේ මන්ත්‍රීතුමන්ලා කරන හෙළිදරවු කිරීම තුළින් අපට පේනවා, අද මෙවැනි ආකාරයෙන් අපේ රටට ඇඟිලි ගහන්න විදේශිකයන්ට අවස්ථාව ඇති කර දී තිබෙන්නේ, ඔබතුමන්ලාට කරන්න එපා කියපු දේ කිරීම තුළිනුයි කියලායි. මා අහනවා, රාජීව විජේසිංහ-

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
Please wind up now, Hon. Member, your time is over.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
Sir, I have been allotted 15 minutes.

---

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
Yes, but it is over now.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
Sir, I will take just five more minutes.

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
No, I cannot give you another five minutes unless a Member from your side gives it.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
Then, I will take only three more minutes.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ගරු ජී.එල්. පීරිස් මැතිතුමා විසින් 2011 පෙබරවාරි 15වන දින බෑන් කී මූන්ට යවන ලද ඒ ලියුම මා **table*** කරනවා.

ඉන් පසු ඉන්දියාවට පස් ගමනක් ගිහිල්ලා දහතුන්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ඉදිරියට ගෙන යනවාය කියලා පෙන්වා දී තිබුණා. ඉන් පසු LLRC වාර්තාව තුළින් මේක ක්‍රියාත්මක කරනවා කියලා කිව්වා. දැන් මෙතැන ඔබතුමන්ලාගේ කථා තුළින්ම යම් වෙනසක් තිබෙනවා. මහින්ද සමරසිංහ කියනවා, ජිනීවාවලට ගිහිල්ලා මේකේ සියයට 99ක් ඉවර කළා කියලා. ඉන් පසු ජී.එල්. පීරිස් ඇමතිතුමා කියනවා, මේකේ සියයට 50ක් ක්‍රියාත්මක කරලා තිබෙනවා කියලා.

**ගරු ලලිත් දිසානායක මහතා (සෞඛ්‍ය නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு லலித் திசாநாயக்க - சுகாதார பிரதி அமைச்சர்)
(The Hon. Lalith Dissanayake - Deputy Minister of Health)
Sir, I rise to a point of Order. - [*Interruption.*]

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
Order, please! There is a point of Order being raised. - [*Interruption.*] What is the point of Order, Hon. Lalith Dissanayake?

**ගරු ලලිත් දිසානායක මහතා**
(மாண்புமிகு லலித் திசாநாயக்க)
(The Hon. Lalith Dissanayake)
ස්ථාවර නියෝග අනුව මන්ත්‍රීතුමන්ලාට, ඇමතිතුමන්ලාට ආමන්ත්‍රණය කරන ක්‍රමයක් තිබෙනවා. මහින්ද සමරසිංහ කියලා කෙනෙක් නැහැ. එතුමා ගරු අමාත්‍යවරයෙක්. එහෙම ආමන්ත්‍රණය කිරීම හරි වැරදියි. මන්ත්‍රීවරුන්ට, ඇමතිවරුන්ට අපහාස කරන්න එපා.

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
ගරු ඇමතිතුමා කියලා කියන්න.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ලලිත් වීරතුංග මැතිතුමා කියනවා, සියයට 50ක් ක්‍රියාත්මක කරලා තිබෙනවා කියලා. මේ කථා තුළින් අපට පෙනෙනවා, මෙතැන වෙනස්කමක් තිබෙනවා කියලා. ඒ නිසා තමයි අද ජාත්‍යන්තර ලෝකය-

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
Please wind up now.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
Just give me two more minutes, Sir.

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
Hon. Ajith P. Perera, can you give him two minutes from your time?

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
Give him one minute, Sir.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
Okay, I will take one minute more.

ඒ විතරක් නොවෙයි. මෙහි තවත් දේවල් අඩංගු වෙලා තිබෙනවා. එදා අර්ථ සාධක අරමුදල ආරක්ෂා කරන්න ඕනෑය කියා කළ උද්ඝෝෂණයේදී රොෂෙන් චානක මරපු එක සම්බන්ධයෙන්, රතුපස්වල සිද්ධියේදී මරපු අය සම්බන්ධයෙන්, ධීවරයින්ගේ තෙල් සහනාධාරය නොලැබීම සම්බන්ධයෙන් කළ උද්ඝෝෂණයේදී මරපු ඇන්තනි මහතා සම්බන්ධයෙන්, අග්‍ර විනිශ්චයකාරතුමිය සම්බන්ධයෙන්, විශ්වවිද්‍යාල ශිෂ්‍යයන්ට ගහපු දේ සම්බන්ධයෙන්, සරත් ෆොන්සේකාට court-martial එක නීත්‍යනුකූල නැහැ කියලා කියපු දේ සම්බන්ධයෙන්, බැංකු කොල්ල කා ඉන්දියාවෙන් ඕනෑය කියලා කියන කේපී වාගේ අය ඒ රටට දෙන්න ඕනෑය කියලා අත් අඩංගුවට නොගැනීම සම්බන්ධයෙන් තමයි අද ජාත්‍යන්තර ලෝකය කියන්නේ ලංකාව banana republic එකක්, ඒ නිසා කියන දේ විශ්වාස කරන්න බැහැ කියලා. ඒ නිසා තමයි මෙවැනි දෙයක් කරන්න ඕනෑ වන්නේ. දැන් මේ පාර්ලිමේන්තුව දැන ගනීවි, මේ වාගේ විමර්ශනයකට අප ලක් කරලා තිබෙන්නේ ඇයි කියලා. මෙවැනි විමර්ශනයකට අප ලක් කරලා තිබෙන්නේ මේ ආණ්ඩුව දීලා තිබෙන පොරොන්දු ක්‍රියාත්මක කරන්නේ නැති නිසායි. රටේ කීර්ති නාමය නැති වෙලා තිබෙන්නේ ඔබතුමන්ලාගේම කටයුතු නිසායි. ඒ නිසා සියලු දෙනාම ඒක රාශි වෙලා එක්සත් ජාතික පක්ෂයෙන් ඉදිරිපත් කරලා තිබෙන සංශෝධනවලට සහයෝගය දෙන්න. මේ

---

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

යෝජනාවත් එක්ක එකතු වෙලා, සුද්දාට අපේ රටට ඇවිල්ලා අපේ රටේ දේවල්වලට ඇඟිලි ගහන්න ඉඩ නොදෙන්න කටයුතු කරන්න අපටත් උදවු කරන්න කියන එක මේ අවස්ථාවේදී ඉල්ලා සිටිමින් මම නිහඬ වනවා.

[අ.භා. 2.46]

**ගරු මෛත්‍රීපාල සිරිසේන මහතා (සෞඛ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு மைத்திரிபால சிறிசேன - சுகாதார அமைச்சர்)
(The Hon. Maithripala Sirisena - Minister of Health)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ආණ්ඩු පක්ෂයේ අපේ සහෝදර මන්ත්‍රීවරු කීප දෙනෙකු ඉදිරිපත් කළ ඉතාමත් වැදගත් යෝජනාවක් පිළිබඳවයි අපි අද කථා කරන්නේ. අපට මේ යෝජනාව පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට හේතු වූ පසු බිම පිළිබඳව ප්‍රධාන වශයෙන්ම අවධානය යොමු කිරීම ඉතාමත්ම අවශ්‍යයි. ඊයේ සිට මේ සම්බන්ධයෙන් විපක්ෂය ඉදිරිපත් කළ තර්ක බොහෝ වෙලාවට අපි අහගෙන සිටියා. විපක්ෂයේ සියලු තර්කවල අරමුණ වන්නේ, අපේ රටේ ස්වාධීනත්වය ගැන නොසලකා අපේ රට තුළට විදේශීය නියෝජිත පිරිසකට පැමිණීමට ඉඩ දිය යුතුය යන්නයි. ප්‍රධාන වශයෙන්ම අපට අවශ්‍ය සමාජ, ආර්ථික සහ දේශපාලන වටපිටාවක් ගොඩ නැඟීමට තිබෙන්නා වූ අභියෝග මෙහිදී කවුරුත් පැහැදිලිව තේරුම් ගැනීම අවශ්‍යයි කියලා මම හිතනවා.

මේ ජිනීවා යෝජනා ඉදිරිපත් කිරීමට ප්‍රධාන වශයෙන්ම හේතු වූ කරුණු පිළිබඳව අපි සැලකිල්ල යොමු කිරීම ඉතාමත්ම අවශ්‍යයි. ජිනීවා හරහා මේ යෝජනා පසුපස සිටින්නේ කවුද කියන කාරණාවත් අපි මූලික වශයෙන්ම තේරුම් ගැනීම අවශ්‍යයි. එක්සත් ජාතික පක්ෂය විශේෂයෙන්ම ඉදිරිපත් කරන ලද කරුණු අනුව, අපට එක්සත් ජාතික පක්ෂයෙන් අහන්නට සිද්ධ වනවා, එල්ටීටීඊ ත්‍රස්තවාදය පරාජය කිරීම සඳහා අතිගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ නායකත්වයෙන් ආරම්භ කළ මානුෂීය මෙහෙයුම්වලදී වාගේම ඒ ජයග්‍රහණය ලැබීමෙන් පසුව එම කටයුතුවලට එක්සත් ජාතික පක්ෂය කොතෙක් දුරට සහයෝගය ලබා දුන්නාද කියන කාරණය.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

ඉහළින්ම සහයෝගය ලබා දුන්නා.

**ගරු මෛත්‍රීපාල සිරිසේන මහතා**
(மாண்புமிகு மைத்திரிபால சிறிசேன)
(The Hon. Maithripala Sirisena)

ප්‍රභාකරන්ගේ එල්ටීටීඊ ත්‍රස්තවාදයට විරුද්ධව එදා අපේ ආරක්ෂක හමුදා පවත්වාගෙන ගිය සටනේදී එක්සත් ජාතික පක්ෂය කිසිදු සහයෝගයක් ලබා දුන්නේ නැහැ. එක්සත් ජාතික පක්ෂය එදා බලාගෙන හිටියේ අපේ ආරක්ෂක හමුදා සහ රජය පරාජයට පත්වන තුරු. ජේ.ආර්. ජයවර්ධන ජනාධිපතිතුමාගේ පාලන කාල සීමාවේ ඉඳලා අවුරුදු තිහකට ආසන්න කාලයක් පැවති යුද්ධයේදී, බලයට පත් වුණ සෑම රජයක්ම යුද්ධය කිරීමට ගොස් අමාරුවේ වැටුණා. ඒ ආකාරයට මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමාගේ රජයත්, ආරක්ෂක හමුදාවත් අමාරු තත්ත්වයකට පත් වෙයි කියලා තමයි එක්සත් ජාතික පක්ෂය බලාගෙන හිටියේ. නමුත් ඒ බලාපොරොත්තු කිසිසේත්ම ඉටු නොවී යුද්ධය ජයග්‍රහණය කළා. ප්‍රධාන වශයෙන්ම යුද්ධය ජයග්‍රහණය කළ අවස්ථාවේ ඉඳලා විපක්ෂය තුළින් දේශපාලන කුහකකමක් තමයි අපි දැක්කේ. මේ ගැන කල්පනා කරන්නට ඕනෑ.

අපි දන්නවා, ලෝකයේ අනික් රටවල -රාජ්‍යවල- ඇති වුණ ප්‍රශ්නවලදී එක්සත් ජාතීන්ගේ සංවිධානයේ මැදිහත් වීම්වලදී, අන්තර් ජාතික මැදිහත් වීම්වලදී ඇති වුණ ප්‍රතිඵල කුමන ආකාරයේද කියලා. මූලික ලෙසම ශ්‍රී ලංකා රජය එක්සත් ජාතීන්ගේ සංවිධානයේ සාමාජිකයකු විධියට, එක්සත් ජාතීන්ගේ සංවිධානයේ ප්‍රඥප්තිවලට ගරු කරන, ඒවා පිළිගත් රජයක් විධියට අපි සෑම විටම එක්සත් ජාතීන්ගේ සංවිධානයේ ප්‍රඥප්ති ආරක්ෂා කරන්නට බැඳී සිටිනවා. නමුත් එක්සත් ජාතීන්ගේ සංවිධානය මේ යෝජනා ඉදිරිපත් කිරීමට පසු බිම් වුණු කරුණු සැලකිල්ලට ගත් විට ඉතා පැහැදිලිව පෙනෙන්නා වූ කාරණයක් තමයි, මේ රට තුළ භෞතික වශයෙන් පරාජයට පත් වූ, අභ්‍යන්තර වශයෙන් පරාජයට පත් වූ එල්ටීටීඊ ත්‍රස්තවාදීන්ගේ විදේශ රටවල සිටින ඉතිරි පිරිසක් ලබා දුන් වැරැදි කරුණු මත, වැරැදි තොරතුරු මත මේ යෝජනා ඉස්සරහට ඇවිත් තිබෙනවාය කියන කාරණය. කවුරුන් හෝ කියනවා නම් රටේ අභ්‍යන්තර ප්‍රශ්න විසඳා ගැනීම සඳහා රටින් පිටස්තර පාර්ශ්වවලට ඉඩ දිය යුතුයි කියලා, එසේ කියන අයගේ තත්ත්වය පිළිබඳව සැලකිල්ල යොමු කිරීම ඉතා අවශ්‍යයි.

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)

Sir, I rise to a point of Order.

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)

What is your point of Order, Hon. Member?

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)

ගරු ඇමතිතුමනි, එක්සත් ජාතික පක්ෂයේ ස්ථාවරය ජාත්‍යන්තර පරීක්ෂණයට විරුද්ධයි කියන එකයි. ඒක ස්ථිරයි. ඔබතුමා වැරැදි අවබෝධයකින් තමයි මේ කථාව කරන්නේ. අපි මේ ජාත්‍යන්තර පරීක්ෂණයකට විරුද්ධයි.

**ගරු මෛත්‍රීපාල සිරිසේන මහතා**
(மாண்புமிகு மைத்திரிபால சிறிசேன)
(The Hon. Maithripala Sirisena)

නැහැ, නැහැ. තමුන්නාන්සේලා ඊයේ සිට කරන ලද ප්‍රකාශ සියල්ල ගත්තාම පෙනෙනවා, මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමාගේ රජයට විරුද්ධ කවුද, ඒ විරුද්ධ ඕනෑම කෙනෙකුට සහයෝගය දිය යුතුයි කියන එක තමුන්නාන්සේලාගේ අරමුණ බව. ඒක තමයි තමුන්නාන්සේලා මේ කරන්න හදන්නේ. ඒක තමයි එකම දේ. නමුත් තමුන්නාන්සේලා විශේෂයෙන්ම කල්පනා කළ යුතු වනවා, මේ රටේ අභ්‍යන්තරය කාර්යයක් සඳහා විදේශීය පරීක්ෂණයකට ඉඩ දුන් විට ඒ තුළින් ඇති වන ප්‍රතිඵල සහ තත්ත්ව පිළිබඳව. අපට මතකයි, සුඩානයේ ඇති වුණ සිද්ධිවලදී සුඩානයට සිදු වුණේ කුමක්ද කියලා. ජිනීවා හරහා එන මේ පරීක්ෂණ තුළින් පැහැදිලිවම සිද්ධ වන්නේ මේ රටේ මිය ගිය ත්‍රස්තවාදී සංවිධානවලට නැවත පණ දීමක්. ඒ නිසා තමයි අපි පැහැදිලිවම කියන්නේ අපේ ප්‍රශ්න අපට විසඳා ගන්න ඉඩ දෙන්න කියලා. අපේ ප්‍රශ්න අපට විසඳා ගැනීමට ඉඩ දිය යුතුයි, අපේ ප්‍රශ්න විසඳීමට විදේශීය මැදිහත් වීමක අවශ්‍යතාවක් නැහැ කියලා කියනවා නම්, තමුන්නාන්සේලා - විපක්ෂය - ඒ ගැන කථා කරනකොට දේශපාලන කුහකකමකින් තොරව ප්‍රකාශ කරන්න ඕනෑ, "මේ රට තුළ තිබෙන ප්‍රශ්න අපි විසඳා ගන්නම්, කිසිම

විදේශීය නියෝජිත පිරිසක් හෝ ඒ කිසිම කෙනෙක් මේ පරීක්ෂණ සඳහා පැමිණීම අවශ්‍ය වෙන්නේ නැහැ" කියලා. නමුත් තමුන්නාන්සේලා කථා කරන්නේ, කරුණු ඉදිරිපත් කරන්නේ හෘදය සාක්ෂියට එකඟව ද කියන කාරණය සැලකිල්ලට ගැනීම ඉතාම අවශ්‍යයි. මේ ගරු සභාවේ වාගේම මේ රටේ සිටින සැම කෙනෙකුගේම පොදු මතය විය යුත්තේ රටේ ස්වාධීනත්වයයි. අවුරුදු 30කට ආසන්න කාලයක් තිස්සේ තිබුණු යුදමය අත් දැකීම්, ඒ තිබුණු ඉතාම කටුක තත්ත්වය, දුෂ්කර තත්ත්වය අප සැම කෙනෙක්ම අත්විඳලා තිබෙනවා. අපි අත්විඳපු ඒ ඉතා දුෂ්කර තත්ත්වය අත් දැකීමට අරගෙන, නැවත එවැනි තත්ත්වයකට මේ රට ගෙන යනවාද කියන කාරණය විශේෂයෙන්ම සලකා බැලීම අවශ්‍යයි.

විශේෂයෙන්ම අතීතයේදී එල්ටීටීඊ ත්‍රස්තවාදයත් සමඟ මේ රට කඩන්නට බලාපොරොත්තු වුණ අයගේ බලාපොරොත්තුවලට ශක්තිය දීමක් තමයි ජිනීවා හරහා එන මේ යෝජනා තුළින් වෙන්නේ. ඒ නිසායි අපි ඉතා පැහැදිලිව කියන්නේ මේ රටේ තිබෙන ප්‍රශ්න රජයට, රටට විසඳා ගැනීමට ඉඩ දෙන්න, අපේ ප්‍රශ්න අපම විසඳා ගන්නම්, පිටස්තර අය අපේ ප්‍රශ්නවලට මැදිහත් වීම අනවශ්‍යයි කියන කාරණය.

මූලික වශයෙන්ම අපේ රට සම්බන්ධයෙන් වැරදි චිත්‍රයක් ජාත්‍යන්තරයට දුන්නේ කවුද, ඒ පසුපස සිටින්නේ කවුද, ජිනීවා යෝජනා ජයග්‍රහණය කරන්න ඒ රටවලට වැරදි තොරතුරු දුන්නේ කවුද කියන කාරණා හැම කෙනෙකුගේම හෘදය සාක්ෂිය තුළ තිබෙන්න ඕනෑ. ඒ හෘදය සාක්ෂියට අනුව කථා කරන්නේ නැතිව, ඒ අනුව රජය දිහා බලන්නේ නැතිව දේශපාලන ඉලක්කයක් තුළ කටයුතු කිරීම ඉතාම අයුක්ති සහගත සහ අසාධාරණ කාරණයක් විධියට තමයි අපි දකින්නේ.

අපට අපේ රටේ ස්වාධීනත්වය රැක ගන්න ඕනෑ. අපේ රණ විරුවන් ආරක්ෂා කර ගන්න ඕනෑ. අපේ රණවිරුවන් සටන් කරනකොට ලෝකයේ අනික් රාජ්‍යයන්ට අපි පෙන්නුම් කළා, අපේ රණවිරුවන් කොච්චර දක්ෂද කියන කාරණය. ලෝකයේ මහා බලවතුන්ට එල්ල වෙච්ච ත්‍රස්තවාදී ප්‍රහාරවලදී ඒවා මැඩ පවත්වන්නට ඒ හමුදාවලට පුළුවන්කමක් ලැබුණේ නැහැ. මහා බලවතුන්ට බැරි වෙච්ච දේ අප වැනි පුංචි රටක් ඉෂ්ට කළා. මහා ගෞරවනීය රටක් විධියට අප ඒ කාර්යය කළා. මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමාගේ නායකත්වයෙන් අපේ ආරක්ෂක හමුදා ඒ ලැබූ ජයග්‍රහණයට මේ රටේ සමස්ත ජනතාවගේම ආශිර්වාදය ලැබුණා. එදා රටේ ජනතාවගේ ආශිර්වාදය එයට ලැබෙනකොටත් එක්සත් ජාතික පක්ෂය දේශපාලන කුහකකමකින් තමයි හිටියේ. එදාත් ඒ සඳහා අපට අවංක සහයෝගයක් දුන්නේ නැහැ. ඒ නිසා තමයි තමුන්නාන්සේලා කිව්වේ, "කිලිනොච්චි යනවාය කියලා මැදවච්චි ගියා"ය කියලා. තමුන්නාන්සේලාගේ එවැනි ප්‍රකාශ අපට ඉතා හොඳින් මතකයි ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි. 30 වසරක යුද්ධයකින් ලැබූ අත් දැකීම් එක්ක අපි මේ රට ස්වාධීන රටක් විධියට, නිදහස් රටක් විධියට, සාමකාමී රටක් විධියට ඉදිරියට ගෙන යැමේදී අනාගතය පිළිබඳව වැඩි අවධානයකින් කටයුතු කිරීම අවශ්‍යයි.

රටේ අද දවසේ තිබෙන ප්‍රශ්න දිහා විපක්ෂය දේශපාලන පටු පරමාර්ථ අනුව කල්පනා කරමින් කටයුතු කිරීම ඉතාම නුසුදුසු දෙයක් විධියට තමයි අපි දකින්නේ. මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමාගේ රජය විධියට වාගේම, ශ්‍රී ලාංකිකයන් විධියට අප සැමවිටම කල්පනා කළ යුත්තේ මේ රට විදේශීය ආක්‍රමණවලින්, විදේශීය බලපෑම්වලින්, විදේශීය ඇතුළුවීම්වලින් ප්‍රතික්ෂේප වෙලා සාමකාමී නිදහස් රටක් විධියට ඉදිරියට යන්නට ඉඩ දිය යුතුය කියන කාරණයයි. ඒ බව විශේෂයෙන්ම සඳහන් කරමින්, අපේ ගරු මන්ත්‍රීවරුන් ගෙනෙන ලද මේ යෝජනාව ඉතාම යුක්ති සහගත කාලෝචිත යෝජනාවක්ය කියන එක ප්‍රකාශ කරමින් මම නිහඬ වෙනවා. ස්තුතියි.

[2.49 p.m.]

**ගරු ඒ. විනායගමූර්ති මහතා**
(மாண்புமிகு அ. விநாயகமூர்த்தி)
(The Hon. A. Vinayagamoorthy)

Hon. Deputy Chairman of Committees, thank you very much for giving me an opportunity to speak on the Motion submitted by nine Hon. Members of this Parliament.

They do not want an investigation against Sri Lanka by the Office of the United Nations High Commissioner for Human Rights to be held. They say that it should not be carried out on the grounds that such a course of action is detrimental to the process of reconciliation and peace and that it erodes the sovereignty, dignity and stature of Sri Lanka.

The Government is worried about reconciliation. Has it even implemented one of the several recommendations made by the LLRC in the Second Volume? The late Mr. C.R. de Silva, Chairman of LLRC, lamented that the Government has not taken steps to implement even the interim recommendations. I want the investigation to be carried out in Sri Lanka. As far as the Tamils are concerned, we have no one to complain to in Sri Lanka except to the very same person who infringes on our fundamental rights.

With regard to resettlement of Tamils, in Valikamam North, about 23 villages are yet to be resettled and about 28,000 persons are involved. In Thaiyiddy, 3,000 persons and in Myliddy, 5,000 persons got displaced from Valikamam North and they have not yet been resettled. Two hundred fifty families who got displaced from Valalai North have not yet been resettled there. I have written several letters in this connection to the GA, Jaffna, in this connection.

The United Nations Special Rapporteur, Dr. Chaloka Beyani, came to Sri Lanka and visited the places where resettlement has not taken place. He has, in his report to the UN, said that people who got displaced from an area must be resettled in that area itself.

In Keppapulavu, nearly 250 families have not yet been resettled. They were brought from Menik Farm as the last batch and put in a jungle. The village that adjoins Keppapulavu is Vattapalai. People have been resettled there but the difficulty that they face is that the agricultural lands belonging to them are situated in Keppapulavu; even their cemetery is in Keppapulavu and they are unable to go there.

About 1,200 families consisting of 6,000 persons were chased away from Sampur, which was declared a high security zone. These 6,000 persons, for the last five years, have been detained in camps. After chasing away these 6,000 persons, the Government declared a 10,000-

acre land as a high security zone and people cannot go there. As a result of this, people living in four villages are unable to go to their own lands. People from Sampur, Koonithivu, Saralaikuda and Sampukani were chased away and nobody is allowed to go and inspect these lands. When will the Government allow these 6,000 persons who were chased away from Sampur to go and resettle in their own lands? It is a breach of fundamental rights of a person, if he is prevented from going and living in his own land.

Regarding resettlement, we are unable to complain to anyone in Sri Lanka. I am a Member of the Consultative Committee on Defence and Urban Development and at a meeting presided over by President Rajapaksa, I requested him to allow the people from Myliddy to resettle in Myliddy itself and to develop Myliddy Fisheries Harbour as the best Fisheries Harbour in Sri Lanka. Before he could open his mouth the Hon. Gotabhaya Rajapaksa who was there got up and said that that cannot be done.

Immediately after the war was over, Ban Ki-moon came to Sri Lanka, visited Vanni, inspected the area, came back and met the President. Both of them issued a Joint Statement where the President accepted accountability. Thereafter, Ban Ki-moon appointed a committee consisting of Darusman and two others to advise him on the condition in Sri Lanka and as to what happened during the war. They, without coming here, gave an up-to-date report to Ban Ki-Moon where they stated that about 40,000 Tamil civilians were brutally killed in the war. Is this not genocide? Further, Pulidevan, Nadesan and his wife - who was a Sinhalese lady - probably after getting the approval of the Government went to the army camp with a white flag. What happened to them? They were shot dead. What happened to Prabhakaran's son who was a 14-year old boy? He was given some biscuits and some time later, they shot him. All what I have said have happened to the Sri Lankan Tamils; to whom can they complain? Can they complain to Mr. Gotabhaya Rajapaksa? Preventing persons from going and living in their own lands is a breach of their fundamental rights.

I think the officers who are coming here to investigate are very senior officers handpicked by Navaneethan Pillay. One of them is a lady who was a Supreme Court Judge in New Zealand and she will be heading the Investigation Unit.

As far as the Tamils are concerned, we solely depend on the UNHRC to get the relief that we want. Therefore, we want the Government to allow the Investigation Unit to come to Sri Lanka and investigate.

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
Hon. Vinayagamoorthy, please wind up.

**ගරු ඒ. විනායගමූර්ති මහතා**
(மாண்புமிகு அ. விநாயகமூர்த்தி)
(The Hon. A. Vinayagamoorthy)
Sir, give me one more minute please. If the war was conducted in a reasonable way, then why are they objecting to the Investigating Team coming to Sri Lanka? If nothing has been done by the army and if there is zero-death casualty, the Government need not worry about the investigating team coming to Sri Lanka. Thank you.

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
Hon. Douglas Devananda, please.

**ගරු දි.මු. ජයරත්න මහතා**
(மாண்புமிகு டி.எம்.ஜயரத்ன)
(The Hon. D.M. Jayaratne)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
Yes, Hon. Prime Minister.

**ගරු දි.මු. ජයරත්න මහතා**
(மாண்புமிகு டி.எம். ஜயரத்ன)
(The Hon. D.M. Jayaratne)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මම ඔබතුමාට කිව්වා, මට විශේෂ සාකච්ඡාවකට යන්නට තිබෙනවාය කියා මට වෙලාව දෙන්නටය කියා. මට ඉඩ දෙන්නේ නැති නිසා මගේ කථාව මා නතර කරනවා. නමුත් ස්ථාවර නියෝග අනුව නම් පළමුවෙන් නැඟී සිටි පුද්ගලයාට කථා කරන්නට මූලාසනය අවසර ලබා දෙන්නට ඕනෑ. එම නිසා මගේ කථාව මා නතර කරනවා.

[பி.ப. 3.05]

**ගරු ඩග්ලස් දේවානන්ද මහතා (සම්ප්‍රදායික කර්මාන්ත හා කුඩා ව්‍යවසාය සංවර්ධන අමාත්‍යතුමා)**
(மாண்புமிகு டக்ளஸ் தேவானந்தா - பாரம்பரிய கைத் தொழில்கள், சிறு தொழில்முயற்சி அபிவிருத்தி அமைச்சர்)
(The Hon. Douglas Devananda - Minister of Traditional Industries and Small Enterprise Development)
கௌரவ குழுக்களின் பிரதித் தவிசாளர் அவர்களே, இந்த விவாதத்தில் கலந்துகொண்டு உரையாற்ற எனக்கு வாய்ப்பு வழங்கியமைக்கு முதலில் நான் நன்றிகூறக் கடமைப் பட்டிருக்கின்றேன். இலங்கை மீதான சர்வதேச விசாரணையை அனுமதிப்பதா? இல்லையா? என்ற விடயத்தை இந்த நாடாளுமன்றத்தில் விவாதத்துக்கு எடுத்துக்கொண்டதை நான் வரவேற்கின்றேன்.

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අගමැතිතුමාට ප්‍රමුඛතාවය ලබා දිය යුතුය කියන එක මේ පාර්ලිමේන්තුවේ තිබෙන සම්ප්‍රදායක්. එතුමා අවස්ථාව ඉල්ලුවා නම් එම අවස්ථාව දිය යුතුව තිබෙනවා.[බාධා කිරීමක්]

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)

Hon. Member, please do not disturb. Hon. Douglas Devananda, you may carry on.

**ගරු ඩග්ලස් දේවානන්ද මහතා**
(மாண்புமிகு டக்ளஸ் தேவானந்தா)
(The Hon. Douglas Devananda)

எமது நாட்டின் மீதான சர்வதேச விசாரணை தேவையா? இல்லையா? என்பதைத் தீர்மானிக்க வேண்டியவர்கள் இந்த நாட்டில் வாழ்கின்ற மக்களே! ஆகவே, அனைத்து மக்களினதும் பிரதிநிதிகளைக் கொண்ட இந்த நாடாளுமன்றமே - இந்தச் சபையே - அதற்கான தீர்மானத்தை எடுக்க முடியும். எங்கே வெடிகுண்டுச் சத்தங்கள் கேட்கின்றனவோ, அங்கே உள்நாட்டுக் குழப்பங்கள், கலவரங்கள், யுத்தம் போன்றவற்றை உருவாக்குவதற்கும் அல்லது தேவையான இடங்களில் தாமே திட்டமிட்டுக் குழப்பங்களை உருவாக்கிவிட்டு, அங்கெல்லாம் தலையை நீட்டித் தமது வல்லாதிக்கத்தை நிலைநாட்டுவதற்கும் சில வெளியுலக நாடுகள் காத்திருக்கின்றன. இப்போதுகூட, தென்னிலங்கையின் சில பிரதேசங்களில் துரதிருஷ்டவசமாக நடந்திருக்கும் மோதல்கள், சில வெளியுலக நாடுகளின் கழுகுக் கண்களுக்கு விருந்து படைப்பதாகவே அமைந்திருக்கின்றன. ஆகவே, தமிழ், முஸ்லிம், சிங்கள மக்கள் என இன, சமூக வேறுபாடு பாராது அனைவரும் இந்த நாட்டின் மக்களே என்ற எமது ஜனாதிபதி மஹிந்த ராஜபக்ஷ அவர்களின் கொள்கையினைத் தொடர்ந்தும் நிலைநாட்ட வேண்டிய பொறுப்பை இந்த நாட்டின் சட்டம், ஒழுங்கு, பாதுகாப்பு போன்றவற்றுக்குப் பொறுப்பானவர்கள் உணர்ந்து செயற்படுவார்களென நம்புகின்றேன். இதேவேளை அங்கு இன, சமூக மக்களுக் கிடையிலான மோதல்களைத் தூண்டிவிட்டவர்கள் எவராக இருப்பினும் அவர்கள் சட்டத்தின் முன்பாக நிறுத்தப்படுவார்களென்றும் பாதிக்கப்பட்ட மக்களுக்கான நிவாரணங்களும் இழப்பீடுகளும் விரைவாக வழங்கப்படுமென்றும் நான் நம்புகின்றேன்.

"ஊர் இரண்டுபட்டால் கூத்தாடிக்குக் கொண்டாட்டம்" என்பார்கள். கூத்தாடிகள் உள்நாட்டிலும் இருப்பார்கள்; வெளிநாட்டிலும் இருப்பார்கள். எமது நாட்டில் இன, சமூக முரண்பாடுகள் தொடர்ந்தும் நீடித்துச் செல்ல வேண்டுமென்பதே அவர்களது அடங்காத ஆசையாகும். இன்று இலங்கை மீதான சர்வதேச விசாரணையை நடத்த விரும்புவோர் இங்கு இன, சமூக முரண்பாட்டுச் சூழலை வளர்க்கவே விரும்புகிறார்கள். மாறாக, அவர்கள் இந்த நாட்டின் அமைதிச் சூழலை ஒருபோதும் விரும்பப்போவதில்லை. இதனையே உலக நாடுகளெங்கும் நடந்துவரும் வரலாற்று அனுபவங்கள் யாவும் வெளிப்படுத்தி வருகின்றன. பலஸ்தீன மக்களின் பிரச்சினைகளைத் தீர்க்காமல் அல்லது தாமே உருவாக்கிய எகிப்தின் பிரச்சினையையோ, சிரியாவின் பிரச்சினையையோ மற்றும் ஆப்கானிஸ்தான், ஈராக், லிபிய மக்களின் பிரச்சினைகளையோ தீர்க்காமல் அங்கெல்லாம் குருதியாற்றைத் தொடர்ந்தும் ஓடவைத்த சர்வதேச போலிச் சமாதான இராஜதந்திரத்தையே இன்று இலங்கைமீதும் சில வெளியுலக நாடுகள் திணிக்க முயல்கின்றன.

போருக்கு முடிவுகட்டி, வன்முறைக்கு முற்றுப்புள்ளி வைத்து, அபிவிருத்திப் பாதையில் நடந்துசெல்கின்றது எமது இலங்கைத் தீவு! இதேவேளை, அரசியல் தீர்வுக்கான கதவுகளைத் திறந்துவிட்டு அதன் முன்னோக்கிய நகர்வுக்கான நல்லெண்ணச் சமிக்ஞைகளையும் இந்த அரசாங்கம் காட்டி வருகின்றது. இந்த நிலையில் இலங்கைத் தீவுக்குள் சர்வதேச விசாரணை என்ற பெயரில் சில வெளியுலக நாடுகள் மூக்கை நுழைக்க முயல்வதன் உள்நோக்கத்தை நாம் புரிந்துகொள்ள வேண்டும். எகிப்திலும் ஆப்கானிஸ்தானிலும் ஈராக்கிலும் லிபியாவிலும் சிரியாவிலும் நடந்து கொண்டிருப்பவை எமது தேசத்திலும் நடக்க வேண்டுமென விரும்புவோரே இலங்கை மீதான சர்வதேச விசாரணையையும் விரும்புகின்றார்கள். ஆகவேதான் நான் இலங்கை மீதான சர்வதேச விசாரணையை முற்றாக வெறுக்கின்றேன். நான் அரசாங்கத்தில் அமைச்சராகப் பங்கெடுத்து வருவதால் மட்டும் இந்த நிலைப்பாட்டைக் கொண்டிருக்கவில்லை. நான் அமைச்சராகப் பங்கெடுத்து வருவதன் நோக்கம், தமிழ் பேசும் மக்களின் அரசியல், அபிவிருத்தி நலன்களை அடிப்படையாகக் கொண்டதேயாகும். நான் அரசில் அமைச்சராகப் பங்கெடுக்காமல் இருந்திருந்தாலும்கூட, இலங்கை அரசின் மீதான சர்வதேச விசாரணையை எதிர்த்திருப்பேன். ஏனெனில், எமது மக்களின் நீண்டகால நலன்களைக் கருத்திற்கொண்டு தொலைதூர நோக்கிலேயே நான் இதுவரை சிந்தித்தும் செயலாற்றியும் வந்திருக்கின்றேன். கடந்த காலங்களில் நான் சொன்னதுபோலவே எல்லாம் நடந்து முடிந்திருக்கின்றன. நான் இன்று எதைச் சொல்கின்றேனோ, அது நாளை நடக்கவும்கூடும்! இலங்கை மீதான சர்வதேச விசாரணை ஏற்றுக்கொள்ளப்பட்டால், இந்த நாட்டில் வாழ்கின்ற தமிழ் பேசும் மக்கள் மட்டுமல்ல, ஒட்டுமொத்த இலங்கை மக்களுமே அதன் விளைவுகளைச் சந்திக்க நேரிடும் என்பதை நான் தொலைதூர நோக்கில் கூறிவைக்க விரும்புகின்றேன்.

இலங்கை - இந்திய ஒப்பந்தம் கைச்சாத்திடப்படும்வரை நானும் ஒரு சுதந்திரப் போராட்ட விடுதலை இயக்கத்தைக் களத்தில் நின்று வழிநடத்திச் சென்றவன். இலங்கை - இந்திய ஒப்பந்தத்தின் பின்னர் இங்கு யுத்தம் நிறுத்தப்பட்டு, பெற்றுக்கொண்ட 13ஆவது திருத்தச் சட்டத்தை எமது அரசியல் இலக்கை நோக்கி வளர்த்தெடுக்க வேண்டுமென்பதையே நான் வலியுறுத்தி வந்திருக்கின்றேன். உரிமைப் போராட்டம் என்பது வேறு; எதையும் பெற முடியாத அழிவு யுத்தம் என்பது வேறு. இதையே நான் திரும்பத் திரும்ப கூறி வந்திருக்கின்றேன்.

யுத்தம் கொடியது! அது எமது மக்களைக் கொன்று பலியெடுக்கும்! எமது தேசத்தை எரித்துச் சுடுகாடாக்கும்! எமது மக்களிடமிருந்து சொந்த நிலங்களை யுத்தம் பறித்தெடுக்கும்! அகதிகளாக எமது மக்களை அலைய வைக்கும்! அழிவு யுத்தம் எமது மக்களை நடுத்தெருவுக்குக் கொண்டுவந்து நிறுத்தும்! இவற்றை அன்றைய சூழலில் அரசியல் துணிச்சலோடும் தொலைதூர நோக்கோடும் நான் மட்டுமே கூறி வந்திருக்கின்றேன். இலங்கை - இந்திய ஒப்பந்தத்தின் பிரகாரம் உருவான 13 வது திருத்தச் சட்டமே எமது அரசியல் தீர்வின் இலக்கை நோக்கிச் செல்லும் தொடக்கப்புள்ளி என்று நான் வலியுறுத்தி வந்திருக்கின்றேன். ஆனால், அதை ஏற்க மறுத்தவர்கள் யுத்தமும் அதன் அவலங்களும் இங்கு தொடர்ந்தும் நடக்கவே வழிவகுத்தார்கள்; அழிவு யுத்தம் நடக்கத் துணைபோனார்கள். இன்று அவர்களே யுத்தக்குற்றம் குறித்துச் சர்வதேச விசாரணை தேவை என்று அரசியல் நாடகமாடுவது நியாயமா? என்று நான் கேட்கின்றேன். அன்று இலங்கை - இந்திய ஒப்பந்தத்தை ஏற்றுக்கொண்டவர்களில் சிலர் அதைத் துஷ்பிரயோகம் செய்து, தாமே வன்முறை நடத்தி யுத்தக் குற்றங்கள் புரிந்துவிட்டு, பின்னர் அவர்களே யுத்தக் குற்றம் நடந்தன என்றும் சர்வதேச விசாரணைகள் தேவை என்றும் சாத்தான்கள் வேதம் ஓதுவதுபோல் இன்று பேசுவது நியாயமா? என்று நான் கேட்கின்றேன்.

அழிவு யுத்தம் எமது மக்களைத் தொடர்ந்தும் பலி கொள்ளக்கூடாது என்பதற்காகவே முன்னாள் ஜனாதிபதி

[ගරු ඩග්ලස් දේවානන්ද මහතා]

பிரேமதாச - புலிகள் பேச்சுவார்த்தையை நாம் வரவேற்றிருந்தோம்; முன்னாள் ஜனாதிபதி சந்திரிகா - புலிகள் பேச்சுவார்த்தையை நாம் வரவேற்றிருந்தோம்; முன்னாள் பிரதமர் ரணில் விக்கிரமசிங்க - புலிகள் பேச்சுவார்த்தையை நாம் வரவேற்றிருந்தோம். ஏன், இன்றைய ஜனாதிபதி மஹிந்த ராஜபக்ஷ - புலிகள் பேச்சுவார்த்தையையும் நாம் வரவேற்றிருந்தோம். அதாவது நோர்வே, ஜப்பான், தாய்லாந்து, சுவிற்சர்லாந்து என்று எல்லா நாடுகளிலும் புலிகளுடன் நடத்தப்பட்ட பேச்சுவார்த்தைகளையும் நாம் வரவேற்றிருந்தோம். ஆனாலும், அரசியல் தீர்வுக்கான அந்தப் பேச்சுவார்த்தைகள் யாவும் சரிவரப் பயன்படுத்தப்படாமல் தமிழ் பேசும் தரப்புக்களாலேயே முறித்துக்கொள்ளப் பட்டபோது, அதைக் கண்மூடி வாய்பொத்தி எதுவும் பேசாமல் ஏற்றுக்கொண்டவர்கள், இன்று யுத்தக்குற்றம் குறித்தும் சர்வதேச விசாரணை குறித்தும் பேசுவது நியாயமா? என்று நான் கேட்கின்றேன்.

முன்னாள் ஜனாதிபதி சந்திரிகா பண்டாரநாயக்க குமாரணதுங்க அவர்கள் கொண்டுவந்த தீர்வு நகலை எதிர்க்கட்சிகளோடு சேர்ந்து இதே நாடாளுமன்றத்தில் எரித்தழித்த சுயலாபத் தமிழ்த் தலைமைகள், இன்று அரசியல் தீர்வு இல்லை என்று நீலிக்கண்ணீர் வடிக்கின்றார்கள். இதனால் என்ன கிடைத்தது? தமிழ்த் தேசியக் கூட்டமைப்பின் தலைவர் இரா. சம்பந்தன் போன்றவர்களுக்குக் குண்டு துளைக்காத வாகனம்! தமிழ் பேசும் மக்களுக்குக் குண்டுமழை பொழியும் கொடுந்துயரங்கள்! சுரேஷ் பிரேமச்சந்திரன் அவர்களுக்கு மீன்பிடி அமைச்சின் ஆலோசகர் பதவி மற்றும் சுளை சுளையாக அரசாங்கத்தின் மாதக் கைக்கூலி! சுதந்திரம் கேட்ட மக்களுக்குச் சோறுகூடப் பெற்றுக்கொடுக்காத சோகச் சுமைகள்!

சுயலாப அரசியல் தலைமைகள் இதுவரை கிடைத்த சந்தர்ப்பங்களைச் சரிவரப் பயன்படுத்தாதமையினால் இங்கு யுத்தம் நீடித்துச் சென்றிருந்தது. நாம் ஆரம்பத்திலிருந்தே வலியுறுத்தி வந்துள்ள 13வது திருத்தச் சட்டத்துக்கமைவான மாகாண சபையை இன்று ஏற்றுக்கொண்டவர்கள், அதை அன்றே ஏற்றிருந்தால் - வைக்கோல் பட்டடை நாய் மாதிரி இன்று அதனை ஏற்றுக்கொண்டும் ஒன்றும் செய்யவில்லை என்பது வேறு - இத்தனை அவலங்களும் அழிவுகளும் நடந்திருக்காது. அவலங்களும் அழிவுகளும் நடப்பதற்கான யுத்த சூழலைத் தாமே உருவாக்கிவிட்டு இன்று யுத்தக் குற்றம் என்றும் சர்வதேச விசாரணை என்றும் அவர்கள் கோருவது வெறும் பகல்வேட அரசியல் நாடகமே! எமது தேசத்துப் பெண் கவிஞர் ஒருவர், "சித்திரவதை முகாமுக்குப் பொறுப்பாக இருந்தவன் குழந்தை பெறும் மனைவிக்காக அழுகிறான்" என்று குறிப்பிட்டதுபோல, தமிழ் இளைஞர், யுவதிகளைச் சிறையிலிட்டுச் சித்திரவதை முகாம் நடத்திய, தமிழ் மக்கள் மத்தியிலுள்ள கோடரிக்காம்புகள் இன்று வடித்துக் கொண்டிருப்பதெல்லாம் வெறும் நீலிக்கண்ணீர் மட்டுமே.

அழிவு யுத்தத்தை முடிவுக்குக் கொண்டுவந்தமைக்காக 2009இல் இந்தச் சபையில் வைத்து ஜனாதிபதி மஹிந்த ராஜபக்ஷ அவர்களுக்குத் தமிழ்த் தேசியக் கூட்டமைப்பின் சார்பாக அதன் தலைவர் இரா. சம்பந்தன் அவர்கள் நன்றி தெரிவித்து உரையாற்றியிருந்தார். அந்த உரையை நாடாளுமன்ற ஹன்சாட் அறிக்கையில் நீங்கள் பார்க்கலாம். இதே தமிழ்த் தேசியக் கூட்டமைப்பினர், தாமே நன்றி தெரிவித்துப் பேசிய அதே யுத்தம் குறித்து இன்று சர்வதேச விசாரணை தேவை என வாதாடுவது வெட்கம்கெட்ட செயல் என்றே கூற வேண்டும். தமிழ் பேசும் மக்களை ஏமாற்றும் அவர்களின் சந்தர்ப்பவாத அரசியலையே இது எடுத்துக் காட்டுகின்றது.

சில வெளியுலக நாடுகள் எமது மக்களை அழிவுகள் வரமுன்னரும் காக்க வரவில்லை; அழிவுகள் வந்தபோதும் காக்க வரவில்லை. ஆனால், இன்று எல்லாம் முடிந்த பின்னர் மட்டும் சர்வதேச விசாரணை என்ற போர்வையில் இங்கு மூக்கை நுழைப்பதை நாம் அனுமதிக்க முடியாது. இதன்மூலம் இங்கு இன முரண்பாட்டுச் சூழலை மேலும் வளர்க்கமுடியுமே தவிர, எமது மக்களின் அரசியலுரிமைப் பிரச்சினைக்கு ஒருபோதும் தீர்வு கண்டுவிட முடியாது. அவர்களுக்கு எமது மக்களின்மீது அக்கறை இருந்திருந்தால் முள்ளிவாய்க்கால் இழப்புகளுக்கு முன்னரே இங்கு வந்திருக்க வேண்டும். எண்ணெய்க் குதங்கள் இலங்கையில் இருந்திருந்தால் எல்லா நாடுகளுமே இங்கு போட்டிபோட்டு வந்திருக்கும்! ஆகவே, "அழுதும் பிள்ளையை அவளே பெற வேண்டும்" என்பதுபோல் எமது பிரச்சினையை நாமேதான் பேசித்தீர்க்க முடியும்.

அண்ணன் தம்பிக்குள் இருந்த சிறு பிரச்சினைகளை வெளியார் மூலமாகத் தீர்த்துவிடலாம் என்ற தப்பான எண்ணம் இந்த நாட்டின் கடந்தகால தூரநோக்கற்ற அரசியல் தலைமைகளிடமும் தமிழ்த் தேசியத் தலைமைகளிடமும் இருந்ததன் விளைவையே இன்று இத்தீவின் அனைத்து மக்களும் அனுபவித்து ஓய்ந்துள்ளார்கள். இந்த நாட்டின் பிரச்சினைகளை இந்த நாட்டுக்குள்ளேயே தீர்க்கவேண்டும் என்ற ஓர் உறுதியான தலைமைத்துவம் 2005ஆம் ஆண்டு இலங்கைத் தீவில் உருவாகியது. அது, பல தசாப்தங்களாக இந்தத் தீவை ஆட்டிப்படைத்த ஆயுத முரண்பாட்டுக்கு முடிவுகட்டி, அபிவிருத்திப் பாதையில் ஆசியாவின் ஆச்சரிய மாக இலங்கைத் தீவை வளர்த்து வருகிறது. இதைப் பொறுக்கமுடியாத சில சர்வதேச நாடுகள், தொடர்ந்தும் இந்தத் தீவின்மீது தமது செல்வாக்கை நீடிக்கும் நோக்குடன், முடிந்து போன விடயங்களுக்கு முடிச்சுப்போட்டு வில்லங் கத்தை ஏற்படுத்த முயற்சித்து வருகின்றன.

இறுதியாக நான் கூறவிரும்புவது இதுதான். இரண்டாம் உலக யுத்தத்தின்போது அமெரிக்கா தலைமையிலான கூட்டுப்படைகள் ஜேர்மனியின் மீதும் ஜப்பான் மீதும் தாக்குதல்களை நடத்தின. அந்த யுத்தத்தின்போது ஜேர்மனி மற்றும் ஜப்பான் தேசங்களில் அழிவுகள் நடந்தன. இலட்சக்கணக்கான மக்கள் பலியெடுக்கப்பட்டார்கள். ஆனாலும், யுத்தம் முடிந்த பின்னர் ஜேர்மனி மற்றும் ஜப்பான் ஆகிய நாடுகளில் புதிதாகத் தோன்றிய அரசுகள் யுத்தத்தில் ஈடுபட்டமைக்கான தமது தரப்பு அரசியல் தலைமையின் தவறுகளையும் ஏற்றுக்கொண்டே அதே அமெரிக்காவோடு கைகுலுக்கின. அவ்வாறு பகை மறந்து கைகுலுக்கியதால்தான், இன்று ஜேர்மனியும் ஜப்பானும் உலகத்திலேயே சிறந்து விளங்கும் நாடுகளாகத் தோற்றம் பெற்றிருக்கின்றன. ஆகவே, தமிழ் பேசும் மக்கள் மத்தியிலான சுயலாப தலைமைகளின் பொறுப்பற்ற தவறான செயலுக்காக, அந்தத் தலைமைகளால் ஏமாற்றப்பட்டுவரும் தமிழ் பேசும் மக்களை அரசாங்கம் வஞ்சித்து விடப்போவதில்லை என்றே நான் நம்புகின்றேன்.

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
Please wind up now.

**ගරු ඩග්ලස් දේවානන්ද මහතා**
(மாண்புமிகு டக்ளஸ் தேவானந்தா)
(The Hon. Douglas Devananda)
ஒரு நிமிடம் தாருங்கள்!

தமிழ் பேசும் மக்களின் சார்பாக நான் அரசாங்கத்தின் உறவுக்குக் கரம் கொடுக்கின்றேன். அதேவேளை, எமது மக்களின் உரிமைக்குக் குரல் கொடுத்து நிற்கின்றேன். நாங்கள் சமாதானப் புறாக்களை இங்கு பறக்கவிட்டிருக்கின்றோம். அதன் கழுத்தை நெரிக்க இங்கு யாரும் வரவேண்டாம். எமது பிரச்சினைகளை நாமே தீர்த்துக்கொள்ள உறுதியுடன் உழைப்போம். எமது மக்களின் துயரக் கதைகள் யாவும் இந்தத் தலைமுறையோடு மட்டும் முடிந்துபோகட்டும்! அடுத்த தலைமுறைக்கு நாம் வழங்கப்போவது அரசியல் தீர்வேயன்றி வாழும் துயரங்களுமல்ல, அடுத்தவனிடம் கையேந்தி நிற்கும் அவலங்களுமல்ல. எங்கிருந்தோ வந்து மீட்பவர்கள் என்று ஏமாற்றும் நிலையை மாற்றி, இங்கிருந்து நாமே படைக்கும் புதிய வரலாற்றையே இந்தத் தலைமுறைக்கு நாம் வழங்கவேண்டும். மீண்டும், மீண்டும் இனப் பகை மூட்டி, அதிலேயே தமது அரசியலை நடத்திப் பழகிவிட்ட தமிழ்த் தேசியத் தலைமைகள், புலம்பெயர் தேசத்து மக்களின் டொலர் களுக்கு வாலாட்டிக்கொண்டு மீண்டும் இந்தத் தேசத்தை அழிவுப் பாதைக்குள் இட்டுச்செல்ல முயலாமல், போருக்குப் பிந்திய ஜப்பான், ஜேர்மனி ஆகிய தேசங்கள் தம்மைக் கட்டியெழுப்பிய வரலாறுகளிலிருந்து பாடம் கற்றுக்கொண்டு, இலங்கைத் தீவை ஒரு தேசமாகக் கட்டிக்காத்து அதற்குள் தமிழர் உரிமைகளை வென்றெடுக்கும் சாத்தியமான அரசியல் அணுகுமுறையைக் கடைப்பிடிக்க முன்வரவேண்டும்.

மக்கள் பலத்துடன் எமது நிலத்தில் நாமே மாற்றங்களை உருவாக்குவோம்! தமிழ் பேசும் மக்களுக்கு இறுதித் தீர்வு கிடைக்காதவரை எங்கள் பயணம் ஒருபோதும் நிற்காது. எமது மக்கள் தமிழர்களாக வாழவேண்டும் என்பதற்காக இலங்கையர் என்ற அடையாளத்தை இழக்கவோ அல்லது இலங்கையராக வாழவேண்டும் என்பதற்காக தமிழர் என்ற அடையாளத்தை இழக்கவோ விரும்புவதில்லை. அவர்கள் தமிழர்களாகவும் அதேநேரம் இலங்கையராகவுமே வாழ விரும்புகின்றார்கள் என்பதை மீண்டும் இச்சபையில் வலியுறுத்த விரும்புகின்றேன்.

நாம் செல்லும் பயணம் வெல்லும்! நன்றி!

[අ.භා. 3.20]

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, එක්සත් ජාතික පක්ෂය නියෝජනය කරමින් කථා කළ -කථික- මන්ත්‍රීතුමන්ලා මෙම විවාදය පුරා ප්‍රකාශ කළ මූලික හරය, රජය නියෝජනය කරන කථික මන්ත්‍රීවරුන්ට, කථික ඇමතිවරුන්ට තවමත් තේරුම් ගැනීමට නොහැකි වී තිබෙනවාය කියන කාරණය ගරු මෛත්‍රීපාල සිරිසේන අමාත්‍යතුමා දක්වපු අදහස් තුළින් මට පෙනී යනවා. මා එතුමාටත්, රජයේ සියලුම ගරු මන්ත්‍රීතුමන්ලාටත්, ඇමතිතුමන්ලාටත්, මේ රටටත් ඉතාම පැහැදිලිව කියනවා, ශ්‍රී ලංකාව තුළ යුද්ධයේදී සිදු වූ කාරණා පිළිබඳව ජාත්‍යන්තර පරීක්ෂණයක් පැවැත්වීම පිළිබඳව එක්සත් ජාතික පක්ෂය විරුද්ධයි කියලා. ජාත්‍යන්තර පරීක්ෂණයකට එක්සත් ජාතික පක්ෂය විරුද්ධයි. ජාත්‍යන්තර පරීක්ෂණයකට එක්සත් ජාතික පක්ෂය විරුද්ධයි. එම නිසා මේ ස්ථාවරය සියයට 100ක් තේරුම් ගත යුතුයි. තේරුම් ගන්න කැමැති නැත්නම් කරන්න දෙයක් නැහැ. ජාත්‍යන්තර පරීක්ෂණයක් පෙන්න-පෙන්නා ඉදිරියේදී එන මැතිවරණවලදී වාසියක් ලබා ගන්න හිතා ගෙන ඉන්න අයට මේ ස්ථාවරය හොඳ නැති වෙන්න පුළුවන්; ඇහෙන්නේ නැති වෙන්න පුළුවන්; තේරුම් ගන්න පුළුවන් ප්‍රඥාවක් නැතිවෙන්න පුළුවන්. එහෙත් එක්සත් ජාතික පක්ෂයේ ස්ථිරසාර ස්ථාවරය තමයි, මේ රටේ එකම රණ විරුවකුවත් ජාත්‍යන්තර ප්‍රජාව ඉදිරියේ පාවා දීමට නොහැකියි; පාවා දීම නොකළ යුතුයි; පාවා දීමට ඉඩ දෙන්නේ නැහැයි කියන එක. අනාගත එක්සත් ජාතික පක්ෂ රජයක් තුළත් මේ යුද්ධයට සහභාගි වුණු රණවිරුවන් සියලු දෙනාම අපි ආරක්ෂා කරනවාය කියන කාරණය වග කීමෙන් ප්‍රකාශ කරනවා. ඒකයි අපේ ස්ථාවරය. එම නිසා ඉතිරි සියල්ලම ඊට යටත් වනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේ ප්‍රශ්නයට අපට මුහුණ දෙන්නට සිදු වන බව යුද්ධය අවසන් වෙලා දින කිහිපයක් යන කොට අප කාටත් තේරුම් ගියා. ජිනීවාවලදීත්, එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කවුන්සිලයේදීත් අපට එරෙහිව යෝජනාවක් සම්මත කිරීමට ඇමෙරිකාව ප්‍රමුඛ රටවල් උත්සාහ කරන විට ජිනීවාහි ශ්‍රී ලංකාවේ නිත්‍ය නියෝජිත දයාන් ජයතිලක මැතිතුමා මූලික වෙලා, ශූර රාජ්‍ය තාන්ත්‍රික උපාය මාර්ග පාවිච්චි කරලා ඒ ප්‍රයත්නය පරාජයට පත් කළා. ඒ වාගේම දිගින් දිගටම ජාත්‍යන්තරයෙන් එන අයුතු බලපෑම්වලින් මිදෙන්නට අවශ්‍යයි කියන කාරණය අපිත් කිව්වා. හැබැයි මේ කාරණය සම්බන්ධයෙන් රජය ආපු මාර්ගය මොකක්ද?

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඇමෙරිකා එක්සත් ජනපදය මේ යුද්ධය අවසන් කරන්න අපට උදවු කරපු රාජ්‍යයක්. යුදමය වශයෙන් අවශ්‍ය තොරතුරු ලබා දීලා, ඔවුන්ගේ චන්ද්‍රිකා පහසුකම් ලබා දීලා අපට උදවු කළා. ඉන්දියාව අපට උදවු කළා. ඉන්දියාව තුළ අභ්‍යන්තර ප්‍රශ්න මතු වන විට උපාය මාර්ගිකව ඒ අභ්‍යන්තර විරෝධතා පසෙකට දමන්න කටයුතු කළා. එක්සත් ජාතීන්ගේ සංවිධානය යුද්ධය අවසන් කරන්න අපට ඉඩ දුන්නා. හැබැයි යුද්ධය අවසන් වෙලා දින 4ක් ගත වන කොට 2009 මැයි මාසයේ 23වන දා ශ්‍රී ලංකාවේ ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමාත්, එක්සත් ජාතීන්ගේ මහ ලේකම් බැන් කී මූන් මැතිතුමාත් ඒකාබද්ධ ප්‍රකාශනයකට අත්සන් කළා. ගරු මහින්ද සමරසිංහ ඇමතිතුමා කියපු ආකාරයට එය ගිවිසුමක්; එය එකඟතාවක්. යුද්ධයේ අවසාන කාලයේ යම් හෙයකින් මේ රට තුළ මානුෂිකවාදී නීතිය කඩ කිරීම පිළිබඳ ප්‍රශ්නයක් ඇති වෙලා තිබෙනවා නම්, -අප කියන්නේ නැහැ, එසේ සිදු වී තිබෙනවාය කියලා. රජය කියන්නේත් නැහැ, එසේ සිදු වී තිබෙනවාය කියලා- ඒ පිළිබඳ වගවීම - accountability - සොයා බැලීමට මේ රටේ ජනාධිපතිවරයා එකඟ වුණා.

**ගරු වාසුදේව නානායක්කාර මහතා (ජාතික භාෂා හා සමාජ ඒකාබද්ධතා අමාත්‍යතුමා)**
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார - தேசிய மொழிகள், சமூக ஒருமைப்பாட்டு அமைச்சர்)
(The Hon. Vasudeva Nanayakkara - Minister of National Languages and Social Integration)
ඒක හරි.

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)

ඒක හරි. හරියට හරි. එහෙම එකඟ වුණාම පළමුවන මාස කිහිපය තුළ, පළමුවන අවුරුද්ද තුළ එක්සත් ජාතීන්ගේ සංවිධානය කිව්වේ මොකක්ද? රට තුළ විශ්වාසදායක පරීක්ෂණ ක්‍රියාදාමයක් පවත්වාගෙන යන්නය කියලායි කිව්වේ ගරු වාසුදේව නානායක්කාර ඇමතිතුමා. අපි ප්‍රමාද වුණා. අපි අපේ සතුරාට අවස්ථාව දුන්නා. අපි අපේ සතුරාගේ උපක්‍රමවලට අසු වුණා. අවසානයේදී රට තුළ විශ්වාසදායක පරීක්ෂණයක් පැවැත්වීමට නොහැකි වීම කියන තර්කය පදනම් කර ගෙන, ජාත්‍යන්තර පරීක්ෂණයක් කරා යොමු කරන්නට අපට එරෙහි බලවේග ශක්තිමත් වුණා. හැබැයි, දැන් හැරිලා බලන කොට එක්සත් ජාතීන්ගේ සංවිධානයට - අප කෙරෙහි නැති - අපේ ස්වාධිපත්‍යය කෙරෙහි බලපාන්නා වූ මේ තීරණයට පසු බිම් වුණු, පදනම් වුණු එකඟතාව තමයි, 2009 මැයි මාසයේ 23 වන දා

[ගරු අජිත් පී. පෙරේරා මහතා]

ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමා බෑන් කී මූන් සමඟ අත්සන් කළ වගවීම පිළිබඳව සොයා බැලීම සඳහා වූ එකඟතාව. රාජපක්ෂ මැතිතුමාට පුළුවන්කම තිබුණා - මේ රජයට පුළුවන්කම තිබුණා - රට තුළ නිවැරදි සාධාරණ පරීක්ෂණයක් පවත්වා අපේ රණ විරුවන්ගේ නිර්දෝෂීභාවය ඔප්පු කරන්නට. ඒක කරන්න බැරි වුණා; ඒක කරන්න අසමත් වුණා. LLRC එක පවා ප්‍රමාද කළා. ඒ ක්‍රියාදාමය පසුපසට දැම්මා; ඒක දියාරු කළා. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේ රටේ රට තුළ විශ්වාසනීය ක්‍රියාදාමයක් හරහා රණ විරුවන්ගේ නිර්දෝෂීත්වය ඔප්පු කරන්නට අවස්ථාවක් නොදුන් නිසා අද අපි සතුරු බලවේගවල ගොදුරක් බවට පත්ව සිටිනවා.

වසර පහකට පස්සේ අද අපි යම් ආකාරයක බරපතළ ප්‍රශ්නයකට මුහුණ දී සිටිනවා. මේ ඇති වුණ පාඩුව පිළිබඳව ජනාධිපතිවරයා පමණක් නොව විදේශ අමාත්‍ය ගරු ජී.එල්. පීරිස් මැතිතුමාත් වග කියන්නට අවශ්‍යයි. ඒ වාගේම මානව හිමිකම් පිළිබඳව කටයුතු කළ අමාත්‍ය ගරු මහින්ද සමරසිංහ මැතිතුමාත් වග කියන්නට අවශ්‍යයි.

රජයක් කියන්නේ එක් කෙනෙකු නොවෙයි. අපි පිළිගන්නවා. හැබැයි රාජ්‍ය තාන්ත්‍රික පරාසයන්වල පාඩුව අද විඳින්නට සිදු වෙලා තිබෙන්නේ රට වෙනුවෙන් ජීවිත පරිත්‍යාගයෙන් ඉදිරිපත් වුණ, අපේ ආදරණීය මාතෘ භූමිය වෙනුවෙන් තමන්ගේ රුධිරය හෙළපු රණ විරුවන්ටයි; ඒ රණ විරුවන්ට නායකත්වය දුන් සේනාධිනායකයින්ටයි. එම නිසා මේ රට මේ අවස්ථාවේදී මුහුණ දී තිබෙන දුෂ්කර අවස්ථාවට වග කිව යුතු වන්නේ දුරදිග නොබලා කටයුතු කළ මේ රටේ රාජ්‍ය නායකයාත්, විෂය භාර අමාත්‍යවරුනුත් තමයි. ඒ කාරණය ස්ථිරයි.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අප මේ යෝජනාවට සංශෝධනයක් ඉදිරිපත් කරනවා. මේ සංශෝධනය පිළිගත්තොත් මේ මතු වෙලා තිබෙන දුෂ්කර තත්ත්වයෙන් අපට එළියට යන්නට පුළුවන් වේය කියා අපි විශ්වාස කරනවා. මේ මාතෘ භූමිය තුළ සාධාරණ පරීක්ෂණයක් පවත්වන්නට අවකාශය තිබෙනවාය කියා මේ මොහොතේ හෝ ජාත්‍යන්තර ලෝකය ඉදිරියේ අපට පෙන්නුම් කරන්න පුළුවන් නම් දෙවන ඉණිමක් අපට ලබා ගත හැකියි. පළමුවන ඉණිමය අප පරාදයි. හැබැයි, අපි හරියට කල්පනාවෙන් සැලසුම් කළොත් අපට දෙවන ඉණිමක් තිබෙනවා. අපට විශ්වාසවන්ත දේශීය පරීක්ෂණයක් පවත්වන්න බැහැයි කියා නවනීදන් පිල්ලේ මහත්මිය කියන්නේ ඇයි? මේ රටේ සාධාරණ අධිකරණයක්, ස්වාධීන අධිකරණයක් නැහැයි කියන කාරණය මතයි. මේ රටේ ස්වාධීන අධිකරණයක් තිබෙනවාද? නැහැ. මේ රටේ අග්‍රවිනිශ්චයකාර ධුරයේ සිටි ශිරානි බණ්ඩාරනායක මැතිනියව අනීතික, නීති විරෝධී ක්‍රියා මාර්ග හරහා බලහත්කාරයෙන් තනතුරෙන් පහ කළා. ඒ සම්බන්ධයෙන් සාධාරණ පරීක්ෂණයක් පවත්වන්න මේ පාර්ලිමේන්තුව අසමත් වුණා. ඒ නිසා කියනවා, මේ රටේ ස්වාධීන අධිකරණයක් නැහැයි කියලා. මේ රටේ ශ්‍රේෂ්ඨාධිකරණයට අරලියගහ මන්දිරයේ කුස්සියේ හිටපු මිනිසුන්ව පත් කරනවා. මේ රටේ ශ්‍රේෂ්ඨාධිකරණයට, ඒ වාගේ උත්තරීතර තනතුරුවලට එවැනි පුද්ගලයන් පත් කළ යුතු නැහැ. ආණ්ඩුවේ බැංකුවක සභාපතිවරයෙකුට ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරුකමක් දරන්න පුළුවන්ද? රටේ ඇමතිවරයකුගේ පෞද්ගලික නීති උපදේශකයකුට ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරුකමක් දරන්න පුළුවන්ද? අන්න ඒ නිසා විදේශිකයෝ අපට කියනවා, "බලන්න, ඔබේ රටේ තත්ත්වය. ඉහළ අධිකරණවල තත්ත්වය බලන්න. අපට විශ්වාස නැහැ" කියලා.

මේ රටේ අධිකරණයට සහාය වන ආයතනය නීතිපති දෙපාර්තමේන්තුවයි. වාසුදේව නානායක්කාර ඇමතිතුමා හොඳාකාරවම දන්නවා, මේ රටේ ඉතිහාසයේ පළමුවැනි වතාවට නීතිපති දෙපාර්තමේන්තුව විධායකයේ තනි බලයට

*[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]*
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[Expunged on the order of the Chair.]*

අතට අරගෙන තිබෙනවා කියලා. නීතිපති දෙපාර්තමේන්තුව ස්වාධීන ආයතනයක්. නීතිපතිවරයාගේ තනතුරම ස්වාධීන තත්ත්වයක් සහිත සුවිශේෂ තනතුරක්. ඒ තනතුර

*[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]*
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[Expunged on the order of the Chair.]*

තනි අභිමතයට, තනි පාලනයට, ගත්තාම ඒකෙන් ඇති වන තත්ත්වය කුමක්ද? මේ රටේ අධිකරණයේ ස්වාධීනත්වය පිළිබඳව -

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
Sir, I rise to a point of Order.

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
Hon. Azwer, what is your point of Order?

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
Sir, he is referring to the conduct of His Excellency the President, which he cannot do. What he says is wrong; what he says is against the Standing Orders.

*[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]*
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[Expunged on the order of the Chair.]*

තනි මතයට අරගෙන තිබෙනවා කියන එක හැන්සාඩ් වාර්තාවෙන් ඉවත් කරන්නට ඕනෑ.

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
If there is anything against the Standing Orders, that portion will be expunged. Hon. Member, you carry on.

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේ රටේ නීතිපති දෙපාර්තමේන්තුව ගැන අපට ප්‍රශ්න මතු වෙනවා. මේ රටේ නීතිපති දෙපාර්තමේන්තුවට ඇඟිලි ගැසීම ගැන ප්‍රශ්න මතු වෙනවා. මේ පාර්ලිමේන්තුවේ ධුර දරන මන්ත්‍රීවරුන්ට අදාළව, රජය සම්බන්ධ පුද්ගලයන් සම්බන්ධව අධි චෝදනා පත්‍ර පදනම් විරහිතව ඉල්ලා අස් කර ගන්නකොට, මිනී මැරුම්, ස්ත්‍රී දූෂණ චෝදනා පිළිබඳව අධි චෝදනා පත්‍ර ඉල්ලා අස්කර ගන්නකොට, ඒ පිළිබඳව මේ රටේ විශ්වාසය නැති වෙලා තිබෙනවා. ඒ බව ලෝකය දන්නවා. ලෝකයට හංගන්න බැහැ. ඒ නිසා කියනවා, එහෙව් රටක කොහොමද ස්වාධීන පරීක්ෂණ පවත්වන්නේ කියා.

මේ රටේ පොලිසිය ගැන මොන කථාද? අපේ ඇස් දෙක ඉස්සරහා මාධ්‍යවේදීන්ට එරෙහිව පිස්තෝලය රැගෙන ආපු හම්බන්තොට නගරාධිපතිවරයාව අද වෙනකන් අත් අඩංගුවට ගන්නට බැරි වෙලා තිබෙනවා. ඒක එක උදාහරණයක් විතරයි. ඒක නරකම නරක උදාහරණයක් විතරයි. එවැනි අවස්ථා සිය ගණනක් තිබෙනවා. සාමාන්‍යයෙන් සිරිපාලට, ගුණපාලට, නීතිය යම් ප්‍රමාණයක් තිබෙනවා වන්නට පුළුවන්. හැබැයි දේශපාලන බලයක් දරන කෙනෙක්, රජයට සම්බන්ධ කෙනෙක්, ධනවත් කෙනෙක්, බලවත් කෙනෙක් එක පැත්තකට ඉන්නකොට පොලිසිය ගන්නේ ඒ දේශපාලන බලය සමඟ තිබෙන පැත්තයි. පොලිසිය ගන්නේ ධනය තිබෙන පැත්තයි. සාධාරණ පැත්ත නොවෙයි. ඉතින් මේ තත්ත්වය මත අද විශ්වාසය නැති වෙලා තිබෙනවා, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි.

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
ගරු මන්ත්‍රීතුමාට නියමිත වෙලාව ඉවරයි. දැන් අවසන් කරන්න.

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
මා අවසන් කරනවා, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි.

අපේ පක්ෂය ඉදිරිපත් කරන සංශෝධනය මෙයයි. මේ රටේ සාධාරණ අධිකරණයක්, සාධාරණ පොලිසියක්, ස්වාධීන නීතිපති දෙපාර්තමේන්තුවක් ස්ථාපනය කිරීම සඳහා මේ ආණ්ඩුවම පත් කරපු, ජනාධිපතිතුමාම පත් කරපු LLRC කොමිසමේ වාර්තාවේ නිර්දේශ පළමුවෙන් ක්‍රියා කළ යුතුයි. දහඅත්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ තිබුණු, පසුව අත්හැර දමපු අධිකරණයේ, රාජ්‍ය සේවයේ, පොලිසියේ ස්වාධීනත්වයට අදාළ ඒ වැදගත් මූලධර්ම නැවත ගෙන ආ යුතුයි. ඒ වාගේම අධිකරණයේ ස්වාධීනත්වය තහවුරු කිරීම සඳහා Latimer House මූලධර්ම සහිත ව්‍යවස්ථා ප්‍රතිපාදන ගෙන ආ යුතුයි. එහෙම කළොත් අන්න එදාට අපේ රටේ අධිකරණයක්, අපේ රටේ විනිශ්චයකාරවරුන්, අපේ රටේ නීතිඥවරුන් යටතේ, රටේ භූමිය ඇතුළේ ශ්‍රී ලංකාවේ නීතියට අනුකූලව මේ යුද්ධය පිළිබඳව පරීක්ෂණ පවත්වන්නට අවස්ථාව ලැබෙනවා. එහෙම වුණොත් මේ ජාත්‍යන්තර උගුලෙන් ගොඩ එන්නට අපට අවස්ථාව ලැබෙනවා. ඒ නිසා දෙවියන්ගේ නාමයට අපත් එක්ක එකඟ වන්න. අපි අත් දෙකම ඔසවලා සංශෝධනවලට යටත්ව මෙම යෝජනාවට කැමැත්ත දෙනවා.

[අ.භා. 3.34]

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා (ජලසම්පාදන හා ජලාපවහන අමාත්‍යතුමා සහ ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා)**
(மாண்புமிகு தினேஷ் குணவர்தன - நீர்வழங்கல், வடிகாலமைப்பு அமைச்சரும் அரசாங்கத் தரப்பின் முதற்கோலாசானும்)
(The Hon. Dinesh Gunawardena - Minister of Water Supply and Drainage and Chief Government Whip)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අපේ රටේ ජාතික නිදහස, ස්වාධීනත්වය, ස්වෛරීභාවය හා පැවැත්ම පිළිබඳ ඉතා වැදගත් වන යෝජනාවක් පාර්ලිමේන්තුව හමුවට ඉදිරිපත් කළ ගරු මන්ත්‍රීතුමන්ලාට අපි පළමු කොට ස්තුතිවන්ත වෙනවා. එම යෝජනාවට අප සියලු දෙනාගේ සහයෝගය ලබා දීමට අප බැඳී සිටින බවත් ඒ සඳහා කටයුතු කළ බවත් මගේ කථාව ආරම්භයේදී ප්‍රකාශ කරන්නට කැමැතියි.

එක්සත් ජාතික පක්ෂයේ පළමුවැනි තර්කය වූයේ මේ යෝජනාවට අදාළ කාරණය මේ පාර්ලිමේන්තුවට අයත් දෙයක් නොවෙයි කියන එකයි. විරුද්ධ පාර්ශ්වයේ ප්‍රධාන පක්ෂය වන එක්සත් ජාතික පක්ෂය මුලින්ම උත්සාහ දැරුවේ මේකෙන් මඟ හරින්නයි. මෙය පාර්ලිමේන්තුවට අයිති නැහැ කියන්නේ කොහොමද? පසු ගිය තිස් අවුරුද්ද තුළ ත්‍රස්තවාදය හා බෙදුම්වාදය පරාජය කිරීම පිළිබඳ ප්‍රශ්න හමුවේ විදේශ ප්‍රතිපත්තිය සම්බන්ධයෙන්, ජාතික ආරක්ෂාව සම්බන්ධයෙන් පාර්ලිමේන්තුවේ අවසරය ගන්න විවිධ ආකාරයෙන් සාකච්ඡා කරමින් කටයුතු කරන්නට අපි මැදිහත් වුණු බව කවුරුත් ඉතා හොඳින් දන්නවා. ඒ වාගේම ගරු ජේ.ආර්. ජයවර්ධන ජනාධිපතිතුමාත් පාර්ලිමේන්තුවට ඇවිල්ලා මේ ගැන කිව්වා. අපේ ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමාත් මේ සටන පිළිබඳව පාර්ලිමේන්තුවට කිව්වා. සටන ජයග්‍රහණය කළාට පසුවත් පාර්ලිමේන්තුවට ඇවිල්ලා ඒ ගැන කිව්වා. මේ පාර්ලිමේන්තුවට තිබෙන වගකීම වන්නේ මහ ජනතාවගේ නියෝජිතයන්ගෙන් සමන්විත පාර්ලිමේන්තුවේ උත්තරීතරභාවය මත කටයුතු කිරීමයි. එක්සත් ජාතික පක්ෂය ඒ හැකියාව නැහැයි කියා කියන්න දරපු උත්සාහය අද අසාර්ථක වී තිබෙන බව මා පළමුවෙන්ම කියන්නට ඕනෑ. අපි පාර්ලිමේන්තු මන්ත්‍රීවරු හැටියට අපේ රටේ විදේශ ප්‍රතිපත්තිය පිළිබඳව සහ ජාතික ආරක්ෂාව පිළිබඳව මතු වන ප්‍රශ්න ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුව සාකච්ඡාවට ලක් කරලා තිබෙනවා. අවුරුදු අටකට, විස්සකට වැඩි කාලයක් පාර්ලිමේන්තුව තුළ හදිසි නීතිය විවාද කර තිබෙනවා. එදිනෙදා අපේ ආරක්ෂක හමුදාවන් පවත්වාගෙන යන්න පාර්ලිමේන්තුවෙන් අවසරය ගන්න අපට සිද්ධ වුණා. එසේ කරපු පාර්ලිමේන්තුවකට මේ පරීක්ෂණය ගැන අදහස් පළ කරන්නට බැහැ කියලා කියන්නට ඉදිරිපත් වීම ගැන මම කනගාටු වෙනවා.

මානව හිමිකම් කොමසාරිස්වරිය මේ පරීක්ෂණය ඇති කිරීමට මත්තෙන් දීර්ඝ කාලයක් තිස්සේ විදේශීය බලපෑම්වලට අපේ රට මුහුණ දුන් බව අපි දන්නවා. ලෝකය බෙදා ගැනීමේ කෲරතර ක්‍රියා මාර්ගවල යෙදුණු අධිරාජ්‍යවාදී රටවල් කිහිපයක් තමන්ගේ අධිරාජ්‍යයන් කඩා වැටිලාත් ඒවා පවත්වාගෙන යන නව විධික්‍රම පිළිබඳව හා තම උපාය මාර්ග අත හැර නැති බවත් අපි තරයේ විශ්වාස කරනවා. ඒ උපාය මාර්ගයන් හඳුනා ගනිමින් ඒවාට ප්‍රතික්‍රියා දැක්වීමට පුළුවන් ස්වෛරී, නිදහස්, ස්වාධීන, ස්වාධිපත්‍ය බලය ක්‍රියාත්මක කළ හැකි රටක් හැටියට ශ්‍රී ලංකාවේ වගකීම ඉෂ්ට කරන්න අපි බැඳී සිටින බව සඳහන් කරන්නට ඕනෑ.

ඉදිරියේදී පවත්වන්නට තිබෙන මේ පරීක්ෂණය පිළිබඳව කථා කරන කොට නවනීදන් පිල්ලේ මහත්මිය 2009 දී අප රට ත්‍රස්තවාදය පැරද වීමෙන් පසුව කළ ප්‍රකාශයක් මම ඉදිරිපත් කරන්න කැමැතියි. In a statement she said that Sri Lanka conducted a war against the LTTE in the guise of fighting terrorism. පරීක්ෂණයකට අවතීර්ණ වෙන්නට කලින් එතුමිය එවැනි ප්‍රකාශයක් කළා. එසේ ප්‍රකාශ කරන්නට කටයුතු කරන කොට රටවල් 35ක්ම එල්ටීටීඊ සංවිධානය තහනම් සංවිධානයක් බවට නම් කරලා තිබුණා. ඒ නිසා ඒවා ගැන කිසිදු තැකීමකින් තොරව ශ්‍රී ලංකාවේ ත්‍රස්තවාදී ප්‍රශ්නය හමාර කිරීමට කටයුතු කළා. ඇමෙරිකාවේ ප්‍රධාන ආර්ථික මධ්‍යස්ථානයට ත්‍රස්තවාදීන් එල්ල කළ 9/11 ප්‍රහාරයෙන් පස්සේ එක්සත් ජාතීන්ගේ සංවිධානය එක්සත් ජාතීන්ගේ මහා මණ්ඩලයට ගිහිල්ලා ත්‍රස්තවාදය පරාජයට පත් කරන්නට ඕනෑ කියලා ප්‍රකාශනයක් සම්මත කළා. ඒ ප්‍රකාශනයට බැඳී හිටපු රටවල් හා එක්ව ශ්‍රී ලංකාව ගත් පියවර නිසා අපේ රටේ ත්‍රස්තවාදය පරාජයට පත් කරන්න පුළුවන් වුණා. ඒ වරම මේ රටේ ජනතාව මේ පාර්ලිමේන්තුවටත්, මේ රජයටත් දුන්නා. අතිගරු ජනාධිපතිතුමාට ජනවරම දුන්නා, ඒ කටයුතු ඉටු කර නිදහස් රටක් ඇති කිරීම සඳහා. ත්‍රස්තවාදය ජයග්‍රහණය කළ එකම රට ශ්‍රී ලංකාව පමණයි. ඇමෙරිකා එක්සත් ජනපදය බලන ඇසින් හෝ මහා බ්‍රිතාන්‍ය බලන ඇසින් හෝ ඔවුන්ගේ හිතාදර

[ගරු දිනේෂ් ගුණවර්ධන මහතා]

ක්‍රියාදාමයේ යෙදී සිටින අය බලන ඇසින් නොබලන රටවල් ලෝකයේ විශාල ප්‍රමාණයක් තිබෙනවා. ඒ රටවල් ශ්‍රී ලංකාවේ ජයග්‍රහණයත්, ශ්‍රී ලංකාව ළඟා කර ගෙන ඇති ප්‍රගතියත්, ශ්‍රී ලංකාව ඇති කර ගෙන තිබෙන නිදහසට, ස්වාධීනත්වයට හා සංවර්ධනයට සහෝදරත්වය හා මිත්‍රත්වය ප්‍රකාශ කරන ක්‍රියාවලිය හැම ජාත්‍යන්තර වේදිකාවකම ප්‍රකාශ කළා. එය එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කොමිසම හමුවේත් ප්‍රකාශ කරලා තිබෙනවා. මේ පරීක්ෂණය පිළිබඳ කතන්දරය අද සාකච්ඡා වන කොට අපට ඒවා කිසි ලෙසකින් අමතක කරන්නට බැහැ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, විරුද්ධ පාර්ශ්වයේ ප්‍රධාන පක්ෂය වන එක්සත් ජාතික පක්ෂයේ ගරු මන්ත්‍රීතුමන්ලා තවත් කාරණාවක් සඳහන් කළා. ඒ තමයි, මේ තොරතුරු ගැන අදාළ කිසිම පරීක්ෂණයක් අපි කරලා නැහැ කියලා. අපේ රජය දිගින් දිගටම ප්‍රකාශ කරලා තිබෙනවා -මේ පාර්ලිමේන්තුවේදීත් ප්‍රකාශ කරලා තිබෙනවා- LLRC කොමිෂම පත් කිරීමත්, LLRC කොමිෂම එකතු කරන ලද කරුණු පදනම් කර ගනිමින් ඒ ප්‍රශ්න විසඳීම සඳහා නොනැවතෙන ක්‍රියා මාර්ගයක් ආරම්භ කරලා තිබෙන බව. මට පෙර කථා කළ මගේ මිත්‍ර ගරු අජිත් පී. පෙරේරා මන්ත්‍රීතුමා සඳහන් කළා, LLRC එක සම්බන්ධයෙන් අපි කිසිවක් කළේ නැහැ කියලා. එතුමා අද කථා කරන Human Rights Council එකේදීත් LLRC එක අරගෙන තිබෙන ප්‍රගතිය හා පියවර ප්‍රශංසාවට ලක් කරලා තිබෙන රටවල්ම තමයි අද මේ ක්‍රියාවලිය ගැන කථා කරන්නේ. අපි පියවරෙන් පියවර ඒ ප්‍රශ්න විසඳීම සඳහා කටයුතු කරනවා. ඒ වාගේම අතුරුදන්වූවන් ගැන හෝ විවිධ පැමිණිලි තිබෙන අය ගැන පරීක්ෂා කිරීමේ විශේෂ කොමිසමක් පත් කරලා ඒ පිළිබඳව කටයුතු කර ගෙන යනවා. ශ්‍රී ලංකාව තුළ ඇති කරලා තිබෙන එවැනි විවිධ ක්‍රියා මාර්ග තුළින් මේ පිළිබඳව යම් සැකයන් තිබෙනවා නම් ඒවා දුරු කිරීමටත්, ප්‍රජාතන්ත්‍රවාදී ක්‍රියාදාමය ශක්තිමත් කිරීමටත් කටයුතු කරලා තිබෙනවා.

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
Hon. Minister, please wind up now.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, වේලාව මදිකම නිසා මගේ කථාව මීට වඩා දිග් කරන්න පුළුවන්කමක් නැහැ. නමුත් මම ඉතා ඕනෑකමින් මේ කාරණය කියනවා. විරුද්ධ පක්ෂයට යුතුකමක් තිබෙනවා මේ යෝජනාවට තමන්ගේ ඡන්දය පාවිච්චි කරලා සහයෝගය දීමට. එක්සත් ජාතික පක්ෂ ආණ්ඩු තිබුණු කාලයේ අපි විරුද්ධ පක්ෂයේ ඉන්න කොට අපේ මවු බිමේ ස්වාධීනත්වය, ස්වෛරීභාවය, නිදහස ආරක්ෂා කිරීමට අපිත් එසේ කටයුතු කළා. අපේ රජය ලබා ගත් මහා විජයග්‍රාහී නිදහසට එරෙහිව මේ පරීක්ෂණ කරන්න හදන්න වෙලාවේ අපේ මාතෘ භූමියට සිදු වන විදේශ ඇඟිලි ගැසීම් නවත්වන්නටත්, අපේ හමුදාව දඬයම් කරන්න හදන වෙලාවේ ඔවුන් කළ මහා පරිත්‍යාගයට කළගුණ දක්වන්නත් පක්ෂ භේදයෙන් තොරව ඉදිරිපත් වන්න. අවසානයේ මෙකෙන් සිදු වන්නේ පරීක්ෂණයක් පමණක් නොවන බවට අද මම අනතුරු අඟවනවා. ත්‍රස්තවාදයට යළි හිස එසවීමට ඉඩ දීමත්, අපේ මාතෘ භූමිය බෙදීමේ කුමන්ත්‍රණය වෙනුවෙන් මේ කටයුත්ත සිදු වනවාය කියන ටික අපි විරුද්ධ පක්ෂයට අනතුරු අඟවනවා. විපක්ෂයේ ඔබ මේ යෝජනාවට එකඟතාව පළ කරමින් තමයි සංශෝධන යෝජනාවක් ඉදිරිපත් කරලා තිබෙන්නේ. ඒ නිසා සංශෝධන යෝජනාව ඉවත් කරලා මේ යෝජනාව සම්මත කරලා එකම පාර්ලිමේන්තුවක සියලු දෙනා මාතෘ භූමිය වෙනුවෙන් තම යුතුකම ඉෂ්ට කරන්න එකතු වන්න කියලා ආරාධනා කරනවා.

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
The next speaker is the Hon. P. Ariyanethran. Before he starts, will an Hon. Member propose the Hon. Ajith P. Perera to take the Chair?

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
Sir, I propose that the Hon. Ajith P. Perera do now take the Chair.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***අනතුරුව නියෝජ්‍ය කාරක සභාපතිතුමා මූලාසනයෙන් ඉවත් වුයෙන්, ගරු අජිත් පී. පෙරේරා මහතා මූලාසනාරූඪ විය.***

*அதன் பிறகு, குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு அஜித் பீ. பெரேரா அவர்கள் தலைமை வகித்தார்கள்.*

*Whereupon* MR. DEPUTY CHAIRMAN OF COMMITTEES *left the Chair, and* THE HON. AJITH P. PERERA *took the Chair.*

[பி.ப. 3.44]

**ගරු පී. අරියනේත්‍රන් මහතා**
(மாண்புமிகு பா. அரியநேத்திரன்)
(The Hon P. Ariyanethran)
கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, ஐக்கிய நாடுகளின் மனித உரிமைகள் ஆணையாளர் அலுவலகத் தினால் இலங்கைக்கு எதிரான விசாரணை மேற்கொள்ளப் படக்கூடாது என்ற பிரேரணை தொடர்பாக இச்சபையிலே நேற்றிலிருந்து இன்றுவரை நடைபெற்றுவரும் விவாதத்தில் நானும் கலந்துகொண்டு பேசுவதில் மகிழ்ச்சியடைகின்றேன். இது தொடர்பில் இங்கு பல வாதப் பிரதிவாதங்கள் முன்வைக்கப்பட்டன. நாங்கள் இதிலிருந்து ஒரு விடயத்தைப் பார்க்கவேண்டியவர்களாக இருக்கின்றோம். ஒரு நாடு என்று சொல்லும்போது, அந்த நாட்டில் மக்கள் சுதந்திரமாக வாழ்கின் றார்களா? என்பதைத்தான் நாங்கள் முதலில் பார்க்கவேண்டும். இந்த நாட்டின் வடக்கு, கிழக்குப் பகுதிகளில் ஓர் இனமாக வாழ்கின்ற தமிழ் மக்கள் கடந்த போராட்ட காலத்திலும் இறுதி யுத்தத்தின்போதும் மிகவும் பாதிக்கப்பட்டார்கள்; அவர்களில் இலட்சக்கணக்கானோர் கொல்லப்பட்டார்கள்.

இறுதி யுத்தமானது, நான் பிரதிநிதித்துவப்படுத்துகின்ற கிழக்கு மாகாணத்தில்தான் ஆரம்பிக்கப்பட்டது. 2006ஆம் ஆண்டு மே மாதம் 03ஆம் திகதி மாவிலாறில் ஆரம்பிக்கப் பட்டு தொடர்ச்சியாக மட்டக்களப்பு, படுவான்கரை, வாகரை மற்றும் மன்னார், கிளிநொச்சி, முல்லைத்தீவு-முள்ளிவாய்க் கால்வரை சென்றது. இந்தப் போர் ஆரம்பிக்கப்பட்டதிலிருந்து இறுதிவரையில் நிகழ்ந்த பல்வேறுபட்ட அனர்த்தங்களில் வடக்கு, கிழக்கைச் சேர்ந்த பல்லாயிரக்கணக்கான மக்கள் இறந்திருக்கின்றார்கள். அவ்வாறே, 2004ஆம் ஆண்டு இப்பாராளுமன்றத்தில் அங்கம் வகித்த மூன்று பாராளுமன்ற உறுப்பினர்களை இறுதி யுத்தத்தின் நிமித்தமாக நாங்கள் இழந்திருக்கின்றோம். குறிப்பாக, 2005ஆம் ஆண்டு டிசம்பர் மாதம் 25ஆம் திகதி மட்டக்களப்பு மாவட்டப் பாராளுமன்ற உறுப்பினர் ஜோசப் பரராஜசிங்கம் அவர்கள் அங்குள்ள தேவாலயமொன்றில் சுட்டுக்கொல்லப்பட்டார். அவ்வாறே, 2006ஆம் ஆண்டு நவம்பர் மாதம் 10ஆம் திகதி யாழ்.

மாவட்டப் பாராளுமன்ற உறுப்பினரான நடராசா ரவிராஜ் கொழும்பில் சுட்டுக்கொல்லப்பட்டார். இதேபோன்று 2007ஆம் ஆண்டு யாழ். மாவட்டப் பாராளுமன்ற உறுப்பினரான சிவநேசன் அவர்கள் வன்னியில் சுட்டுக்கொல்லப்பட்டார். எனவே, இந்த யுத்தத்தில் பொதுமக்கள் மாத்திரம் கொலை செய்யப்பட வில்லை. மாறாக, மக்கள் பிரதிநிதிகளாக இருக்கின்ற பாராளு மன்ற உறுப்பினர்களும் படுகொலை செய்யப்பட்டிருக் கின்றார்கள் என்பதை நீங்கள் புரிந்துகொள்ள வேண்டும்.

இப்போரின் இறுதி நாட்களில் பல்லாயிரக்கணக்கான மக்கள் - ஏறக்குறைய 1,47,000 பேர் படுகொலை செய்யப்பட்ட தாகப் பல்வேறுபட்ட தகவல்கள் தெரிவிக்கின்றன. இதனை ஐக்கிய நாடுகளின் மனித உரிமைகள் ஆணையாளர் மட்டு மல்ல, மன்னாரிலுள்ள ஆயர் அவர்கள்கூட உறுதிப்படுத்தி யிருக்கின்றார். ஆகவே, நாங்கள் கேட்பது என்னவெனில், சர்வதேச விசாரணை ஒன்றின்மூலமாக குற்றமிழைத்தவர்கள் தண்டிக்கப்படவேண்டும் என்றுதான். ஆனால், இப்பாராளு மன்றத்தில் சிலர் ஆற்றிய உரைகள், தண்டனை வழங்கப்பட்டுவிட்டதுபோன்றே அமைந்திருக்கின்றன. இலங்கையும் ஐக்கிய நாடுகள் சபையில் அங்கம் வகிக்கின்ற ஒரு நாடுதான். அப்படியான ஒரு நாட்டில் வாழுகின்ற ஓர் இனத்துக்கு அந்த நாட்டுக்குள் தீர்வு கிடைக்காத பட்சத்தில், இன்னொரு நாட்டிடம் தீர்வைக் கேட்பதில் என்ன தவறு இருக்கின்றது? என நான் கேட்க விரும்புகின்றேன். இதிலே நீங்கள் ஒன்றைப் புரிந்துகொள்ள வேண்டும். இறுதி யுத்தத்தில் 21 சர்வதேச நாடுகள் இந்த அரசாங்கத்திற்கு உதவியிருந்தன. அப்போது இந்த விடயங்களை நீங்கள் எவருமே கவனத்தில் எடுக்கவில்லை. ஆனால், இங்கு மனிதப் படுகொலைகள், அவலங்கள் இடம்பெற்றதற்குப் பிற்பாடு அதற்கான ஒரு விசாரணை நடைபெறவேண்டுமென்று சம்பந்தப்பட்ட நாடுகள் கூறுகின்றபோது அதைத் தடுப்பதில் என்ன நியாயம் இருக்கின்றதென்பதை நான் கேட்க விரும்புகின்றேன்.

நேற்று இங்கு பேசிய பல உறுப்பினர்கள், இலங்கையின் அரசியல் யாப்பின் நிமித்தம் ஓர் இறைமையுள்ள நாட்டிலே இன்னொரு நாடு தலையிடக்கூடாது என்று கூறியிருந்தார்கள். நான் அதனை ஏற்றுக்கொள்கின்றேன். ஆனால், மாறி மாறிப் பதவிக்கு வந்த அரசாங்கங்கள் உருவாக்கிய எந்த அரசியல் யாப்பையும் எங்கள் தமிழ்த் தரப்பிலிருந்த தலைமைகள் ஏற்றுக்கொள்ளவில்லை என்பதை நீங்கள் முதலில் புரிந்துகொள்ள வேண்டும். தமிழர் தரப்புக்கள் ஏற்றுக் கொள்ளாமலேதான் இந்த அரசியலமைப்பும் உருவாக்கப் பட்டது. நாட்டிலே இருக்கின்ற சகல இன மக்களையும் சமமாகப் பார்த்திருந்தால் இந்த அவலங்களுக்கு முகங் கொடுக்க வேண்டிய தேவை உங்களுக்கு ஏற்பட்டிருக்காது.

இப்பொழுது நீங்கள் நாட்டுப்பற்று பற்றிக் கூறுகின்றீர்கள்! எதிர்க்கட்சியினரும் உங்களுக்கு ஆதரவு அளிக்கவேண்டு மென்று கேட்கின்றீர்கள். எதிர்க்கட்சிகளில் பிரதானமாக இருப்பது ஐக்கிய தேசியக் கட்சி. அது பெரும்பான்மைச் சிங்கள மக்களைப் பிரதிநிதித்துவப்படுத்துகின்ற ஒரு கட்சியாகும். நிச்சயமாக அவர்கள் இதற்கு ஆதரவளிப் பார்களோ, இல்லையோ என்பது எங்களுக்குத் தெரியாது. அடுத்ததாக, ஜே.வி.பீ.யினரை எடுத்துக்கொண்டால், அவர்கள் இதற்கு ஆதரவளிக்கலாம் அல்லது ஆதரவளிக்காமல் இருந்துவிடலாம். ஆனால், தமிழ்த் தேசியக் கூட்டமைப்பு என்பது வடக்கு, கிழக்கிலே இருக்கின்ற தமிழ் மக்களுக்காக, அவர்களின் ஜனநாயக உரிமைகளைக் காப்பாற்றுவதற்காக, அவர்களின் வாக்குகளால் அங்கீகரிக்கப்பட்ட ஒரு கட்சியாக இருக்கின்றது. இங்கு ஐக்கிய நாடுகள் சபையின் விசாரணை நடைபெற வேண்டுமென்பதற்காக அங்கு சென்றது தமிழ்த் தேசியக் கூட்டமைப்பு மட்டுமே என்பதை நீங்கள் புரிந்துகொள்ள வேண்டும். ஆகவே, நிச்சயமாக அத்தகைய ஒரு விசாரணை நடைபெற வேண்டும். அதற்கு நாங்கள் எல்லோரும் பூரண ஆதரவளிக்க வேண்டும். அரசாங்கத்தில் இருப்பவர்கள் இதற்கு விட்டுக்கொடுக்க வேண்டும். ஏனென்றால், இந்த விசாரணையின்மூலம் குற்றவாளி யாரென்பதை நாங்கள் தெரிந்துகொள்ள வேண்டும். குற்றவாளி யாரென்பதை அறிவதற்கு முன்பே, தாங்கள் குற்றவாளியாகி விடுவோமோ என்ற பீதி அரசாங்கத்திடம் காணப்படுகின்றது. இந்த விசாரணை நேர்மையானதாக இருக்க வேண்டுமென்று நாங்கள் உங்களிடம் கேட்டுக் கொள்ள விரும்புகின்றோம்.

இதிலே இன்னுமொன்றையும் நாங்கள் கூற வேண்டியவர் களாக இருக்கின்றோம். குற்றங்களைச் செய்தவர்கள், அதற்கு உடந்தையானவர்கள் பலர் அரசாங்கத்திலே இருக்கின் றார்கள். ஆகவே, குற்றங்களைச் செய்தவர்களுக்குத் தண்டனை வழங்கவேண்டிய ஓர் அரசாங்கம், குற்றவாளி களையே தன்னுடன் வைத்துக்கொண்டு எவ்வாறு அவர்களைத் தண்டிக்கப்போகின்றது? கடந்த 5 வருடங்களுக்குள் உள்ளூர் விசாரணைகளை நடத்துவதற்கான சந்தர்ப்பம் இருந்தது. இந்தக் காலப்பகுதியில் எந்த விசாரணையும் செய்யப்படவில்லை. ஜனாதிபதி அவர்கள் கற்றுக்கொண்ட பாடங்கள் மற்றும் நல்லிணக்க ஆணைக் குழுவை நியமிக்கும்போதுகூட இந்தப் பாராளுமன்றத்தின் அங்கீகாரத்தைப் பெறவில்லை. நிறைவேற்று அதிகாரத்தை வைத்துக்கொண்டு தன்னிச்சையாக அந்த ஆணைக்குழுவை அவர் நியமித்தார். அந்த ஆணைக்குழு செய்த பரிந்துரைகள் தொடர்பாகவும் இந்தப் பாராளுமன்றத்தில் விவாதத்திற்கு எடுத்துக்கொள்ளப்படவில்லை. ஆனால், இப்பொழுது சர்வ தேச விசாரணை என்றவுடன் எந்தவகையில் அதைப் பாராளுமன்றத்தில் கொண்டுவந்து விவாதிக்க முடியும்? என்பதைத்தான் நாங்கள் கேட்கின்றோம்.

இந்த விடயங்களை நாங்கள் மேலும் உன்னிப்பாகப் பார்க்கும்போது, இறுதி யுத்தம் நடந்த வேளையிலே நிகழ்ந்த ஒரு சம்பவம் ஞாபகத்துக்கு வருகின்றது. 2007ஆம் ஆண்டு வரவு செலவுத்திட்ட வாக்கெடுப்பின்போது தமிழ்த் தேசியக் கூட்டமைப்பு பாராளுமன்ற உறுப்பினர்களை அரசாங்கத் துக்குச் சார்பாக வாக்களிக்கச்செய்ய வேண்டுமென்பதற்காக எங்களின் உறவினர்களைத் துப்பாக்கிமுனையில் கடத்தி வைத்துக்கொண்டு, இந்தப் பாராளுமன்றத்திலே எங்களை ஜனநாயக ரீதியாக வாக்களிக்கவிடாமல் தடுத்த வரலாறும் இருக்கின்றது. இவைகளையெல்லாம் சர்வதேசத்தின் கவனத்துக்குக் கொண்டுசெல்ல வேண்டிய தேவை எங்களுக்கு இருக்கின்றது. ஜனநாயகரீதியான ஓர் ஆட்சி நடைபெறுவ தாகக் கூறுகின்ற ஓர் அரசாங்கத்தின் செயற்பாடுகளே இவை! அன்று எங்களை வாக்களிக்க விடாமல் தடுத்தவர்கள் இன்றும் இந்த அரசாங்கத்திலே அங்கம் வகித்துக்கொண்டிருக் கின்றார்கள். பலர் ஆலோசகர்களாக இருக்கின்றார்கள்; இன்னும் பலர் இணைப்பாளர்களாக இருக்கின்றார்கள். மக்களைக் கடத்திய அந்த இணைப்பாளர்கள் இன்று கிழக்கு மாகாண சபையிலே உறுப்பினர்களாக நியமனம் பெற்றுவிட்டார்கள். ஆகவே, சர்வதேசத்தின் மூலமாக ஒரு சுயாதீன விசாரணையைச் செய்வதால் மட்டும்தான் இவ்வாறான விடயங்களைத் தடுக்க முடியும். இல்லையேல், இலங்கை அரசாங்கத்தினால் நிச்சயமாக நாங்கள் தொடர்ந்தும் ஏமாற்றப்படுவோம். எனவே, தமிழ்த் தேசியக் கூட்டமைப்பு இந்தப் பிரேரணையை எதிர்த்து வாக்களிக்கும் என்று கூறி, விடைபெறுகின்றேன். நன்றி. வணக்கம்.

[අ.භා. 3.53]

**ගරු ඩිව් ගුණසේකර මහතා (මානව සම්පත් පිළිබඳ අමාත්‍යතුමා)**

(மாண்புமிகு டியூ குணசேகர - மனித வளங்கள் அமைச்சர்)

(The Hon. DEW Gunasekara - Minister of Human Resources)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, වේලාව සීමිත නිසා මගේ ලිඛිත කථාව ඉදිරිපත් කිරීමට බලාපොරොත්තු වෙනවා. මේ ගරු සභාව හමුවේ තිබෙන, ආණ්ඩු පක්ෂයේ ගරු මන්ත්‍රීවරුන් නව දෙනෙකු විසින් ඉදිරිපත් කර ඇති යෝජනාව සම්බන්ධයෙන් ආණ්ඩු පක්ෂයේ පාර්ශ්වකරුවකු වශයෙන් ශ්‍රී ලංකාවේ කොමියුනිස්ට් පක්ෂය වෙනුවෙන් අපේ ස්ථාවරය පැහැදිලි කිරීමට මම උත්සාහ ගන්නවා.

පළමුව, ජිනීවා මානව හිමිකම් කවුන්සිලය හරහා ඇමෙරිකාව විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව අනවශ්‍ය දෙයක්. එය අපේ අභ්‍යන්තර ප්‍රශ්නවලට ඇඟිලි ගැසීමක්. එය අපේ රටේ ස්වාධිපත්‍යය, ආත්ම ගෞරවය සහ උදාරභාවයට තර්ජනයක්. යුද්ධයෙන් පසු සාමය අපේක්ෂාවෙන් සිටින ශ්‍රී ලාංකික ජනතාවගේ ප්‍රතිසන්ධාන ක්‍රියාවලියට බාධාවක්, බාධකයක්. අන්තවාදී හැඟීම් ඇවිස්සීමක්, ත්‍රස්තවාදයට හා බෙදුම්වාදයට ධෛර්යය දීමක්.

අපේ ප්‍රශ්න අපට විසඳා ගැනීමට ඉඩ දෙන ලෙස ඇන්ග්ලෝ-ඇමෙරිකානු ආධිපත්‍යයට අපි දැඩි ලෙස කියා සිටිනවා.

මේ යෝජනාව පිටුපසින් ක්‍රියාත්මක වන බලවේගය එක්සත් ජාතීන්ගේ සංවිධානය කියලා මම පිළිගන්නේ නැහැ. ඇන්ග්ලෝ-ඇමෙරිකන් ආධිපත්‍ය තමයි මෙය මෙහෙයවන්නේ; මේ යෝජනාව ඉදිරිපත් කරලා තිබෙන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ රට "එක්සත් ජාතීන්" නම් ජාත්‍යන්තර සංවිධානයේ පැරණි සාමාජිකයෙක්. එම සංවිධානය දෙවන ලෝක යුද්ධයෙන් පසු පිහිටුවනු ලැබුවේ කුමන අරමුණක් සඳහාද? ලෝක සාමය සහ ජාත්‍යන්තර සුරක්ෂිත භාවය තමයි UN එක පිහිටු වීමේ ප්‍රධාන අරමුණ වන්නේ. එහි ආරම්භක සැසිවාරයේදී, එදා ඇමෙරිකානු ජනාධිපති හැරී ට්‍රූමන් කළ ප්‍රකාශයක් උපුටා දක්වන්න මා බලාපොරොත්තු වෙනවා. ඔහුගේම වචනවලින් මම පළමුවෙන් එය ඉංග්‍රීසි භාෂාවෙන් කියවන්නම්. "We all have to recognize, no matter how great our strength, that we must deny ourselves the licence to do always as we please".

එය තමයි වැදගත්ම කාරණාව. මේක තමයි ඒ සංකල්පය. ඒ සංකල්පය අනුව තමයි නිෂේධ බලය - veto - ආවේ. ඒ ප්‍රකාශයේ සිංහල පරිවර්තනය සරල විධියට මම කියන්නම්.

"අපේ ශක්තිය කොතරම් විශාල වුවද, අප පිළිගත යුතු එක් දෙයක් නම්, සැමවිටම අප කැමැති දේ කිරීමේ අවසරය අප විසින් අපටම අහිමි කළ යුතු බවයි." එය තමයි කරන්නේ. ඒක තමයි මෙතැන ප්‍රධාන සංකල්පය.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ට්‍රූමන්ගේ මෙම උපදෙස ට්‍රූමන්ගෙන් පසු කිසිම ජනාධිපතිවරයෙක් මෙතෙක් අනුගමනය කරලා නැහැ; අනුගමනය කරන්නේත් නැහැ.

මේ කරුණ නිසාම තමයි ආරක්ෂක මණ්ඩලයේ ප්‍රධාන රටවල් පහට නිෂේධ බලයක් ලබා දී තිබෙන්නේ. හිතුවක්කාර ලෙස තමන්ට වුවමනා දේ, තමන්ට කැමැති දේ ක්‍රියාත්මක කිරීම වළක්වාලීමටයි එම නිෂේධ බලය එදා ලබා දුන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද ලෝක රටාවේ යථාර්ථය කුමක්ද? එය දෙවන ලෝක යුද්ධයෙන් පසු නිර්මාණය වූ යථාර්ථය නොවේ. ඒ දේශපාලන යථාර්ථය අද නැහැ, ඒ ජාත්‍යන්තර යථාර්ථය අද නැහැ. දෙවන ලෝක යුද්ධයෙන් පසු ඇති වූ bipolar ලෝක රටාව 1991න් පසු නැති වුණා. 1991න් පසුව ඇති වූ unipolar ලෝක රටාවත් අද ක්‍රම ක්‍රමයෙන් හීන වී යනවා. අද multipolar -බහුවිද- ලෝක රටාවක් ඇති වෙලා තිබෙනවා. ඒ අනුව ලෝක බල තුලනය වෙනස් වෙමින් තිබෙනවා. මෙම වෙනස් වන යථාර්ථය නොතකා ඇමෙරිකානු රජය තම විදේශ ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කරනවා. විශේෂයෙන්ම ජනාධිපති ජෝර්ජ් ඩබ්ලිව්. බුෂ් විදේශ ප්‍රතිපත්තියක් වශයෙන් අනුගමනය කළේ policy of unilateralism; ඒක පාර්ශ්වික ක්‍රියා පිළිවෙතක්.

ඒ වාගේම ආරක්ෂක ප්‍රතිපත්තිය වශයෙන් ඔවුන් ක්‍රියාත්මක කළේ "පැනලා පහර දීමයි" -policy of pre-emption. අපි එය පසු ගිය අවුරුදු 13 තුළදී දුටුවා. ඇෆ්ගනිස්තානයේ, ඉරාකයේ ඉඳලා මෑත ලිබියාව දක්වා අපි එම තත්ත්වය දුටුවා. ඉරාකයේත්, සිරියාවේත් අදත් එම තත්ත්වය අපි දකිනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, දැන් වෙනස් වෙමින් පවතින ලෝක රටාව තුළ, ජනාධිපති ඔබාමා ක්‍රියාත්මක කරන්නේ ඊට වඩා තරමක් වෙනස් වූ උපාය මාර්ගයක්. මිලිටරි හා රාජ්‍ය තාන්ත්‍රික වශයෙන් ද්විත්ව උපාය මාර්ගයක්. Military offensive සහ diplomatic offensive කියන දෙකම කලවම් කරගෙන තමයි ඇමෙරිකාවේ වර්තමාන ජනාධිපතිතුමා ක්‍රියාත්මක වන්නේ. ජෝර්ජ් බුෂ් ක්‍රියාත්මක කළේ military offensive එකයි. Diplomatic offensive එකට අනුකූලව තමයි ජිනීවාවල මේ යෝජනාව ගෙනැල්ලා තිබෙන්නේ. ජිනීවා යෝජනාව තුළින් දැන් ක්‍රියාත්මක වන්නේ එම රාජ්‍ය තාන්ත්‍රික උපාය මාර්ගය -diplomatic offensive එක- ක්‍රියාවට නැඟීමයි. මිලිටරි ප්‍රහාරයෙන් රාජ්‍ය තාන්ත්‍රික ප්‍රහාරයට තල්ලු කිරීමක් සිදු වෙමින් තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එදා යුද්ධය අවසන් වූ අවස්ථාවේ ශ්‍රී ලංකාව සම්බන්ධයෙන් මිලිටරි ප්‍රහාරයක් වෙනුවට තෝරා ගත්තේ රාජ්‍ය තාන්ත්‍රික ප්‍රහාරයක්. එදා ඇන්ග්ලෝ-ඇමෙරිකානු ආධිපත්‍ය උත්සාහ ගත්තා අපේ ප්‍රශ්නයට මැදිහත් වන්න. ඊට ඉඩ ලැබුණේ නැහැ. ඉඩ ලැබුණේ නැති නිසායි දැන් ජිනීවා යෝජනා හරහා එය සිදු කිරීමට උත්සාහ ගන්නේ.

මා මෙම ප්‍රශ්නයට ප්‍රවේශ වන්නේ එම සන්දර්භය තුළ සිටිමිනුයි. මෙය දමිළ ජනතාවට ඇති සුවිශේෂී ආදරයක් නිසා සිදු කළ මැදිහත් වීමක් නොවෙයි. එය තම විදේශ සහ ආරක්ෂණ ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමේ වුවමනාව අනුව කළ මැදිහත් වීමක්. මෙතැන තිබෙන්නේ භූ දේශපාලනික අවශ්‍යතාවක් සහ ගෝලීය උපාය මාර්ගයක්; geopolitical interests and global strategies. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "ත්‍රස්තවාදයට එරෙහි යුද්ධය" - "War on Terror" - යනුවෙන් ප්‍රකාශිත, 2001 සැප්තැම්බර් 11වන දින දියත් කළ ඇමෙරිකානු මිලිටරි උපාය මාර්ගය හරහා ගත වූ වසර දහතුන තුළ සිදු කළ මහා විනාශය තක්සේරු කළ නොහැකියි. ඉරාකය, ලිබියාව, සිරියාව, ලෙබනනය, යේමනය, ඊජිප්තුව, ඇෆ්ගනිස්තානය, පාකිස්තානය හරහා අධිරාජ්‍යවාදීන් දියත් කර ඇති මිලිටරි/රාජ්‍ය තාන්ත්‍රික උපාය මාර්ගය නොනවත්වා ඉදිරියට ගෙන යමින් සිටිනවා. ටියුනීසියාවෙන් උදාවූ අරාබි වසන්තය නමැති, ප්‍රජාතන්ත්‍රවාදයේ රැල්ල ආපස්සට හරවනු ලැබුවා. ඉන් නොනැවතී සුඩානය ද දෙකඩ කරනු ලැබුවා. වෙන් කරනු ලැබූ දකුණු සුඩානය තුළ ද යළිත් යුද ගැටුම් ආරම්භ වී තිබෙනවා. ඒ මානව හිමිකම් පිළිබඳ දයානුකම්පාවද? මුළු මැද පෙරදිග මිනිසුන් දසලක්ෂ ගණනක් ඝාතනය කළත් ඒ ප්‍රශ්නය කිසිම අවස්ථාවක එක්සත් ජාතීන්ගේ සංවිධානයේ මානව හිමිකම් කවුන්සලයවත්, එක්සත් ජාතීන්ගේ සංවිධානයවත් -ඒ කවුරුවත්- මතු කළේ නැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද දකුණු ආසියානු ආර්ථික කලාපයේ ජාතිවාදී, බෙදුම්වාදී, ආගමික මූල ධර්මවාදී, ත්‍රස්තවාදී ප්‍රවණතාවලට ආධාර සපයමින්, අධිරාජ්‍යවාදීන් එම කලාපය ද තම ගොදුරක් බවට පත් කරගෙන තිබෙනවා. නැඟෙනහිර ආසියාවේ කොරියානු අර්ධද්වීපය පමණක් නොව දැන් දකුණු චීන මුහුදේ මතුවී තිබෙන අර්බුදයට ද ඇතුළු වීමට මාන බලමින් සිටිනවා. ඇෆ්ගනිස්තානය මුළුමනින් විනාශ කර හමාරයි. පාකිස්තානයට 'ඩ්‍රෝන්' ප්‍රහාර එල්ල කරමින් තිබෙනවා. මේවා මානව හිමිකම් උල්ලංඝනය කිරීම් නොවෙයිද? මේකයි දෙබිඩි ප්‍රතිපත්තිය? ශ්‍රී ලංකාව 1931 ඉඳලා සර්වජන ඡන්ද බලය පාවිච්චි කරපු, ප්‍රජාතන්ත්‍රවාදය ස්ථාපිත කරපු රටක්. මා ඉහතින් සඳහන් කරපු රටවල් වාගේ ප්‍රජාතන්ත්‍රවාදය නොතිබුණු රටක් නොවෙයි. එසේ තිබියදී ඇයි ශ්‍රී ලංකාවට මේ තත්ත්වයන් ඇති කරලා තිබෙන්නේ?

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)

ගරු ඇමතිතුමා, තවත් විනාඩියක් පමණයි ඔබතුමාට තිබෙන්නේ.

**ගරු ඩිව් ගුණසේකර මහතා**
(மாண்புமிகு டியூ குணசேகர)
(The Hon. DEW Gunasekara)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එපමණක් නොවෙයි. යුද්ධය ආරම්භ වුණේ 1983 දීයි. 1983 දී ඇති වූ මහා බේදවාචකය වූ කළු ජූලිය පිළිබඳව ඔය මානව හිමිකම් මණ්ඩලය ප්‍රශ්න මතු කළාද? ඊට පස්සේ පසු ගිය අවුරුදු 30 තුළ ජනාධිපතිවරුන් පස්දෙනකු යටතේ මේ රටේ කොයි තරම් ඝාතන සිදු වුණාද? ඒ වාගේම 1988 -1989 කාලයේ පාරවල් දිගේ මිනී කඳන් තිබුණු අවස්ථාවල මේ ප්‍රශ්නය මතු කරලා තිබෙනවාද? අපේ හිටපු ජනාධිපති ප්‍රේමදාස මහත්මයාගේ කාලයේ පොලිස් නිලධාරින් 600ක් පමණ අමු අමුවේ මරා දමා තිබුණු එක ගැන තවමත් පරීක්ෂණයක් කරලා නැහැ. එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් මණ්ඩලය ඒ පිළිබඳව කටයුතු කළාද?

ඒ නිසා මෙතැන තිබෙන්නේ සැඟ වෙච්ච න්‍යාය පත්‍රයක්. සැඟවෙච්ච න්‍යාය පත්‍රයකුත් තිබෙනවා, දෙබිඩි ප්‍රතිපත්තියකුත් තිබෙනවා. ජාත්‍යන්තර දේශපාලන යථාර්ථය පදනම් කර ගෙනයි ඒ විධියේ යෝජනා ඉදිරිපත් කරන්නේ. [බාධා කිරීමක්] මට කථා කරන්න ඉඩ දීලා, තමුන්නාන්සේ පසුව කථා කරන්න. [බාධා කිරීමක්] මේ වෙන කාරණාවක් නිසා නොවෙයි.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)

ගරු ඇමතිතුමනි, ඔබතුමාට වෙන් කර තිබෙන කාලය අවසානයි.

**ගරු ඩිව් ගුණසේකර මහතා**
(மாண்புமிகு டியூ குணசேகர)
(The Hon. DEW Gunasekara)

බලයට එන්න බලාගෙන ඉන්නා එක්සත් ජාතික පක්ෂයෙන් මම ඉල්ලා සිටිනවා, තමුන්නාන්සේලා මේ ජාත්‍යන්තර සාධක හරියට තේරුම් අරගෙන, දේශපාලනයේ යථාර්ථය තේරුම් අරගෙන කටයුතු කරන්නය කියලා. දෙමළ ජනතාවට තිබෙන ආදරය නිසාවත්, මානව හිමිකම් උල්ලංඝනය වීම නිසාවත් ගෙනෙන යෝජනා නොවෙයි ඒවා. ඒවා ඇමෙරිකාවේ විදේශ ප්‍රතිපත්තිය පදනම් කරගෙන ගෙනා යෝජනා නිසායි, අද පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරලා තිබෙන මේ යෝජනාවට අප සහයෝගය දෙන්නේ කියන කාරණය සඳහන් කරමින් මගේ කථාව අවසන් කරනවා. බොහොම ස්තුතියි.

[අ.භා. 4.04]

**ගරු විජිත හේරත් මහතා**
(மாண்புமிகு விஜித ஹேரத்)
(The Hon. Vijitha Herath)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ශ්‍රී ලංකාවේ අභ්‍යන්තර ප්‍රශ්නයකට ඇමෙරිකා එක්සත් ජනපදය හෝ වෙනත් කිසිදු ජාත්‍යන්තර මැදිහත්වීමකට ජනතා විමුක්ති පෙරමුණ එකහෙළාම විරුද්ධයි. එය නැවත නැවතත් අවධාරණය කළ යුතු වෙනවා. අපේ රටේ අභ්‍යන්තර ප්‍රශ්නවලට ඇඟිලි ගසන්න, ඒ අභ්‍යන්තර ප්‍රශ්නවලට මැදිහත් වෙන්න ලෝකයේ කිසිදු රාජ්‍යයකට හෝ රාජ්‍යයන් කීපයකට හෝ කිසිදු අයිතියක් නැහැ. අපේ රටේ ස්වෛරීභාවය, ස්වාධීනත්වය ආරක්ෂා කර ගැනීම අපේ වගකීමක්. ඒ වගකීම හරියාකාරව ඉටු කර ගන්න නම්, අද මේ ලෝකයේ සිදුවන අධිරාජ්‍යවාදී මැදිහත්වීම් නිවැරදිව තේරුම් අරගෙන ඒ අධිරාජ්‍යවාදී මැදිහත්වීම්වලට එරෙහිව අපි උපායමාර්ගිකව ක්‍රියා මාර්ග ගත යුතුව තිබෙනවා. නමුත් මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, යුද්ධය අවස්ථාවෙන් පසුව අපේ රටේ ඇති වුණු සිදුවීම් දිහා බලන කොට ඒ අධිරාජ්‍යවාදීන්ගේ උගුලට අහුවෙන්නේ නැතිව ඒකට එරෙහිව කටයුතු කරනවා වෙනුවට ඒ උගුලේ තව තවත් හිරවෙන ක්‍රියාමාර්ග තමයි වර්තමාන ආණ්ඩුව විසින් ගනු ලැබුවේ.

යුද්ධය කියන්නේ යුද්ධයක්. යුද්ධය අවස්ථාවේදී විවිධ සිදුවීම් සිදු වෙනවා. ඒක වළක්වන්න බැහැ. සිවිල් යුද්ධයක් තිබෙන අවස්ථාවකදී, අපි අකැමැති වුණත් බොහෝ සිදුවීම් සිද්ධ වෙනවා. එය වැළැක්වීම අසීරු කාරණාවක්. නමුත් ප්‍රශ්නය තිබෙන්නේ ඒ යුද්ධය අවසන් වුණාට පස්සේ මේ ආණ්ඩුව මේ එක්සත් ජාතීන්ගේ සංවිධානය හරහා එන අධිරාජ්‍යවාදී මැදිහත්වීමට මුහුණ දෙන්න ගත්ත ක්‍රියා මාර්ග පිළිබඳවයි. පටන් ගත්තෙම 2009 මැයි මාසයේ 23වන දා එක්සත් ජාතීන්ගේ සංවිධානයේ බැන් කි මූන් මහත්තයා එක්ක ඒකාබද්ධ ප්‍රකාශනයක් අත්සන් කරලා. මහින්ද රාජපක්ෂ මැතිතුමාත්, බැන් කි මූන් මහත්තයාත් එක්ව නිකුත් කළ ඒ ඒකාබද්ධ ප්‍රකාශනයේ අවසාන වාක්‍ය තුනේ ඉතා පැහැදිලිව මෙන්න මෙහෙම කියා තිබෙනවා.

I quote:

> "Sri Lanka reiterated its strongest commitment to the promotion and protection of human rights, in keeping with international human rights standards and Sri Lanka's international obligations. The Secretary-General underlined the importance of an accountability process for addressing violations of international humanitarian and human rights law. The Government will take measures to address those grievances."

එතකොට ඉතා පැහැදිලිව, ජාත්‍යන්තර මානුෂීය නීතිය පිළිබඳව වගවීමේ ක්‍රියාවලියකට සම්බන්ධ වන බවට, ඒ පිළිබඳව ශ්‍රී ලංකාවේ රජය ඉදිරි පියවර ගන්න බවට සහතිකයක් දුන්නේ මේ ඒකාබද්ධ ප්‍රකාශනයෙන්. ඒ ඒකාබද්ධ ප්‍රකාශනය පදනම් කර ගෙන තමයි ඉන් අනතුරුව දරුස්මාන් කමිටුව පත් කළේ; දරුස්මාන් වාර්තාව එළි දැක් වුණේ. ඒ දරුස්මාන් වාර්තාවේ පූර්විකාවේ ඉතා පැහැදිලිව කියනවා, මේ කමිටුව පත් කළේ, බැන් කී මූන් මහතාට එදා ඒ ඒකාබද්ධ ප්‍රකාශනයෙන් ලැබුණු ඒ අයිතිය මතයි කියලා; මේ කමිටුව ක්‍රියාත්මක වෙන්නේ ඒ පදනම මතයි කියලා; ඒ කමිටුවේ ක්‍රියාකාරිත්වයේ පදනම තිබෙන්නේ එතැනයි කියලා. ඒ ක්‍රියාවලිය ඉදිරියට ආවා. ආණ්ඩුව මොකක්ද කළේ? ජාත්‍යන්තරව එන තත්ත්වයට මුහුණ දෙන්න ක්‍රියා මාර්ග ගන්නවා වෙනුවට ලංකාව ඇතුළත හුදු ලාභ, බාල මැතිවරණවාදී දේශපාලනය විකුණන්න ගිහින් - market කරන්න ගිහින්- දවසින් දවස අමාරුවේ වැටුණා; උගුලක හිර වුණා. LLRC එක පිහිටෙව්වා. LLRC එකේ දින වකවානු තීරණය කළේ කොහොමද?

[ගරු විජිත හේරත් මහතා]

ඩිව් ගුණසේකර ඇමතිතුමා කිව්වා, යුද්ධය පටන් ගත්තේ 1980 දශකයේ කියා. නමුත් ජනාධිපතිවරයා පත් කළ LLRC එකේ දින තීරණය කළේ සටන් විරාම ගිවිසුම අත්සන් කළ දිනයේ සිට යුද්ධය අවසන් වූ දිනය දක්වා පමණයි. එතැනම වරද්දා ගත්තා. එතුමාම කියනවා නම් යුද්ධය 1983ත් තිබුණා කියා ඇයි, LLRC එක 2002 මාර්තු 22 දින සිට පමණක් ක්‍රියාත්මක වුණේ? එතුමන්ලාට තිබුණා ඒ කොමිසම පත් කරන යෝජනාව මේ අවුරුදු කිහිපයේ විතරක් නොවෙයි, ඊට එහා ඉඳලා යුද්ධය ඇති වෙන්න බලපෑ හේතු සාධක පිළිබඳව සොයා බලා ඒවාට අවශ්‍ය කරන පිළියම් යෙදීම දක්වා වුණු කමිටුවක් පත් කරන්න. එහෙම කළේ නැහැ. ඇයි? එහෙම කරන්න එදා ඩිව් ගුණසේකර ඇමතිතුමාට බලයක් තිබුණෙත් නැහැ. ඩිව් ගුණසේකර ඇමතිතුමා නියෝජනය කරන කැබිනට් මණ්ඩලයෙන් ඇහුවේ නැහැ. යෝජනාව පාර්ලිමේන්තුවට දැම්මේ නැහැ. ජනාධිපතිවරයා තනි අභිමතය පරිදි කළ දෙයක්. ඒවා පාර්ලිමේන්තුවෙන් සම්මත කළේ නැහැ. ඒවා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළෙත් නැහැ. එහෙමයි ඉතිහාසයේ කටයුතු කළේ. නවනීදන් පිල්ලේ මහත්මියගේ මූලිකත්වයෙන් යුත් මානව හිමිකම් කොමිසම ඉදිරිපත් කළ යෝජනාවේ පැහැදිලිව තිබෙන්නේ එදා මේ ඒකාබද්ධ ප්‍රකාශනයේ පාවිච්චි කළ වචන. ඒ කොතැනකවත් "යුද අපරාධ" - war crimes - කියන වචනය නැහැ. ඉතාම පැහැදිලිව සඳහන්ව තිබෙන්නේ ජාත්‍යන්තර මානුෂීය නීතිය - International Humanitarian Law - ගැන. ජාත්‍යන්තර මානුෂීය නීතිය ඇතුළත තමයි මේ සියලු කරුණු අඩංගු වෙලා තිබෙන්නේ. මේ යෝජනාවේ තිබෙන්නෙත් ජාත්‍යන්තර මානුෂීය නීතිය පිළිබඳව ලංකාව කටයුතු කළාද නැද්ද කියන එක පිළිබඳව සොයා බැලීම සහ විශේෂයෙන්ම ලංකාව වගවීමේ ක්‍රියාවලිය පිළිබඳව විනිවිදභාවයකින් යුක්තව කටයුතු කර නැහැ කියන ප්‍රශ්නය. රටක් විධියට ජාත්‍යන්තර මැදිහත්වීම වළක්වා ගන්න නම්, අප රටේ සිදුවන විවිධ ප්‍රජාතන්ත්‍ර විරෝධී මානව හිමිකම් උල්ලංඝනය වීම් පිළිබඳව අප නීතිමය පියවර ගත යුතුව තිබෙනවා. එහෙම නීතිමය පියවර ගන්නවා නම් බැන් කි මූන්ට හෝ නවනීදන් පිල්ලේට ඇඟිලි ගහන්න ඉඩක් ලැබෙන්නේ නැහැ.

අපට ඉතිහාසයේ උදාහරණ මතකයි. ක්‍රිෂාන්ති කුමාරස්වාමි ඝාතනය කරපු වෙලාවේ ඒ පිළිබඳව හමුදා අධිකරණය විශේෂ නඩු විභාගයක් කැඳෙව්වා. ඒ නඩු විභාගයෙන් ක්‍රිෂාන්ති කුමාරස්වාමි ඝාතනයට සම්බන්ධ වින්තිකරුවන්ට අදාළව දඬුවම් දුන්නා. දඬුවම් දුන්නාට පසු බැන් කී මූන්ලා, නවනීදන් පිල්ලේලා ඒ සිද්ධිය පිළිබඳව ප්‍රශ්න කරන්න ආවේ නැහැ. ඒ වාගේම බණ්ඩාරවෙල බිඳුණුවැව පුනරුත්ථාපන කඳවුරේ රඳවාගෙන හිටපු රැඳවියන්ට පහර දුන්නා; ඝාතනය කළා. ඒ පිළිබඳව ලංකාවේ ශ්‍රේෂ්ඨාධිකරණයෙන් තීන්දුවක් දීලා ඒ වගඋත්තරකරුවන්ට අදාළ දඬුවම් දුන්නා. දඬුවම් දුන්නාට පසු ඒ ගැන ප්‍රශ්න කරන්න ආපහු ජිනීවා කොමිසම ආවේ නැහැ. හරි පැහැදිලියි. රටක් විධියට රට ඇතුළත සිදු වන වැරදීම් පිළිබඳව නිවැරදි අපක්ෂපාතී පරීක්ෂණයක් කරලා වැරදිකරුවන්ට දඬුවම් දුන්නා නම් මෙවැනි සිදුවීම් ඇති වන්නේ නැහැ. මෙවැනි යෝජනා එන්න ඉඩක් හැදෙන්නේ නැහැ. මේකත් සමඟ බැඳුණු ක්‍රියාවලියක් ඉදිරියට ආවා. අපේ රටේ අභ්‍යන්තරව කරන පරීක්ෂණයක් මඟින් ජාත්‍යන්තරයට පිළිගන්න පුළුවන් තත්ත්වයක් අප ඔප්පු කර පෙන්විය යුතුව තිබුණා.

**ගරු වාසුදේව නානායක්කාර මහතා**
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
කවුද, ''ජාත්‍යන්තරය'' කියන්නේ?

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
අධිරාජ්‍යවාදීන්.

**ගරු විජිත හේරත් මහතා**
(மாண்புமிகு விஜித ஹேரத்)
(The Hon. Vijitha Herath)
ඔබතුමාගේ අධිරාජ්‍යවාදීන්.

**ගරු වාසුදේව නානායක්කාර මහතා**
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
කවුද හිටියේ ඒ කාලයේ? [බාධා කිරීමක්] මොකක්ද මේ කියන්නේ? එක පැත්තකින් කියනවා, ඒ අයට පරීක්ෂණය කරන්න දෙන්න බැහැ කියා. අනෙක් පැත්තෙන් ජාත්‍යන්තරය ඉදිරියේ අප මොකක්ද කළේ කියා අහනවා.

**ගරු විජිත හේරත් මහතා**
(மாண்புமிகு விஜித ஹேரத்)
(The Hon. Vijitha Herath)
කළේ නැත්නම් මොකටද භය වෙන්නේ? හරි පැහැදිලිව, ඒ පිළිබඳව කරන ලද අභ්‍යන්තර පරීක්ෂණයක් මඟින් වින්තිකරුවන්ට දඬුවම් දීලා, ඒ ගැන නිවැරදි, අපක්ෂපාතී පරීක්ෂණයක් සිද්ධ වෙනවා නම් ඔය කාටවත් ඇඟිලි ගහන්න ලැබෙන්නේ නැහැ. අපි රටක් විධියට, අපේ රට අභ්‍යන්තරයේ ස්වාධීන පරීක්ෂණයක් පිළිබඳ විශ්වාසය තහවුරු කළ යුතුව තිබුණා. ස්වාධීන පරීක්ෂණයක් පිළිබඳ විශ්වාසය තහවුරු කරන්න නම් අපේ රටේ අධිකරණ පද්ධතිය පිළිබඳ විශ්වාසය තහවුරු කළ යුතුව තිබුණා. [බාධා කිරීම්]

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ගරු වාසුදේව නානායක්කාර ඇමතිතුමනි, වාඩි වෙන්න. මංගල සමරවීර මන්ත්‍රීතුමනි, වාඩි වෙන්න. ගරු මන්ත්‍රීතුමාට කථා කරන්න ඉඩ දෙන්න. [බාධා කිරීම්]

**ගරු විජිත හේරත් මහතා**
(மாண்புமிகு விஜித ஹேரத்)
(The Hon. Vijitha Herath)
අධිකරණ පද්ධතිය පිළිබඳ විශ්වාසය බිඳ වැට්ටුවා. ශ්‍රේෂ්ඨාධිකරණයේ අගවිනිසුරුතුමියව බලහත්කාරයෙන් එළියට ඇදලා දැම්මා. [බාධා කිරීම්] නීතිඥවරුන්ගේ ගෙවල්වලට වෙඩි තිබ්බා. [බාධා කිරීම්]

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ගරු මන්ත්‍රීවරුනි, කරුණාකර නිශ්ශබ්ද වෙන්න.

**ගරු විජිත හේරත් මහතා**
(மாண்புமிகு விஜித ஹேரத்)
(The Hon. Vijitha Herath)
නීතිඥ සංගමයේ සභාපතිවරයාගේ නිවසට වෙඩි තිබ්බා. [බාධා කිරීම්]

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ගරු මන්ත්‍රීතුමාගේ කථාවට බාධා කරන්න එපා. කරුණාකර සභාව නිශ්ශබ්ද වන්න.

**ගරු විජිත හේරත් මහතා**
(மாண்புமிகு விஜித ஹேரத்)
(The Hon. Vijitha Herath)

අධිකරණ සේවා කොමිසමේ ලේකම් මංජුල තිලකරත්න මහත්මයාට අමානුෂික විධියට පහර දුන්නා. [බාධා කිරීම්] අන්න එවැනි දේවල්වලින් මේ රටේ අධිකරණය පිළිබඳ තිබුණු විශ්වාසය මුළුමනින්ම බිඳ වැටුවා. [බාධා කිරීම්]

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)

මංගල සමරවීර මන්ත්‍රීතුමනි, සුජීව සේනසිංහ මන්ත්‍රීතුමනි, නිශ්ශබ්ද වෙන්න.

**ගරු විජිත හේරත් මහතා**
(மாண்புமிகு விஜித ஹேரத்)
(The Hon. Vijitha Herath)

ඒ බිඳ වැටීම තුළ තමයි, - [බාධා කිරීම්] මුන්නැහේලාට, පිල්ලෙලාට, බැන් කී මූන්ලාට අපේ රටට ඇඟිලි ගහන්න ඉඩ ප්‍රස්ථාව ලැබුණේ. ඒ නිසා අදත් අප බොහොම පැහැදිලිව කියන්නේ මේකයි. [බාධා කිරීම්]

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)

ගරු වාසුදේව නානායක්කාර ඇමතිතුමනි, වාඩි වෙන්න.

**ගරු විජිත හේරත් මහතා**
(மாண்புமிகு விஜித ஹேரத்)
(The Hon. Vijitha Herath)

ජාත්‍යන්තර මැදිහත්වීම්, මානව හිමිකම් කොමිෂන් සභාවෙන් එන මේ යෝජනා පරද්දන්න ඕනෑ. ඒවා පරද්දන්න නම් මෙහේ ගැලරියට, මෙහේ ඡන්දවලට, ආණ්ඩුවේ බල වුවමනාවට මේ වාගේ පුහු සාකච්ඡා කරලා වැඩක් නැහැ.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තව විනාඩියක පමණ කාලයක් තිබෙන්නේ.

**ගරු විජිත හේරත් මහතා**
(மாண்புமிகு விஜித ஹேரத்)
(The Hon. Vijitha Herath)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේක යුද්ධයෙන් පසුව පැමිණි අඛණ්ඩ ක්‍රියාවලියක්. ඒ අඛණ්ඩ ක්‍රියාවලිය ඇතුළේ තමයි මේ දේවල් සිද්ධ වුණේ. ඒ නිසා අදවත් ආණ්ඩුව මෙන්න මේ කාරණය හරියට තේරුම් ගත යුතුයි. ජනතා විමුක්ති පෙරමුණේ අප ඉතා පැහැදිලිව කියන්නේ එක්සත් ජාතීන්ගේ සංවිධානයේ මේ යෝජනාව පරද්දන්න ඕනෑ කියලායි. ඒක පරදවන්න මේ පාර්ලිමේන්තුවේ යෝජනා සම්මත කළාට හරියන්නේ නැහැ. ඒක පරදවන්න නම් අපේ රට අභ්‍යන්තරයේ මානව හිමිකම් ආරක්ෂා කරනවා, ප්‍රජාතන්ත්‍රවාදය ආරක්ෂා කරනවාය කියලා භාවිතාවෙන් අප ඔප්පු කරලා පෙන්වන්න ඕනෑ. ඒකට බොරු කයිවාරු ගහලා හරියන්නේ නැහැ. 1987 දී ඉන්දු ලංකා ගිවිසුම අත්සන් කරලා ඉන්දියානු හමුදාව මේ රටට එන කොට, - [බාධා කිරීම්]

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ කාලය අවසානයි. මී ළඟට, ගරු සුසිල් ප්‍රේමජයන්ත ඇමතිතුමා.[බාධා කිරීමක්]

[අ.භා. 4.15]

**ගරු ඒ.ඩී. සුසිල් ප්‍රේමජයන්ත මහතා (පරිසර හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යතුමා)**
(மாண்புமிகு ஏ.டி. சுசில் பிரேமஜயந்த - சுற்றாடல், புதுப்பிக்கத்தக்க சக்தி அமைச்சர்)
(The Hon. A.D. Susil Premajayantha - Minister of Environment and Renewable Energy)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ආණ්ඩු පක්ෂයේ ගරු මන්ත්‍රීතුමන්ලා කණ්ඩායමකගේ අත්සනින් යුතුව මෙම යෝජනාව ඊයේ මෙම පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළා. මේ පිළිබඳව විවිධ මත ප්‍රකාශ වුණා. මෙතැනදී ප්‍රශ්නයක් මතු වුණා, දැන්ද මේ යෝජනාව ගේන්නේ කියලා. මම විශේෂයෙන්ම පැහැදිලි කරන්න අවශ්‍යයි, 2009 දී මානුෂික මෙහෙයුම අවසන් වෙලා දින පහක් ගත වෙන කොට තමයි පරීක්ෂණයක් කරන්න ඕනෑය කියලා UNHCR කොමසාරිස්තුමිය කිව්වේ. ඒ නිසා මේක අලුත් දෙයක් නොවෙයි. හැබැයි, 2014 ජුනි මාසයේ 05වැනි දා තමයි අපේ ගරු විදේශ කටයුතු අමාත්‍යතුමාට මේ ලිපිය මඟින් ලිඛිතව දැනුම් දුන්නේ මෙවැනි පරීක්ෂණයක් කරන බව. ලිඛිතව එම ලිපිය ලැබුණාට පසුව තමයි මේ යෝජනාව ගෙන එන්න මේ ගරු මන්ත්‍රීවරු තීන්දු කළේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එම ලිපියේ පළමුවෙනි ඡේදයේම තිබෙනවා, "Human rights and related crimes committed by both parties in Sri Lanka" කියලා. So, what do you mean by "both parties"? -[*Interruption*] What is the reference? Is it you and I ? No, surely no. - [*Interruption*.] So, then, what do you mean by "both parties"? - [*Interruption*.]

මෙවැනි බරපතළ වූ සිද්ධියක් පිළිබඳව මේ ලිපියේ සඳහන් කර තිබෙන්නේ කොහොමද කියලා මම කරුණු එකින් එක අරගෙන පෙන්වා දෙන්නම්. මම මේ එක තැනක් විතරයි කියෙව්වේ. මේ ලිපිය කියවන්න ගියොත් ගොඩක් වෙලාව යයි.

එම ලිපියේ තවදුරටත් කියා තිබෙනවා, "I encourage you to appoint a focal point on the Government side" කියලා.

ආණ්ඩුව පැත්තෙන් මේ සම්බන්ධීකරණය කිරීම සඳහා focal point එකක් පත් කරන්න කියලා. මොකටද? මේකේ තවම Panel of Judgesලා පත් කර නැහැ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාත් නීතිඥයෙක් නේ. නඩුකාරයෙක් පත් කරන්නේ නැතිව, -

**ගරු වාසුදේව නානායක්කාර මහතා**
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)

How can they appoint judges?

**ගරු ඒ.ඩී. සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு ஏ.டி. சுசில் பிரேமஜயந்த)
(The Hon. A.D. Susil Premajayantha)

A Panel.

**ගරු වාසුදේව නානායක්කාර මහතා**
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)

A Panel of Inquirers.

**ගරු ඒ.ඩී. සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு ஏ.டி. சுசில் பிரேமஜயந்த)
(The Hon. A.D. Susil Premajayantha)

Yes, not Judges but Inquirers. Panel එකක් පත් කරන්නේ නැතුව තීන්දුව දෙන්න දින නියම කරනවා. අපි දන්නේ නැහැ, සාක්ෂිකාරයෝ කවුද කියලා. කෝ, ඒ ලැයිස්තු? උසාවියට ගියාම ඉස්සෙල්ලා බලන්නේ කෝ, සාක්ෂි ලැයිස්තුව, මොනවාද, තිබෙන සාක්ෂි කියලා නේ. මේ කිසිම දෙයක් නැහැ. එහෙම නම් මේකේ මොකක්ද සඳහන් වෙන්නේ? මේ සියල්ල සැලසුම් කරලා, මේ පරීක්ෂණ වාර්තාව දෙන දිනයත් තීන්දු කරලා මේ සියල්ලම අවසන් කරලා ඉවර වෙලා අපට ලියුමක් එවනවා, මේකට සහයෝගය දෙන්න කියලා. ඊට අමතරව මේ ඡේදයේ මෙහෙම කියනවා;

"I would like to take this opportunity to once again encourage the Government of Sri Lanka to conduct an independent and credible domestic investigation into allegations of violations of …"

එහෙම කියා ගෙන යනවා. "අපි මෙහෙම පත් කරනවා, මේකට සහයෝගය දෙන්න"යි කියලා කියන ගමන් ඒ ඡේදයේ කියනවා, ඒ සියලු කරුණු සම්බන්ධයෙන් අපට මෙහේ පරීක්ෂණයක් කරන්න කියලා. මොකක්ද මේ දෙබිඩි පිළිවෙත? අපේ රටේ පරීක්ෂණයක් කෙරෙනවා. අතුරුදන් වූවන් පිළිබඳ පැමිණිලි විමර්ශනය කිරීමේ ජනාධිපති කොමිසම ඉතාම සාර්ථක ආකාරයෙන් කටයුතු කරගෙන යනවා. පැමිණිලි 6,000කට වැඩි ප්‍රමාණයක් ලැබිලා ඒ පිළිබඳව-

**ගරු වාසුදේව නානායක්කාර මහතා**
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)

16,000ක්.

**ගරු ඒ.ඩී. සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு ஏ.டி. சுசில் பிரேமஜயந்த)
(The Hon. A.D. Susil Premajayantha)

එක එක පළාත් අනුව ඒ පිළිබඳව පරීක්ෂා කරනවා. LLRC එක පරීක්ෂා කරලා ඒවායේ නිර්දේශයන් දුන්නා. එයින් අතිවිශාල ප්‍රමාණයක් මේ වෙන කොට ක්‍රියාත්මක කරලා අවසන් කරලා තිබෙනවා. අවුරුදු 30ක යුද්ධයක් තිබුණු රටකට, ත්‍රස්තවාදයක් තිබුණු රටකට මේ ගොල්ලන් කියනවා, අවුරුදු හතරෙන් මේ සියල්ල කරන්නය කියලා. හැබැයි වෙන රටවල මීට වඩා-

**ගරු වාසුදේව නානායක්කාර මහතා**
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)

විල්කොට් වාර්තාව දෙන්න අවුරුදු 6ක් ගියා.

**ගරු ඒ.ඩී. සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு ஏ.டி. சுசில் பிரேமஜயந்த)
(The Hon. A.D. Susil Premajayantha)

විල්කොට් වාර්තාව දෙන්න අවුරුදු 6ක් ගියා. ඒවාට මේ කියන දේවල් නැහැ. අපේ ජනතා විමුක්ති පෙරමුණේ මන්ත්‍රීවරු මේ යෝජනාවට සංශෝධනයක් ගෙනැල්ලා තිබුණා. සමහර විට කෙනෙකුට කියන්න පුළුවන් 2009න් පස්සේ ඒවා නොවෙයි නේ මේ පිල්ලේ හොයන්න කියලා තිබෙන්නේ කියලා. පිල්ලේගේ මේ ලියුමේ කියලා තිබෙන්නේ මේ පරීක්ෂණ කමිටුව පත් කරන්නේ 2009න් පස්සේ ඒවා හොයන්න නොවෙයි, මානුෂික මෙහෙයුමේ සිදු වුණ සිදුවීම් පිළිබඳව සොයා පරීක්ෂා කරන්නයි. ගරු මන්ත්‍රීතුමනි, කවුරු හෝ කිව්වොත් 1988, 1989 ,1990ත් එක්ක පරීක්ෂා කරන්න කියලා, එතකොට මොකද කරන්නේ? [බාධා කිරීමක්] නැහැ, නැහැ. මට කථා කරන්න ඉඩ දෙන්න. එහෙම කියන්නත් පුළුවන් නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මා මේ කාරණයත් පෙන්වලා දෙන්නම්. එක්සත් ජාතික පක්ෂයේ මන්ත්‍රීවරු මේ පාර්ලිමේන්තුවේ වාගේම පුවත් පත් මාධ්‍ය සාකච්ඡාවලදී කරපු ප්‍රකාශ අනුව මේකට විරුද්ධ වෙන්නේ නැහැ. අඩ ගහලා ඇතුළට ගනියි පරීක්ෂා කරන්නය කියලා. ඇයි? විදේශ නිරීක්ෂකයෝ ගෙන්වූවේ කවුද? ප්‍රභාකරන් එක්ක ගිවිසුම අත්සන් කළේ කවුද? ඔස්ලෝ, බැංකොක්, ටෝකියෝ ගිහිල්ලා සාකච්ඡා කළේ කවුද? මේ ප්‍රශ්නය ජාත්‍යන්තරකරණයට ගෙනිච්චේ එක්සත් ජාතික පක්ෂය. ඒ විතරක් නොවෙයි. 1983 දී වුණ සිදුවීම්වලදී ගිනි තියන කොට, පුච්චන කොට, සතියක් තිස්සේ මේ සියල්ල සිදුවෙන කොට ඒවා නිසියාකාරයෙන් කළමනාකරණය නොකිරීම නිසා තමයි, ලක්ෂ සංඛ්‍යාත දමිළ ජනතාවක් බටහිර රටවලට ගියේ. ඒ අයගේ දෙවැනි පරම්පරාව තමයි, කැමැත්තෙන් හෝ අකමැත්තෙන් එල්ටීටීඊයට සහාය දෙන්න අරමුදල් රැස් කළේ. ඩයස්පෝරාව කියලා අදත් මුදල් රැස් කරන්නේ, ජිනීවාවලට අවශ්‍ය කරුණු සපයන්නේ ඒ සියලු දේ කරන්නේ ඒ අයයි. ඒ අයට මේ රටින් යන්න ඉඩ සැලස්සුවේ කවුද? සන්ධානයද? මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමාද? නැහැ. තමුන්නාන්සේලා සහ තමුන්නාන්සේලාගේ පූර්වගාමීනුයි. අද ඒවා අමතක කරලායි තිබෙන්නේ. ඒවා අමතක කරලායි කථා කරන්නේ. මෙන්න තමුන්නාන්සේලාගේ මන්ත්‍රීවරු කියපු දේවල්? 2007.10.31 "ලංකාදීප" පුවත් පතේ පිටු අංක 18 හි මෙසේ සඳහන් වී තිබෙනවා:

"යුද්ධය පෙරට දමමින් දිගටම ජනතාව මුලා කිරිමේ ව්‍යාපාරයක රාජපක්ෂ සහෝදර සමාගම නිරතවෙලා"

කවුද, මේ කියන්නේ? එක්සත් ජාතික පක්ෂ මන්ත්‍රී ලක්ෂ්මන් කිරිඇල්ල. එහි තවදුරටත් මෙසේ සඳහන් වී තිබෙනවා:

"මෙතෙක් කර තිබෙන සෑම සමීක්ෂණයකින්ම හෙළි වන්නේ රටේ බහුතරය සාමකාමී විසඳුම් අපේක්ෂා කරන බවයි. යුද්ධය ඕනෑම "ගොනෙකුට" කළ හැකියි. අමාරු කාර්යය වන්නේ සාමය ගෙන ඒමයි."

මෙන්න, එක්සත් ජාතික පක්ෂ මන්ත්‍රීවරුන්ගේ ආකල්පය. මංගල සමරවීර මන්ත්‍රීතුමා මෙතැන ඉඳලා ගියා. මෙන්න එතුමා කියලා තිබෙන දේ. 2008 නොවැම්බර් 28 වැනි සිකුරාදා "ලංකාදීප" පත්තරයේ මෙසේ සඳහන් වී තිබෙනවා:

"හෙට කිලිනොච්චිය අල්ලා ගත්තත් ත්‍රස්තවාදී ප්‍රශ්නය අවසන් වන්නේ නෑ"

එතුමා තවදුරටත් මෙසේ කියා තිබෙනවා.

"ප්‍රතිපත්තිමය තීරණයකට ලෝකයේ සියලුම හමුදාපතිවරුන් එළැඹ සිටිනවා. අපේ හමුදාපති යුද හමුදාවට නොව ගැලවීමේ හමුදාවටවත් නායකත්වය දෙන්න සුදුසු නැහැ."

එතකොට හිටපු හමුදාපති කවුද? සරත් ෆොන්සේකා මහත්මයා. ඉතින් එතුමා කියන විධියට ගැලවීමේ හමුදාවටවත් සුදුසු නැහැයි කිව්ව සරත් ෆොන්සේකා මහත්මයා ජනාධිපති කරන්න තමයි පසු ගිය ජනාධිපතිවරණයේදී උදවු කළේ. එහෙම නම් පසු ගිය ජනාධිපතිවරණයේදී යුද්ධය මෙහෙයවූවාය කියන, දමිළ ජනතාවට එරෙහිව සටන් කළාය කියන හමුදාපතිතුමාට තමයි ඡන්දය දුන්නේ. අද ටීඑන්ඒ එකේ මන්ත්‍රීවරුත් ඒ ගැන නිහඬයි. ඡන්දයත් දුන්නා. ඒ නිසා මේ හැම එකකින්ම ඉතාම පැහැදිලිව පෙනෙන්නේ සැලසුම් සහගතව මේ රටට සාමය ගෙන ඒමට එරෙහි වන්නා වූ පිරිස් සිටින බවයි.

2009 මැයි 19 වැනි දා මේ ත්‍රස්තවාදී යුද්ධය අවසන් කරලා අතිගරු ජනාධිපතිතුමා මේ ගරු සභාවට ඇවිල්ලා කාවද ඇමතුවේ? එදා මේ උත්තරීතර සභාවයි ඇමතුවේ. අන්න ඒක තමයි, රාජ්‍ය නායකයකුගේ ලක්ෂණය. එතුමා ත්‍රස්තවාදය අවසන් කරන්න තීන්දුව ගත්තා. ඒ තීන්දුව ගන්න බැරි නායකයෝ අපේ රටේ සිටියා. ඒ නිසා තමයි, අවුරුදු තිහක් මේ රටේ ජනතාව දුක් වින්දේ. සිංහල, දමිළ, මුස්ලිම් හැම ජන කොටසක්ම -[බාධා කිරීමක්] අපි ඉතින් වැඩ කළා නේ. වෙනත් ක්‍රමයකට සාමය ගේන්න තමයි, උත්සාහ කළේ. ක්‍රමය වෙනස්. [බාධා කිරීම්] හරි, හරි. මගේ කථාව කරන්න ඉඩ දෙන්න. [බාධා කිරීම්]

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ජනතා විමුක්ති පෙරමුණ මේ යෝජනාවට විරුද්ධ වෙන්නේ කොහොමද? විරුද්ධ වෙන්න බැහැ. මම දන්නවා. එතුමන්ලා සංශෝධනයක් ගෙනාවා. නමුත් එතුමන්ලාට විරුද්ධ වෙන්න බැහැ. එතුමන්ලාට විරුද්ධ වෙන්න බැරි ඇයි? 2006 මාර්තු මාසයේ තිබුණු පළාත් පාලන මැතිවරණයට පෙර අපේ සාකච්ඡාවේදී ඉතා පැහැදිලිව මෙන්න මේ විධියට කිව්වා. පළමුවෙන්ම, ප්‍රභාකරන්ගේ ගිවිසුම අහෝසි කරන්න ඕනෑ. ඒක කළා. දෙවනුව, නිරීක්ෂකයෝ යවන්න ඕනෑය කිව්වා. යැව්වා. ඒක මම එක දෙක කිව්වාට, දෙක තුන වෙන්න ඕනෑ. පළමුවෙන්ම එල්ටීටීඊය යුදමය වශයෙන් පරාජය කරන්න ඕනෑය කිව්වා. ඒකත් කළා. ඒ කළ එකේ ප්‍රතිඵලය තමයි මේ. යුද්ධය අවසන් නොකළා නම්, එල්ටීටීඊය පරාජය නොකළා නම්, ප්‍රභාකරන් ඇතුළු ඒ නායකයින්ට ඒ ආකාරයෙන් දඬුවම් නොදුන්නා නම් අද මේ යෝජනාව එනවාද? සරල ප්‍රශ්නය එච්චරයි. එල්ටීටීඊය පරාජය නොකළා නම් ජිනීවාවලදී මේ යෝජනාව ගේනවාද? නැහැ. මේ යෝජනාව ගේන්නේ එල්ටීටීඊ යුද්ධය පරාජය කළ නිසා නම්, සාමය උදා කළ නිසා නම් පක්ෂ භේදයෙන් තොරව, ජාති භේදයෙන්, වර්ග භේදයෙන් තොරව සෑම ශ්‍රී ලාංකිකයකුම එකට හිටගෙන මේ යෝජනාවට පක්ෂ වෙලා ජිනීවාවලටයි, එයට උල්පන්දම් දෙන සියලු බටහිර බලවේගවලටයි කියන්න ඕනෑ "මෙන්න ශ්‍රී ලාංකීය ජාතියේ අභිමානය රැක ගන්න අපි සියලු දෙනා අත්වැල් බැඳ ගන්නවා"ය කියලා. ඒක කියන්න තරම් කොන්ද පණ නැහැ. එහෙම නම් කොන්ද පණ නැති නායකයින්ට රටක පාලනය භාර දෙන්නත් මේ රටේ ජනතාව සූදානම් නැහැයි කියන පණිවිඩය දෙමින් මා මගේ කථාව අවසන් කරනවා.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
මීළඟට ගරු අජිත් කුමාර මන්ත්‍රීතුමා.

[අ.භා. 4.26]

**ගරු අජිත් කුමාර මහතා**
(மாண்புமிகு அஜித் குமார)
(The Hon. Ajith Kumara)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, යුද්ධය අවසන් මොහොතේ නිරායුධ සිවිල් පුරවැසියන් ඝාතනය වුණාද, නැද්ද කියන එක සොයන්න එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කවුන්සිලය පරීක්ෂණයක් පවත්වන්න කමිටුවක් පත් කරන්න ගත් තීරණයට සහාය දෙනවාද නැද්ද කියන එක සාකච්ඡා කරන්න තමයි ආණ්ඩුවෙන් මේ පාර්ලිමේන්තුවට යෝජනාවක් ගෙනැවිත් තිබෙන්නේ.

විශේෂයෙන්ම ආණ්ඩුව මේ වෙලාවේ කියනවා, අධිරාජ්‍යවාදයට විරුද්ධ වෙන්න මේ යෝජනාවට සහයෝගය දෙන්න කියලා. එක්සත් ජාතීන්ගේ සංවිධානය පැත්තෙන්, එහෙම නැත්නම් ඒකට පක්ෂව කථා කරන අය කියනවා, ප්‍රජාතන්ත්‍රවාදය වෙනුවෙන්, සාධාරණත්වය වෙනුවෙන් මේකට සහයෝගය දෙන්න කියලා. එතකොට එක පැත්තකින් ආණ්ඩුවේ අධිරාජ්‍ය විරෝධයත්, එක්සත් ජාතීන්ගේ සංවිධානයේ ප්‍රජාතන්ත්‍රවාදය පිළිබඳ මේ සාකච්ඡාත් දෙකම අසත්‍ය කියන එක ගැන පසු ගිය කාලයේදී අපි දිගටම කථා කළා. නැවත වතාවක් ඒක තහවුරු කරන්න උදාහරණ ඕනෑ තරම් තිබෙනවා. ඒ නිසා මෙය පාර්ලිමේන්තුවේදී ඇසිය යුතු ප්‍රශ්නයක්ද? එක පැත්තකින් මේක ආණ්ඩුවේ අර්බුදයක් වහ ගන්න අහන ප්‍රශ්නයක්. ඒ නිසා අපි හිතනවා, මේ ප්‍රශ්නය මෙතැනදී අහන්න අදාළ නැති, සාකච්ඡා කළ යුතු ප්‍රශ්නයක් නොවෙයි, විමසිය යුතු ප්‍රශ්නයක් නොවෙයි කියා. නමුත් මේ අවස්ථාවේදී එක පැත්තකින් වසන් කර තිබෙන සමාජ කතිකාවක් මතු කර ගැනීම සඳහා අදහස් දැක්වීමක් විතරක් කරන්නටයි අපි බලාපොරොත්තු වන්නේ. ඒ නිසා මේක ගෙන ආ යුතු යෝජනාවක් නොවෙයි. මේ ආණ්ඩුවේ අර්බුදයක් වසා ගන්නයි මෙවැනි කටයුතු කරන්නේ. ආණ්ඩුව ඡන්දයක් තියෙන වෙලාවක හෝ ආණ්ඩුව අර්බුදයට පත් වුණු වෙලාවක හෝ දේශප්‍රේමීත්වය, ජාති ආලය, අධිරාජ්‍ය විරෝධය කියන මාතෘකා ගෙනෙනවා. මේකත් ඒ වාගේ අවස්ථාවක්.

විශේෂයෙන් පසු ගිය ඉතිහාසය පුරාම මේ රටේ පීඩිත ජනතාවගේ අයිතිවාසිකම්, මානව හිමිකම් උල්ලංඝනය කරන්න තමයි මේ පාර්ලිමේන්තුවට යෝජනා ගෙනාවේ. ඒ නිසා මේකත් එක පැත්තකින් මූලික ප්‍රශ්නය යට කරලා වෙනත් අරමුණක් වෙනුවෙන් ගෙනා යෝජනාවක්. පැහැදිලිවම මේ යෝජනාව ඉදිරිපත් වුණු වෙලාවේ ආණ්ඩුව මේකට සහයෝගය දෙන්නේ නැහැ කියලා කිව්වා. ඒ වාගේම මේ යෝජනාව ගැන පාර්ලිමේන්තුව තුළ කථා කළත් මේ රටේ පසු ගිය අවුරුදු 30ක යුද්ධය ඇතුළේ පීඩාවට පත් වුණු මිනිස්සුන්ගේ කිසිදු මානව අයිතිවාසිකමක් පිළිබඳව සාධාරණයක් ඉෂ්ට වේවිය කියලා අපි විශ්වාස කරන්නේ නැහැ.

විශේෂයෙන්ම එක්සත් ජාතීන්ගේ සංවිධානයත් මේ ප්‍රශ්නය මතු කර තිබෙන්නේ කොහොම ද? ඔවුන් මේ ප්‍රශ්නය මතු කර තිබෙන්නේ, ඒ වාගේම ඒ සංවිධානයට උදව් කරන අය, ඒ මතයට පක්ෂ අය මේ ප්‍රශ්නය මතු කර තිබෙන්නේ යුද්ධය අවසන් මොහොතේ නිරායුධ සිවිල් වැසියන් ඝාතනය කළාද කියන කාරණය පදනම් කර ගෙනයි; යුද්ධය අවසන් කළාට පස්සේ සිවිල් වැසියන් ඝාතනය කළා ද කියන එක පදනම් කරගෙනයි. ඒකයි මූලික කාරණය. එතැනට මේක ලඝු කළා. පසු ගිය කාලාන්තරයක් තිස්සේ පැවැති යුද්ධය තුළ ක්‍රියාකාරී වුණු අය ගැන, එහෙම නැත්නම් මනුෂ්‍යත්වයට එරෙහිව ඝාතන වුණා ද කියන එක ගැන නොවෙයි බලන්නේ. යුද්ධය අවසන් වුණාට පස්සේ ඝාතනය වුණාද කියන එකයි බලන්නේ. ඔවුන් මේක එතැනට ලඝු කර තිබෙනවා. යුද්ධයකදී වුණත් මනුෂ්‍යත්වයට එරෙහිව ඝාතන කරන්න පුළුවන්ද කියන ප්‍රශ්නය ඔවුන් ගත්තේ නැහැ. ඒ නිසා ඔවුන්ගේ අරමුණ මොකක්ද කියන එකත් එතැනින් පැහැදිලියි.

පසු ගිය කාලයේ සාකච්ඡා වුණා ඉසිපියා කියන තරුණිය අත් අඩංගුවේදී දූෂණය කර මරා දැමුවා කියලා. ඒකෙදී ආණ්ඩුව මොකක්ද කිව්වේ? "එයා එල්ටීටීඊ ලුතිනන්වරියක්, එල්ටීටීඊ එකේ නිලයක් දැරූ කෙනෙක්, යුද්ධයට සම්බන්ධ වුණු කෙනෙක්" කිව්වා. ඒක වෙනම කථාවක්. හැබැයි, තිබෙන ප්‍රශ්නය මොකක්ද? අත්අඩංගුවේදී දූෂණය කරලායි මරා දැම්මේ. ඒ වාගේම 1971 සහ 1988-1989 වකවානුවේදීත් පුද්ගලයින් අත් අඩංගුවට අරගෙන මරා දැම්මා. වධ බන්ධනයට ලක් කළා. ඒ නිසා ඔවුන්ගේ අරමුණ මොකක්ද? අරමුණ හරිද වැරදි ද කියන කාරණය වෙන එකක්. නමුත් ඒ අයට එහෙම කරන්න පුළුවන්ද කියන ප්‍රශ්නය තිබෙනවා. ඒ නිසා මේ ප්‍රශ්නය, යුද්ධය අවසන් කරපු වෙලාවේ කරපු ඝාතන කියන තැනට සීමා කිරීම තුළින්ම එක්සත් ජාතීන්ගේ සංවිධානය මොන තැනට සීමා වෙලාද කියන එක අපි දකිනවා.

[ගරු අජිත් කුමාර මහතා]

විශේෂයෙන්ම 1983 දී එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුවේ මෙහෙයවීමෙන් යාපනය පුස්තකාලය ගිනි තිබ්බා. සති අන්ත පත්තරයක පළ වෙලා තිබුණා කවුද ඒකට වග කියන්න ඕනෑ කියලා. ඒ නිසා එදා ඉඳලා විතරක් නොවෙයි, ඊට කලින් ඉඳලා මේ යුද්ධය නිර්මාණය කරපු, ඒකට මැදිහත් වුණු, ඒකෙන් පීඩා වින්ද අයට යුක්තිය ඉෂ්ට වෙන්න ඕනෑ නැද්ද? ඒකට වග කිව යුතු අයගෙන් ප්‍රශ්න කරන්න ඕනෑ නැද්ද? අද එහෙම ප්‍රශ්න කිරීමක් එක්සත් ජාතීන්ගේ සංවිධානය කරන්නෙත් නැහැ; අපි මෙතැනට ඒක ගන්නෙත් නැහැ. උතුරු නැඟෙනහිර තරුණ තරුණියන් මරාගෙන මැරෙන බෝම්බ කාරයින් බවට පත් වුණු ඒ ඛේදවාචකය, ගැබිනි මවුවරු මරාගෙන මැරෙන බෝම්බකාරියන් බවට පත් වුණු ආර්ථික, දේශපාලන, සමාජ හේතු අපි අමතක කර තිබෙනවා. ඒවා පැත්තකින් තියලා මේ ප්‍රශ්නය විතරක් අපි සාකච්ඡාවට ගන්නවා. ඒ නිසා අපි හිතනවා ඒක තමයි ලිබරල්වාදීන්ට -

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
කරුණාකර, නිශ්ශබ්ද වෙන්න. මේ අවස්ථාවේදී ගරු නියෝජ්‍ය කථානායකතුමා මූලසුන ගන්නවා ඇති.

***අනතුරුව ගරු අජිත් පී. පෙරේරා මහතා මූලාසනයෙන් ඉවත් වුයෙන්, නියෝජ්‍ය කථානායකතුමා මූලාසනාරූඪ විය.***

*அதன்பிறகு, மாண்புமிகு அஜித் பீ. பெரேரா அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, பிரதிச் சபாநாயகர் அவர்கள் தலைமை வகித்தார்கள்.*

*Whereupon* THE HON. AJITH P. PERERA *left the Chair, and* MR. DEPUTY SPEAKER *took the Chair.*

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
කථා කරන්න, ගරු මන්ත්‍රීතුමා.

**ගරු අජිත් කුමාර මහතා**
(மாண்புமிகு அஜித் குமார)
(The Hon. Ajith Kumara)
ලිබරල්වාදීන්ට අනුව, එවැනි මරාගෙන මැරෙන බෝම්බකරුවන් නිර්මාණය වුණේ මොළ හෝදලා ඔවුන් මානසික විකෘති තත්ත්වයට පත් කිරීමෙනුයි. ඒක තමයි ඔවුන්ගේ අදහස. අපි හිතනවා, ඊට වඩා බොහොම පළල් කථාවක් තිබෙනවා කියලා. එක්සත් ජාතීන්ගේ යෝජනාවේ තිබෙන්නේ සමස්තය අත හැරලා අවසාන ප්‍රතිඵලය ගැන විතරක් ප්‍රශ්න කරන එකයි; සාකච්ඡා කරන එකයි. අපි ඒකට එකඟ නැහැ. ඒ වාගේම ඉතිහාසය පුරාම වුණු මානව ඛේදවාචකය, ඒ ඛේදවාචකයට බලපෑ කාරණා ගැන හඳුනා ගන්නවත් බැරි ආණ්ඩුවක් ඒකට පටු අර්ථයෙන් විරුද්ධ වන එකටත් අපි විරුද්ධයි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඉතිහාසය පුරාම මානව අයිතිවාසිකම් උල්ලංඝනය කළ සහ ඉතිහාසය පුරාම ඒ මානව අයිතිවාසිකම් උල්ලංඝනය කරන්න මැදිහත් වුණු සංවිධානයක් තමයි එක්සත් ජාතීන්ගේ සංවිධානය. ඒ සංවිධානයට මේකට ඇත්ත උත්තර හොයන්න උවමනාවක් නැහැ. ඔවුන් අද ලෝකයම තමන්ගේ න්‍යාය පත්‍රයට අනුව හසුරවනවා. ඒ වාගේම විශේෂයෙන් මැද පෙරදිග ඇතුළු රටවල්වල පීඩිත ජනතාව ජීවත් වෙන්න ඕනෑ කොයි ප්‍රමාණයෙන් ද, කොයි විධියට ද, තමන්ගේ උවමනාවට ද, නැද්ද කියන එක තීරණය කරන්නත් ඔවුන් මැදිහත් වෙනවා. එහෙම අයගෙන්, එවැනි සංවිධානවලින් මේ රටේ පීඩිත සිංහල, දෙමළ, මුස්ලිම් ජනතාවට යුක්තිය ඉෂ්ට වෙයි කියලා කවුරු හෝ බලාපොරොත්තු වනවා නම්, අපි විශ්වාස කරනවා ඒක බලාපොරොත්තු වන්න බැහැ කියලා. අපට එවැනි අයට උදවු කරන්න වුවමනාවක් නැහැ.

අනෙක් පැත්තෙන් මේ ආණ්ඩුව කියනවා, අධිරාජ්‍යවාදීන් රටට අත පොවන්න යනවා, ඒකට ඉඩ දෙන්න බැහැ කියලා. මෙහෙම කියන්නේ කවුද? මේ ආණ්ඩුවේ ඉන්න හැමෝම දැන් ඒක කියන්න හදනවා. ඒ නිසා "අධිරාජ්‍යවාදයෙන් බේරෙන්න අපට උදව් කරන්න, දේශ ප්‍රේමයෙන් සහයෝගය දෙන්න, භේදයක් නැතිව ලාංකික විධියට සහයෝගය දෙන්න" කියනවා. පාර්ලිමේන්තුව ඇතුළේ ඒකට විරුද්ධ වන්න කියලා අපට අත වනනවා, කථා කරනවා. මෙහෙම කියන්නේ කවුද? අධ්‍යාපනය කියන මානව අයිතිය වෙළෙඳ භාණ්ඩයක් බවට පත් කිරීමේ අධිරාජ්‍යවාදී වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කරන ආණ්ඩුවයි අපට මෙහෙම කියන්නේ. ජනතාවගේ සෞඛ්‍ය අයිතිය විනාශ කරන අධිරාජ්‍යවාදී වැඩ පිළිවෙළ ගෙනෙන, ඒ වෙනුවට අලුත් ඖෂධ පනත් ගෙනෙන, සේනක බිබිලේ ඖෂධ ප්‍රතිපත්ති පැත්තකට දමා අධිරාජ්‍යවාදීන්ගේ වෙළෙඳ පොළ වුවමනාවට පනත් ගෙනෙන ආණ්ඩුව කියනවා, අධිරාජ්‍යවාදීන්ට විරුද්ධ වන්න කියලා.

ඊළඟට, සියලුම දේවල් වෙළෙඳ පොළ ලාභය අරමුණු කර ගෙන ක්‍රියාත්මක කරන, බීජ පනත වැනි පනත් ගෙනෙන, ගොවීන්ගේ විශ්‍රාම වැටුප කප්පාදු කරන, ජනතාවගේ අයිතිවාසිකම් කප්පාදු කරන න්‍යාය පත්‍රවලට වැඩ කරන, ඒ වෙනුවෙන් ගිවිසුම් ගහපු ආණ්ඩුවක් කියනවා, අධිරාජ්‍යවාදීන්ට එරෙහි වන්න එන්න කියලා. ඊළඟට රතුපස්වලදී, තුන්තානෙදී වතුර වස කරන්න එපා කියලා ජනතාව හඬ නඟද්දී ඒ විරෝධතාවට වෙඩි තියලා පරිසර විනාශ කරන සමාගම් වෙනුවෙන් පෙනී සිටින, ඒ ලාභය අපේක්ෂා කරන අරමුණු වෙනුවෙන් පෙනී සිටින ආණ්ඩුවක් කියනවා, අධිරාජ්‍යවාදයට විරුද්ධව අපිත් එක්ක එකතු වන්න කියලා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අමුතුවෙන් අධිරාජ්‍යවාදයට අත පොවන්න දෙයක් නැහැ. මේ ආණ්ඩුව ඒක ගෙනැල්ලායි තිබෙන්නේ. ඒකට උදවු දීලායි තිබෙන්නේ. රහසිනුත්, ප්‍රසිද්ධියේත්, අප්‍රසිද්ධියේත් ඒකට උදව් කරලා තිබෙන ආණ්ඩුවක් තමයි දැන් කියන්නේ අධිරාජ්‍යවාදීන්ට විරුද්ධ වන්න වරෙල්ලා කියලා. ඒ නිසා මේක බොරුවක්. ඒ බොරුවට අපි විරුද්ධ වන්න ඕනෑ.

ඊළඟට, මේ ආණ්ඩුව අධිරාජ්‍යවාදීන්ගේ නව ලිබරල් ප්‍රතිසංස්කරණ හැම පැත්තෙන්ම ක්‍රියාත්මක කරන ආණ්ඩුවක්. එහෙම කර ගෙන කියනවා, "අනේ! අධිරාජ්‍යවාදීන් එක්ක විරුද්ධ වන්න අපට උදවු කරන්න. ඒ උගුලේ අහු වන්න එපා" කියලා. උගුලේ අහු වෙලා තිබෙන්නේ කවුද? දැනුවත්ව හරි නොදැනුවත්ව හරි, ප්‍රසිද්ධියේ හරි අප්‍රසිද්ධියේ හරි ඒ උගුලේ අහු වෙලා තිබෙන්නේ කවුද? ඒ උගුලේ මේ රටම කැඳවා ගෙන යන්නේ කවුද? මේ ආණ්ඩුව. තමන්ගේ දේශපාලන න්‍යාය පත්‍රය වෙනුවෙන් තමන් අමාරුවේ වැටෙනකොට, තමන්ගේ පස්ස බිම ඇනෙනකොට, තමන් අර්බුදයට යනකොට, අභ්‍යන්තර අර්බුද එනකොට පාර්ලිමේන්තුවට ඇවිල්ලා අපට කෙඳිරි ගානවා, අධිරාජ්‍යවාදයට විරුද්ධ වන්න කියලා.

ආණ්ඩුව කියනවා, ප්‍රතිසන්ධානයට මේක බාධාවක් කියලා. දෙමළ ජනතාව වෙනුවෙන් හරි, මේ රටේ පීඩාවට පත් වූ ජනතාව වෙනුවෙන් හරි කරන ප්‍රතිසන්ධානයට බාධාවක් කියලා මේ යෝජනාව ගෙනෙනවා. එහෙම කියලා ඉතිහාසය ගැන කථා කරන්න එපා කියලා අපට කියනවා. ඉතිහාසය වළ දමන්න කියනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, කථාවක් තිබෙනවා නේ, "මළවුන්ට නිදහසේ සැතපෙන්න ඉඩ දීලා ජීවත් වන එවුන් එක්ක ඉස්සරහට යමල්ලා" කියලා. මේ ආණ්ඩුව කියන්නේ ඒක.

හැබැයි, අපි හිතනවා, මළවුන්ට යුක්තිය ඉෂ්ට කරන්න ඕනෑය කියලා. මිය ගියේ දෙමළෙක්ද, සිංහලයෙක්ද, මුස්ලිම් කෙනෙක්ද, කවුද කියලා අදාළ නැහැ. මිය ගියේ මනුෂ්‍යයෙක් නම් ඒ මනුෂ්‍යයා මිනිස්සු වෙනුවෙන්, මනුෂ්‍යත්වය වෙනුවෙන් යුක්තිය ඉෂ්ට කරන්න ඕනෑ. ඒ ඉතිහාසය වළ දමන්න බැහැ. ඒ නිසා උතුරේත් නැඟෙනහිරත් දකුණේත් මේ යුද්ධයත් එක්ක පීඩාවට පත් වූ සියලු දෙනාට යුක්තිය ඉෂ්ට කරන්න ඕනෑ.

ඒ යුද්ධයට දායක වුණු කෙනා කවුරු වුණත් ඔවුන්ට එහෙම වුණේ ඇයි කියන කාරණය හොයා ඔවුන් වෙනුවෙන් යුක්තිය ඉෂ්ට කරන්න ඕනෑ. ප්‍රශ්නය වන්නේ මිය ගියේ සිංහලයෙක්ද, දෙමළෙක්ද කියන එක නොවෙයි. මේ ක්‍රියාවලිය ඇතුළේ ඔවුන් මිය ගියා නම්, මේ පාලකයෝ ගෙනාපු පාපතර ක්‍රියාවලිය ඇතුළේ ඔවුන් ඝාතනයට ලක් වුණා නම් ඒකට යුක්තිය ඉෂ්ට කරන්න ඕනෑ. ඒකට මැදිහත් වන්න ඕනෑ. ඒ වග කීමෙන් අපට ගැළවෙන්න බැහැ. අපේ වගකීම වන්නේ නැවත වතාවක් එවැනි දේවල් කැඳවන එක නොවෙයි. අපි එවැනි දේවල් වැළැක්වීම සඳහා සැබෑ ලෙසම ඔවුන්ට යුක්තිය ඉෂ්ට කරන්න ඕනෑ. ඒක තමයි අපේ සමාජයේ වගකීම; සදාචාරාත්මක සමාජයක වගකීම; මනුෂ්‍යත්වය ගැන කල්පනා කරන සමාජයක වගකීම. ඒ නිසා ඒ වෙනුවෙන් මැදිහත් වන්න ඕනෑ. හැබැයි, ජීවත් වන අයට යුක්තිය ඉෂ්ට කරන්න පුළුවන් වන්නේත්, මළවුන්ට යුක්තිය ඉෂ්ට කරන්න පුළුවන් වන්නේත් මේ සමස්ත යුදමය ක්‍රියාවලිය තුළ සිද්ධ වූ විනාශයට, මනුෂ්‍යත්වයට එරෙහි විනාශයට සමාජයක් ලෙස අපි හැමෝම හෘදය සාක්ෂියෙන් වග කිව්වොත් පමණයි. හැබැයි, ඒකට හෘදය සාක්ෂියක් තිබෙන්න ඕනෑ.

අපි කියනවා මේ ආණ්ඩුවේ හෘදය සාක්ෂියක් තිබෙන අය ඉන්නවා නම් ඒ වෙනුවෙන් නැඟී සිටින්න කියලා. එහෙම නැත්නම් නිහඬව ඉන්න. ඒ නිසා හෘදය සාක්ෂියක් තිබෙන සියලුම පීඩිත ජනතාවට අපි ආරාධනා කරනවා, මානව හිමිකම් රැක ගන්නත්, මනුෂ්‍යත්වයට එරෙහිව කරන අපරාධවලට එරෙහිව සාධාරණය හොයා ගන්නත් ආගම්වාදීන් පස්සේ, ජාතිවාදීන් පස්සේ යන්න එපාය කියලා.

බොරුවට මනුෂ්‍යත්වය වෙනුවෙන් කථා කරන, බොරුවට මේ රටේ ජනතාව වෙනුවෙන් කථා කරන එක්සත් ජාතීන්ගේ සංවිධානය වාගේ ලෝකයේම මානව අයිතිවාසිකම් විනාශ කරන සංවිධානයක් පස්සේ යන්න එපා. ඒ වෙනුවෙන් ඔබේ මැදිහත් වීමක් කරන්න. තමන්ගේ අරමුණ වෙනුවෙන්; ජනතාවගේ අරමුණ වෙනුවෙන් ඒ මැදිහත් වීම කරන්න කියලා ලෝකය පුරා සිටින ජනතාවට අපි කියනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ නිසා මේ යෝජනාවට සංශෝධන එකතු කරන එකෙන්වත් ඵලක් වන්නේ නැහැ කියලා අපි විශ්වාස කරනවා. මේ යෝජනාව ගෙනාවේ වෙන අරමුණකින්. මේ යෝජනාව මේ පාර්ලිමේන්තුව ඇතුළේ විවාද කිරීමට අවශ්‍ය යෝජනාවක් නොවෙයි. මෙය පාර්ලිමේන්තුවට ගෙන ආ යුතු යෝජනාවක් නොවෙයි. ආණ්ඩුව එක පැත්තකින් විපක්ෂය හිර කරන්න හදනවා. විපක්ෂය ආණ්ඩුව හිර කරන්න හදනවා. ඒකෙන් මේ ප්‍රශ්නයට උත්තරයක් ලැබෙන්නේ නැහැ. ජනතාවට අපි ආරාධනා කරනවා, මනුෂ්‍යත්වය ආරක්ෂා කරන්න පෙළ ගැහෙන්න කියලා. බොහොම ස්තුතියි.

[අ.භා. 4.37]

**ගරු පාඨලී චම්පික රණවක මහතා (තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යතුමා)**
(மாண்புமிகு பாட்டளி சம்பிக ரணவக்க - தொழில்நுட்ப, ஆராய்ச்சி அமைச்சர்)
(The Hon. Patali Champika Ranawaka - Minister of Technology and Research)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මෙතෙක් කාලයක් -විශේෂයෙන්ම 2009න් පස්සේ- ජාත්‍යන්තර ක්ෂේත්‍රයේ විවිධ බලවේග විසින් ගෙන ගිය ශ්‍රී ලංකාව වටලෑමේ ක්‍රියාවලිය පිළිබඳව මේ රටේ මහජන නියෝජිතයෝ හැටියට ව්‍යවස්ථාදායකයේ මේ ප්‍රශ්නය සාකච්ඡා කරන්න අපට අවස්ථාවක් ලැබීම ගැන අපි පළමුවෙන් ස්තුතිවන්ත වනවා. ජාත්‍යන්තරය නමින් හඳුන්වන එක්සත් ජනපදය ප්‍රමුඛ බටහිර රටවල උපාය මාර්ගය මොකක්ද? අපේ ඇතැම් අය කියන විධියට අප වෙනුවෙන් පත් කරලා තිබෙන මේ ජාත්‍යන්තර පරීක්ෂණ මණ්ඩලය ඉදිරියට ගිහිල්ලා, අපේ නිවැරැදිතාව පෙන්වන්න, රටේ නිවැරැදිතාව පෙන්වන්න අපට පුළුවන්ද? එහෙම යුක්තිසහගත මණ්ඩලයක්ද එතැන පත් වෙලා තිබෙන්නේ? එහෙම නැත්නම් මේ තිබෙන තත්ත්වයන් පිළිබඳව කරුණු දක්වලා, තර්ක විතර්ක කරලා, එතැනට ගිහිල්ලා මේ කොමිසමේ වාර්තාව සත්‍ය කරුණු මත පදනම් වන යුක්තිසහගත වාර්තාවක් බවට පරිවර්තනය කරන්න අපට පුළුවන්ද? අපි විශ්වාස කරන්නේ නැහැ, මොනම ආකාරයකින්වත් කරුණු දැක්වීමක් මඟින් හෝ එසේත් නැත්නම් සත්‍ය තොරතුරු පහදා දීමකින් හෝ මේ බටහිර බලවේගවල අරමුණුවලින් ගොඩ නැඟුණු මේ කොමිසමේ වාර්තාව වෙනස් කළ හැකියි කියලා. ඒ මඟින් නිවැරැදි ලෙස ලෝකය තුළ අපේ රටේ ප්‍රතිරූපය ගොඩ නැංවිය හැකියි කියලා අපි විශ්වාස කරන්නේ නැහැ. මොකද, බටහිර ලෝකයේ උපාය මාර්ගය ඉතාම පැහැදිලියි. ඒක මේ උතුරේ යුද ගැටුම් නිසා ඇති වුණු ක්‍රියාවලියක් නොවෙයි. ඒක බොහොම පැහැදිලිව අපේ ඉන්දියානු කලාපයේ -ඒ සාගරයේ- ඇති වෙලා තිබෙන බලගතු යුද දේශපාලනික ප්‍රශ්නයක් නිසා මේ රට දේශපාලනික වශයෙන් වට කරලා අස්ථාවර කිරීමේ වැඩ පිළිවෙළක් හැටියටයි ඉදිරිපත් වෙලා තිබෙන්නේ. ඒ නිසා අපි මොනවා කිව්වත්, මොනවා කළත් ඒ බටහිර බලවේගවල අරමුණු ඉෂ්ට කර ගන්නා තාක් කල් ඔවුන් ඉදිරියට යනවා.

එදා -2002, 2004- ඒ දීන සාම සමයේ, අර සුඩානයේ කළා වාගේ අන්තර් පාලනයක් හරහා මේ රටත් දෙකඩ කරන වැඩසටහනක් රනිල් වික්‍රමසිංහ මහත්තයාලා දීන සාම ක්‍රියාවලිය හරහා දියත් කළා. ඒ දීන සාම ක්‍රියාවලිය මේ රටේ ජනතාව පරාජයට පත් කළා. ඒ වාගේම ඒ දීන සාම ක්‍රියාවලියේ යුද නියෝජිතයා හැටියට සිටි ඒ නව දෙමළ නාසිවාදයේ එල්ටීටීඊ ත්‍රස්තවාදය යුදමය වශයෙන් පරාජය කරන්න අපේ ආරක්ෂක අංශවලට හැකි වුණා. අද මෙතැන හැම කෙනාටම වාද විවාද කරන්න, තමන්ගේ මැතිවරණ කොට්ඨාසවලට යන්න ඒ නිදහසත්, යුක්තියත්, සාධාරණත්වයත් ලබා දුන්නේ විසිහය දහසක් අපේ දරුවෝ ජීවිත පූජා කරලා මිසක ඔය අද හඬ නඟන, මානව හිමිකම් ආදිය ගැන කථා කරන පිරිස නිසා නොවෙයි. අන්න ඒ නිසා අපි නැවතත් අවධාරණය කරනවා, මේ ක්‍රියාවලිය පිටු පස්සේ තිබෙන්නේ රට වට කරන, රට අස්ථාවර කරන ක්‍රියාවලියක් මිසක දෙමළ ජනයාට සාධාරණය ඉෂ්ට කරන, මනුෂ්‍යත්වයේ ප්‍රශ්න විසඳන ක්‍රියාවලියක් නොවෙයි කියන කාරණය. ඒ නිසා රජයේ ස්ථාවරය අප අගය කරනවා. මේ ක්‍රියාදාමයට සහාය නොදී, අපේ රට ඇතුළේ යම්කිසි ප්‍රශ්නයක් තිබෙනවා නම් රට ඇතුළේම තිබෙන ශක්තිමත් යාන්ත්‍රණයක් මඟින් ඒ ප්‍රශ්නය විසඳිය යුතුයි කියන එක අප මේ අවස්ථාවේදී අගය කරනවා.

මේ ජාත්‍යන්තර වටලෑමට එතැනින් මෙතැනින් උත්තර දීලා, උපාය මාර්ගයකින් තොරව කටයුතු කරලා විසඳුම් හොයන්න බැහැ. අපට පෙනෙනවා, අද රට රටවල්වලට බටහිර ලෝකයේ මැදිහත් වීමෙන් සිද්ධ වෙලා තිබෙන අපරාධය මොකක්ද කියලා. ඇෆ්ගනිස්ථානය කියන වටිනා රට අද යුද බියෙන් මත් වෙලා විනාශ වෙලා ගිහින් තිබෙන්නේ ඇයි කියන කාරණය, ඉරාකයේ අයිසිස් වාගේ අන්තවාදී සංවිධානවලට මුළු ඉරාකයම -ඒ ශිෂ්ටාචාරය- විනාශ කරන්න ඉඩ දීලා තිබෙන්නේ ඇයි කියන කාරණය, සිරියාවේ සාමය උදා කරලා තිබෙන්නේ කොහොමද කියන කාරණය, ලිබියාවේ ගඩාෆිගෙන් පස්සේ ප්‍රජාතන්ත්‍රවාදය සාමය, මනුෂ්‍යත්වය, යුක්තිය ඉටු වෙලා තිබෙනවාද කියන

[ගරු පාඨලී චම්පික රණවක මහතා]

කාරණය තුළින් බටහිර ලෝකයේ මැදිහත් වීමෙන් සිද්ධ වෙලා තිබෙන අපරාධය පෙනෙනවා. ඒ හැම රටක්ම යුද භීතියෙන්, මළ කඳන්වලින්, ලේ ගංගාවලින් අද පිරී ඉතිරී ගිහින් තිබෙනවා. ශ්‍රී ලංකාවටත් මේ කරන්න හදන්නේ ඒකයි. මේකට උඩ ගෙඩි දෙන කවර දේශපාලනඥයෙකු හෝ ඉන්නවාද, විදේශීය ජන මාධ්‍ය ඉදිරියේ මේ රට අස්ථාවර කිරීම සඳහා වැරදි ප්‍රචාර කරන කවුරු හෝ ඉන්නවාද, ඒ සියලු දෙනාම රට කැඳවාගෙන යන්න හදන්නේ ඒ මහා අන්තවාදයටයි කියන කාරණය අපි පැහැදිලි කරන්න ඕනෑ. ඒ නිසා ඒ සෑම කෙනෙකුම ඉදිරි අනාගතයේදීත් මේ රටවල් ඇතුළේ යුද අපරාධකරුවෝ වෙනවා මිසක් රට වෙනුවෙන් පෙනී හිටපු, යුක්තිසහගත මනුෂ්‍යත්වය වෙනුවෙන් පෙනී හිටපු පිරිස් වන්නේ නැහැ.

එදා ඒ පළාත් සභා මැතිවරණය වෙලාවේදී අපේ නිශාන්ත ශ්‍රී වර්ණසිංහ මැතිතුමා පෙන්වා දුන්නා, මේක පැහැදිලි උපාය මාර්ගයක් මත පමණයි පරාජය කළ හැක්කේ කියන කාරණය. එය පදනම් කරගෙන ජාත්‍යන්තර වශයෙන්, ආර්ථිකමය වශයෙන්, සමාජමය වශයෙන් කොහොම ද අපි මේ අභියෝගයට මුහුණ දෙන්නේ, කොහොමද අපි මේ අභියෝගය පරාජය කරන්නේ, මොකක්ද අපේ උපාය මාර්ගය විය යුත්තේ කියන එක පිළිබඳ වැඩ පිළිවෙළක් එතුමා එදා පෙන්වා දුන්නා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ දහඅට වැදෑරුම් වැඩ පිළිවෙළ හැන්සාඩ්ගත කිරීම සඳහා මම මේ අවස්ථාවේදී **සභාගත*** කරනවා.

එක ප්‍රශ්නයක්, දෙකක් විසඳාගෙන එනකොට එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් මහ කොමසාරිස් කාර්යාලය අපේ රටට විරුද්ධව තිබෙන චෝදනා පත්‍ර එකින් එක පළල් කරගෙන යනවා. එදා යුද්ධයේ අවසන් දවස් කිහිපයේ සිදු වුණාය කියන ඒ අපරාධ සම්බන්ධයෙන් තිබෙන කාරණය පියවරෙන් පියවර පළල් කර ගෙන යනවා. මුලින්ම හිටපු අග විනිසුරුතුමියගේ ප්‍රශ්නය අභිමුව රටේ අධිකරණයේ ස්වාධීනත්වය පිළිබඳ ගැටලුව මතු කළා. අද වනකොට ආගමික සංහිඳියාව පිළිබඳ ප්‍රශ්නය ගැන ඒකපාර්ශ්වීය ප්‍රකාශ කරමින් කටයුතු කර ගෙන යනවා. අපේ පිරිසුත් ඊට අවශ්‍ය කරන විධියට වැරදි තොරතුරු පදනම් කරගෙන විදේශීය ජනමාධ්‍ය ඉදිරියේ මේ රටේ ආගමික සංහිඳියාව පිළිබඳ භයානක ප්‍රශ්නයක් තිබෙනවාය කියන එක ව්‍යාප්ත කරගෙන යනවා. අද ක්‍රම ක්‍රමයෙන් ඒකත් මේ න්‍යාය පත්‍රයට ඇතුළු කර ගෙන යනවා.

ඊළඟට, මේ රටේ ප්‍රජාතන්ත්‍රවාදය පිළිබඳ ප්‍රශ්නය, මේ රටේ ආර්ථික නිදහස පිළිබඳ ප්‍රශ්නය ආදී හැම එකක් කරා යන විධියේ දේශපාලනික ක්‍රියා දාමයක් අද අන්තර්ජාතික වටලෑමක් මඟින් කර ගෙන යනවා. ඒ නිසා මේක උතුරේ නන්දිකඩාල් කළපුව අසල යුද මෙහෙයුමේදී අවසාන දින කිහිපයේ ඇති වුණු ගැටුමේ ක්‍රියාවලියක් පමණක් නොවෙයි. අද වනකොට මුළු රටම වට කිරීමට අවශ්‍ය වැඩ පිළිවෙළ මානව හිමිකම් කවුන්සිලය හරහා දියත් කර තිබෙනවා. මේකේ අරමුණ මේ රටත් සුඩානය වාගේ, සෝමාලියාව වාගේ, ඇෆ්ඝනිස්ථානය වාගේ, සිරියාව වාගේ ක්‍රියාවලියක් බවට, බිඳ වැටුණු රාජ්‍යයක් බවට, කුළල් කා ගන්නා රාජ්‍යයක් බවට, මළ කඳන් ගොඩ ගැහුණු රාජ්‍යයක් බවට පත් කිරීමයි. ඒකට ඉතිහාසයකුත් තිබෙනවා.

එදා බ්‍රිතාන්‍යයන් මේ රටට ඇවිල්ලා, අපේ නිරායුධ ජනතාව දසදහස් ගණන් ඝාතනය කළා. ඒ පිළිබඳව මානව හිමිකම් වාර්තා නැහැ. ඇෆ්ඝනිස්ථානයට, ඉරාකයට ගිහිල්ලා කරපු අපරාධ පිළිබඳව අද වන තෙක් බ්‍රිතාන්‍ය අගමැතිවරයා ඒ යුද අපරාධ වාර්තාව බ්‍රිතාන්‍ය පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළේ නැහැ, ටෝනි බ්ලෙයාර්ට විරුද්ධව; බුෂ් මහත්මයාට විරුද්ධව. ඒ වාර්තා යටපත් කරලා මේ පුංචි රට යට කරන්න, කොටු කරන්න ඓතිහාසිකව අත්වල ලේ තවරා ගත් පිරිස් අද ක්‍රියා කර ගෙන යනවා. නමුත් අපි බොහොම ආඩම්බරයෙන් කියන්න ඕනෑ, වසර දස දහස් ගණනක ඉතිහාසයක් තුළ විවිධ ජන කණ්ඩායම්වල, පිරිස්වල බලපෑම් ඉදිරියේ අපි අපේ අනන්‍යතාවය රැක ගත්තා වාගේ ඉදිරි කාලයේදීත් අපේ ස්වාධීනත්වයත්, අපේ අනන්‍යතාවයත් ආරක්ෂා කර ගන්නා බව.

විදේශීය බලවේගත් එක්ක එකතු වෙලා, විදේශීය බලවේගවල සරණින් මේ රටේ දේශපාලන බලය අල්ලා ගන්න පුළුවන්ය, මේ රටේ දේශපාලනය වෙනස් කරන්න පුළුවන්ය කියා යම් යම් පිරිස් හිතනවා නම් ඒක මුළාවක්. ඉන්දියාව පසුපස්සේ ගිහින් ලංකාවේ ප්‍රශ්නය විසඳා ගන්න උත්සාහ කරපු දෙමළ එක්සත් විමුක්ති පෙරමුණේ නායකයන් අවසන් කර ගත්තු තැන්වලින්ම දෙමළ ජාතික සන්ධානයේ නායකයින්ටත් අවසන් කර ගන්න වේවි.

මේ රටේ අපේ ජනතාව ඇති වනතුරු ලේ වගුරා තිබුණත්, අපට අභියෝග එල්ල වෙලා තිබෙනවා නම් අපි ඒ අභියෝගය භාර ගෙන රටේ ශක්තිමත් ජාතික ආර්ථිකයක් පිහිටුවා ආර්ථික ප්‍රහාරවලට මුහුණ දෙන්න පුළුවන් අන්දමේ විධිමත් රටක් බවට මේ රට පත් කර ගන්න ඕනෑ. රාජ්‍ය තාන්ත්‍රික වශයෙන් මේ රට ශක්තිමත් කරලා, රාජ්‍ය තාන්ත්‍රික ප්‍රහාරයකට මේ රට සූදානම් කිරීම මඟින් වෙනස් වෙන නව ලෝකයට අපි මුහුණ දෙන්න ඕනෑ. අද අපි මතක තියා ගන්න ඕනෑ, අද බටහිර ලෝකයේ තිබෙන්නේ බැසගෙන යන අධිරාජ්‍යවාදයක්ය කියන එක. අද නැඟගෙන එන ලෝකය ආසියාවයි. අද නැඟගෙන එන සමාජ, දේශපාලනික, ආර්ථික බලවේගය ආසියාවයි. ඒ නැඟ එන ආසියාවේ වැදගත් කේන්ද්‍රස්ථානයක් බවට රට ගොඩ නඟන වැඩ පිළිවෙළක් එක්ක පක්ෂ, පාට බේදයෙන් තොරව පියවර ගැනීමෙන් පමණයි මේ වට ලෑම පරාජය කරන්න පුළුවන් වෙන්නේ. ඒ වාගේම නිශ්චිත චෝදනා තිබෙනවා නම් ඒවා අපේ අභ්‍යන්තර යාන්ත්‍රණයක් මඟින් විසඳා රටට යුක්තිය ඉටු කළ යුතුය කියන එකත් ප්‍රකාශ කරමින් මම නිහඬ වෙනවා.

[අ.භා. 4.47]

**ගරු හරින් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு ஹரின் பர்னாந்து)
(The Hon. Harin Fernando)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඉතාම බැරෑරුම් මාතෘකාවක් ඔස්සේ දේශප්‍රේමීන් සහ දේශද්‍රෝහීන් කවුද කියා හඳුන්වන්න ආණ්ඩු පක්ෂයේ පසු පෙළ මන්ත්‍රීවරුන් ඉදිරියට දමාගෙන ගෙනා යෝජනාවක් තමයි අද අපි මේ විවාද කරන්නේ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ යෝජනාවේ අපට තේරෙන්නේ නැති දේ තමයි, ලංකාව වෙනුවෙන් එක්සත් ජාතීන්ගේ සංවිධානයට පත් කර තිබෙන නියෝජිතවරයා "අපි මේකට සහයෝගය දෙන්නේ නැහැ" කියලා ඒ සංවිධානයට කිව්වාට පසුවත් ඒ ගැන මේ පාර්ලිමේන්තුවේ විවාද කිරීමේ තේරුමක් තිබෙනවාද කියන එක. ඒ ගැන අපට විශාල ප්‍රශ්නයක් තිබෙනවා. රවිනාථ ආරියසිංහ මහත්මයා එක්සත් ජාතීන්ගේ සංවිධානයට ගිහින් කියනවා, "අපි මේකට සහයෝගය දෙන්නේ නැහැ" කියලා. එහෙම නම් මොන කෙංගෙඩියකටද ඒ ගැන අපෙන් අහන්නේ? ඇයි දැන් මේ යෝජනාව මෙතැනට ගෙනැල්ලා තිබෙන්නේ? ඒක කරන්නේ මේ නිසායි. දැන් මේ ආණ්ඩුවට තිබෙනවා ගමේ දේශපාලනය කිරීමේ වුවමනාවක්. දැන් මේ ආණ්ඩුවට දේශප්‍රේමීත්වයේ ඔටුන්න දමා ගෙන

---

* **පුස්තකාලයේ තබා ඇත.**
* *நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
* *Placed in the Library.*

යුඑන්පීකාරයන් දේශද්‍රෝහීන් කියලා පෙන්වන්න වුවමනාවක් තිබෙනවා. ඒකයි මේ වැඩ පිළිවෙළ. වෙන කිසිම දෙයක් නොවෙයි. කෙසේ වෙතත්. දේශප්‍රේමීත්වයේ තරම අලුත්ගම සිද්ධියෙන් පෙනෙනවා. දේශප්‍රේමීත්වයේ තරම බේරුවල සිද්ධියෙන් පෙනෙනවා. මෙන්න ඡන්ද දිනන්න ගෙනෙන දේශප්‍රේමීත්වයේ තරම. ළඟදී ජනාධිපතිවරණයකට යන්න ඕනෑ නිසා, යුඑන්පීකාරයන් රටට ද්‍රෝහීකම් කරනවා කියලා දැන් ඉඳන්ම දේශප්‍රේමීත්වය වපුරන්න හදනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මෙතැන අපට තේරෙන්නේ නැති ප්‍රශ්නයක් තිබෙනවා. ජාත්‍යන්තරය ලංකාව ගැන විමර්ශනයක් කරන එකට අපි විරුද්ධයි. ඒ ගැන අහන්න දෙයක් නැහැ. අපි එක වතාවක් නොවෙයි දහ වතාවක් විරුද්ධයි. ඒක නොවෙයි මෙතැන තිබෙන ප්‍රශ්නය. ප්‍රශ්නය තමයි, ආණ්ඩුව මේ යෝජනාව ගෙනාවේ මොන චේතනාවෙන්ද කියන එක. එතුමන්ලාගේ චේතනාව ගමේ දේශපාලනය කරන එකයි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපට තවත් අපැහැදිලි තැනක් තිබෙනවා. යුද්ධය කරපු නියම යුද විරුවෙක් මේ රටේ ඉන්නවා. යුද්ධය කරපු නියම යුද විරුවා, ජනරාල් සරත් ෆොන්සේකා මහත්මයා ප්‍රසිද්ධියේ කියනවා, "අපට විරුද්ධව චෝදනාවක් ආවොත් මම ඉදිරිපත් වෙනවා" කියලා. "චෝදනාව ගෙනෙන්න, යුද්ධය අවසන් කරපු නායකයා හැටියට මම පිළිතුරු දෙන්න ඉදිරිපත් වෙන්නම්" කියලා එතුමා කියනවා. අනික් කට්ටිය යුද්ධය ඉවර කළේ AC කාමර ඇතුළේ ඉඳලා නේ. ඒ ගොල්ලන් යුද්දෙට ගියේ නැහැ. යුද්ධ කරපු නියම නායකයා කියනවා, "මේ විමර්ශනය ගෙනෙන්න, අපි ඒකෙන් නිදොස් වෙන්නම්, නිදහස් වෙන්නම්" කියලා. මේ ආණ්ඩුවේ ඇමතිවරුන්ගෙන් මම අහන්න කැමැතියි, ඇයි එහෙම නම් ඔබතුමන්ලාට බැරි මේ සම්මුතිවලට එකඟ නොවී ඉන්න. එහෙම නම් එක්සත් ජාතීන්ගේ සංවිධානයේ සාමාජිකත්වය අපට එපා කියන්න.

පාඨලී චම්පික රණවක ඇමතිතුමා කිව්වා දැන් ආසියාව තමයි දියුණු වෙමින් තිබෙන්නේ, බටහිර ලෝකය කඩා වැටෙනවා කියලා. ඒක යකාගේ කථාවක්. එතුමන්ලාට බටහිර ලෝකය පෙනෙන්න බැහැ. හැබැයි, බටහිර ලෝකය එක්ක තමයි සම්බන්ධකම් තියා ගන්න හදන්නේ. බටහිර රටවල තමයි citizenship තියා ගන්න හදන්නේ මේ ඉන්න නායකයෝ. බටහිර ලෝකෙට බැණ බැණ ඉන්න කට්ටිය ඊයේ කෑ ගැහුවා මම දැක්කා. තප්පුලාගෙන කියවගෙන කියවගෙන ගියා. නමුත් එතුමා පාවිච්චි කරන්නේ iPhone එකක්. ඒක හදන්නේ ඇමෙරිකාවේ. නමුත් බණින්නේ ඇමෙරිකාවට. ලජ්ජා නැතිව අපි දිහා බලලා අපට කියනවා, "කොළ පාට කමිස ඇඳගෙන ඉන්න එවුන් අධිරාජ්‍යවාදීන්" කියලා. රතු පාට ෂර්ට් ඇඳගෙන ඉන්න කට්ටියට බැන්නා, ඒ ගොල්ලන් සමාජවාදීන් කියලා. මම අහන්න කැමැතියි, එතුමාට තිබෙන වාදය මොකක්ද කියලා. ආණ්ඩුව බංකොලොත්, ආණ්ඩුවේ ආර්ථික ඝාතකයෙක් ඉන්නවා, ආණ්ඩුව එක්ක ජීවත් වෙන්න බැහැ කියලා මෙච්චර කල් කියපු මනුස්සයා රාජපක්ෂ කේක් කෑල්ලක් කාලා අද එක පාරට කියනවා "මේක හොඳයි" කියලා. දැන් බලන්න පුළුවන් ඇත්ත දේශප්‍රේමියෝ කවුද කියලා. එතුමා මොන පැත්තේ ඉඳගෙනද කථා කරන්නේ? එතුමා එක දවසකදී කියනවා, "ආණ්ඩුවේ ඉන්නේ හොරු" කියලා. අනික් දවසේ ආණ්ඩුව රකින්න කථා කරනවා. ඇට නැති දිව පෙරළෙන විධියට කථා කරන මේ වාගේ ඇමතිවරු විශ්වාස කරන්න අපට පුළුවන්ද ගරු නියෝජ්‍ය කථානායකතුමනි?

මේ වනකොට අපට ලොකු ප්‍රශ්නයක් තිබෙනවා. මේ දරුස්මාන් වාර්තාවට කරුණු දුන්නේ අපි නොවෙයි. දරුස්මාන් වාර්තාවේ මෙන්න මෙහෙම කියනවා:

> "The Government's written submissions to the Panel state that "members of the Armed Forces suspected of violations under the Army, Navy and Air Force Acts can be brought to justice by the mechanism of a court martial or tried in civilian courts."

දරුස්මාන් වාර්තාවේ කියනවා, අපි written submission එකක් දුන්නා කියලා. අපි ලිඛිතව කියලා තිබෙනවා ලු, අපේ හමුදාවේ කට්ටිය වැරදි කරලා තිබෙනවා නම් ඒවා court martial එකකින් විසඳනවා කියලා. දැන් දරුස්මාන් අපට කියනවා, "එහෙම නම් උඹලාගෙ රටේ ප්‍රශ්නයක් සිදු වුණා කියලා උඹලා පිළිඅරගෙන තිබෙනවා" කියලා. එහෙම නම් මේ විමර්ශනය එන්නේ අපේ වරදින්ද?

**ගරු වාසුදේව නානායක්කාර මහතා**
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
සිදු වුණා නම්.

**ගරු හරින් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு ஹரின் பர்னாந்து )
(The Hon. Harin Fernando)
ඔබතුමා මේක කියවන්න කෝ, ඔබතුමාට මම දෙන්නම්. දැන් ඔබතුමා ඔහොම කථා කළාට ඔබතුමා ඉස්සර හැම දාම ජිනීවා යන කෙනා නේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේකයි තිබෙන ප්‍රශ්නය. දරුස්මාන් වාර්තාවේ තවදුරටත් මෙහෙමත් කියනවා:

> "In recent years, the Supreme Court, at the head of Sri Lanka's judicial system, has become increasingly politicized, with an assertive Chief Justice at the helm,.."

මොකක්ද මේ කියන්නේ? ඒ ගොල්ලන් කියනවා ලංකාවේ උසාවි පද්ධතිය ගැන විශ්වාසයක් නැහැ කියලා. මේ රටේ ඉන්න Chief Justice, politicize වෙලාලු. එතුමන්ලා කියනවා, "අපට උඹලාගේ system එක ගැන විශ්වාසයක් නැහැ" කියලා. System එක ගැන විශ්වාසයක් නැත්තේ ඇයි? ඔබතුමන්ලා මේ පාර්ලිමේන්තුව මාර්ගයෙන් හිටපු අග්‍රවිනිශ්චයකාරතුමිය එළෙව්වා. ඉතින් ඒ මිනිසුන්ට විශ්වාසයක් නැහැ. එහෙම නම් ඒකත් අපේ වරදක්ද? අපි කරපු වරදක් නිසාද ඒක වුණේ? මේ රටේ සිදුවීම්, රතුපස්වල සිදුවීම්, අලුත්ගම, බේරුවල සිදුවීම් නිසා තමයි ඒ විශ්වාසය නැති වෙලා තිබෙන්නේ? ඒකට ඉතින් අපේ බෙල්ල අල්ලලා රේල් පීල්ලට තිබ්බාම හරිද?

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ ආණ්ඩුව ඉතා වංචනික ලෙස කටයුතු කරන බව අපි පැහැදිලිව කියන්න ඕනෑ. UN එකේ ශ්‍රී ලංකා නිත්‍ය නියෝජිත එතුමාගේ වාර්තාවෙන් කියනවා, LLRC වාර්තාවේ පරිච්ඡේද 285කින් සමන්විත 9වන පරිච්ඡේදයේ සඳහන් කරුණුවලින් කරුණු 144ක් identify කළා කියලා. කරුණු 144ක් තෝරා ගත්තාය කියනවා. නමුත් මෙච්චර අවුරුදු ගණනක් ගිහිල්ලාත් එයින් කරුණු 45කට විසඳුම් සොයන්න පටන් ගන්න පමණයි පුළුවන් වෙලා තිබෙන්නේ. ඉතින්, මේ ජාත්‍යන්තර පරීක්ෂණ සඳහා මේ රටට එන එක අහන්න දෙයක් නොවෙයි. ඒකට හේතුව අපේ නොහැකියාව; අපි කාලය මරපු එක.

හැබැයි, මා එකක් කියනවා ගරු නියෝජ්‍ය කථානායකතුමනි. මෙන්න මේක තමයි සත්‍යය. මෙන්න මෙතැනින් සොයා ගන්න පුළුවන් සැබෑ දේශ ප්‍රේමීන් කවුද, සැබෑ දේශ ද්‍රෝහීන් කවුද කියලා. මේ පරීක්ෂණයේ අරමුණ මොකක්ද? මේ පරීක්ෂණයේ අරමුණ වෙන මොකක්වත් නොවෙයි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. යුද්ධ කාලයේ වෙච්ච අපරාධ සොයා ගැනීම තමයි මේ පරීක්ෂණයේ අරමුණ. යුද්ධ කාලයේ වෙච්ච අපරාධ කිව්වාම, එතැන ආණ්ඩුව කරපු අපරාධ විතරක් නොවෙයි තිබෙන්නේ. එතැන LTTE එකෙන් කරපු අපරාධත් තිබෙනවා. ඒක මතක තබා ගන්න. අද අපට මේ යෝජනාව ගැන සැකයක්

[ගරු හරින් ප්‍රනාන්දු මහතා]

තිබෙනවා; සාධාරණ සැකයක් තිබෙනවා. ඒ නිසා මේ පාර්ලිමේන්තුවේ උත්තරීතර සභාවේදී අපි ප්‍රකාශයක් කරනවා. දේශ ප්‍රේමීන් කියා හිතා ගෙන ඉන්න පසු පෙළ මන්ත්‍රීවරුන් මේ දේ අහගන්න. මේ යුද පරීක්ෂණවලට භය ඇයි? ඔබතුමන්ලා දේශ ද්‍රෝහීන් බවට පත් වනවා මේ යෝජනාවෙන්. ඒ කොහොමද? අද ඔබතුමන්ලා ආරක්ෂා කරන්නේ කේපී, කරුණා සහ පිල්ලෙයාන්. කේපී තමයි, ප්‍රේමදාස මහත්මයා මරන්න, ගාමිණී දිසානායක මහත්මයා මරන්න, යූඑන්පී එකේ නායකයන් ඔක්කොම මරන්න සල්ලි ආයෝජනය කරපු මනුස්සයා. එයා අද ඉන්නේ කාගේ උකුළේද? මේ යුද පරීක්ෂණ ගෙනෙන්න හදන්නේ වෙන මොනවත් නිසා නොවෙයි. මේ යුද පරීක්ෂණ ගෙනෙන කොට කේපීගේත් හොර අහුවෙනවා. අද කේපී ඉන්නේ කාගේ උකුළේද? ශ්‍රී ලංකා නිදහස් පක්ෂය එස්.ඩබ්ලිව්.ආර්.ඩී. බණ්ඩාරනායක මැතිතුමා හදපු පක්ෂය. ඒ පක්ෂයේ අනුර බණ්ඩාරනායක මහත්මයාගෙන් ඇති වූ පුරප්පාඩුව පුරවන්නේ කවුද? ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ උපසභාපති වන්නේ කවුද? කරුණා අම්මාන්. එතුමා අරන්තලාවේ භික්ෂූන් වහන්සේලා ඝාතනය කළාය කියනවා, එක දිගට විනාඩි 15කින් පොලිසියේ 600දෙනෙකු මරා දැම්මාය කියනවා. මේ පරීක්ෂණයේදී එතුමන්ලා අහුවෙන්නේ නැද්ද? ඒකටද මේ භය? එතකොට දේශ ප්‍රේමීන් කවුද, දේශ ද්‍රෝහීන් කවුද කියලා මා විමල් වීරවංශ ඇමතිතුමාගෙන් අහනවා. පොළොව ඉම්බාට, පොළොවේ තිබෙන carpet එක ඉම්බාට, එහෙමත් නැත්නම් බබාලා වඩා ගත්තාට, තුන්මුල්ල හන්දියේ උද්ඝෝෂණය කළාට දේශ ප්‍රේමීන් වෙන්නේ නැහැ. දේශ ප්‍රේමීකම එහෙම හැදෙන්න නැහැ. මැන්ඩෙලා පොළොව, carpet ඉම්බේ නැහැ. ගාන්ධි carpet ඉම්බේ නැහැ. මාටින් ලූතර් කිං carpet ඉම්බේ නැහැ. ලී ක්වාන් යූ carpet ඉම්බේ නැහැ. එතුමන්ලා රටට ආදරය ඇතිව කටයුතු කළා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. එතුමන්ලා ජනතාවට කරන්න ඕනෑ වැඩ කටයුතු ටික කරලා දුන්නා. එතුමන්ලාට තමයි නියම දේශ ප්‍රේමීන් කියන්නේ. ඒ නිසා දේශ ප්‍රේමීන් අපද, දේශ ද්‍රෝහීන් ඔබතුමන්ලාද කියන එක පිළිබඳ ප්‍රශ්නයක් අපට මේ අවස්ථාවේදී මතු වනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, කථාවක් තිබෙනවා, "Truth crushed to earth shall rise again." කියලා. "සත්‍යය වළලා දැම්මාට දවසක සත්‍යය එළි වෙනවා." මේ වන කොට සත්‍යය සුළු සුළු වශයෙන් එළියට එන්න පටන් ගෙන තිබෙන බව බේරුවල සිද්ධියෙන්ම පෙනෙනවා. මේ ප්‍රශ්නය ඔඩු දුවන්න දෙන්නේ නැතුව වළක්වා ගන්න ආණ්ඩුවට අවස්ථාව තිබුණා. අද ජනාධිපතිතුමා බේරුවලට ගියාට වැඩක් නැහැ. බේරුවල සිද්ධියේදී නිල වශයෙන් 3දෙනෙකු සහ නිල නොවන වශයෙන් 8දෙනෙකු මැරිලා. මේවා නවත්වන්න තිබුණු දේවල්. නියම නීතියක් මේ රට තුළ නැහැ.

පසු ගිය දවසක පොලීසිය බලා ගෙන සිටියදී, STF එක බලා ගෙන සිටියදී අපේ පාලිත තෙවරප්පෙරුම මන්ත්‍රීතුමාගේ ඔළුව පැළෙන කල් ගැහුවා, වාහනය කුඩු පට්ටම් කළා. එතැනදී පොලීසිය හරියට කටයුතු කළේ නැහැ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. පුංචි ළමයකුගේ ඔළුව පැළුවා. ඔහු තවම කොළඹ රෝහලේ ඉන්නවා. මේවා ගැන කිසිම කෙනෙක් බැලුවේ නැහැ. අද මේ රටේ ඉන්න පොලීසිය, හමුදාව බිල්ලට අරගෙන ඉවරයි.

මේ දරුස්මාන් වාර්තාවෙන්ම කියන විධියට පැහැදිලිව ඔප්පු වනවා, ඔබතුමන්ලා හමුදාව බිල්ලට දෙන්න ගිය බව. නමුත් සැබෑ දේශ ප්‍රේමීන් කියලා කෑ ගහනවා. මහා දේශ ප්‍රේමියා කියලා පායලී චම්පික රණවක ඇමතිතුමා මොර දෙනවා. එතුමා මහා දේශ ප්‍රේමීත්වයෙන් යුතුව අප හඳුන්වා දෙන්න යනවා අධිරාජ්‍යවාදී ගැත්තෝ කියලා. ඇමෙරිකාව, එංගලන්තය, ජර්මනිය, ඕස්ට්‍රේලියාව, ජපානය, කැනඩාව නැතුව පුළුවන් නම් රට පාලනය කරලා බලන්නකෝ. අද වන කල්, තවමත් අපේ ආර්ථිකයට පණ පොවන්නේ මොන රටවල්ද? අද අපේ රටට සුද්දන් ගෙන්වා ගන්න හදනවා. කොහෙන්ද? සුද්දන් ගෙන්වන්න හදන්නේ සීෂෙල්ස් රටෙන්ද? සීෂෙල්ස් රටේ ජනගහනය ලක්ෂ තුනයි. හැබැයි, ලංකාවෙන් සීෂෙල්ස් රටට plane එකක් යනවා, ලක්ෂ තුනක ජනගහනයක් ඉන්න රටෙන් සංචාරකයන් මෙරටට ගෙනෙන්න. මොන බොරුවක්ද මේ කරන්නේ ගරු නියෝජ්‍ය කථානායකතුමනි?

දේශ ප්‍රේමීත්වය කියන label එක ගහගන්න හදන එකට විමල් වීරවංශ මැතිතුමා ගැන මා ඉතා කනගාටු වනවා. පක්ෂය වෙනුවෙන් මට අද පෞද්ගලිකව තීන්දුවක් ගන්න බැහැ. විමල් වීරවංශ ඇමතිතුමා ආණ්ඩුවෙන් එළියට ඇවිල්ලා ඔය ප්‍රකාශය කළා නම්, මා කිසිම විරුද්ධත්වයක් නැතුව විමල් වීරවංශ ඇමතිතුමාත් එක්ක අද ඡන්දය දෙනවා, මගේ පක්ෂයෙන් මොන තහනමට ලක් වුණත්. හැබැයි එතුමා එක දවසක් ඒ පැත්තේ ඉඳගෙන බැණලා, එක දවසක් ඒ පැත්තේ ඉඳගෙන,

"ආණ්ඩුවේ පී.බී. ජයසුන්දර හොරා, හොරා, ආර්ථික ඝාතකයා" කියලා, අනෙක් පැත්තට දිව කරකවලා කියනවා," නැහැ, මේ ආණ්ඩුව රකින්නට ඕනෑ." කියලා. මොන තරම් දෙපත් නයෙක්ද? ඒ මනුෂ්‍යයා ළඟට යන්න බැහැ, ඒ තරම් විෂයි. යූඑන්පී එක ගැන කිඹුල් කඳුළු හෙළනවා. අපේ නායකයෝ ගැන කිඹුල් කඳුල් කඳුළු හෙළනවා. ගරු නිමල් සිරිපාල ද සිල්වා ඇමතිතුමා කිව්වා, "ඔව්, රෝම සම්මුතියට අත්සන් නොකරපු නිසා තමයි අද අප බේරිලා ඉන්නේ" කියා. අන්න බොහොම සතුටුයි. එම නිසා එතුමා කියනවා, මේකටත් එකඟ වෙන්නටය කියා. ඒ දෙක පරස්පරයි නේ. ඇත්ත වශයෙන්ම අප වරදක් කරලා නැත්නම් අප ශක්‍රයාටවත් භය වෙන්නට ඕනෑ නැහැ. අපේ හිත පිරිසිදු නම්, අපි භය නැත්නම් ගේන්න පරීක්ෂණය. ලංකාවේ අපි ඔක්කොම එක විධියට හිට ගන්නවා. අප අපේ රට පාවා දෙන්නේ නැහැ.

ගරු විමල් වීරවංශ මැතිතුමාට මම තව කාරණයක් කියන්නට ඕනෑ. අප ලංකාවෙන් පිට ගිහින් එක දවසක්වත් ලංකාවේ ආණ්ඩුව විවේචනය කර නැහැ. පිට රටවලට ගියවිට, මම පෞද්ගලිකව ගරු මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ හොඳ කියලා තිබෙනවා. අප කවදාවත් රටෙන් පිට ගිහිල්ලා රට ගැන විවේචනය කරලා, පහත් විධියේ දේශපාලන වාසි අරගෙන නැහැ. එතුමාගේ දේශපාලනය වාසිය එහෙම ඇති, ලෙමන් පෆ් කා ගෙන උදඝෝෂණ කළාට. අපේ එහෙම ප්‍රතිපත්තියක් නැහැ. නමුත් අප අදත් කියනවා, ජාත්‍යන්තරයත් එක්ක කටයුතු කරද්දී මීට වඩා විනිවිදභාවයකින් යුතුව කටයුතු කළ යුතුයි කියලා. එලෙස කටයුතු නොකිරීම තුළ තමයි අද මේ සියලු අර්බුද නිර්මාණය වෙලා තිබෙන්නේ.

ගරු වාසුදේව නානායක්කාර ඇමතිතුමා කෑ ගහනවා. ඒ කාලයේ කොච්චර ජීනිවා ගියා ද? අර පොත්වල තිබෙන්නේ. පොලිතීන් ලෑල්ලක් එල්ලාගෙන පාර අයිනේ ඉඳගෙන උද්ඝෝෂණ කළ හැටි; මහින්ද රාජපක්ෂ මහත්මයාත් එක්ක ගිහිල්ලා තමරා කුනනායගම් එකතු කර ගෙන [බාධා කිරීමක්] අර පොතක් තියෙන්නේ අපේ මහත්තයා. ඒකේ තියෙන්නේ ඔබතුමා ගිහිල්ලා උද්ඝෝෂණ කළ හැටි. අන්න එහෙමයි, ඔබතුමන්ලා පිටරට ගිහිල්ලා කථා කළේ, අපේ ආණ්ඩුව තිබෙද්දී. අප එහෙම කළේ නැහැ. අප ගෙවල් ගානේ ගිහිල්ලා සල්ලි එකතු කරගෙන රටට විරුද්ධව උද්ඝෝෂණ කළේ නැහැ. උද්ඝෝෂණ කරපු තැනක් තිබෙනවා නම් පෙන්වන්න. නමුත් ඔබතුමන්ලා

මේ සියලු දේවල්වලදී අවංකව හරියට කෙලින් හිටගත්තේ නැති නිසා තමයි අද මේ අර්බුද ඇති වෙලා තිබෙන්නේ. දැන් ඒක යූඇන්පීකාරයෝ පිට තියලා අපේ පිටින් කපන්න හදනවා, "අප දේශප්‍රේමීයෝ. මුන් දේශද්‍රෝහියෝ "කියලා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අප කියනවා, අප මේකට එකඟ වෙනවා, නමුත් එකඟ වන්නේ එක ක්‍රමවේදයකින් කියලා. අපේ යෝජනා ටිකක් තිබෙනවා. අපේ ඒ යෝජනා ටික ඔබතුමන්ලාට ඉදිරිපත් කරාවි. ජී.එල්. පීරිස් ඇමතිතුමා හැම වෙලාවේම කියන්නේ, "We have a home-grown solution"' කියලා නේ; "මේ අප විසින්ම හදපු විසඳුමක්" කියලා නේ. ඉතින් ක්‍රියාත්මක කරන්නකෝ දෙවියනේ. LLRC එක මේ වෙනකොට ක්‍රියාත්මක කර තිබුණා නම් මොන ජාත්‍යන්තරයටත් බැහැ, අපට අභියෝගයක් කරන්න. අප LLRC වාර්තාව ක්‍රියාත්මක කර තිබුණා නම් වූදිතයෝ ටිකත් අල්ලලා ඉවරයි. ඔබතුමන්ලාගේ වාසියට වැරදිකාරයෝ හැටියට හමුදාවේ කිහිප දෙනෙක් පෙන්වනවා, දරුස්මාන් වාර්තාවට. ඊට පස්සේ ඒක ආයෙත් හකුළා ගන්නවා. ඇයි? අර A/C කාමරවල හිටපු කට්ටියගේ නම් ටික ගැවෙනකොට භය වෙනවා. ඒක නිසා තමයි අද මේ යෝජනාව ගෙනාවේ. ඒක දන්නේ නැහැ, අපේ පසු පෙළ මන්ත්‍රීවරු. මා ඒ කවුරු ගැනවත් අභිතකින් කථා කරනවා නොවෙයි. මා හිතන විධියට ගරු මාලනී ෆොන්සේකා මැතිනිය මේකට අත්සන් කළාට, මේ මොකක් ද ගෙනාවේ කියලාවත් දන්නේ නැතිව ඇති. මොකටද අත්සන් කළේ කියලාවත් එතුමිය දන්නේ නැතිව ඇති. මා එතුමියට චෝදනාවක් කරනවා නොවෙයි. ගරු නිමල් විජේසිංහ මන්ත්‍රීතුමාත් මේ ගැන හාංකවිසියක්වත් දන්නේ නැතිව ඇති; මොකක් ද මේ කියන්නේ කියලා දන්නේ නැතිව ඇති. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, කාටද මේ ගැහැව්වේ? ගැලරියට. මේක ගෙනාවේ ගැලරියට ගහලා යූඑන්පීකාරයන්ව කොන් කරලා පෙන්වන්න, "මුන් දේශද්‍රෝහියෝ "කියලා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා මීට වඩා ඔබතුමාගේ කාලය ගන්නේ නැහැ. මගේ කථාව අවසන් කරන්න ප්‍රථම මා ඉල්ලීමක් කරනවා. LLRC වාර්තාව සම්පූර්ණ වශයෙන්ම ක්‍රියාත්මක කරනවාය කියන යෝජනාව ගේන්න. ඒවාට ගේන්න ඕනෑ කරන අණපනත් ටික ගේන්න. ඒ සියලු කටයුතු ටික ගෙනැල්ලා කියන්න මේ කටයුතු කරනවාය කියා. ඒ වාගේම ඔබතුමන්ලා දහහත්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ක්‍රියාත්මක කරනවාය කියන විශ්වාසය ඇති කරන්න. ඒක පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන්න. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එහෙම නම් එක අතක් නොවෙයි අප අත් දෙකම උස්සලා සහයෝගය දෙන බව මතක් කරමින් මම නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

[අ.භා. 5.02]

**ගරු වාසුදේව නානායක්කාර මහතා (ජාතික භාෂා හා සමාජ ඒකාබද්ධතා අමාත්‍යතුමා)**
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார - தேசிய மொழிகள், சமூக ஒருமைப்பாட்டு அமைச்சர்)
(The Hon. Vasudeva Nanayakkara - Minister of National Languages and Social Integration)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අප මේ කථා කරන්නේ එක්සත් ජාතීන්ගේ සංවිධානයේ එක මණ්ඩලයක් ගැනයි. එක්සත් ජාතීන්ගේ සංවිධානය ගැන වන්දනීය, සම්මානනීය ආකාරයට සමහරු කථා කරනකොට ඒ අයට යමක් උපුටා දක්වන්නට ඕනෑය කියා මා සිතුවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, දෙවන ලෝක යුද්ධයෙන් පස්සේ, සියලුම ජාතීන් එකතුවෙලා එක්සත් ජාතීන්ගේ සංවිධානය හැදුවේ ලෝකයේ සාමය දිගටම පවත්වා ගෙන යන්නයි. ඒ වාගේම පසු කාලයක ලෝකයේ අඩු දියුණු රටවල දියුණුවක් ඇති කරන ක්‍රියාදාමයකට යන්නයි. මේ එක්සත් ජාතීන්ගේ සංවිධානය ආරම්භයේදීම අරමුණු කළේ එක්තරා සම්මුතියක් හැටියටයි. එහෙම නැතිව බලහත්කාරකම් කරන්න නොවෙයි. කිසියම් රටක එකඟත්වය නැති තැනකට කඩා වැදිලා එතැන එක්සත් ජාතීන්ගේ සංවිධානයේ කොඩිය ගහන්න නොවෙයි. නමුත් පසුකාලයක අධිරාජ්‍යවාදීන් එක්සත් ජාතීන්ගේ සංවිධානය තමන්ගේ අතකොළුවක් බවට පත්කර ගනිමින්, මෙය ක්‍රමානුකූලව රටවලට කඩා වැදීමේ උපක්‍රමයක මුවාවක් හැටියට පාවිච්චි කර තිබෙනවා. මම උපුටා දක්වන්න කැමැතියි, නිරුපම් සෙන් විසින් 2013 වසරේ ලලිත් ඇතුළත් මුදලි අනුස්මරණ දේශනයේ දී කළ ප්‍රකාශයක්. නිරුපම් සෙන් කියන්නේ, ඉන්දියානු ආණ්ඩුවේ එක්සත් ජාතීන්ගේ සංවිධානයේ හිටපු ස්ථාවර නියෝජිතවරයා. ඔහු මේ ලංකාවේ තානාපතිවරයා වශයෙනුත් පත්වෙලා සිටියා. ඊට පසුව ඔහු එක්සත් ජාතීන්ගේ නියෝජිත මහ සභාවේ සභාපතිතුමාගේ ආර්ථික අර්බුදය හා මූල්‍ය අර්බුදය පිළිබඳව උපදේශකවරයා හැටියටත් පත්වෙලා සිටියා. එම දේශනයේ දී ඔහු කියා තිබෙනවා, එක්සත් ජාතීන්ගේ සංවිධානයේ ආරම්භක අරමුණුවලට ඉඳුරාම පටහැනිව අද වනවිට අලුත් තත්ත්වයකට එක්සත් ජාතීන්ගේ සංවිධානය පත් වී තිබෙන බව. මේ කියන්නේ, එක්සත් ජාතීන්ගේ සංවිධානයේ හිටපු ඉන්දීය නියෝජිතවරයා. මා එම කොටස ඉංග්‍රීසි භාෂාවෙන් කියවන්නම්. එහි මෙසේ සඳහන් වනවා:

"Today you have something completely different."

ඒ කියන්නේ UN එක ගැන.

ඊළඟට, නිරුපම් සෙන් යම් පොතක් ගැන සඳහන් කරනවා.

"If you read the book 'Surrender is not an Option' by John Bolton.."

ඒ පොත ලියලා තිබෙන්නේ ජෝන් බෝල්ටන්. ඔහු ඇමෙරිකා එක්සත් ජනපදයේ ජෝර්ජ් බුෂ්ගේ කාලයේ, එක්සත් ජාතීන්ගේ සංවිධානයේ හිටපු ස්ථාවර නියෝජිතයා. ඔහු ලියපු පොත තමයි "Surrender is not an Option". He was the US Permanent Representative in the days of George W. Bush.

ඒ පොතේ ඉතාමත්ම පැහැදිලිව මෙසේ කියා තිබෙනවා:

"...that the present Secretary-General...

මේ කියන්නේ දැන් සිටින එක්කෙනා.

...was appointed through a Sino-U.S. conspiracy because it was expected that he would carry out the U.S. agenda 100 per cent."

මේ කියන්නේ කවුද? ජෝන් බෝල්ටන්. ජෝන් බෝල්ටන් කියන්නේ කවුද? ජෝන් බෝල්ටන් කියන්නේ ඇමෙරිකා එක්සත් ජනපදයෙන් පැමිණි එක්සත් ජාතීන්ගේ සංවිධානයේ හිටපු නියෝජිතයෙක්. ඒ පොත මොකක්ද? "Surrender is not an Option".

ඊළඟට, නිරුපම් සෙන් මෙහෙම කියනවා. මා එම කොටසත් කියවන්නම්. එහි මෙසේ සඳහන් වනවා:

" ...from the 1970s, the U.S. and its allies progressively emasculated the UN, reducing it to virtual silence on economic issues, by keeping it on the verge of bankruptcy and 'voluntarising' funding (so that he who paid the piper would call the tune). Question remains: What impelled them to do so?"

ඒ, ඊට පසුව ඔහු පැහැදිලි කළ ආකාරයයි.

මා මේ කියන්නට හදන්නේ එක්සත් ජාතීන්ගේ සංවිධානයේ ආරම්භක අවස්ථාවේ තිබුණු සම්මුතිය සහ ඒ වෙලාවේ තිබුණු මූලික සාරධර්ම පසු කලෙක සම්පූර්ණයෙන්ම බිඳ වැටී එක්සත් ජාතීන්ගේ සංවිධානය ඇමෙරිකා එක්සත් ජනපදයේ අතකොළුවක් බවට පත් වූ ආකාරයයි. එක්සත් ජාතීන්ගේ සංවිධානයේ ඉන්දියාවේ හිටපු නියෝජිතයාත්, ඒ වාගේම එක්සත් ජාතීන්ගේ සංවිධානයට ඇමෙරිකාවෙන් ආපු නියෝජිතයාත් ඔහුගේ පොතේ කියා තිබෙන්නා වූ කරුණු උපුටා දක්වමිනුයි මා කියන්නේ.

මා මෙසේ කිව්වේ ඇයි? අප තේරුම් ගන්නට ඕනෑ, මානව හිමිකම් සංවිධානය අද කොයිතරම් දුරට දේශපාලනයේ අතකොළුවක් බවට පත්වී තිබෙනවාද කියලා. ඒකටයි මා මේ කාරණය කිව්වේ. අද දේශපාලනයේ දී ජාත්‍යන්තර වශයෙන් බෙදුණු පිල් මොනවාද කියලා අපි කවුරුත් දන්නවා. මේ බෙදුණු පිල් අතරේ තමන්ගේ බලය ක්‍රියාත්මක කරන එක ආයතනයක් හැටියට අධිරාජ්‍යවාදීන් මෙය යොදා ගන්නා බවයි මා මේ කියන්නේ.

ඊළඟට ජාත්‍යන්තර මැදිහත්වීම්වලට බියෙන් නම් අපි කිසිවක් කරන්නේ නැහැ. අපට ජාත්‍යන්තර මැදිහත්වීම් ගැන බයක් නැහැ. අපි දන්නවා, ජාත්‍යන්තර වශයෙන් අපට තිබෙන්නා වූ මැදිහත්වීම් මොනවාද, අපේ ස්වාධිපත්‍යය මොකක්ද කියලා.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)

ගරු ඇමතිතුමා, කාලය පිළිබඳ ප්‍රශ්නයක් තිබෙනවා. ඔබතුමාගේ කථාව අවසන් කරන්න.

**ගරු වාසුදේව නානායක්කාර මහතා**
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ කරුණ කියලා මගේ කථාව අවසන් කරනවා.

අපි LLRC වාර්තාවේ නිර්දේශ ක්‍රියාත්මක කරන්න කටයුතු කර ගෙන යනවා. නමුත් මතක තබා ගන්න, ඒගොල්ලන්ගේ credibility එකට අපට වැඩ කරන්න බැහැ. අපට වැඩ කරන්න පුළුවන් අපේ credibility එකට; අපි පිළිගන්නා credibility එකට. ඒගොල්ලන්ට වුවමනා කරන credibility එක අපට කවදාවත් සංසිඳුවන්න බැහැ. මොකද, ඒක ඔවුන්ගේ කුමන්ත්‍රණකාරී වුවමනාවත් එක්ක ගැට ගැහිලා තිබෙන නිසා.

